252 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 252 - இல. 12
Volume 252 - No. 12

2017 ජූනි 21වන බදාදා
2017 யூன் 21, புதன்கிழமை
Wednesday, 21st June, 2017

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
ස්ථාවර නියෝග සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත් පිළිබඳ රැස්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්න:
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහුවිධ නිපුණතා සේවා සඳහා බඳවා ගත් අභ්‍යාසලාභීන්
උඩ වලවේ බහුකාර්ය ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාව මුහුණ පා ඇති ගැටලු

ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර වූ ආරක්ෂක ගිවිසුම:
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

ජන ජීවිතයට බලපාන ගැටලු විසඳීම සඳහා කඩිනම් පියවර ගැනීම:
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

කටාර් රාජ්‍යයෙහි වර්තමාන තත්ත්වය:
විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදි.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
විජය උදාන පදනම (සංස්ථාගත කිරීමේ) –[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා] - පළමුවර කියවන ලදි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර හා තුන්වන වර කියවා සම්මත කරන ලදි.

කල් තැබීමේ යෝජනාව:
මත් වීම හේතුවෙන් ජන ජීවිතයට සිදුවන අහිතකර බලපෑම්

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள் :
நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களது நடத்தைக் கோவை இறுதி வரைவுகள் பற்றிய கூட்டம்

அரசாங்க சேவை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:
இலங்கைத் துறைமுக அதிகாரசபையில் பல்துறைத் திறன் சேவைக்காக ஆட்சேர்க்கப்பட்ட பயிற்சியாளர்கள்
உமாஓயா பல்நோக்குத் திட்டத்தினால் மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்

இலங்கைக்கும் ஐக்கிய அமெரிக்க இராச்சியத்துக்கும் இடையிலான பாதுகாப்பு ஒப்பந்தம்:
மாண்புமிகு பிரதம அமைச்சரின் கூற்று

மக்களின் வாழ்வைப் பாதிக்கும் விடயங்களைத் தடுப்பதற்கான துரித நடவடிக்கை:
மாண்புமிகு பிரதம அமைச்சரின் கூற்று

கட்டார் நாட்டின் தற்போதைய நிலைமை:
வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று

சுகததாச தேசிய விளையாட்டுகள் கட்டிடத்தொகுதி அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
விஜய உதான மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன] - முதன்முறை மதிப்பிடப்பட்டது

காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் (தாபித்தலும் நிர்வகித்தலும் பணிகளை நிறைவேற்றுதலும்) (திருத்தம்) சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை :
கழிவகற்றல் செயற்பாட்டின் ஒழுங்கீனம் காரணமாக மக்களின் வாழ்வுக்கு ஏற்படும் பாதிப்பு

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Meeting on Final Draft of Standing Orders and Code of Conduct for Members of Parliament

PROGRESS REPORT OF PUBLIC SERVICES COMMISSION

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Trainees Recruited for Multi-Skilled Services in Sri Lanka Ports Authority
Problems Caused to People by Uma-Oya Multipurpose Project

MILITARY AGREEMENT BETWEEN SRI LANKA AND UNITED STATES OF AMERICA:
Statement by Hon. Prime Minister

IMMEDIATE ACTION TO ARREST ISSUES AFFECTING PUBLIC LIFE:
Statement by Hon. Prime Minister

CURRENT SITUATION IN QATAR:
Statement by Minister of Foreign Affairs

SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
Wijeya Udana Foundation (Incorporation) - [Hon. (Dr.) Kavinda Heshan Jayawardana] – Read the First time

OFFICE ON MISSING PERSONS (ESTABLISHMENT, ADMINISTRATION AND DISCHARGE OF FUNCTIONS) (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

ADJOURNMENT MOTION:
Adverse Impacts on Public Life owing to Irregular Garbage Disposal

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 ජූනි 21වන බදාදා
2017 யூன் 21, புதன்கிழமை
Wednesday, 21st June, 2017

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

ස්ථාවර නියෝග සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත් පිළිබඳ රැස්වීම
நிலையியற் கட்டளைகள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களது நடத்தைக் கோவையின் இறுதி வரைவுகள் பற்றிய கூட்டம்
MEETING ON FINAL DRAFT OF STANDING ORDERS AND CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2017 ජූනි මස 07වැනි බදාදා දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයේ අවසන් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස 2017 ජූනි මස 22වැනි බ්‍රහස්පතින්දා අපර භාග 3.00ට පාර්ලිමේන්තු සංකීර්ණයේ කාරක සභා කාමර අංක 01හිදී මාගේ මූලිකත්වයෙන් විශේෂ රැස්වීමක් පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇති බැවින්, ඊට පැමිණ සහභාගිවන මෙන් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාරුණිකව මෙයින් දන්වනු කැමැත්තෙමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව
அரசாங்க சேவை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை
PROGRESS REPORT OF PUBLIC SERVICES COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 55 (5) ව්‍යවස්ථා ප්‍රකාරව 2017.01.01 දින සිට 2017.03.31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විශේෂ කාර්යභාර අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා විශේෂ කාර්යභාර අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(i) 2016 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්; සහ

(ii) 2016 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා ඉඩම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2016 මුදල් වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මාතලේ, තැන්න, "නදීවාස" යන ලිපිනයෙහි පදිංචි ආර්.කේ.ඒ.ඩී.එල්.ඩබ්ලිව්. රණවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මහියංගනය, හෙබරව, බදුල්ල-අලුයටවෙල ද්විතීයික පාසලේ සේවය කරන ටී. වසන්ත මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මහවෙල, පරණ දොඹවෙල, අංක 52/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. පුංචිබණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, බදුල්ල, ගහබඩ පටු මාවත, අංක 14/12ඒ. දරන ස්ථානයෙහි පදිංචි ආරියසිංහ වයලට මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

ගරු කථානායකතුමනි, අම්බලන්තොට, වාදුරුප්ප, අක්කර 06 යන ලිපිනයෙහි පදිංචි ඩී.එස්.ඩබ්ලිව්. ආරච්චිගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු බන්දුල ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 දරන ස්ථානයේ පිහිටි බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ, සමස්ත ලංකා පළාත් ආදායම් සේවා එකමුතුවේ ලේකම් ඒ.ජී.එන්. ගමගේ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හම්බන්තොට, වැලිගත්ත, කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනීය සේවක සංගමයේ ඒ.එන්. අබේගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) නාකුළුගමුව, පලවින්න, "සුහද" යන ලිපිනයෙහි පදිංචි වන්නිආරච්චිගේ ගුණදාස මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) යෝගියාන, දික්වෙල, අංක 70 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. සුගතපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

ගරු කථානායකතුමනි, දෙවලපොල, වල්පිටමුල්ල, අංක 20 දරන ස්ථානයෙහි පදිංචි එම්.පී. උක්වත්තගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa)

ගරු කථානායකතුමනි, ගිණිගත්හේන, කැලණිගම, දාගම්පිටිය යන ලිපිනයෙහි පදිංචි යූ.වී. රත්නපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் ஆனந்த விஜேமான்ன)
(The Hon. Lakshman Ananda Wijemanne)
ගරු කථානායකතුමනි, මීගහතැන්න, පැලවත්ත පාර, අනුරාධ හෝටලය යන ලිපිනයෙහි පදිංචි උපාලි ගුණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, කුරුණෑගල, මිල්ලව, මානෙල්වත්ත, අංක 86 දරන ස්ථානයෙහි පදිංචි කේ.එන්. ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රසන්න රණවීර මැතිතුමා - පැමිණ නැත.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මාතලේ, මාදිපොල, මහවැහැර, "ශාලිකා" යන ලිපිනයෙහි පදිංචි පී.ජී. විජේකෝන් බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
Hon. Speaker, I present a petition from Mr. K. Sivalingam of 4th Division, Ampal Road, Mulliyawala.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ලාක්ෂා කර්මාන්ත වෙළෙඳ පොළ පුළුල් කිරීම: ගෙන ඇති පියවර
அரக்கு சார்ந்த கைத்தொழில் சந்தையின் விரிவாக்கம் : நடவடிக்கை
EXPANSION OF MARKET FOR LACQUER INDUSTRY: STEPS TAKEN

697/'16

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) ලාක්ෂා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳව ගැටලු පවතින බවත්;

(iii) මෙම කර්මාන්තය තුළින් රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ලාක්ෂා නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්,වසර තුළ ලබාගත් අපනයන ආදායම කොපමණද;

(iii) අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේනම්,ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ ලාක්ෂා කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේනම්,එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரக்கு சார்ந்த உற்பத்திக் கைத்தொழிலை வாழ்வாதாரமாகக் கொண்டுள்ளவர்கள் தற்போது அக்கைத்தொழிலிலிருந்து விலகிச் செல்கின்றனர் என்பதையும்;

(ii) மூலப்பொருள் மற்றும் சந்தை தொடர்பாக பிரச்சினைகள் காணப்படுகின்றன என்பதையும்;

(iii) இக்கைத்தொழிலானது இந்நாட்டுக்கு பெருமளவு வெளிநாட்டுச் செலாவணியை ஈட்டித்தரக் கூடியதொன்றாகுமென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அரக்கு சார்ந்த உற்பத்திகள் ஏற்றுமதி செய்யப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், 2015ஆம் ஆண்டினுள் பெற்றுக்கொள்ளப்பட்ட ஏற்றுமதி வருமானம் யாதென்பதையும்;

(iii) ஏற்றுமதி செய்யப்படுவதில்லையெனில், ஏற்றுமதி செய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) ஆமெனில், அது எத்திகதியிலிருந்து என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) நாட்டினுள் அரக்கு சார்ந்த கைத்தொழிலுக்கு தேவையான சந்தையை விரிவுபடுத்த அரசாங்கம் நடவடிக்கை மேற்கொண்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Industry and Commerce:

(a) Is he aware that-

(i) the people who have made their living on lacquer-related products are getting distanced from that industry at present;

(ii) there are problems in regard to raw material and the market; and

(iii) this industry could bring a lot of foreign exchange to the country?

(b) Will he inform this House,-

(i) whether lacquer products are exported;

(ii) if so, the export income received in the year 2015; and

(iii) if not exported, whether action will be taken to export; and

(iv) if so, the date on which it will be commenced?

(c) Will he also inform this House,-

(i) whether the Government has taken steps to expand the market for lacquer industry in the country; and

(ii) if so, the aforesaid steps?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ලාක්ෂා කර්මාන්තය පමණක් නොව සාම්ප්‍රදායික කර්මාන්තවල නියැළී සිටින පවුල්වල දරුවන් නූතන ලෝකයේ වෙනස් වන ගතික පරිසරය සහ අධ්‍යාපන රටාවේ වෙනස්වීමට සමගාමීව වෙනස් වන ස්වරූපයක් පොදුවේ දක්නට ලැබේ. සාම්ප්‍රදායික හස්ත කර්මාන්තවල නියැළෙනවාට වඩා, නවීන වෘත්තීන්වල නියැළීමට ඔවුන් වඩා නැඹුරුතාවක් දක්වන බව පෙනේ.

(ii) ලාක්ෂා ආශ්‍රිත නිර්මාණ නිෂ්පාදනයේදී ප්‍රධාන වශයෙන් භාවිත කරනු ලබන්නේ ලාකඩ, වර්ණ සහ දැව වන අතර, ලාකඩ ඉන්දියාවෙන් ආනයනය කරනු ලබයි. ඒ අනුව ලාකඩ අමුද්‍රව්‍ය මිල වැඩිවීම සම්බන්ධව ගැටලුවක් පවතී. එහෙත් ලාක්ෂා ආශ්‍රිත නිර්මාණ සඳහා ඉහළ ඉල්ලුමක් පවතින බැවින්, වෙළෙඳ පොළ සම්බන්ධ ගැටලුවක් නොමැත.

(iii) ඔව්.

ලාක්ෂා ආශ්‍රිත නිර්මාණ සඳහා විදේශීය සංචාරකයන්ගේ ඉල්ලුම ඉහළ මට්ටමක පැවතිය ද, දැව හා ලාකඩ

අමුද්‍රව්‍ය ලෙස යොදා ගන්නා බැවින් එම නිර්මාණ විදේශීය රටවල්වලට අපනයනය කිරීමේ දී විවිධ සම්බාධක (ජීවානුහරණය කිරීම සහ වෙනත් විශේෂ ගාස්තු) පවතී.

(ආ) (i) ලාක්ෂා ආශ්‍රිත නිෂ්පාදන විශාල ප්‍රමාණවලින් සෘජුව අපනයනය නොකෙරෙන අතර මෙම නිෂ්පාදන සංචාරකයන් සඳහා විකිණීම සිදු කෙරෙන බැවින් ඒවා අපනයන ආදායම ලෙස වාර්තා නොවේ.

(ii) මේවා දැව නිෂ්පාදන තුළ අන්තර්ගත වන අතර නිෂ්පාදන සඳහා වෙනම HS අංකයක් නොමැත. එබැවින් ලාක්ෂා නිෂ්පාදනවල නිශ්චිත අපනයන වටිනාකමක් සෙවීම අපහසුය.

(iii) ඉහත (ආ) (i) පිළිතුර පරිදි පැන නොනඟී.

(iv) ඉහත (ආ) (i) පිළිතුර පරිදි පැන නොනඟී.

(ඇ) (i) ඔව්.

(ii) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති "ලක්සල" ආයතනයේ අළෙවි මධ්‍යස්ථාන 15ක

මෙම නිර්මාණ අළෙවි කිරීමට ඉඩ පහසුකම් සලසා දී ඇති අතර ඉදිරියේදී සියලු ලංකා සතොස ප්‍රධාන

මධ්‍යස්ථානවල විශේෂ කුටියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. තවද, වෙළෙඳ පොළට සරිලන නව

නිර්මාණ හඳුන්වා දීමට ද කටයුතු කර ඇත.

(ඈ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා විෂයභාර ඇමතිතුමා නොවුණත් ලබා දුන්නු පිළිතුරට ස්තුතිවන්ත වන අතර, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි.

දැන් ගරු ඇමතිතුමාගේ පිළිතුරෙහි පැහැදිලිව සඳහන් වුණා, HS අංකයක් ගැන. ආනයනය සහ අපනයනය කියන දෙකේදීම නිශ්චිත HS අගයක් තිබෙනවාය කියන්නේම පිළිගැනීමක් තිබෙනවා කියන එකයි. හැබැයි, අපේ රටේ ලාක්ෂා කර්මාන්තයේ යෙදෙන විශාල පිරිසක් සිටියත්, රටට ඉන් විශාල විදේශ විනිමයක් ලැබුණත්, සංචාරකයන්ගෙන් ලංකාවේ ලාක්ෂා නිෂ්පාදනවලට ලොකු ඉල්ලුමක් තිබුණත් මේ HS අගය නොලැබීම තුළම ඒ ව්‍යාපාරය සඳහා පසු ගිය වකවානුවේ දක්වා තිබෙන සැලකිල්ලේ තරම පෙනෙනවා.

ඉතින් මේ තත්ත්වය තවදුරටත් ඉදිරියට ගෙන යෑමද රජයේ අපේක්ෂාව? එහෙම නැතිව, ලාක්ෂා කර්මාන්තයට සහ එහි නිරතවන්නන්ට වැඩි ශක්තියක් ලැබෙන්නත්, රටට මේ හරහා යම් වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගන්නත්, මේ කර්මාන්තයේ යෙදෙන අයගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්නත්, සංචාරකයන් ආකර්ෂණය කර ගන්නත් පරණ පිල්ල හැර අලුත් ක්‍රමවේදයක් ඇත්තේම නැද්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, "අලුත් පිල්ලක් තමයි" කියලා මට මේ ප්‍රශ්නයට උත්තර දෙන්නට පුළුවන්. නමුත් විෂය භාර

අමාත්‍යවරයාට තමයි මේකට හරි උත්තරය දෙන්නට පුළුවන්. එම නිසා අපි මේ ප්‍රශ්නය එතුමාට ඉදිරිපත් කරලා සාධාරණ උත්තරයක් දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ දෙවන ප්‍රශ්නය මේකයි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමාගේ දීර්ඝ පිළිතුරේ සඳහන් වුණා මේ කර්මාන්තය සඳහා අවශ්‍ය කරන ලාකඩ ගෙන්වීම සිද්ධ කරන්නේ ඉන්දියාවෙන් කියලා. මේ සභාවේ සිටින අය වාගේම, පහ වසර ශිෂ්‍යත්වය, සාමාන්‍ය පෙළ, උසස් පෙළ සහ වෙනත් විභාග ලියපු අය දන්නවා විභාග ශාලාධිපතිවරයා උත්තර පත්‍ර ටික පාර්සලයට දාලා අලවලා සීල් එක තියන්නේත් ඉන්දියාවෙන් ගෙනෙන ලාකඩවලින් කියලා. ලංකාවේ ලාකඩ නිෂ්පාදනයට තිබෙන ගැටලුව මොකක්ද, එය අපට කරන්නට බැරි ප්‍රශ්නය මොකක්ද? [බාධා කිරීමක්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එතුමාගේ සියලු අතුරු ප්‍රශ්න අදාළ අමාත්‍යවරයාට යොමු කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, තුන්වෙනි අතුරු ප්‍රශ්නය මේකයි. ඒ ප්‍රශ්නයත් අදාළ ඇමතිවරයාට යොමු කරයිද දන්නේ නැහැ, ගරු ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ ඇමතිතුමා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය සැකෙවින් අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
රට තුළ ලාක්ෂා කර්මාන්තයේ යෙදෙන පිරිසට සහන පොලී පදනම මත ඒ ව්‍යාපාරය දියුණු කර ගන්න ණය ලබා දෙන ක්‍රමයක් දැනට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ලාක්ෂා කර්මාන්තය විතරක් නොවෙයි පිත්තල කර්මාන්තය වැනි බොහෝ කර්මාන්තවල තත්ත්වයත් එහෙමයි.

අලුත් කර්මාන්තවලට හෝ අලුත් නිෂ්පාදනවලට ණය ලබා දීමේ එවැනි ක්‍රමයක් තිබෙනවා. ඒ නිසා සාම්ප්‍රදායික නිෂ්පාදන ආරක්ෂා කරගැනීමේ පරමාර්ථයෙන්, සහන පොලිය සහ දීර්ඝ කාලීනව යළි අය කර ගැනීමේ පදනම කියන සාධක දෙක සලකමින් එවැනි ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තිබෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එවැනි සාම්ප්‍රදායික කර්මාන්තවලට ණය දෙන ක්‍රමයක් අපේ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වනවා. අපි එතුමාටත් ඒ ප්‍රශ්නය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා.

පොල්පිතිගම, ඉරුදෙනියාය ජනපදය: ජනපදවාසීන්ට ඉඩම් පැවරීම
பொல்பித்திகம, இருதெனியாய குடியேற்றம்: வதிவாளர்களுக்குக் காணிகளை மாற்றுதல்
IRUDENIYAYA, POLPITHIGAMA COLONY: TRANSFER OF LAND TO SETTLERS

808/'16

2. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දැනට පවුල් 1,500කට වඩා වැඩි ප්‍රමාණයක් ජීවත් වන පොල්පිතිගම, ඉරුදෙනියාය ජනපදය 1970 දී රජයේ වගා සංග්‍රාමය යටතේ ජනාවාස ලෙස ආරම්භ වූ බවත්;

(ii) මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ජනපද වාසින්ට නොමැතිවීම හේතුවෙන් ඔවුන් දුෂ්කරතා රැසකට මුහුණ දී ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) ස්ථිර නිවාස, මංමාවත්, පාසල්, සමුපකාර, ප්‍රජාශාලා, විදුලිය සහ සමිති සමාගම් ඇතුළු යටිතල පහසුකම් සහිත රජයේ පරිපාලන කටයුතු සියල්ල සිදු වන මෙම ජනපදයේ ඉඩම්වල අයිතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගත් වර්ෂය කවරේද;

(ii) මෙම දුෂ්කරතා නිසාම ඇතැම් විට වනජීවී නිලධාරීන් සහ ජනපද වාසීන් අතර ගැටුම් පවා නිර්මාණය වන වාතාවරණයක් තුළ මෙම ඉඩම් නිදහස් කිරීමට කටයුතු නොකරන්නේ මන්ද;

(iii) හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් කරුණාරත්න මහතා විසින් 6වන පාර්ලිමේන්තුවේ වනජීවී අමාත්‍යාංශ උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන ලද මෙම ගැටලුවට ලබා දුන් විසඳුම / තීරණය කවරේද;

(iv) එම විසඳුමට / තීරණයට අනුව, මෙම ඉඩම් නිදහස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது 1500 க்கு மேற்பட்ட குடும்பங்கள் வாழும் பொல்பித்திகம, இருதெனியாய குடியேற்றம் 1970ஆம் ஆண்டில் அரசாங்கத்தின் பயிர்செய்கைப் போராட்டத்தின் கீழ் குடியிருப்பாக ஆரம்பமானது என்பதையும்;

(ii) மேற்படி காணிகளின் சட்டபூர்வமான உரிமை குடியேற்றவாசிகளுக்கு இல்லாமையின் காரணமாக இவர்கள் பல்வேறு அசௌகரியங்களை எதிர்நோக்கியுள்ளார்கள் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) நிரந்தர வீடுகள், வீதிகள், பாடசாலைகள், கூட்டுறவு சங்கங்கள், சனசமூக மண்டபங்கள்,

[ගරු බිමල් රත්නායක මහතා]

மின்சாரம், சங்கங்கள், நிறுவனங்கள் உள்ளிட்ட உட்கட்டமைப்பு வசதிகளைக் கொண்ட அரசாங்க நிருவாக நடவடிக்கைகள் அனைத்தும் மேற்கொள்ளப்படுகின்ற இந்தக் குடியேற்றத்தின் காணிகளின் உரிமை வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்திற்கு பொறுப்பளிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(ii) மேற்படி அசௌகரியங்கள் காரணமாக சிலவேளை வனசீவராசிகள் பாதுகாப்பு அலுவலர்களுக்கும் குடியிருப்பாளர்களுக்கும் இடையே மோதல்கள்கூட உருவாகின்ற சூழலில் இந்தக் காணிகளை விடுவிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படாமைக்கான காரணம் யாது என்பதையும்;

(iii) முன்னாள் பாராளுமன்ற உறுப்பினர் திரு. நாமல் கருணாரத்னவினால் 6ஆவது பாராளுமன்றத்தின் வனசீவராசிகள் அமைச்சின் ஆலோசனைக் குழுவுக்கு சமர்ப்பிக்கப்பட்ட மேற்படி பிரச்சினைக்கு வழங்கப்பட்ட தீர்வு/ தீர்மானம் யாது என்பதையும்;

(iv) மேற்படி தீர்வு/தீர்மானத்திற்கு அமைய, இக்காணிகளை விடுவிக்க நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife:

(a) Will he accept that -

(i) the Irudeniyaya Colony in Polpithigama, where over one thousand five hundred families live at present, commenced settlement in the 1970s under the government's cultivation drive; and

(ii) the settlers have faced with many difficulties as they do not have legal title to the lands they possess?

(b) Will he inform this House-

(i) in which year the title of lands was vested in the Wild Life Conservation Department in respect of this settlement, in which all the infrastructure including permanent houses, roads, schools, cooperative shops, community centres, electricity and societies are present and all the government's administrative activities are carried out;

(ii) why steps are not taken to release these lands in a backdrop where even clashes occur between officers of the Wild Life Conservation Department and the settlers due to the difficulties referred to above;

(iii) what resolution / decision was given to this problem, which was presented before the Consultative Committee on Wild Life of the Sixth Parliament by former Member of Parliament Mr. Namal Karunarathna; and

(iv) whether steps will be taken to release these lands according to such resolution/ decision?

(c) If not, why?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඉරුදෙනියාය ජනපදය ආරම්භ වූ කාල සීමා සම්බන්ධ වාර්තා අප සතුව නොමැත. ඒ කියන්නේ, වනජීවී අමාත්‍යාංශයේ නැති බවයි. නමුත් ඉතිහාසයේ, මා ප්‍රධාන ඇමති විධියට සිටි කාලයේ එයට අත දුන් කෙනෙක්. ඒ ඉතිහාස විස්තර මම දෙන්නම්.

(ii) ඔව්.

(ආ) (i) කහල්ල පල්ලෙකැලේ වනජීවී අභයභූමිය 1989 ජූලි 11 දින අංක 566/5 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

ගරු මන්ත්‍රීතුමනි, කහල්ල පල්ලෙකැලේ ගැන ඔබතුමාත් දන්නවා. මේ ගරු සභාවේ සිටින අපේ අමරසේන මන්ත්‍රීතුමාත් ඒ ප්‍රදේශයෙන් පත් වූ කෙනෙක්. ගලේවෙල ඉඳලා කලාවැව දක්වා අපට තිබෙන එකම කන්ද එයයි. මා ප්‍රධාන ඇමති කාලයේ, දිසා ඇමති කාලයේ අක්කර 60,000ක්ව තිබූ එම කන්ද අක්කර 20,000 දක්වා අඩු වෙලා තිබෙනවා. මිනිස්සු ඒ කන්ද සුද්ද කරලා, බිම් එළි කරලා ඒවායෙහි පදිංචි වෙලා තිබෙනවා. එය තමයි දේශගුණික පෝෂණය ලබා දුන් සම්පත.

මම ප්‍රධාන ඇමති විධියට ඒ වෙලාවේ පරිසර පනතක් ගෙනාවා. ලංකාවේ මහ ආණ්ඩුවේ පරිසර අධිකාරියටවත් ගිහිල්ලා වයඹ පළාතට අතක් ගහන්න බැරි පනතක්, ඒක. ගරු කථානායකතුමාත් ඒක දන්නවා ඇති. මම ඒ පනත ගෙනාවේ මොකද, මම පරිසරයට ආදරය කරන නිසා. ඒ වෙලාවේ මම ප්‍රධාන ඇමති. මම ඒක ගැසට් කළේ අනාගත පරම්පරාව දිහා බලලායි. මහාචාර්ය කොටගම මැතිතුමා තමයි එවකට අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සිටියේ. අක්කර 60,000ක ප්‍රමාණය අක්කර 18,026ට අඩු වුණු නිසා තමයි මම එම ප්‍රදේශය තහනම් කරලා, වනජීවී භූමියක් විධියට; රක්ෂිතයක් විධියට ගැසට් කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ගත් වර්ෂයයි අහන්නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔව්, උත්තරය තිබෙනවා. මම ඉතින් පොඩ්ඩක් විස්තර කර දෙන්න එපා යැ.

(ආ) (ii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2002.02.22 දිනැතිව කුරුණෑගල පළාත් ඉඩම් කොමසාරිස් වෙත, අභයභූමිය තුළ පිහිටා ඇති ඉරුදෙනියාය ව්‍යාපෘතියේ ඉඩම් අක්කර 1990ක් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව නිදහස් කිරීමට අනුමැතිය දීමට තීරණය කර ඇත.

කහල්ල පල්ලෙකැලේ අභයභූමියේ නීතිමය තත්ත්වය එසේම පවතිද්දී ඉරුදෙනියාය උස්බිම් ව්‍යාපෘතිය සඳහා අවසර දීම. උස්බිම් පමණයි. මොකද, එතැන වැවක් තිබෙනවා. ඒක ඔබතුමාත් දන්නවා.

එම ව්‍යාපෘතිය ප්‍රදේශයේ දැනට සංවර්ධනය වී ඇති භූමි ප්‍රදේශය මැනුම් කිරීම.

මැනුම් කර වෙන් කළ සීමාවේ පොළොවෙන් අඩි 02ක් පමණ උස්ව කොන්ක්‍රීට් කණු යෙදීම. ඒ කියන්නේ වතුර මට්ටමින් මෙහා කොන්ක්‍රීට් කණු දමලා මායිම් ලකුණු කරනවා. නැත්නම් ඒ ජලාශය ගොඩවෙලා යනවා. මට වඩා ඔබතුමා දන්නවා ඇති, අවුරුදු 40ක් 50ක් තිස්සේ ඒ ජලාශයේ වතුරවලින් කුඹුරු යාය වගා කරනවා.

කළු ගඟේ වතුර දැන් අපට එනවා. එම නිසා ඒකෙන් මුළු යාපහුවටත්, ගල්ගමුවටත්, වැව් හයසිය ගණනකට වතුර ගෙනියනවා.

සංවර්ධනය වී ඇති ප්‍රදේශයෙන් පිටත කිසිදු ආකාරයකින් වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත උල්ලංඝනය නොවන පරිදි කටයුතු කිරීම.

අභයභූමිය තුළ අභ්‍යන්තර පදිංචිකරුවන් සුදුසු පරිදි පදිංචි කරවීම.

කැලෑබිම් හා වනවගා රක්ෂිත බිම් ගොවි පවුල් අතර බෙදා නොදීම.

* ඊට අමතරව කුරුණෑගල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකගේ සභාපතිත්වයෙන් හා අදාළ ආයතන 09ක සභාගිත්වයෙන් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව අනුව රජයේ ඉඩම් ප්‍රතිපත්තියට අනුකූලව සහ කමිටු නිර්දේශවලට අනුව මෙම ඉඩම් ලබා දීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාව පළකර ඇත.

* තවද, මේ සම්බන්ධව ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2014.06.24 දින -අපේ කාලයේ නොවෙයි - පැවැති රැස්වීමේදී දැනට පදිංචිව සිටින පවුල් 1,231ක් සඳහා අලිමංකඩවල් හැර ඉඩම් ලබා දීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා දී ඇත.

මේ අපේ රජය කාලයේ නොවෙයි.

(ආ) (iii)

කහල්ල - පල්ලේකැලේ අභයභූමියේ නීතිමය තත්ත්වය එසේම පවතිද්දී ඉරුදෙනියාය උස් බිම් ව්‍යාපෘතිය සඳහා අවසර දීම.

එම ව්‍යාපෘතිය ප්‍රදේශයේ දැනට සංවර්ධනය වී ඇති භූමි ප්‍රදේශය මැනුම් කිරීම.

මැනුම් කර වෙන් කළ සීමාවේ පොළොවෙන් අඩි 02ක් පමණ උස්ව කොන්ක්‍රීට් කණු යෙදීම.

සංවර්ධනය වී ඇති ප්‍රදේශයෙන් පිටත කිසිදු ආකාරයකින් වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත උල්ලංඝනය නොවන පරිදි කටයුතු කිරීම;

අභය භූමිය තුළ අභ්‍යන්තර පදිංචිකරුවන් සුදුසු පරිදි පදිංචි කරවීම;

කැලෑ බිම් හා වන වගා රක්ෂිත බිම් ගොවි පවුල් අතර බෙදා නොදීම.

(ආ) (iv) හක්වටුනාව ජලාශයට අලි ඇතුන් පැමිණෙන අලිමංකඩේ පදිංචි පවුල් 17ක් විකල්ප ඉඩම් ලබාගෙන මෙම ස්ථානයෙන් ඉවත් වීම ප්‍රතික්ෂේප කර ඇති අතර, ඒ අනුව මේ වනවිට එම කටයුතු තාවකාලිකව නැවතී ඇත. අදාළ පවුල් 17 විකල්ප ඉඩම් හෝ වන්දි ලබාගෙන අලිමංකඩෙන් ඉවත් වන්නේ නම් මෙම විදුලි වැට කඩිනමින් ඉදිකර ඉඩම් නිදහස් කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් වෙත ආරම්භ කළ හැකි බව කාරුණිකව දන්වමි.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් තවදුරටත් උත්තර දෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය, බැරැරුම් ප්‍රශ්නයක්. ප්‍රධාන ඇමති හැටියට මම ඉරුදෙනියාය ජනපදයට ගිහිල්ලා ඒ අයට අත දුන්නු කෙනෙක්. ඒ අතර කහල්ල පල්ලේකැලේ කියන කන්ද ආරක්ෂා කිරීම වෙනුවෙන් එය ගැසට් කරන්නත් මම කටයුතු කළා. මම අනාගතය බලලා තමයි කටයුතු කරන්නේ. දේශපාලනය ගැන නොවෙයි මම බලන්නේ. මේ පාර්ලිමේන්තුවට අපි පත්වෙලා ඉන්නේ ජනතාව වෙනුවෙන් සේවය කරන්නයි. ගරු කථානායකතුමනි, ඔබතුමාත් එහෙම කෙනෙක් බව මා දන්නවා. තොප්පියක් දාගෙන මනාප ගන්න නොවෙයි අපේ ජීවිත කාලය තුළදී අපි ක්‍රියා කරන්නේ. අපට යම් යම් තීරණ ගන්න තිබෙනවා. තොප්පියක් දාගෙන මනාප ගන්න නොවෙයි අපි කටයුතු කරන්නේ. [බාධා කිරීමක්] තොප්පිය දාගෙන. තොප්පිය වැටෙනවා. නොයෙක් විධියේ තොප්පි වර්ග තිබෙනවා. මම බලන්නේ ගහ කොළ, සතා සිව්පාවා, අනාගතය ගැනයි. [බාධා කිරීමක්] ජයවික්‍රම පෙරේරා කියන නම පළාත් සභාවේ අකුරු කොටලා නැහැ. රජ කාලයේ කරපු දේවල් මුඛ පරම්පරාවෙන් එන දේවල්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුර ලබා දෙන්න. අද හුඟක් කාරණා ගැන කථා කරන්න තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට මේ කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තොප්පිය ගැන කථා කරන්න අපි පස්සේ දවසක් යොදා ගනිමු.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මේ කාරණය සම්බන්ධයෙන් අපි නීතිපතිතුමාගෙන් උපදෙස් ලබාගෙන තිබෙනවා. නීතිපතිතුමා පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙන දේවල් සම්බන්ධයෙනුත් ඕනෑ නම් මට කියන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, යාපහුව ආසනයේ වැව් 600ක් වතුර නැතිව තිබෙනවා. ඒ ප්‍රදේශයේ ජනතාව සමෘද්ධියෙන් ජීවත් වනවා. ඔබතුමා ඒ ගැන දන්නවා. දුගී භාවයෙන් ඔවුන් ජීවත් වනවා. දැදුරු ඔය ජලාශයේ වතුර ගල්ගමුවටත්, නිකවැරටියත් එනවා. අපි මේ

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

ප්‍රදේශයේ තිබෙන වියළි භූමිය තෙත් භූමියක් කරන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්න නම් මේ තිබෙන ජලාශවලට වතුර ගෙනැල්ලා දමන්න ඕනෑ. ජනාධිපතිතුමා නියෝගයක් දීලා තිබෙනවා, වනජීවී භූමිය තුළ තිබෙන වැව් හදන එක මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට බාර දෙන්න. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ඒ වැව් පාලනය වෙන්න ඕනෑ. නැත්නම් අනාගතයේ වනජීවී දෙපාර්තමේන්තුවයි, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයයි, - ඒ වැව් දෙක හැදීමේ කටයුතු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට බාර දෙන්න මම එකඟ වුණා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒ වැව් දෙක හැදීමේ කටයුතු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට බාර දෙන්න ඔබතුමා එකඟ වුණාද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
මහවැලියෙන් ජලය නොකඩවා එනවා.

ගරු කථානායකතුමනි, ඒ එනවා වාගේ අපි මේ රාජධානි හදාගෙන නොවෙයි-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, අපි අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාවක් දෙමු නේද, ගරු ඇමතිතුමනි?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
අවස්ථාවක් දෙනවා. ඔබතුමා අවස්ථාව දුන්නාට පස්සේ මම අහන්න අවස්ථාව දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, එහෙම නම් ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්න අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, අවස්ථා දෙකකදී ඔබතුමා පැහැදිලි කළා, 2014 ජුනි මාසයේදී අක්කර 1,990ක් -මම හිතන විධියට පවුල් 1,231ට අයිති ප්‍රමාණය වෙන්න ඕනෑ. ඒක පැහැදිලි නැහැ.- ඒ නීති, අණපනත් ආරක්ෂා වන පරිදි ඒ උස් බිම් ප්‍රදේශයේ ජනතාවට ඉඩම් ලබා දෙන්න ඉඩම් අමාත්‍යාංශයත්, ඔබතුමාගේ අමාත්‍යාංශයත් -ඔබතුමාට කලින් සිටි ඇමතිවරුන්ගේ සිට- එකඟතාව පළ කරලා තිබෙනවා කියලා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, තවම නිදහස් කරලා නොමැති වීමයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මගේ ප්‍රශ්නය වන්නේ ඒවා නිදහස් කරන්නේ කවදාද කියන එකයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, සමීක්ෂණයට අනුව පැහැදිලිවම පවුල් 13යි ඒ භූමියට අයත් ප්‍රදේශයේ ජීවත් වෙන්නේ; අලිමංකඩවල. වෙන ප්‍රශ්නයක් නොවෙයි. [බාධා කිරීමක්] ඉන්න කෝ, මම කියනකල්. ඒ 13 ගැන තමයි ඔය තර්ක කරන්නේ, උද්ඝෝෂණ කරන්නේ. ඊයේ පෙරේදා දවසක රාත්‍රී මට කථා කළා, අලි ඇවිල්ලා අලි ගෙවල් කඩනවා කියලා. මට කථා කළාම මම අපේ නිලධාරීන්ට කථා කරලා කිව්වා. අලිමංකඩ වහලා අපේ ගරු මන්ත්‍රීතුමෙකුගේ ගෙයකටත් වල් අලි ගිහිල්ලා තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ. මම කියන්න ඕනෑ නැහැ නේ. මම කිව්වා නේ. ඒ නිසා ඒ පවුල් 13 යන්න ඕනෑ. අපි නීතිමය පියවර ගන්නවා. මම නොවෙයි, මහවැලිය, වාරි මාර්ග අමාත්‍යාංශය, මගේ අමාත්‍යාංශය - ගරු කථානායකතුමනි, මීට ඉස්සර වෙලාත් මම කිව්වා, අපි ඔක්කෝම සමීක්ෂණ කරලා තිබෙනවා. ඒ ගෙවල්වල වටිනාකම අනුව වන්දි දෙනවා; ඉඩම් දෙනවා. දෙල් ගහට, කොස් ගහට, පොල් ගහට, පුවක් ගහට වාගේම අමුඩයටත් අපි වන්දි ගෙවනවා.

ඔක්කෝම ගෙවනවා නම්, ඒ අයට වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් දෙනවා නම්, පවුල් 13ක් ගැන කථා කරලා, අපට ගල්ගමුව ආසනයේ ඉන්න පවුල් 20,000කට විපතක් වෙන්න දෙන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, පවුල් 13ක ප්‍රශ්නය බලපාන්නේ අලිමංකඩ විවෘත කිරීමට හෝ නොකිරීමට පමණයි. ඔබතුමාගේ වාර්තා අනුව ඔබතුමාම පිළිගත්තා, මේ ප්‍රශ්නය තිබෙන්නේ පවුල් 1,230 ගණනකටයි කියලා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා ඇහුම් කන් දෙන්න කෝ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමා, පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න කෝ. ඔබතුමාට mike එක නැහැ. පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න කෝ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්නය අහන්න. ඊට පස්සේ පිළිතුරු දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මම ලියලා තිබෙන්නේ පවුල් 1,500යි කියලා. නමුත් ඔබතුමා පිළිගත්තා, පවුල් 1,230 ගණනක් කියලා. ඒ අයගේ ඉඩම් නිදහස් කරනවාද කියන ප්‍රශ්නය තමයි මම අහලා තිබෙන්නේ. අලි වැට ගැන නෙමෙයි මම අහලා තිබෙන්නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මම උත්තර දෙන්නම්. අර පවුල් 13 හැර අනිත් ඔක්කෝටම ඒ අයිතිය දෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කවදාද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒවා ලබාදෙන්න ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා සාකච්ඡා කළා. මම එහාටත් ගියා. ඒ පවුල් 13 එතැනින් යන්න ඕනෑ. ඒ අය ඉවත් කිරීම කරනවා. ඒ අයට ඉඩම් ලබාදීමට ගැසට් කරනවා, කැබිනට් පත්‍රිකාවක් දාලා වන්දි ගෙවනවා. මම ඒ ඔක්කෝම කරනවා. දැනට දිසා ලේකම් එහේ ක්‍රියාත්මක වෙනවා. ඉනින් ඒ කටයුතු කරන කොට අවුරුද්දක් විතර යයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, හොඳයි. දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න. ඇමතිතුමාට කාලය දුන්නා නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කියන්නේ අලි වැට ළඟ පවුල් 13ක් ඉන්නවා, ඒ පවුල් 13 ඉවත් කරනවා කියන එකහතාව මත තමයි ඉතිරි පවුල් 1,200 ගණනට ඔප්පු දෙන්නේ කියලා. ඒ දෙක අතර සම්බන්ධයක් නැහැ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම කිව්වේ නැහැ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒ පවුල් 13 ඉවත් කිරීම කරනවා. අනිත් ප්‍රශ්නයටත් පැහැදිලිවම උත්තරය දුන්නා. [බාධා කිරීමක්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අලියත් තර්ජනය පාලා පැනලා ගෙවල් කඩනවා, බිඳිනවා. දැන් ඔබතුමා කියන්නේ ඒ අය හරියට hostages වාගේ නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒ කම්බි කැඩීම නවත්වන්න අපි මුරකාවල් දාලා, භටයෝ දාලා, අපි ඒවා කරන්නම්. හැබැයි, කම්බිය ගැහුවේ නැත්නම් මොකද වෙන්නේ? ඊයේ-පෙරේදා රාත්‍රියේ ගරු මන්ත්‍රීතුමෙකුගේ ගේ ළඟටම අලි ගිහිල්ලා තිබෙනවා. මට මිනිස්සු කියනවා, "සර්, අලි එළවන්න අනෙක් කට්ටිය බොහොම හිටියා"ය කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අද අපට කටයුතු ගොඩාක් තිබෙනවා. ඒකයි අපි කියන්නේ, අනෙක් අයට බාධා වෙන - [බාධා කිරීම්] ඊට පසුව කථා කරනකොට, සාකච්ඡාවට ගන්න. හොඳයි. [බාධා කිරීම්] ගරු ඇමතිතුමනි, ඉදිරියේදී සාකච්ඡාවට ගන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඒක නීත්‍යානුකූලව කරන්න ඕනෑ වැඩක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ දිස්ත්‍රික් සම්මේලනයේදී කථා කරගෙන විසඳා ගත්තා නම් හොඳයි. [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ පවුල් දහතුනේ ප්‍රශ්නය මත පදනම්ව ඇතත්, නැතත් මේ අයට - [බාධා කිරීම්]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔබතුමා පිළිගන්නවාද? ඒ පවුල් 13 ඉවත් කිරීමට එකඟ වෙනවාද? [බාධා කිරීම්]

පුද්ගලික බස්රථ සඳහා ලබා දුන් මාර්ග බලපත්‍ර: ඌව පළාත
தனியார் பேருந்துகளுக்கு வழங்கிய வீதி அனுமதிப்பத்திரங்கள்: ஊவா மாகாணம்
ROUTE PERMITS GIVEN FOR PRIVATE BUSES: UVA PROVINCE

1124/'16

4. ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) වත්මන් යහපාලන ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු ඌව පළාත තුළ පුද්ගලික බස්රථ සඳහා මාර්ග බලපත්‍ර ලබා දී තිබේද;
(ii) එසේ නම්, එලෙස මාර්ග බලපත්‍ර ලබා දී ඇති මාර්ග කවරේද;
(iii) එසේ මාර්ග බලපත්‍ර ලබා ගත් පුද්ගලයන්ගේ නම් කවරේද;
(iv) ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;
යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) தற்போதைய நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் ஊவா மாகாணத்தில் தனியார் பேருந்துகளுக்காக வீதி அனுமதிப்பத்திரங்கள் வழங்கப்பட்டுள்ளனவா;

[ගරු වමින්ද විජේසිරි මහතා]

(ii) ඇමෙනිල්, අව්විතමාක වීති අනුමතිප් පත්තිරங්කள් වழங්කப්பட்டுள்ள வீதிகள் யாவை;

(iii) அவ்விதமாக வீதி அனுமதிப்பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஆட்களின் பெயர்கள் யாவை;

(iv) அதற்காகக் கடைப்பிடித்த முறையியல்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) whether route permits have been issued for private buses within the Uva Province after the present Good Governance Government came to power;

(ii) if so, for what routes such route permits have been issued;

(iii) of the names of persons who have obtained route permits in that manner; and

(iv) what criteria were followed for this purpose?

(b) If not, why?

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) සහ (iii)`සඳහා පිළිතුර **සභාගත*** කරමි.

(iv) උඹව පළාත තුළ වාසය කරනු ලබන මගී ජනතාව හා අනෙකුත් සමිති සමාගම් මඟින් කරන ලද ඉල්ලීම් පළාත් ප්‍රවාහන ගරු අමාත්‍යතුමා විසින් උඹව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිතුමාට යොමු කිරීමෙන් අනතුරුව නව බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදයට අනුව සාමාන්‍ය සේවා හා සුඛෝපභෝගී සේවා නව මාර්ග බලපත්‍ර ලබා දී ඇත.

නව බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය ඇමුණුමෙහි දක්වා ඇත. පාසල් ළමුන් හා දෙමව්පියන්ගේ ඉල්ලීම් අනුව විදුහල්පතිවරුන්ගේ නිර්දේශය මත පාසල් ළමුන් පමණක් ප්‍රවාහනය කිරීමට සිසුසැරිය ලෙස නව මාර්ග බලපත්‍ර ලබාදී ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම **සභාගත**** කරමි.

** * පුස්තකාලයේ තබා ඇත.*
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

**** සභාමේසය මත තබන ලද (ii) සහ (iii)හි පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட (ii) மற்றும் (iii)க்கான விடை :*
** Answer tabled:*

නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සාමාන්‍ය සේවා

අනු අංකය	මාර්ගය	හිමිකරුගේ නම
01.	සෙවනගල - කිරිඉබ්බන්වැව -	ඒ.ඒ.වමින්ද අරුණ කුමාර
02.	නමුණුකුල - පස්සර - බිබිලේගම	ටී.ඩබ්ලිව්.කේ. උපුල්
03.	මහියංගණ - 17 කණුව -	එන්.ඩබ්ලිව්.එන්.එස්.
04.	රොකතැන්න - හාලිඇල - බදුල්ල	ආර්.එම්. ඉමිටියාස් මහතා
05.	කෙරදිමුල්ල - නැදුන්ගමුව -	බී.ඩී. අබේසිංහ මහතා
06.	පතනවත්ත - කන්දෙගෙදර -	කේ.ඩී. තුෂාර සංජීව මහතා
07.	කැලිපනාවෙල - වැල්ලවාය	ආර්.එම්. නලින්ද ධම්මික
08.	කහගොල්ල අරාව -කන්දකැටිය -	ජේ.එම්. දිනේෂ් ජයසුන්දර
09.	බණ්ඩාරවෙල - ඉනිකම්බැද්ද -	එච්.එම්. බණ්ඩාර මහතා
10.	මහියංගණ - මොරයාය -	ජී.වී. සුගත් පද්මසිරි මහතා
11.	බණ්ඩාරවෙල - දියතලාව -	කේ. චාමික ප්‍රදීප් සිල්වා
12.	බණ්ඩාරඑළියවත්ත - ගල්කන්ද හන්දිය - නායබැද්ද හන්දිය - බණ්ඩාරවෙල	ඒ. ජයසංකර් මහතා
13.	පියරපන්දෝව - බණ්ඩාරවෙල	එම්. සංජීව අසංක මහතා
14.	බදුල්ල - කිරිඔරුව -	ඩබ්ලිව්.ජී. කරුණාදාස
15.	සින්නඇලගොල්ල - බදුල්ල	ආර්. එම්. පාලිත මහතා
16.	දොඩම්ගොල්ල - ඉලුක්පැලැස්ස -	ආර්.ඩී. ජයසේන මහතා

නව බලපත්‍ර නිකුත් කිරීම සුඛෝපභෝගී සේවා

අනු අංකය	මාර්ගය	හිමිකරුගේ නම
01.	බදුල්ල - බණ්ඩාරවෙල	ඉන්ද්‍රප්‍රිය දිලීප බලපිටිය
02.	බදුල්ල - බණ්ඩාරවෙල	පී.ඒ. වමින්ද මුණසිංහ
03.	මොණරාගල - බදුල්ල	කේ.පී.ඒ.එස්.කේ.

නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සිසු සැරිය (පාසල් ළමුන් පමණක් ප්‍රවාහන සේවා)

අනු අංකය	මාර්ගය	හිමිකරුගේ නම
01.	ලද්දුම - ගනේතැන්න හරහා වැලිමඩ	ආර්.එම්. දර්ශිකා රත්නායක
02.	නැදුන්ගමුව - වැලිමඩ (සිසු සැරිය සේවා)	එන්.එන්. තිසේරා කරුණාරත්න මහතා
03.	කිතල්ඇල්ල - බණ්ඩාරවෙල - බදුල්ල (සිසු සැරිය සේවා)	ටී.ඩබ්ලිව්.එම්. සුපුන් යසින්ත මහතා
04.	යාලගමුව - වැලිමඩ (සිසු සැරිය සේවා)	ඊ. ඩබ්ලිව්.ඒ.එම්. හරිශ්චන්ද්‍ර ඒකනායක මහතා
05.	මස්පන්න - වැලිමඩ (සිසු සැරිය සේවා)	ආර්. ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්. මානෙල් කුමාර මහතා

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම අප දන්නවා, පළාත් ප්‍රවාහන අමාත්‍යාංශය විසින් මේ බලපත්‍ර ලබාදීලා, ධාවනය වන බස් රථවලින් ලොග් සටහන් සඳහා යම්කිසි ගාස්තුවක් අය කරන බව. අපේ පළාතේ ලොග් සටහන් ගාස්තුව අය කරන්නේ පෞද්ගලික බස් සමාගමක්. ගරු ඇමතිතුමනි, මෙන්න මේ කාරණය ගැන මට ඔබතුමාගෙන් දැනුවත් කිරීමක් කර ගන්න අවශ්‍යයි. රජයට, පළාත් සභාවට හිමි විය යුතු ගාස්තුවක් පෞද්ගලික බස් සමාගමක් එකතු කිරීම දෙස නිහඬව බලා සිටින්න පළාත් සභාවේ අදාළ පුද්ගලයන් කටයුතු කරනවා. මෙය නීත්‍යානුකූල තත්ත්වයක්ද, එසේ නොමැති නම් ඒ පිළිබඳව ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
ඒ සම්බන්ධව තිබෙන නීතිමය තත්ත්වය මට මේ අවස්ථාවේ කියන්න අපහසුයි, ගරු මන්ත්‍රීතුමනි. මම ඒ ගැන සොයා බලා ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නම්. ඒ පිළිබඳව මේ ගරු සභාවත් දැනුවත් කරන්නම්.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අප දන්නවා මේ route permit එක ලබා ගන්න විවිධ උපක්‍රම පාවිච්චි කරන බව. ඉන් එකක් තමයි මධ්‍යම රජය හරහා ප්‍රවාහන අමාත්‍යාංශය හරහා බලපත්‍ර දෙන නිසා ප්‍රධාන නගරයක් හරහා යන්න දෙන්නේ නැහැ. එම නිසා කුඩා නගරයකින් ආරම්භ කරලා, ප්‍රධාන නගරයක් හරහා යන්න තමයි කටයුතු කරන්නේ. මේ ප්‍රශ්නය නිසා තමයි බස් අතර accidents වැඩි වන්නේ. අපි කොළඹ සිට යන 99 බස් රථය ගනිමු. පොඩි අතුරු ගමක නමක් දමලා, 99 route එකේම ධාවනය වන තවත් route permit එකක් දෙනවා. එතකොට ඒ ගමින් එළියට එනකොට අර පාරෙත් එන නිසා තමයි, ක්ෂේත්‍රයේ ඉන්න උදවිය කියන්නේ, නාඩි අල්ලන්න කියන කාරණය.

ඒ නිසා තමයි මේ බස් අර්බුදය සහ මගීන්ට සිදුවෙන අපහසුතාව දිගින් දිගටම සිදු වෙන්නේ. පසුගිය කාලයේ බස් රථයේ කොන්දොස්තරවරයා ගැබිනි මාතාවකට පවා විවිධ විධියට අඩන්තේට්ටම් කළ බව අපි දැක්කා. ඔබතුමා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විධියට, මේ සඳහා මැදිහත් වෙලා බස් අතර තරගයක් ඇති නොවන විධියට කටයුතු කළ හැකි ආකාරයේ වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්ද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
අපි මේ සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාශය සමඟත්, මගී ප්‍රවාහන අධිකාරිය සමඟත් සාකච්ඡා කරලා නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමේ වැඩ පිළිවෙළක් පටන් ගනිමු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාට තුන්වන අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවාද?

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා හැම ප්‍රශ්නයකටම ධනාත්මකව උත්තර දෙන්නේ නැහැ. කලින් ඉඳලත් එහෙමයි. දැන් මෙම ප්‍රශ්නයටත් පිළිතුරු ලබා දෙයිද කියලා මම දන්නේ නැහැ. මම යෝජනා කරන්න හදන්නේ,-

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
ඔබතුමාගේ ගට්ටනය තිබෙන්නේ පළාත් සභාවත් එක්ක. ඔබතුමා යොමු කරපු ප්‍රශ්නයට මම උත්තරයක් දුන්නා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ, ඔබතුමා වගකිවයුතු ඇමතිවරයෙක් විධියට,-

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
මම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වුණත් මට ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රශ්නයක් යොමු කළා නම්, ඒ සම්බන්ධයෙන් මට සොයා බලා තීන්දු-තීරණ ගත යුතු වෙනවා. ඔබතුමා අහන සෑම ප්‍රශ්නවලටම මට ඔබතුමා කියන විධියට උත්තර දෙන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් ඔබතුමා කියන්නේ සාකච්ඡා කර කියනවා කියලා නේ?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පයිසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, පළාත් සභාව වෙනුවෙන් යොමු කරන ප්‍රශ්නවලට මම සොයා බලා උත්තර දෙන්න ඕනෑ. අතුරු ප්‍රශ්න අහනවිට මම ධනාත්මකව උත්තර දෙන්නේ නැහැ කියලා මෙතුමා මට චෝදනා කරනවා. එතුමා මහ ඇමතිතුමාත් සමඟ තිබෙන ප්‍රශ්නය නිසා, මේ ගරු සභාවේ කාලය නාස්ති කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පළමුවෙනි අතුරු ප්‍රශ්න දෙක බොහොම ලස්සනට ගියා. තුන්වැනි අතුරු ප්‍රශ්නය අසන අවස්ථාවේදී අවුලක් වෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු අමාත්‍යතුමනි, මේ මගේ ප්‍රශ්න අසන කාලය නේ. ඔබතුමා මගේ අයිතිය ගැන කථා කරන්න එපා. ගරු කථානායකතුමා ඒ අයිතිය ගැන කථා කරාවි. ඒ නිසා කරුණාකරලා ඉන්න. ඔබතුමා අද මොකක්ද කරලා තිබෙන්නේ?

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න මට අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම මගේ ප්‍රශ්නයට පිළිතුර නොවෙයි ඉල්ලන්නේ. වගකිව යුතු ඇමැතිවරයෙක් හැටියට, බුද්ධිමත් ඇමැතිවරයෙක් හැටියට ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳවයි විමසන්නේ. මම මෙතුමාට තව යෝජනාවක් කරන්නයි හදන්නේ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member is making a proposal. Let him make the proposal. -[*Interruption.*]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ යෝජනාව මෙසේයි. මේ රටේ තිබෙන කුණු කසළ ප්‍රශ්නය තුළින් තමයි ඩෙංගු ප්‍රශ්නය හට ගන්නේ. පළාතෙන් පළාතට බස් ගමනාගමනය සිදු වෙනවා. හැබැයි, බස්වල ගමන් කරන මගීන් ගෙන යන මේ කුණු කසළ විධිමත්ව බැහැර කිරීමක් කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක කුණු කසළ ප්‍රශ්නයක් නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බස් සම්බන්ධ ප්‍රශ්නයක් ගැන කථා කළ නිසායි අහන්නේ. පළාත් පාලන ආයතනයක හිටපු නියෝජිතයෙක් හැටියට මම දන්නවා, ඒ දවස්වල මගේ නගරයට විශාල බස් සංඛ්‍යාවක් විවිධ පළාත්වලින් ආවා කියලා.

ගරු කථානායකතුමනි, bus standsවලට එන බස්වලින් බහින මගීන්ට කුණු කසළ දැමීමට ස්ථානයක් සකස් කරන්න ඕනෑ. සමහර වේලාවට මගීන් බස් එකේ යන ගමන් කුණු ටික එළියට දමන බව අපි දන්නවා . එහෙම නොවෙන්න වග බලා ගත යුතු වැඩ පිළිවෙළක් හදන්න. අද පළාත් පාලන ආයතන සියල්ල ක්‍රියාත්මක නොවන තත්ත්වයක තිබෙන්නේ. කොමසාරිස්වරු හා ලේකම්තුමන්ලා තමයි ඒවා පාලනය කරන්නේ. එම නිසා මෙතුමාට පළාත් සභා හරහා ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්ද, හදනවාද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. හැබැයි, පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රශ්නය ගැන මෙතුමා කථා කරනවා. ඒක ජනාධිපතිතුමාත් දන්නවා. ඔබතුමන්ලා ඒක විසඳන්න කටයුතු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, please take note of that.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
I will take note of it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, the Hon. Minister has taken note of it.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
This is a waste of valuable time of the House.

වවුනියාවේ කටපහපුරම් ග්‍රාමයේ යළි පදිංචි කළ ජනතාව: මූලික පහසුකම්

வவுனியா, கற்பகபுரம் கிராமத்தில் மீள்குடியமர்த்தப்பட்டோர் : அடிப்படை வசதிகளை

RESETTLED PEOPLE OF KATPAHAPURAM VILLAGE IN VAVUNIYA: BASIC FACILITIES

1164/'16

7. ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-(2)

(අ) (i) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සම්පයිමඩු ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කටපහපුරම් ග්‍රාමයේ ජනතාව 1990 වර්ෂයේදී යුද්ධය හේතුවෙන් අවතැන්වූ බවත්;

(ii) 2009 වර්ෂයේදී එසේ අවතැන්වූවන්ගෙන් පවුල් 130ක්, කිසිදු මූලික පහසුකමක් නොමැතිව නැවත පදිංචි කළ බවත්;

(iii) මෙතෙක් ඔවුන්ට රජයේ සහන හෝ නිවාස යෝජනා ක්‍රමයක් හෝ නොලැබුණු බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ජනතාවට නිවාස යෝජනා ක්‍රමයක් සහ නැවත පදිංචිවූවන් සඳහා අවශ්‍ය අනිකුත් සහනයන් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா பிரதேச செயலாளர் பிரிவில், சம்பைமடு கிராம அலுவலர் பிரிவின் கற்பகபுரம் கிராம மக்கள் 1990ஆம் ஆண்டில் யுத்தம் காரணமாக இடம்பெயர்ந்தனரென்பதையும்;

(ii) 2009ஆம் ஆண்டில் அவ்விதமாக இடம்பெயர்ந்தவர்களில் 130 குடும்பங்கள் எவ்விதமான அடிப்படை வசதிகளுமின்றி மீளக்குடியமர்த்தப்பட்டனர் என்பதையும்;

(iii) இற்றைவரை இவர்களுக்கு அரசாங்க நிவாரணங்களோ வீடமைப்புத் திட்டமோ கிடைக்க வில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இந்த மக்களுக்கு வீடமைப்புத் திட்டமொன்றையும் மீளக்குடியமர்ந்தவர்களுக்கு அவசிய மான ஏனைய நிவாரணங்களையும் வழங்கத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப் படுமா வென்பதையும்;

(ii) ஆமெனில், அவை யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Is he aware that-

(i) the people in Katpahapuram village in Sampaimadu Grama Niladhari Division in Vavuniya Divisional Secretary's Division were displaced in 1990 due to the war;

(ii) out of those families who were displaced, 130 families were resettled in the year 2009, without any basic facilities; and

(iii) they have not received Government relief or Housing scheme yet?

(b) Will he inform this House-

(i) whether necessary action will be taken to provide these people with a housing scheme and other necessary assistance for the persons who have been resettled; and

(ii) if so, what those actions are?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාට හදිසි අවශ්‍යතාවක් හේතුවෙන් අද දින පැමිණෙන්නට නොහැකි බව පවසමින් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන ලෙස මාහට දැනුම් දුන්නා. ගරු කථානායකතුමනි, එතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍යාධාර යටතේ කටිපහපුරම් ගම්මානයට අයත් ප්‍රතිලාභීන් 06 දෙනෙකුට 2016 වර්ෂය තුළ පවුල් ඒකකයකට රුපියල් 100,000ක් බැගින් ජීවනෝපාය ආධාර පහත සඳහන් ආකාරයට දෙන ලදී.

ළිං ඉදිකිරීමට - ප්‍රතිලාභීන් සිව් දෙනෙකුට දීලා තිබෙනවා.

යතුරුපැදි - එක් ප්‍රතිලාභියෙකුට දීලා තිබෙනවා.

කෘෂි උපකරණ - එක් ප්‍රතිලාභියෙකුට දීලා තිබෙනවා

* අප අමාත්‍යාංශය විසින් ප්‍රතිලාභීන් 32කට 2016 වසරේදී මෙම ගම්මානය තුළ වැසිකිළි ඉදිකර දී ඇත.

* අප අමාත්‍යාංශය විසින් 2015 වසරේදී රුපියල් මිලියනයක් වටිනා මාතෘ - ළදරු සෞඛ්‍ය මධ්‍යස්ථානයක් මෙම ගම්මානය තුළ ඉදිකර දී ඇත.

(ආ) (i) ඔව්.

(ii) උතුරු-නැඟෙනහිර පළාත් තුළ පැවැති යුද්ධය හේතුවෙන් විපතට පත් ජනතාව වෙනුවෙන් අප අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ පිළිවෙළ සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරනු ලබන්නේ අමාත්‍යාංශයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකවලට අනුකූලවය.

මෙම නිර්ණායක යටතේ කටිපහපුරම් ගම්මානයේ ජනතාව ප්‍රතිලාභීන් හැටියට තෝරා ගනු ලැබුවහොත් ඔවුන්ට අවශ්‍ය සියලු සහනාධාර ලබාදීමට අප අමාත්‍යාංශය කටයුතු කරනු ඇතැයි ප්‍රකාශ කරමි. අවසන් යුද්ධය පැවැති වකවානුව තුළ මුළුමනින්ම විපතට පත්වූ ගම්මානවලට අප අමාත්‍යාංශයේ සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ ප්‍රමුඛත්වයක් ලබා දෙන බවද පෙන්වා දෙනු කැමැත්තෙමි.

(ඇ) අදාළ නොවේ.

උලපනේ පිහිටි කර්මාන්තපුරය : විස්තර
உலப்பனையிலுள்ள கைத்தொழில்பேட்டை: விபரம்
INDUSTRIAL ZONE IN ULAPANE: DETAILS

1168/'16

8. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) නාවලපිටිය මැතිවරණ බල ප්‍රදේශයට අයත් උලපනේ පිහිටි කර්මාන්තපුරය ආරම්භ කිරීම සඳහා පසු ගිය රජය විසින් වෙන් කළ මුදල කොපමණද;

(ii) එහි කර්මාන්තශාලා කොපමණ සංඛ්‍යාවක් ආරම්භ කර ක්‍රියාත්මක වූයේද;

(iii) මේ වන විට වැසී ගොස් ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත (අ)(i) හි සඳහන් කර්මාන්තපුරය යළි නගා සිටුවීමට නව වැඩ පිළිවෙළක් සකස් කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாவலப்பிட்டி தேர்தல் ஆளுகைப் பிரதேசத்திற்கு சொந்தமான உலப்பனையில் அமைந்துள்ள கைத்தொழில்பேட்டையை ஆரம்பிப்பதற்காக கடந்த அரசாங்கத்தினால் ஒதுக்கப்பட்ட பணத்தொகை யாது என்பதையும்;

(ii) அங்கு எத்தனை தொழிற்சாலைகள் ஆரம்பிக்கப்பட்டு இயங்கிவந்தன என்பதையும்;

(iii) தற்போது மூடப்பட்டுள்ள தொழிற்சாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேலே (அ) (i) இல் குறிப்பிடப்பட்டுள்ள கைத்தொழிற்பேட்டையை மீண்டும் கட்டியெழுப்புவதற்கான புதிய வேலைத் திட்டமொன்று தயார் செய்யப்பட்டுள்ளதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House-

(i) the amount of money that had been allocated by the previous government for the establishment of the industrial zone in Ulapane in Nawalapitiya Electorate;

(ii) the number of factories that were started and run in the aforesaid industrial zone; and

(iii) the number of factories that have been closed down by now?

(b) Will he also inform this House whether a new programme has been prepared to upgrade the industrial zone mentioned in (a) (i) above?

(c) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
Hon. Speaker, I answer the Question.

(a) (i) Rs. 90 million

(ii) Nineteen factories

(iii) Four factories

However, measures are being taken to lease the land blocks allocated to the closed down factories to new industrialists after their project proposals are processed and recommended by the Regional Industrial Service Committee and Ministry's Project Evaluation Committee and thereafter with the approval of the Cabinet Ministers.

(b) Yes.

During the last two years, improvements have been made to infrastructure facilities by constructing drainage systems and by renovating main road about 1000 metres and byroads about 410 metres in length spending Rs. 29 million. Besides, street lampposts have been erected on both sides of the internal roads. It is planned to construct an administration building and install fire extinguishers in the industrial estate in this year. The Department of National Planning has allocated Rs. 20 million for these purposes.

(c) Does not arise.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් විශාල ආයෝජනයක් කරලා තමයි උලපනේ කර්මාන්ත පුරය ආරම්භ කළේ කියලා. ඔබතුමා දැන් උත්තර දුන්නා, එම කර්මාන්ත පුරය ආරම්භ කරන කොට තිබුණු කර්මාන්තශාලා සංඛ්‍යාව සහ මේ වන කොට වැසී ගිහින් තිබෙන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද කියා. ඒ වාගේම අලුතෙන් කර්මාන්ත කිසිවක් ආරම්භ වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, එම කර්මාන්ත පුරයට කරපු ආයෝජනයේ ප්‍රතිඵලයක් නැති නිසා තමයි මම ඔබතුමාගේ අවධානයට මෙම කාරණා යොමු කරන්නේ.

පළමුවැනි කාරණය මම කියන්නම් ගරු ඇමතිතුමනි. උලපනේ කර්මාන්ත පුරයේ විශාල කර්මාන්තශාලා තුනක් තිබුණා. කර්මාන්ත පුරයට එන ආයෝජකයන් විශාල මුදලක් ආයෝජනය කරනවා. එම කර්මාන්තකරුවන් මුදල් ආයෝජනය කරලා, කර්මාන්තශාලා හදනවා. නමුත්, ඒගොල්ලන්ට ආර්ථික ප්‍රශ්නයක් මතු වුණාම ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න කෙනෙක් නැහැ. අපි හිතමු, ඔවුන්ට මූල්‍ය ප්‍රශ්නයක් තිබෙනවා; බැංකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒකට ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා යම් මැදිහත් වීමක් සිදු වනවාද? ඒ වාගේම දැන් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් හදන කර්මාන්ත පුරවල ආයෝජකයන්ට ප්‍රශ්නයක් පැන නැඟුන වෙලාවට ඒවා විසඳීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් කියනවා නම්, අපි කර්මාන්තකරුවන් සියලු දෙනාම එකතු කරගෙන දිසාපතිතුමා යටතේ දිස්ත්‍රික් කමිටුවක් හදලා තිබෙනවා. මාස තුනකට සැරයක් එම කමිටුව රැස් වෙනවා. පළාතකට එක් කෙනෙක් බැගින් පළාත් සභා මහ ඇමතිතුමාගේ recommendations අනුව අපි සභාපතිවරු පත් කරලා තිබෙනවා. ඒක නම් කර තිබෙන්නේ, RIS Committee කියලා. එම කමිටු රැස් වෙලා ප්‍රශ්න විසඳනවා. ඒ අතර මමත්, අපේ කර්මාන්ත පුරවල ඉන්න සියලුම investorsලාත් මාස හයකට සැරයක් හමු වනවා. අපි හමු වෙලා, ඒ අයගේ issues විසඳනවා. අපි area by area ගිහිල්ලා එලෙස කටයුතු කර තිබෙනවා. Last meeting එක අපි කළේ, වෙන්නප්පුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, ඔබතුමා උලපනේ කර්මාන්ත පුරයට එක වතාවක් ඇවිත් තිබුණා. ඔබතුමා දකින්නට ඇති ඒකේ විශාල කර්මාන්තශාලා තිබෙනවා. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔය කියන යාන්ත්‍රණය සිද්ධ වෙන්නේ නැහැ. ඔබතුමා කිව්වා, ආයෝජකයන්ට මතු වන ප්‍රශ්න ගැන හොයලා බලන්න දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සහ පළාතේ මහ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් තිබෙනවා කියලා. ඔබතුමා හොයලා බලන්න, අවුරුදු ගණනකින් එම කමිටුව රැස් වෙලාත් නැහැ; හොයලා බලලාත් නැහැ. ඒ වාගේම ඔබතුමා කිව්වා, මාස හයකට

සැරයක් එම ආයෝජකයන් සමඟ ඔබතුමා කථා කරනවා කියලා. එම කර්මාන්තකරුවන්ව මම හමු වුණා, ගරු ඇමතිතුමනි. මම කියන්නේ කුමන ආණ්ඩුවකින් හෝ කර්මාන්ත-

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

මම අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ එම කර්මාන්තකරුවන් හමු වෙලා, එතුමන්ලාගේ ඉල්ලීම උඩ ගිය අවුරුද්දේ infrastructureවලින් මිලියන 29ක් වෙන් කරලා ඒ පාර හදලා දුන්නා. ඔවුන්ගේ ඉල්ලීම උඩයි පාර හදලා දුන්නේ. ඔවුන් හම්බවුණේ නැත්නම් ඒක කොහොමද වෙන්නේ? මා එක වරක් එහි ගියා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නය පාර හදන එක ගැනවත්, යටිතල පහසුකම් ගැනවත් නොවෙයි. ඔබතුමන්ලා යටිතල පහසුකම් - infrastructure - දිලා කර්මාන්තපුරයක් හැදුවාට පස්සේ ආයෝජකයන් විශාල මුදලක් ණය අරගෙන ඒ කර්මාන්තශාලා කරගෙන යනවා. හැබැයි මොනයම් හෝ ප්‍රශ්නයක් -මූල්‍යමය ප්‍රශ්නයක් හෝ කම්කරු ප්‍රශ්නයක්- මත ඒ කර්මාන්තශාලාව වැටුණාම ඒවාට මැදිහත් වෙන්න කවුරුවත් නැහැ, ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්] ඔබතුමා කිව්වා නේ, මාස 6කට වරක් හම්බ වෙනවාය කියලා. ඔබතුමා කිව්වා, ඒ ගොල්ලෝ ඇවිල්ලා විවිධ යෝජනා අමාත්‍යාංශයට දුන්නාය කියලා. හැබැයි ඒවාට හරිහැටි විසඳුම් ලැබෙන්නේ නැහැ, ඇමතිතුමනි. ඒ කර්මාන්තශාලා වැසීම නිසා අපේ ප්‍රදේශයේ රැකියා 1,500ක් විතර අහිමි වුණා. එය අපේ ප්‍රදේශයටත් පාඩුවක්; ආයෝජකයන්ටත් පාඩුවක්. එම නිසා මා ඔබතුමාගෙන් පළමුවන සහ අවසාන වශයෙන් එක ප්‍රශ්නයයි අහන්නේ. කර්මාන්තපුර හදනවා වාගේම මේ පිළිබඳව සොයා බලන යම් වැඩ පිළිවෙළක් ඔබතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට ගන්න. දිසාපතිතුමන්ලා, මහ ඇමතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා මේ කටයුත්ත කරන්නේ නැහැ. මෙය ඔබතුමාගේ අමාත්‍යාංශය යටතට ගෙන, ඔබතුමාගේ නායකත්වයෙන් මේ පිළිබඳව සොයා බලන්න කියලා තමයි කියන්නේ. එහෙම නැත්නම් මේ සියලුම කර්මාන්තශාලා වැහෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. Hon. Minister, please give attention to that.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

Okay. We will take action. මා පොඩ්ඩක් පැහැදිලි කරන්න ඕනෑ. ඒ පළාතට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් අපේ Ministry එකේම ඉන්නවා. ඒකයි දැනුත් මට එන්න ප්‍රමාද වුණේ. දැන් Progress Review Meeting එක පවත්වලායි ආවේ. ඔබතුමා කියන විධියට අනිවාර්යයෙන් ඒ සියලුම factory ownersලා ගෙන්වා ඔවුන්ට තිබෙන ප්‍රශ්න විසඳන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ jobs 1,500ක් මේ අවුරුදු දෙක තුළ නැති වුණා කියලාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මෙය අපේ කාලයේත් තිබුණු ප්‍රශ්නයක් ඇමතිතුමනි. අපේ කාලයේත් මා මේ ගැන කථා කළා. මට එයට විසඳුමක් ලබාගන්න බැරි වුණා. මා ඔබතුමාට කියන්නේ, අඩු ගණනේ ඔබතුමන්ලාගේ කාලයේදී හෝ මෙයට මැදිහත් වනවා නම් හොඳයි කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු ඇමතිතුමනි, ඒ ගැන අවධානය යොමු කරන්න.

ලංකා සතොස ආනයනය කළ සහල්: විස්තර
லங்கா சதொச இறக்குமதி செய்த அரிசி : விபரம்
RICE IMPORTED BY LANKA SATHOSA: DETAILS

1170/'16

9. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2014 සැප්තැම්බර් සිට 2015 පෙබරවාරි දක්වා කාලයේදී ලංකා සතොස මඟින් ආනයනය කරනු ලැබූ සහල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iv) ආනයනික සහල් නිෂ්කාශනය කිරීම හා ප්‍රමාද ගාස්තු වෙනුවෙන් ශ්‍රී ලංකා රේගුවට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවනු ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සහල් කිලෝවක ආනයනික මිල සහ විකුණුම් මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඒ අනුව ලංකා සතොසට සිදුවූ අලාභය කවරේද;

(vii) මෙම තොගයෙන් විකුණනු ලැබූ සහල් ප්‍රමාණය කොපමණද;

(viii) නරක් වූ සහල් ප්‍රමාණය සහ සත්ව ආහාර ලෙස සහල් විකිණීමට කැබිනට් අනුමතිය ලැබුණු දිනය කවරේද;

(ix) එසේ විකිණූ සහල් ප්‍රමාණය, කිලෝවක විකුණුම් මිල සහ සිදු වූ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(x) සත්ව ආහාර ලෙස එම නරක් වූ සහල් මිලදී ගත් ආයතනය සහ ප්‍රමාණය කවරේද;

(xi) සහල් ආනයනයේ සිට විකිණීම දක්වා සමස්ත ක්‍රියාවලිය තුළ ලංකා සතොස වියදම් කළ මුදල, ඉපයූ මුදල හා අලාභය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014 செப்ரெம்பர் தொடக்கம் 2015 பெப்ருவரி வரையான காலப்பகுதியில் லங்கா சதொச மூலமாக இறக்குமதி செய்யப்பட்ட அரிசியின் அளவு யாது;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) இதற்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா;

(iii) ஒவ்வொரு நிறுவனமும் சமர்ப்பித்த விலைகள் யாவை;

(iv) இறக்குமதி செய்த அரிசியை விடுவிப்பதற்கு மற்றும் தாமதக் கட்டணங்களுக்காக இலங்கைச் சுங்கத்திற்கும் இலங்கை துறைமுக அதிகாரசபைக்கும் செலுத்தப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

(v) ஒரு கிலோ அரிசியின் இறக்குமதி விலை மற்றும் விற்பனை விலை தனித்தனியாக யாது;

(vi) அதற்கிணங்க லங்கா சதொசவிற்கு நேர்ந்த நட்டம் யாது;

(vii) இந்த தொகையிலிருந்து விற்பனை செய்யப்பட்ட அரிசியின் அளவு யாது;

(viii) பழுதடைந்த அரிசியின் அளவு மற்றும் அரிசியை விலங்குணவாக விற்பனைசெய்ய அமைச்சரவை அங்கீகாரம் கிடைத்த திகதி யாது;

(ix) இவ்விதமாக விற்பனை செய்யப்பட்ட அரிசியின் அளவு, ஒரு கிலோ அரிசியின் விலை மற்றும் நேர்ந்த நட்டம் வெவ்வேறாக யாது;

(x) விலங்குணவாக மேற்படி பழுதடைந்த அரிசியை கொள்வனவு செய்த நிறுவனம் மற்றும் அளவு யாது;

(xi) அரிசி இறக்குமதி தொடக்கம் விற்பனை வரையான ஒட்டுமொத்தச் செயற்பாட்டினுள் லங்கா சதொச செலவிட்ட பணத்தொகை, ஈட்டிய பணத்தொகை மற்றும் நட்டம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House-

(i) the quantity of rice imported by the Lanka Sathosa during the period September, 2014 to February, 2015;

(ii) whether tenders were called for this purpose;

(iii) what amount was quoted by each tenderer;

(iv) the amounts paid to the Sri Lanka Customs and to the Sri Lanka Ports Authority for clearance of imported rice and as demurrage, separately;

(v) the import price and sale price of rice, separately;

(vi) what loss was caused to the Lanka Sathosa accordingly;

(vii) what quantity of rice was sold out of this consignment;

(viii) what quantity of rice spoiled and the date on which Cabinet approval was granted to sell it as animal food;

(ix) the quantity that was sold thus, the sale price per kilogram and the loss caused, separately;

(x) what firm purchased the spoilt rice and what quantity was so purchased; and

(xi) the amount spent by the Lanka Sathosa during the overall process from the import to the sale, proceeds from the sale and the loss incurred by the Lanka Sathosa?

(b) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
Hon. Speaker, the Answer is as follows:

(a) (i) 257,557 metric tonnes.

(ii) No.

(iii) There were no quotations called through a tender process. However, Letters of Credit were opened based on the Proforma Invoices sent from the General Treasury and the Line Ministry to the former Chairman of Lanka Sathosa Limited. Eight times, the Banks had issued the following Letters of Credit.

Under Letters of Credit

No	LC No	Bank	Supplier	Commodity	Qty (MT)	Price Per MT (USD)
1	24186	People's Bank	United foods Ltd., India	White Raw	50,000	430.00
2	26193	People's Bank	Omvishkar Export, India	Ponni Samba	1,040	455.00
3	64568	Bank of Ceylon	Bangladesh G to G Bangladesh	Nadu	25,000	450.00
4	63537	Bank of Ceylon	ACP Industries Ltd., India	Ponni Samba	48,309	488.00
5	63519	Bank of Ceylon	ACP Industries Ltd., India	Nadu	4,887	408.00
6	63519	Bank of Ceylon	ACP Industries Ltd., India	Ponni Samba	37,705	488.00
7	33283	People's Bank	United Foods Ltd., India	White Raw	30,000	405.00
8	33274	People's Bank	Trident Champer, India	Ponni Samba	31,354	510.00
				Total	228,295	

Hon. Member, they have paid only under DP terms, the details of which are as follows:

Under DP terms (Deferred Payment)

No.	Supplier	Commodity	QTY (MT)	Price per MT (USD)
1	Omvishkar Export Ltd., India	Ponni Samba	1,040	470.00
		Ponni Samba	1,038	440.00
		Nadu	957	435.00
		Ponni Samba	260	485.00
		Nadu	5,380	455.00
		Ponni Samba	1,066	535.00
		Ponni Samba	2,392	520.00
		Nadu	52	420.00
2	Shamila Spices Ltd., India	Nadu	517	440.00
		Nadu	1,087	455.00
		Nadu	988	460.00
		Nadu	3,292	435.00
		Ponni Samba	1,878	520.00
3	Mohan Sundaram Ltd., India	Ponni Samba	520	522.00
4	Uma Export Ltd., India	Ponni Samba	1,560	520.00
5	Luxmi Export Ltd., India	Ponni Samba	500	520.00
6	Star Export Ltd., India	Ponni Samba	2,575	520.00
		Nadu	1,000	435.00
		Nadu	1,250	385.00
		Ponni Samba	1,000	535.00
7	Rika Global Ltd., India	Ponni Samba	910	505.00
		Total	**29,262**	
		Grand Total	**257,557**	

(iv) Payments to the Sri Lanka Customs:

Customs Duty paid by the Lanka Sathosa for Customs clearance of the rice stocks: Rs. 132,770,828.72.

Payments to the Sri Lanka Ports Authority:

Payments made to the Sri Lanka Ports Authority for the importation of rice stocks: Rs. 648,450,056.09.

Payments made to the Sri Lanka Ports Authority as demurrages : Rs. 187,621,525.00.

(v)

No	Commodity	Weighted average price of 1Kg of imported Rice	Selling price of 1 Kg of Rice
1	White Raw	64.00	50.00
2	Nadu	64.00	55.00
3	Ponni Samba	75.00	60.00

(vi)

Com-modity	Estimated sales qty (Kg)	Estimated sales Revenue (Rs.)	Estimated cost of sold qty (Rs.)	Losses in-curred (Rs.)
White Raw	73,023,204.00	3,651,160,200.00	4,673,485,056.00	(1,022,324,856.00)
Nadu	35,216,947.00	1,936,932,085.00	2,253,884,608.00	(316,952,523.00)
Ponni Samba	67,967,614.00	4,078,056,840.00	5,097,571,050.00	(1,019,514,210.00)
Total	**176,207,765.00**	**9,666,149,125.00**	**12,024,940,714.00**	**(2,358,791,589.00)**

(vii)

Description	MT
Estimated quantity sold for human consumption	176,876.00
Quantity issued for animal foods	68,282.00
Total quantity sold	**245,158.00**

(viii) Date of Cabinet approval: 16th March, 2016.

Quantity issued as animal feed: 80,680 metric tonnes.

(ix)

Quantity issued for animal food	(Kg) Avg. Cost per Kg	Total cost (Rs.)	Selling price per (Kg)	Sales value (Rs.)	Loss incurred (Rs.)
6,976,796	64	446,514,944.00	38	265,118,248.00	(181,396,696.00)
3,471,683	64	222,187,712.00	38	131,923,954.00	(90, 263,758.00)
57,833,991	75	4,337,549,325.00	38	2,197,691,658.00	(2,139,857,667.00)
68,282,470		5,006,251,981.00		**2,594,733,860.00**	(2,411,518,121.00)

(x)

Name of the Company	Purchased Qty. (Kg)
Ceylon Grain Elevators PLC	30,500,000
Gold Coin Feed Mills	10,500,000
New Hope Lanka Ltd.	2,800,000
Pussalla Meat Producers	12,900,000
Fortune Agro Industries	5,000,000
Super Feed (Pvt.) Ltd.	5,000,000
Tharul Farm	282,470
CIC	1,000,000
LMP Traders	300,000
Total	**68,282,470**

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

(xi)

Description	Rs.
Cost	
Total cost of 257,557 metric tonnes of rice purchased	17,936,808,820.00
Add: Other indirect expenses	1,237,421,575.20
Total cost	**19,174,230,395.20**
Revenue	
Estimated revenue from rice sales for human consumption	9,716,286,625.00
Sales revenue from issue of rice for animal food	2,594,733,860.00
Total sales	**12,311,020,485.00**
Estimated losses incurred	**(6,863,209,910.20)**

Note: The total cost does not include the Finance Cost and the duty waiver payable by the Line Ministries (Ministry of Co-operative and Marketing Development and Ministry of Food Security). For the above calculation, we have considered only the landed cost to the Lanka Sathosa.

(b) Does not arise.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
Hon. Minister, could you repeat the answer for (a) (i)?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
The answer is, 257,557 metric tonnes.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මගේ අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

මේ සහල් තොගය ආනයනය කිරීම සඳහා - ඒ සමස්ත ප්‍රමාණය- කැබිනට් අනුමැතිය ලැබිලා නැහැ. ඇමතිතුමා කියනවා, මෙට්‍රික් ටොන් 257,000ට වැඩි ප්‍රමාණයක් ගැන. නමුත් මා දන්නා හැටියට කැබිනට් අනුමැතිය තිබෙන්නේ මෙට්‍රික් ටොන් 50,000ට. ඒත් මෙට්‍රික් ටොන් 5,000 බැගින් ආනයනය කිරීම සඳහා. කැබිනට් තීන්දුවත් උල්ලංඝනය කරලා මේ ආකාරයට සහල් ආනයනය කිරීම සම්බන්ධයෙන් ඒ අයට එරෙහිව දැනට අමාත්‍යාංශය විසින් නීතිමය ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවාද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ඇත්තටම මේ සම්බන්ධව FCID එක, ජනාධිපති විමර්ශන කොමිසම, Commission to Investigate Allegations of Bribery or Corruption කියන තැන් තුනේම inquiry එකක් යනවා. එදා හිටපු ඉහළ නිලධාරීන් ඔක්කෝම මේ inquiriesවලට ගිහින් ආවා. දැන් ඉන්න ඇමතිවරයා වන මගෙනුත් මේ සම්බන්ධ තොරතුරු ඉල්ලා තිබුණා. මම ගිහිල්ලා ඒ තොරතුරු දීලා ආවා. [බාධා කිරීමක්] මොකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුරු දෙන්න, ගරු ඇමතිතුමා. ගරු ඇමතිතුමා කියන්න. You can reply to that Supplementary Question, Hon. Minister.

ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ නිසා සතොසට තිබුණු අලාභය රුපියල් කෝටි 230ක්. මේක තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ නොවෙයි, 2014 සැප්තැම්බර් මාසයේ ඉඳලාම මතු වෙන ප්‍රශ්නයක්. මේ ගැන විගණකාධිපතිතුමා විශේෂ වාර්තාවකුත් නිකුත් කළා. හැබැයි, දැන් FCID එකේ හෝ CID එකේ හෝ කොහේ හෝ මේ ගැන විභාග වෙනවාය කියමින් වසර තුනකටත් ආසන්න කාලයක් ප්‍රශ්නය ඇද ඇද තිබෙනවා මීසක් ඒ කිසිවෙකුට එරෙහිව ගත්ත ක්‍රියා මාර්ගයක් නැහැ, මේ අලාභය අය කර ගන්නට හෝ දඬුවම් පමුණුවන්නට. ඒ සම්බන්ධයෙන් ඔබතුමා කියන්නේ මොකක්ද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ඒ අදාළ inquiry කරන තැන් අපේ ආයතනයෙන් තොරතුරු ඉල්ලුවාම අපි ඒ තොරතුරු ඔක්කෝම දීලා තිබෙනවා. ඔබතුමා කියන විධියට මේ පාඩුව කරන්න රුපියල් 74කට හාල් ආනයනය කරලා රුපියල් 50ට විකුණලා තිබෙනවා. ඒ වෙලාවේ හැටියට එහෙම විකුණලා තිබෙනවා. අඩුවෙන් විකුණපු නිසා Rs. 2.3 billion පාඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම, විකුණන වෙලාවේදී ඒවා block කරලා තිබුණු නිසා තව පාඩු සිදු වුණා. ඒ inquiry වෙලාවේ ගබඩා වහලා තිබුණු නිසාත් සමහර ඒවා නරක් වුණා. කල් ගිය නිසා එවැනි පාඩු සිදු වුණා. ඒකට අදාළව inquiry එකක් පැවැත්වෙනවා. ඒ සම්බන්ධ තොරතුරු සියල්ලම අදාළ ඇමතිවරයා හැටියට inquiry කරන ස්ථානවලට මම ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, මොකක්ද සිද්ද වුණේ කියලා සියලු විස්තර කැබිනට් මණ්ඩලයට මම ලබා දීලා තිබෙනවා. අපේ Cabinet-appointed Cost of Living Committee එකක් තිබෙනවා. ඒ සභාපතිතුමායි මමයි ඒකටත් මේ තොරතුරු submit කරලා, කැබිනට් මණ්ඩලයටත් දැනුම්දීමක් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ ප්‍රශ්නය අහන්නේ කවුද?

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, රුපියල් මිලියන 2,500ට වැඩි පාඩුවක් මේ හරහා සිදුවී තිබෙනවා. ගරු කථානායකතුමනි,

එතුමා කියපු පරිදිම මෙම සහල් ආනයනය කරන ලද මිලට වඩා අඩුවෙන් විකිණීමත්, ඒ සහල් තොග තැන්පත් කිරීමේදී සිදුවූ විනාශයත් මඟින් තමයි මේ පාඩුව සිදු වෙලා තිබෙන්නේ.

මම ගරු ඇමතිතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. මෙම ආනයනය කරන ලද සහල් කල් ඉකුත් වූවාට පසු, ජනතාවගේ පරිභෝජනය සඳහා සුදුසු නැතැයි කියලා නිර්දේශ කරලා, ඒවා සත්ව ආහාරවලට ලබා දෙන්න කියලා නිර්දේශයක් ලබා දුන්නා. මිනිසුන්ගේ පරිභෝජනයට සුදුසු නැති නිසා ඒවා සත්ව ආහාරවලට ලබා දිය යුතුයි කියලා නිර්දේශයක් ලබා දී තිබියදී, මෙම සහල් යළි මෝල් හිමියන් වෙත ලබා දීලා, ඒවා පිරිසිදු කොට ජනතාවට යළි ලබා දුන් බවට තොරතුරු පසු ගිය දවස්වල වාර්තා වෙලා තිබුණා. ඒ කියන්නේ, සත්ව ආහාරවලට නිකුත් කළ යුතු යැයි නිර්දේශ කරලා තිබුණු සහල් නැවත මෝල් හිමියන් වෙත ලබා දීලා, ඒවා polish කරලා ජනතාවට පරිභෝජනය කරන්න ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳව මාධ්‍යවල වාර්තා කරලා තිබුණා මම දැක්කා. ඒ වාගේම, ඒ පිළිබඳව වැටලීම් කිහිපයකුත් කරලා තිබුණා.

ගරු ඇමතිතුමනි, ජනතාවගේ පරිභෝජනයට සුදුසු නොවන සහල් නැවත වෙළෙඳ පොළට නිකුත් කිරීමක් සිදු වූයේ කෙසේද කියා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

"නුසුදුසු සහල්" කියලා සතොසෙන් වාර්තාව ආවාට පසු නැවත අපි ඒවා මෝල් හිමියන්ට වික්කේ නැහැ. ඒවා poultry farmsවලට තමයි දුන්නේ. එහෙම දුන්නේත් කමිටුවක් පත් කරලායි. ඔබතුමා කියන කාරණය මාධ්‍යයෙන් එක දවසක් පෙන්නුවා. සමුපකාර අංශයෙන් සහල් මෙට්‍රික්ටොන් 3,000ක් ආනයනය කරලා තිබුණා. ඒ ගොල්ලෝ අපේ Cost of Living Committee එකට ඒවා ඉදිරිපත් කළා, "මේවා polish කරලා විකුණන්න ඕනෑ" කියලා. ඊට පස්සේ ඒ ගොල්ලෝ Government Analyst's Department එකෙන් හෝ ඒකට සුදුසු ආයතනයකින් වාර්තාවක් ගත්තා. මම හිතන විධියට, ඒවා consumption එකට සුදුසුයි කියලා වාර්තාව ආවාට පසුව තමයි ඒ සහල් මෙට්‍රික් ටොන් 3,000 මෝල් හිමියන්ට දීලා තිබෙන්නේ. ඒ වෙලාවේ, "මේ වාගේ වැරදි වැඩක් වුණා" කියලා මාධ්‍යයෙන් ප්‍රචාරය වුණා.

අපි ඒ ගැන සොයා බලනකොට දැන ගන්න ලැබුණා, ඒ කටයුතු පිළිවෙළක් අනුව කර තිබෙන බව. Consumer Affairs Authority ඒකත් මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක්. එහි නිලධාරි මහත්වරු ගිහිල්ලා තමයි ඒ වැටලීම් කළේ. Consumption එකට සුදුසු ඒවා කොටසක් -භාගයක්- විකුණුවා. කල් ගිය නිසා ඉතිරි ඒවා විකුණන්න බැරි වුණා. ඒවා consumption එකට දෙන්න බැරි වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඒවා සතොසට ආපු සහල් නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, අපි මේ කථා කරන්නේ අපේ රටේ ජනතාව පරිභෝජනය කරන එහෙම නැත්නම් ආහාරයට ගන්නා ප්‍රධානම ධාන්‍ය වර්ගය වන සහල් පිළිබඳවයි. ගරු කථානායකතුමනි, මේ සහල් කල් ඉකුත් වෙලා ජනතාවගේ පරිභෝජනයට සුදුසු නැහැයි කියලා කුකුළු ව්‍යාපාරය සඳහා ලබා දුන්නාට පසු, ඒවා ඒ ව්‍යාපාර වෙනුවෙන්ම යොදවනවාද කියා සොයා බලන්නත්, ඒවා නැවත වෙළෙඳ පොළට ඒම වැළැක්වීම සඳහාත් තිබෙන ක්‍රමවේදය කුමක්ද? ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රමවේදයක් නැහැ. ගරු කථානායකතුමනි, සිදු වී තිබෙන දේ තමයි සත්ව ආහාර සඳහා නිකුත් කරනවාය කියන සහල් තොග වෙනත් පාරකින් නැවතත් මෝල් හිමියන් වෙත යෑම; නැවත ඒ සහල් polish කරලා වෙළෙඳ පොළට ඇවිල්ලා තිබීම. මේක තමයි සිදු වී තිබෙන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඒ ලබා දුන් සහල් සත්ව ආහාර සඳහාම යෙදවූවාය කියන්න තිබෙන සහතිකය කුමක්ද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

පේරාදෙනියේ තිබෙන ඒ අදාළ ආයතනයෙන් වාර්තාව අරගෙන, ඒ අයගේ registration ඔක්කෝම බලලා තමයි අපි නිකුත් කළේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන විධියට ඒ සහල් ඒ විධියට මෝල් හිමියන්ට හෝ වෙනත් කාටවත් යන්න පුළුවන් විධියට නොවෙයි දුන්නේ. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට මා කිව්වා, කුමන කොම්පැනිවලටද මේවා ලබා දුන්නේ කියලා. Prima, CIC Holdings, Gold Coin වාගේ වැදගත් ආයතනවලට තමයි ඒවා ඔක්කෝම දීලා තිබෙන්නේ. ඒ අය ඒ අවශ්‍ය සියලු සහතික අපට ලබා දීලා මුදල් ගෙවලා ඒවා ගත්තේ. ඊට පසුව Consumer Affairs Authority එක හරහා සොයා බලන්නයි, ඒ කටයුතු monitor කරන්නයි, ඒ සහල් වෙන තැනකට යනවා ද, නැද්ද කියලා බලන්නයි විශේෂ කමිටුවක් පත් කරලා කටයුතු කළා.

1983 වන විට යාපනය නගරයේ පැවැති ව්‍යාපාර: විස්තර

1983இல் யாழ். நகரத்தில் பேணிவந்த தொழில்முயற்சிகள் : விபரம்

BUSINESSES ESTABLISHMENTS IN JAFFNA TOWN BY 1983: DETAILS

1178/'16

10. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -

(2):

(අ) (i) 1983 වර්ෂය වනවිට යාපනය නගරය තුළ පැවති සුළු, මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් දමිළ ව්‍යාපාරිකයන්ට අයත් ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(iii) සිංහල හෝ වෙනත් ජන වර්ගයක පුද්ගලයන්ට අයත් ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(iv) එහි සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 වර්ෂයේ දමිළ සහ සිංහල ව්‍යාපාරිකයන් පවත්වාගෙන ගිය ව්‍යාපාර සියල්ලම මේ වනවිටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) නොඑසේ නම්, එම ව්‍යාපාර පවත්වාගෙන ගිය පුද්ගලයන් හෝ ඒවායේ උරුමකරුවන් හෝ යාපනය දිස්ත්‍රික්කය තුළ මේ වනවිටත් ජීවත්ව සිටින්නේද;

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

(iii) එසේ නම්, එහි සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කෛත්තොழිල් මற්றුම් වාණිප අලුවල්කළ් අමෛච්චරෛක් කේට්ට වින්ා:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் யாழ்ப்பாண நகரத்தில் நிலவிய சிறிய, நடுத்தர மற்றும் பாரிய அளவிலான தொழில்முயற்சிகளின் எண்ணிக்கை யாது;

(ii) அவ்வெண்ணிக்கையில் தமிழ் தொழில் முயற்சியாளர்களுக்கு சொந்தமான தொழில் முயற்சிகளின் எண்ணிக்கை யாது;

(iii) சிங்கள அல்லது வேறு இனப்பிரிவைச் சேர்ந்த ஆட்களுக்குச் சொந்தமான தொழில்முயற்சிகளின் எண்ணிக்கை யாது;

(iv) அதன் முழுமையான அறிக்கையொன்றினைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 1983ஆம் ஆண்டில் தமிழ் மற்றும் சிங்கள தொழில்முயற்சியாளர்கள் பேணிவந்த தொழில்முயற்சிகள் அனைத்தும் இன்றளவிலும் இயங்கிவருகின்றனவா;

(ii) இன்றேல் அத்தொழில்முயற்சிகளை பேணிவந்த ஆட்கள் அல்லது அவற்றின் பின்னுரித்தாளிகள் யாழ்ப்பாண மாவட்டத்தில் தற்போதும் வசித்து வருகிறார்களா;

(iii) ஆமெனில், அதன் முழுமையான அறிக்கையொன்றினை இச்சபைக்கு சமர்ப்பிப்பாரா ;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House-

(i) the number of small, medium and large-scale businesses that were in existence within the Jaffna town by 1983;

(ii) how many of them were belonged to Tamil businessmen;

(iii) how many were belonged to persons of Sinhalese or some other race; and

(iv) whether he will table a full report in this regard?

(b) Will he also inform this House-

(i) whether the businesses that had been run by Tamil and Sinhalese businessman in the year 1983 still continue;

(ii) if not, whether the persons who had been running those businesses or their heirs still live within the Jaffna District; and

(iii) if so, whether he will table a full report in this regard?

(c) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු කථානායකතුමනි, යාපනයේ ඒ දවස්වල දෙමළ, සිංහල, මුස්ලිම් ජනතාවට අයිතිව තිබුණු ව්‍යාපාර ඔක්කෝම ගැනයි තොරතුරු ඉල්ලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මා ඒ තොරතුරු GA කාර්යාලයේත් බැලුවා. අපේ අමාත්‍යාංශයේ හෝ අනෙකුත් අදාළ තැන්වලත් ඒ තොරතුරු කිසිවක් නැහැ. අපේ Department of Census and Statistics එකෙන් ඒ දවස්වල - 1982දී- ගත්ත තොරතුරු අනුව තමයි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු සකස් කරලා තිබෙන්නේ.

The Answer is as follows:

(a) (i) There is no record or information available at the Ministry or offices coming under the purview of the Ministry in regard to the number of small, medium and large-scale business that were in existence within the Jaffna town by 1983. Even District Secretariat, Jaffna does not have any particulars. However, according to the information available at the Department of Census and Statistics, the number of industries existed in the District of Jaffna in the year 1982 were as follows:

	Major Industry Division	Establishments with 5 and more persons engaged		Establishments with less than 5 persons engaged	
		No. of establishments	No. of persons engaged	No. of establishments	No. of persons engaged
01	Mining & Quarrying	21	1.344	-	-
02	Manufacturing	667	10,787	2,433	5,922
03	Manufacture of Food, beverage and tobacco	331	3,743	596	1,637
04	Textile, wearing apparel and leather industries	130	1,924	436	1.010
05	Manufacture of wood and wood products including furniture	73	474	547	1,442
06	Manufacture of paper of products, printing & publishing	25	315	36	87
07	Manufacture of chemical and chemical petroleum, coal, rubber and plastic products	15	740	5	16
08	Manufacture of non-metallic mineral products except products except products of petroleum & coal	7	2,392	34	66
09	Manufacture of fabricated metal products, machinery & equipment	59	935	357	866
10	Other manufacturing industries basic metal industries	27	196	422	798
	Total	1,355	22,868	4,866	11,844

(ii) There is no record available to answer this question.

(iii) There is no record available to answer this question.

(iv) No. A report cannot be tabled as there is no information available to prepare a report in this regard.

(b) (i) There is no information available in this regard, therefore it is not possible to answer this question.

(ii) It is not possible to answer this question due to non-availability of records in this regard.

(iii) A report cannot be tabled as there is no information available in this regard.

(c) Does not arise.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගෙන් මම සරලව ඇහුවේ යාපනය දිස්ත්‍රික්කයේ යුද්ධය ආරම්භ වීමට පෙර දමිළ, සිංහල, මුස්ලිම් හෝ වෙනත් ජන වර්ගවලට අයත් පුද්ගලයන්ට අදාළ ව්‍යාපාර කොතරම් තිබුණේද, එවැනි ව්‍යාපාර යුද්ධයෙන් පසුව නැවත ස්ථානගතවී තිබෙනවාද, ඒ ව්‍යාපාර පවත්වාගෙන ගිය කුමන හෝ ජන වර්ගයකට අයත් පුද්ගලයන් හෝ ඒවායේ වර්තමාන උරුමකරුවන් මේ වන විට යාපනය දිස්ත්‍රික්කය තුළ සිටිනවාද කියන කාරණාවයි. නමුත් එතුමා කියන විධියට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාර්තා නැහැ කියනවා නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

වාර්තා නැහැයි කියන එකයි එතුමා කියන්නේ. ගරු කථානායකතුමනි, නමුත් අපි දන්නවා යාපනය දිස්ත්‍රික්කය කියන්නේ එක පැත්තකින් සිංහල ව්‍යාපාරිකයන් සිටි ප්‍රදේශයක් බව. ඒ වාගේම අනාදිමත් කාලයක සිට දෙමළ ජනතාවගේ මහා ව්‍යාපාර තිබුණු ප්‍රදේශයක්. ගරු ඇමතිතුමා කියන සංඛ්‍යා ලේඛන අනුවත් ඒ බව තහවුරු වෙනවා. ගරු කථානායකතුමනි, මම අහන්නේ යුද්ධය ඉවරවෙලා ගතවුණු කාලය තුළදී කුමන හෝ ආකාරයකින් ඒ ප්‍රදේශවල නැවත පදිංචියට ගිය සිංහල, දෙමළ සහ මුස්ලිම් ව්‍යාපාරිකයන් ඉන්නවා. ගරු ඇමතිතුමනි, මේ වන තුරුත් එම තොරතුරු ඔබතුමාගේ අමාත්‍යාංශයට වාර්තා වෙලා නැත්තේ ඇයි?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය සාධාරණයි. අපේ අගමැතිතුමාගේ උපදෙස් පරිදි Task Force එකක් පත් කරලා පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම අමාත්‍යාංශය යටතේ සිංහල සහ මුස්ලිම් ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු කරගෙන යනවා. ඔබතුමා කියන ආකාරයට නැවත පදිංචි කරන අය අතර ඒ වාගේ අය ඉන්නවා නම්, ඒ අයගෙන් ඉල්ලීමක් තිබෙනවා නම්, අපට ඒ අයට උදව් කරන්න පුළුවන්. Compensation ලබා දීම සඳහා REPPIA ආයතනය තිබෙනවා. ඒ හරහා එම අයට compensation දෙන්නත් පුළුවන්. ඒ වාගේ තොරතුරු වාර්තාගත වෙලා නැති නිසා Department of Census and Statistics එකේ 1982 තොරතුරු තමයි ගත්තේ. එහෙම නැත්නම් අමාත්‍යාංශයෙන් පත්තරයේ notice එකක් දාලා එවැනි පුද්ගලයන් ඉන්නවා නම් ඉදිරිපත් වෙන්න කියලා ඉල්ලීමක් කරන්නට පුළුවන්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

යාපනයේ සිටි සිංහල, දෙමළ හෝ මුස්ලිම් ව්‍යාපාරිකයන් 2009 දී යුද්ධය අවසන් වීමෙන් පසුව ඇති වුණු සාමකාමී වාතාවරණය ඇතුළත රජයේ කුමන හෝ ආයතනයකින් නැවත ව්‍යාපාර කරන්නට ඉල්ලා නැහැයි කියන කාරණාවද ඔබතුමා ඔය තහවුරු කරන්නේ?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

කොහොම වුණත් මැණික් ෆාම් කඳවුරේ ඒ වෙලාවේ සිටි සියලුම දෙමළ අනාථයින් නැවත පදිංචි කළා. ඒ දවස්වල එල්ටීටීඊ සංවිධානය එළවලා දාපු මුස්ලිම් සහ සිංහල ජනතාව නැවත පදිංචි කරන්නට පසුගිය ආණ්ඩුව කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැහැ. මේ ආණ්ඩුවත් ළඟදී තමයි Task Force එකක් පත් කරලා ඒ සඳහා වැඩ පිළිවෙළක් ඇති කරලා තිබෙන්නේ. හරියට පදිංචි වීමක් සිදු වෙලා නැති කොට මිනිස්සු ඇවිල්ලා තමන්ගේ ව්‍යාපාර කරන්නට, කර්මාන්ත කරන්නට ඉල්ලන්නේ නැහැනේ. අද වෙනකම් එහෙම ඉල්ලලා නැහැ. ඒ අයගෙන් ඒ වාගේ ඉල්ලීම් තිබෙනවා නම්, අනිවාර්යයෙන් ඒවා ඉටු කරන්නට කටයුතු කරනවා.

අදාළ අමාත්‍යවරයා හැටියට මා දැනට එහෙම එන අයගෙන් තොරතුරු ලබාගෙන අනාගතයේදී වැඩ පිළිවෙළක් ඇති කරන්නම්.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු අමාත්‍යතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැනට වැඩ පිළිවෙළක් තිබෙනවා නේ.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා අහන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැනට වැඩ පිළිවෙළක් තිබෙනවා. ඔබතුමාත් එයට සහයෝගය දෙන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ඔබතුමාත් දන්නා කවුරු හරි ඉන්නවා නම් අපට ඒ තොරතුරු දෙන්න. අපි අවස්ථාව දෙන්නම්.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මා අහන්නේ මෙයයි. ඔබතුමා පසු ගිය රජයේ පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම අමාත්‍යවරයා හැටියට එම විෂය භාරව වැඩ කටයුතු කරපු අමාත්‍යවරයා නේ?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ඔව්.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව දැනුත් ඒ තොරතුරු ඇති. ඒ කාලය තුළ යාපනය සිංහල මහා විද්‍යාලය එක්ක බැඳුණු, උප්පැන්න තිබුණු, සිංහල ජාතිකයන් හැටියට ඉපදුණු, ඒ ප්‍රදේශයේම පදිංචිවූ සිංහල ව්‍යාපාරිකයන් සිටි බවට තොරතුරු වාර්තා සජිත් ප්‍රේමදාස අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්වරුන් සතුව, දිසාපතිතුමා සතුව තිබෙනවා කියා මම දන්නවා. ගරු අග්‍රාමාත්‍යතුමාත් දැන් මේ ගරු සභාවේ සිටින නිසා මා මෙය වගකීමෙනුයි කියන්නේ. මා වගකීමෙන් කියනවා, දිසාපතිතුමා ළඟ, ප්‍රාදේශීය ලේකම්වරුන් ළඟ ඒ වාර්තා, තොරතුරු තිබෙන බව. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ තොරතුරු සම්ප්‍රේෂණය කර ගන්නේ නැත්තේ ඇයි?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
තමා ළඟ කිසිම document එකක් නැහැ කියා GA මට එවපු ලියුම තිබෙනවා. ඔබතුමා කියනවා තොරතුරු තිබෙනවා කියා. ගරු මන්ත්‍රීතුමා, එහෙම තොරතුරු තිබෙනවා නම් ඔබතුමා ඒවා මට දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන ඔබතුමා සොයා බලන්න, ගරු අමාත්‍යතුමා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මට තොරතුරු දෙන්න පුළුවන්කමක් නැහැ. මම රජයේ නිලධාරියෙක් නොවෙයි නේ. හැබැයි මම දන්නවා ඒ කාලයේ තොරතුරු තිබෙන බව.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
මම නැහැ කියලා කියන්නේ නැහැ. සිංහල මිනිස්සු ජීවත් වුණා; සිංහල පාසල් තිබුණා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
සිංහල ප්‍රශ්නයක් නොවෙයි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
සිංහල මිනිස්සු ජීවත් වුණා; සිංහල මිනිස්සු බෙකරි කළා; කර්මාන්ත කළා. නමුත් තොරතුරු නැහැ. මා ඔබතුමාට කියන්නේ, එවැනි අය පිළිබඳ තොරතුරු ඔබතුමා ළඟ තිබෙනවා නම් මට දෙන්න, මා ඒ අයට උදවු කරන්නම් කියලායි කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමා දැන් කරුණු කිව්වා නේ. ඔබතුමා ඒ ගැන සොයා බලන්න, ගරු අමාත්‍යතුමා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
අනිවාර්යයෙන්ම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Take necessary action.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
තොරතුරු නැහැ කියා GA කියන කොට, GA ළඟ තොරතුරු තිබෙනවා කියා ඔබතුමා කියන එක මට පිළිගන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න. ජුනි 18වන දා පත්තරේ සඳහන්ව තිබෙනවා, යුද්ධය කාලයේ යාපනය අත හැර ගිය බේකරිකරුවන් 300දෙනකුගේ උද්ඝෝෂණයක් පසු ගිය දවසක තිබුණා කියා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාත් දන්නවා ඇති ඒ ගැන. ජුනි 18වන දා -ඉරිදා- පත්තරේ ඒ බව සඳහන්ව තිබෙනවා. ඒ නිසා තමයි මම මේ කාරණාව අහන්නේ. ඒ නිසා ඔබතුමා මේ ගැන සොයා බලන්න. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ජාතික සංහිඳියාව වෙනුවෙන් පෙනී සිටින ආණ්ඩුවක් වන නිසා, ඒ ලේබල් එක තිබෙන නිසා, යාපනය දිස්ත්‍රික්කයේ සහ උතුරු ප්‍රදේශයේ අනෙකුත් දිස්ත්‍රික්කවල යුද්ධය හේතුවෙන් තමන්ගේ ව්‍යාපාර අහිමි වූ දෙමළ හෝ සිංහල හෝ මුස්ලිම් හෝ කුමන හෝ ව්‍යාපාරික පිරිසක් සිටිනවා නම්, ඔවුන්ට ඒවා නැවත ලබා ගන්න කඩිනමින් අවස්ථාව ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. එක් ජන වර්ගයකට අදාළව නොවෙයි, සියලු ජන වර්ගවලට අදාළව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, pay your attention to this. Please, take necessary action.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු කථානායකතුමනි, ඒවා ගැන අනිවාර්යයෙන් සොයා බලා අපි උදවු කරන්නම්. තවත් කාරණයක් කියන්න ඕනෑ. මා නැවත පදිංචි කිරීමේ අමාත්‍යවරයා හැටියට ඒ දවස්වල සිටියා කියමින්

එතුමා මට යම් චෝදනාවක් කළා. එය ඇත්තයි. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් දැන් මේ ගරු සභාවේ සිටිනවා. ඒ දවස්වල පැවැති ආණ්ඩුව policy decisions එකක් ගත්තා සිංහල, මුස්ලිම් ජනතාව පදිංචි කරවන්නේ නැහැ කියලා.

ඒ දවස්වල අවතැන් වූ සහෝදර දෙමළ ජනතාව ලක්ෂ 3ක් ඇවිල්ලා මැණික්ෆාම්වල හිටියා. ආරම්භයේ දී ඒ කට්ටිය පදිංචි කරලා ඉවර වුණාට පසුව දෙවැනි අදියර යටතේ තමයි අවුරුදු 20කට පෙර එළවපු සිංහල හා මුස්ලිම් මිනිස්සු පදිංචි කරවන්න කටයුතු කළේ. පළමුවැනි අදියර යටතේ සියයට 90ක් එම කටයුතු භාරව හිටපු ඇමතිවරයා මමයි. එම කටයුතු පිළිවෙළක් කරලා ඉවර වෙන කොටම ඒ අමාත්‍ය ධුරයෙන් මම අයින් වුණා. ඒ නිසා සිංහල හා මුස්ලිම් මිනිස්සු පදිංචි කරවන්න බැරි වෙන්න හේතුව මම නොවෙයි. ඒ වෙලාවේ හැටියට මැණික්ෆාම් වල සිටි කට්ටිය නැවත පදිංචි කරවන්න කියලා ලෝකයෙන් ලොකු ඉල්ලුමක් තිබුණා. ඒ අනුව තමයි ඒක කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා you gave the explanation.

මේ අවස්ථාවේ දී මම ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, දැනටමත් වෙලාව අපර භාග 2.00 පසු වී තිබෙන බවට. තව ප්‍රශ්න පහක් අහන්න තිබෙනවා. ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න තුනක් තිබෙනවා. අමාත්‍යාංශ නිවේදන තිබෙනවා. ඒ නිසා මේවා ඉක්මනින් ඉවර කරන්න ගරු සභාවේ කාරුණික සහාය බලාපොරොත්තු වෙනවා. නැත්නම් අද දිනට නියමිත විවාදය සඳහා කාලය නැති වෙනවා.

බහුවිධ නිපුණතා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම: ශ්‍රී ලංකා වරාය අධිකාරිය
பல்திறன் பயிலுனர்களை ஆட்சேர்த்தல்: இலங்கைத் துறைமுக அதிகாரசபை
RECRUITMENT OF MULTI-SKILLED TRAINEES: SRI LANKA PORTS AUTHORITY

1321/'16

13. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2014.01.09 සහ 2014.07.01 යන දිනයන්හි අවුරුදු 03ක් සඳහා යැයි පවසමින් 175 දෙනෙකුත්, 2014.11.14 දින, දින නියමයක් නොමැතිව තවත් 14 දෙනෙකු සහ 2016.10.20 දින කාන්තාවන් 02ක් සහ පිරිමින් 03 දෙනෙකුත්, බහුවිධ නිපුණතා අභ්‍යාසලාභීන් ලෙස ශ්‍රීලංකා වරාය අධිකාරියට බඳවා ගනු ලැබුවේද;

(ii) ඔවුන්ට වසරකට අනියම් නිවාඩු 07ක් සහ අසනීප නිවාඩු 14ක හිමිකම ඇති බවත් දැනුම් දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ උපදෙස් අනුව 2015 ජූලි මස වාචික විභාගයක් පැවැත්වූබවත්; එයට 30 දෙනෙකු පෙනී සිටිබවත්, ඔවුන් රැකියා සඳහා සම්මුඛ පරීක්ෂණයටද කැඳවූබවත් පිළිගන්නේද;

(ii) 2016. 06. 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීන්දුව අනුව, සියලු පුරප්පාඩු සම්පූර්ණ කළ යුත්තේ අභ්‍යාසලාභීන්ගෙන් යැයි සඳහන් වුවත්, එසේ නොකර අමාත්‍යවරයා විසින් ආරක්ෂක අංශයට 95ක් ද, පසුව 120ක්ද, ඉන්පසු තවත් 600ක්ද සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා වැඩ සහායක/ලිපිකරු තනතුරු පත්වීම් ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014.01.09 மற்றும் 2014.07.01 ஆகிய திகதிகளில் 03 வருடங்களுக்கு எனக் கூறி 175 பேரும், 2014.11.14ஆம் திகதி காலவரையறையின்றி மேலும் 14 பேரும், 2016.10.20ஆம் திகதி 02 பெண்கள் மற்றும் 03 ஆண்களும், பல்திறன் பயிலுனர்களாக இலங்கை துறைமுக அதிகார சபைக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள் ளார்களா என்பதையும்;

(ii) இவர்கள் ஒரு வருடத்திற்கு 07 அமய லீவு களுக்கும், 14 சுகவீன லீவுகளுக்கும் உரித்துடையவர்களாவர் என அறிவிக்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அமைச்சரின் ஆலோசனையின் பேரில் 2015 யூலை மாதம் வாய்மூலப் பரீட்சையொன்று நடத்தப்பட்டதென்பதையும்; இதில் 30 பேர் பங்கேற்றுள்ளார்கள் என்பதையும்; இவர்கள் தொழில்வாய்ப்புக்கான நேர்முகப்பரீட்சைக்கும் தோற்றுவிக்கப்பட்டுள்ளனர் என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) 2016.06.16ஆம் திகதிய பணிப்பாளர் சபைத் தீர்மானத்திற்கு அமைய, சகல வெற்றிடங்களும் பயிலுனர்களைக்கொண்டே நிரப்பப்பட வேண்டுமெனக் குறிப்பிடப்பட்டுள்ளபோதிலும், அவ்வாறு செய்யாது அமைச்சரினால் பாதுகாப் புப் பிரிவுக்கு 95 பேரும், பின்னர் 120 பேரும் மற்றும் அதன் பின்னர் மேலும் 600 பேரும் நேர்முகப்பரீட்சைக்கு அழைக்கப்பட்டு வேலை உதவியாளர்/எழுதுவினைஞர் பதவி நிய மனங்கள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Shipping:

(a) Will he inform this House -

(i) whether the Sri Lanka Ports Authority recruited 175 individuals on 09.01.2014 and 01.07.2014 for a 3-year period of employment and another 14 individuals on 14.11.2014 without any specific period of employment and 02 women and 03 men on 20.10.2016 as multi-skilled trainees; and

(ii) whether they have been informed that they are entitled for 7 casual leave and 14 medical leave, annually?

(b) Will he also inform this House-

(i) whether he accepts the fact that an oral examination was held in July 2015 on the

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

instructions of the Minister and 30 people appeared in that and they were called for interviews; and

(ii) whether the Minister had called 95 individuals for security division and 120 and 600 individuals for interviews later on and granted them with Work Assistant/ Clerk appointments, in contravention to the director board decision dated 16.06.2016 although the same specifies that all vacancies should be filled with trainees?

(c) If not, why

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා (වරාය හා නාවික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Muthuhettigamage - Deputy Minister of Ports and Shipping Affairs)

ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ප්‍රශ්නය මඟින් විමසා ඇති සියලු තොතුරු සම්පූර්ණයෙන්ම නිවැරදි නොවේ.

එනමුදු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ සේවාස්ථ පුහුණු වැඩසටහනක් සඳහා පහත සඳහන් පරිදි අභ්‍යාසලාභීන් බඳවා ගන්නා ලදී.

කණ්ඩායම	බඳවා ගත් දිනය	අභ්‍යාසලාභීන් සංඛ්‍යාව
පළමු කණ්ඩායම	2014.01.09	84
දෙවන කණ්ඩායම	2014.07.07	40
තෙවන කණ්ඩායම	2014.07.14	65
සිව්වන කණ්ඩායම	2014.10.21	12
පස්වන කණ්ඩායම	2014.11.17	14
	එකතුව	215

(ii) වසරකට අසනීප නිවාඩු 07ක් සහ අනියම් නිවාඩු 14ක හිමිකමක් ඇති බව දන්වා ඇත.

(ආ) (i) 2015 ජූලි මස වාචික විභාගයක් පවත්වා නොමැත.

අභ්‍යාසලාභීන් විසින් ලබාගත් පුහුණුව මත ඉදිරි පියවර ගැනීම සඳහා සියලු අභ්‍යාසලාභීන් හට 2015.06.25 දින ලිඛිත විභාගයක් පවත්වන ලද අතර, ඒ සඳහා අභ්‍යාසලාභීන් තිස්දෙදෙනකු (32) පමණක් සහභාගී වී ඇත.

එම පිරිස යළි විශේෂ පුහුණුවකට යොමු කර ඉන් අනතුරුව සම්මුඛ පරීක්ෂණ පවත්වා 2016.11.01 දින සිට වැඩ සහායක තනතුරට හා 2016.12.02 දින සිට ගිනි භට තනතුරට බඳවා ගන්නා ලදී.

(ii) එදිනට එවැනි අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නැත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කටයුතු කාර්යක්ෂම හා ඵලදායීව පවත්වාගෙන යාමේ අරමුණින් සේවා අවශ්‍යතාව මත පහත සඳහන් තනතුරුවල අනුමත සේවක සංඛ්‍යාව තුළ පැවැති පුරප්පාඩු පිරවීම සඳහා එකී තනතුරුවලට අදාළ බඳවා ගැනීම් පරිපාටීන්ට අනුකූලව බාහිරව බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

අනු අංකය	තනතුර	බඳවා ගත් සංඛ්‍යාව	බඳවා ගත් දිනයන්
01	වැඩ සහායක	498	2015.04.22, 2016.06.26, 2016.11.01, 2017.02.06
02	ගිනි භට	21	2016.12.02
03	කළමනාකරණ සහකාර (ගිණුම්)	31	2015.12.01, 2016.05.06, 2016.09.01, 2017.02.06
04	හෙද කාර්ය සහායක	06	2016.09.01
05	ආරක්ෂක නියාමක	157	2015.06.26, 2016.07.04, 2016.12.02, 2016.12.05, 2016.12.06
06	රියදුරු	25	2017.01.05, 2017.01.09
07	රියදුරු (අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සංචිත රියදුරන් ස්ථිර තනතුරට පත්කිරීම)	63	2016.12.01
08	යතුරු ලිපි සකසන්නා	01	2016.12.02
09	සන්නිවේදන හා මාධ්‍ය සහකාර	01	2016.12.02
10	වීඩියෝ කැමරා ශිල්පී	01	2016.12.02

(ඇ) පැන නොනඟී.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. මේ විධියට බඳවා ගැනීම් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කරලා තිබෙනවා. මේ බඳවා ගැනීම් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් තිබුණාද කියලායි මම අහන්නේ.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
විධිමත් ක්‍රමවේදයක් කියන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

විධිමත් ක්‍රමවේදයක් කියන්නේ දැන්වීම් පළ කරලා, ඉල්ලුම් පත්‍ර කැඳවා, පරීක්ෂණයක් පවත්වා, පරීක්ෂණයේ නිර්ණායක හදලා, ඒ අනුවද මේ බඳවා ගැනීම් කළේ?

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)

මේ බඳවා ගැනීම්වලට එහෙම ක්‍රමයක් නැහැ. ඔබතුමා කථා කරන්නේ 215 ගැනද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අහන්නේ 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මේ කරපු බඳවා ගැනීම් සම්බන්ධයෙන්.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
2015 වර්ෂයේ සැප්තැම්බර් දෙවෙනිදායින් පස්සේ බඳවා ගත් තනතුරුවලට වෙනම ක්‍රමයක් යටතේ බඳවා ගෙන තිබෙන්නේ. ඊට කලින් ලැයිස්තුව වන 215 තව ක්‍රමයක් යටතේ බඳවා ගෙන තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විවිධ තනතුරුවලට විවිධ බඳවා ගැනීම් කළේ විධිමත් ක්‍රමවේදයක් අනුවද? ඒ විධිමත් ක්‍රමවේදය මොකක්ද?

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ක්‍රමවේදයක් අනුව. ඉල්ලුම් පත්‍ර කැඳවා නිසියාකාරව බඳවා ගැනීම් කරලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉල්ලුම් පත්‍ර කැඳෙව්වේ පත්තරයේ දැන්වීමක් පළ කරලාද, වෙනත් යම් ආකාරයකින් මහ ජනයාට දැනුම් දීලාද?

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
පත්තරයේ දැන්වීමක් පළ කර නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක නේ මම අහන්නේ. මෙහෙම බඳවා ගැනීමක් තිබෙනවාය කියලා දන්නේ නැතිව මිනිස්සු ඉල්ලුම් කරන්නේ කොහොමද?

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
අභ්‍යාසලාභීන් හැටියට 215ක් හිටියා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ කාරණය මම පිළිගන්නවා.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ඒ 215 දෙනාටම විභාගයක් පැවැත්වූවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අහන්නේ මේකයි. ඒ අයගෙන් බඳවා ගත් අය බහුවිධ නිපුණතා අභ්‍යාසලාභීන්. ඒගොල්ලන් යම් අභ්‍යාසලාභීන් හැටියට ඉන්න අය. ඒ අයගෙන් බඳවා ගත් එක ගැන නොවෙයි මා අහන්නේ. මහ ජනයාට විධිමත් දැනුම් දීමක් කරලා, ඉල්ලුම් පත්‍ර කැඳවලා, පරීක්ෂණයකට යම් ක්‍රමවේදයක් හදලා, පරීක්ෂණයෙන් ලකුණු දෙන ක්‍රමවේදයක් අනුවද මේ බඳවා ගැනීම් කළේ කියායි මා අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා මුලදීම කිව්වා නේ, එහෙම බඳවා ගැනීමක් කළේ නැහැ කියලා.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ඒ කාරණය සම්බන්ධව සොයා බලා ඔබතුමාට මා උත්තර දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ව්‍යුහාත්මක ලකුණු ක්‍රමයක්; ව්‍යුහාත්මක ප්‍රශ්න ක්‍රමයක්; ව්‍යුහාත්මක සුදුසුකම් ක්‍රමයක්. මහ ජනයාට මේ සම්බන්ධව දැනුම් දීමක් කරලාද මේ බඳවා ගැනීම් කළේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කලිනුත් ඔය ප්‍රශ්නය ඇහුවානේ.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ඒ ගැන සොයා බලා මම කියන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමන්ලා කරපු දේ හරිද?

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
හරි,හරි. ඉතාම නිවැරදියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඉදිරියේදී ඒවා හදා ගනිමු, ගරු මන්ත්‍රීතුමා. දැන් ඒ ගැන කථා කරලා වැඩක් නැහැ නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ කරපු විධිය හරි නම් යහ පාලනයේ ප්‍රතිපත්තිය මේ අනුව ගැළපෙනවාද?

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ගැළපෙනවා, ගැළපෙනවා.

කුරුඳු පුහුණු පාසල් : විස්තර
கறுவா பயிற்சி நிலையங்கள்: விபரம்
CINNAMON TRAINING ACADEMIES: DETAILS

1398/'16

14. **ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2016 අය වැයෙහි අංක 168 යෝජනාව අනුව, කුරුඳු පුහුණු පාසල් ව්‍යාප්ත කිරීම සඳහා වෙන් කළ රුපියල් මිලියන 50ක මුදල වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති කුරුඳු පුහුණු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසැල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(v) 2016 වර්ෂය තුළදී කුරුඳු පුහුණු පාසල් තුළ පුහුණුව ලැබූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව සහ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

ආරම්භක් කෛත්තොළිල් අමෙච්චරෙක් කේට්ට වින්නා:

(அ) (i) 2016 வரவு செலவு திட்டத்தின் 168 ஆம் இலக்க முன்மொழிவின் பிரகாரம், கறுவா பயிற்சி நிலையத்தை விஸ்தரிப்பதற்காக ஒதுக்கப்பட்ட ரூபா 50 மில்லியன் தொகை செலவிடப்பட்ட விதம் பற்றிய செலவு விபரத்தை சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) இன்றேல், ஏன் என்பதையும்:

(iii) இலங்கையில் தாபிக்கப்பட்டுள்ள கறுவா பயிற்சி நிலையங்களின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(iv) மேற்படி நிலையங்கள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(v) 2016 ஆம் ஆண்டில் கறுவா பயிற்சி நிலையங் களில் பயிற்சி பெற்றவர்களின் எண்ணிக்கையும் பெயர்களும் யாவை என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Primary Industries:

(a) Will he inform this House -

(i) whether an expenditure report on the manner in which Rs.50 million allocated for the expansion of the cinnamon training academies as per proposal number 168 of the 2016 Budget Proposals, was spent will be submitted;

(ii) if not, why;

(iii) the number of cinnamon training academies located in Sri Lanka;

(iv) the places where the aforesaid schools are located; and

(v) the number and the names of persons who received training at cinnamon training academies in year 2016?

(b) If not, why?

ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම කුරුඳු පුහුණු පාසැල් සඳහා විවිධ ආයතන මඟින් සහ රජයෙන් රුපියල් මිලියන 50ක් පමණ වියදම් කොට ආරම්භ කොට ඇතත් මේ වන තෙක් සැලකිය යුතු අන්දමින් පුහුණු වීම් කටයුතු සඳහා යෙදවී නොමැත. තවද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් මාතර පලොල්පිටිය කුරුඳු පුහුණු මධ්‍යස්ථානය මඟින්ද නොමිලේ නේවාසික පුහුණු පවත්වාගෙන ගියද ඒ සඳහා සහභාගිත්වයද ප්‍රමාණවත් පරිදි සිදු නොවේ. කොස්ගොඩ පිහිටි මෙම කුරුඳු පුහුණු පාසල් මුදල් අයකර පුහුණුවීම් කටයුතු සැලසුම් කොට ඇතත් නේවාසික පහසුකම් නොමැති වීමෙන් ඒ සඳහා පුහුණුලාභීන් සහභාගි නොවන බව හඳුනා ගත් බව සඳහන් කළ හෙයින් මූලිකව ආසන්නයේ පිහිටි වෙනත් නේවාසික පහසුකම් භාවිතා කර පුහුණු වීම් පවත්වාගෙන යාමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟින්ද සාකච්ඡාවකින් පසු තීරණය කෙරුණි.

කෙසේ වෙතත් කුරුඳු කර්මාන්තයේ විශේෂයෙන්ම කුරුඳු තැලුම්කරුවන් 20,000ක් පමණ සිටින අතර එයින් අර්ධයකටවත් සුදුසුකම් පරීක්ෂාකොට පෙර දැනුම ඇගයීමෙන් සහතික ලබාදීමේ අවශ්‍යතාවක් ඇත. මේ සඳහා දැනටමත් කොස්ගොඩ කුරුඳු පුහුණු පාසල සමඟ ඒකාබද්ධව දෙදින පුහුණු පාඨමාලා සහ ඇගයීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරමින් පවතී. මේ අනුව ඉදිරියේදී අවශ්‍යතාව සහ පුහුණුලාභීන් මෙම පාසල සඳහා යොමු වීම අනුව නේවාසිකාගාර සකස් කිරීමට අද සැලසුම් කර තිබෙනවා.

(ii) අදාළ නොවේ.

(iii) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති පුහුණු පාසල් ගණන එකකි.

එය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය ලෙස හැඳින්වේ.

(iv) මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ, පලොල්පිටිය ප්‍රදේශයේ පිහිටුවා ඇත.

(v) 2016 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන 36කි.

2016 වර්ෂයේ පුහුණුව ලැබූ පුහුණුලාභීන් ගණන 898කි. පුහුණුලාභීන්ගේ නම් ඇතුළත් ලේඛනය **සභාගත*** කරමි.

2016 වර්ෂයේ පුහුණු කරන ලද මිනිස් දින ගණන 1324.5කි.

<u>එක් එක් පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර</u>

යහපත් නිෂ්පාදන පිළිවෙත් යටතේ කුරුඳු සැකසීම - දින 5 පුහුණු වැඩසටහන = 11

යහපත් නිෂ්පාදන පිළිවෙත් යටතේ කුරුඳු සැකසීම - පුහුණු කරන ලද පුහුණුලාභීන් ගණන = 93

යහපත් නිෂ්පාදන පිළිවෙත් යටතේ කුරුඳු සැකසීම - පුහුණු කරන ලද මිනිස් දින ගණන = 453

කුරුඳු කර්මාන්තය පිළිබඳ මූලික දැනුවත් කිරීමේ දින 3 වැඩසටහන් = 01

පුහුණුලාභීන් ගණන = 23

පුහුණු කරන ලද මිනිස් දින ගණන = 69

යහපත් පිළිවෙත් යටතේ කුරුඳු ඉඩම් කළමනාකරණය දින 2 වැඩසටහන් = 09

පුහුණුලාභීන් ගණන = 210 පුහුණු කරන ලද මිනිස් දින ගණන = 371

කුරුඳු කර්මාන්තය පිළිබඳ මූලික දැනුවත් කිරීම - එක් දින වැඩසටහන් = 11

කුරුඳු කර්මාන්තය පිළිබඳ මූලික දැනුවත් කිරීම - පුහුණුලාභීන් ගණන = 291

කුරුඳු කර්මාන්තය පිළිබඳ මූලික දැනුවත් කිරීම - මිනිස් දින ගණන = 291

විශ්වවිද්‍යාල හා පාසල් සිසුන් දැනුවත් කිරීම දින 1/2 වැඩසටහන් = 04

විශ්වවිද්‍යාල හා පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව = 281

විශ්වවිද්‍යාල හා පාසල් සිසුන් දැනුවත් කිරීම - මිනිස් දින ගණන = 140.5

(ආ) අදාළ නොවේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු අමාත්‍යතුමාගෙන් මම පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. 2016 අය වැය කථාවේ 167, 168, 169 යන යෝජනා තුනම තිබෙන්නේ කුරුඳු කර්මාන්තයේ දියුණුව වෙනුවෙනුයි. ඔබතුමා වෙනුවෙන් පිළිතුරු ලබා දෙමින් ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා ඊයේ සඳහන් කළා, මේ වන තෙක් කුරුඳු සංවර්ධන අධිකාරිය පිහිටුවා නැහැ කියලා. තිබෙන කුරුඳු පුහුණු පාසල් ව්‍යාප්ත කිරීම සඳහා තමයි අනෙක් මුදල වෙන් කරලා තිබෙන්නේ. මේ යෝජනා තුනටම වෙන් කරලා තිබෙන මුදල රුපියල් මිලියන 150ක්. මගේ ප්‍රශ්නය වන්නේ ඒ රුපියල් මිලියන 150න් ඔබතුමාගේ අමාත්‍යාංශය ලබා ගත් මුදල කවර ප්‍රමාණයක්ද කියන එකයි.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ඒ මුදල -රුපියල් මිලියන 150- සම්පූර්ණයෙන්ම අපට ලබා ගන්න අවස්ථාව තිබුණා. නමුත් හරි සැලසුමක් නැතුව නිස්කාරණේ මුදල් නාස්ති කරන්න අපට පුළුවන්කමක් නැහැ. ඔබතුමා ඊයේ ප්‍රශ්නයක් අහලා තිබුණා. පුහුණු කිරීම් සඳහා අපි රුපියල් මිලියන 50ක් වියදම් කරලා ඒක හදලා තිබෙනවා. ඒකටත් NGO එකකින් සහ රජයෙන් මුදල් දීලා තිබෙනවා. එතකොට hostel එකක් හදන්න අවශ්‍ය නම් අපට hostel එකක් හදන්න පුළුවන්. ඒක තමයි අපි තීරණය කළේ, ඒ පුහුණු කිරීම් කරන්න. අපි දැනට මුදල් අමාත්‍යාංශයෙන් තීරණයක් අරගෙන තිබෙනවා, කැමැති කට්ටියට ඒක කරන්න දෙන්න. ඒකට අමතරව අද වන විට අපි අවශ්‍යතාව හඳුනා ගෙන තිබෙනවා.

දැන් අපට GSP Plus බදු සහනය හම්බ වෙලා තිබෙනවා. නමුත් දැන් අපට පිට රටට - යුරෝපයට - කුරුඳු අපනයනය කරන්න පුළුවන් කමක් නැහැ. මොකද, ඒ quality එක අපට match කරන්න බැරි වෙලා තිබෙන නිසා. ඔබතුමා අහන ප්‍රශ්නය තමයි, ඒ රුපියල් මිලියන 150ම අපට ලැබුණාද කියන එක. ඒ මුදල්වලින් අපට මේ අවුරුද්දට අවශ්‍ය ප්‍රමාණය ලබා ගන්න පුළුවන්. සාමාන්‍ය දේ තමයි, රජයෙන් අමාත්‍යාංශයකට මුදලක් වෙන් කළොත්, අදාළ අමාත්‍යාංශය මොකක් හෝ දේකට කියලා ඒ මුදල වියදම් කරන්න හදනවා. නමුත්, අපේ අමාත්‍යාංශයෙන් වියදම් කරන මුදල ඇත්තටම රටට ප්‍රයෝජනවත් විධියට, වැඩදායී විධියට වියදම් කරන්න ඕනෑ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට දීර්ඝ වශයෙන් පිළිතුරු දෙන්න අවශ්‍ය ප්‍රශ්නයක් නොවෙයි මම අහන්නේ. මේ ගරු සභාවට ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ වෙන් කරන ලද මුදල්වලින් උපයෝජනයකොට නොගත් ප්‍රමාණය ඔබතුමාගේ අමාත්‍යාංශයට එන්නේ නැහැ. එතකොට ඒ අය වැය ලේඛනයේ සමස්තය ගත්තාම ආදායම්, වියදම් ගළපා තිබෙන ආකාරයේ වියදම ඒ වර්ෂය තුළදී නොවුණාම ඒ ඇස්තමේන්තු එකිනෙකට වෙනස් වෙනවා; පරතර වෙනස් වෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නවලින් සහ උපදේශක කාරක සභාවලදී අපි නිශ්චිත වශයෙන් දැනගන්න හදන්නේ, වෙන් කරන මුදලින් සත්‍ය වශයෙන් එම වර්ෂය තුළදී වියදම් කළේ කොච්චරද කියලා. එතකොට තමයි ඇත්ත අය වැය පරතරය සොයාගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා වෙන් කරන ලද රුපියල් මිලියන 150න් ඔබතුමාට ලැබුණේ කීයද කියලායි මම ඔබතුමාගෙන් අහන්නේ. ඒකට විතරයි මට උත්තර අවශ්‍ය වන්නේ.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ඒක තමයි මම ඉස්සෙල්ලා කිව්වේ. ගිය අවුරුද්දේ අපට හරියට වැඩසටහනක් නොතිබුණු නිසා ඒ මුදල් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. කුරුඳුවලින් ලැබෙන ආදායම රුපියල් බිලියනයක් දක්වා වැඩි කරන්න දැන් අපි බලාපොරොත්තු වෙනවා. මේ අවුරුද්දේ මුදල් අමාත්‍යාංශයෙන් අපට ඒ මුදල් ලබාදෙනවා කියලා පොරොන්දු වෙලා තිබෙනවා. ඒ මුළු මුදලම අපට ලබා ගන්න පුළුවන්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඒ කියන්නේ, එම රුපියල් මිලියන 150න් ඒ වර්ෂය තුළ සතයක්වත් වියදම් වෙලා නැහැ. ඒක මහා භාණ්ඩාගාරයේ ඉතිරියක් ලෙස තිබෙනවා. ඒක හරි. එච්චරයි ඕනෑ. එච්චරයි මට දැනගන්න අවශ්‍ය. බොහොම ස්තුතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

මීළඟට, ප්‍රශ්න අංක 15 -1586/'17- (1), ගරු සන්දිත් සමරසිංහ මහතා.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

උතුරු පළාතේ යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු : විස්තර

வட மாகாணத்திலுள்ள தரைப்படை, கடற்படை மற்றும் விமானப்படை முகாம்கள் : விபரம்

ARMY, NAVY AND AIRFORCE CAMPS IN NORTHERN PROVINCE: DETAILS

1000/'16

3 ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துல குணவர்தன) (மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Udaya Prabhath Gammanpila)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) 2009 මැයි 19 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 ජනවාරි 08 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 සැප්තැම්බර් 30 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக்கேட்ட வினா:

(அ)(i) 2009 மே 19ஆம் திகதியளவில் வட மாகாணத்தில் காணப்பட்ட தரைப்படை, கடற்படை மற்றும் விமானப்படை முகாம்களின் எண்ணிக்கை, இவற்றின் நிலப் பரப்பளவு தனித்தனியே எவ்வளவென்பதையும்;

(ii) 2015 சனவரி 08ஆம் திகதியளவில் வட மாகாணத்தில் காணப்பட்ட தரைப்படை, கடற்படை மற்றும் விமானப்படை முகாம்களின் எண்ணிக்கை, இவற்றின் நிலப் பரப்பளவு தனித்தனியே எவ்வளவென்பதையும்;

(iii) 2016 செப்ரெம்பர் 30ஆம் திகதியளவில் வட மாகாணத்தில் காணப்பட்ட தரைப்படை, கடற்படை மற்றும் விமானப்படை முகாம்களின் எண்ணிக்கை, இவற்றின் நிலப் பரப்பளவு தனித்தனியே எவ்வளவென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of Army, Navy and Air force camps in the Northern Province and their extents of land as at 19th May 2009 separately;

(ii) the number of Army, Navy and Air force camps in the Northern Province and their extents of land as at 08th January 2015 separately; and

(iii) the number of Army, Navy and Air force camps in the Northern Province and their extents of land as at 30th September 2016 separately?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

හමුදාව	කඳවුරු සංඛ්‍යාව	භූමි ප්‍රමාණය (අක්කර)
යුද්ධ හමුදාව	ආරක්ෂක සේනා මූලස්ථාන - 2 සේනාංක මූලස්ථාන - 16 බලසේනා මූලස්ථාන - 57 ඒකක - 197	73,545
නාවික හමුදාව	ප්‍රධාන නාවික කඳවුරු - 12 නාවික අනුබණ්ඩ - 103	5,272
ගුවන් හමුදාව	කඳවුරු - 04	2,835 (මීට අමතරව, පුවරසන්කුලම "විශේෂ මෙහෙයුම් රාශි මූලය" ස්ථාපිත කර තිබූ අතර, එහි භූමි ප්‍රමාණය ගණනය කර නොතිබුණි.)

(ii)

හමුදාව	කඳවුරු සංඛ්‍යාව	භූමි ප්‍රමාණය (අක්කර)
යුද්ධ හමුදාව	ආරක්ෂක සේනා මූලස්ථාන - 4 සේනාංක මූලස්ථාන - 13 බලසේනා මූලස්ථාන - 40 ඒකක - 93	51,722
නාවික හමුදාව	ප්‍රධාන නාවික කඳවුරු - 14 නාවික අනුබණ්ඩ - 180	4,644
ගුවන් හමුදාව	කඳවුරු - 06	10,283

(iii)

හමුදාව	කඳවුරු සංඛ්‍යාව	භූමි ප්‍රමාණය (අක්කර)
යුද්ධ හමුදාව	ආරක්ෂක සේනා මූලස්ථාන - 4 සේනාංක මූලස්ථාන - 13 බලසේනා මූලස්ථාන - 40 ඒකක - 90	24,095
නාවික හමුදාව	ප්‍රධාන නාවික කඳවුරු - 14 නාවික අනුබණ්ඩ - 175	2,832
ගුවන් හමුදාව	කඳවුරු - 06	3,833

(ඇ) පැන නොනඟී.

පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම: ප්‍රතිපත්තිය
முதலாம் தரத்திற்குப் பிள்ளைகளை அனுமதித்தல் : கொள்கை
ADMISSION OF CHILDREN TO GRADE ONE: POLICY

1139/'16

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. S.M. Marikkar)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදී ජාතික පාසල් හා පළාත් පාසල් සඳහා එකම ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, 2016 වර්ෂයේ බස්නාහිර පළාත් සභා පාසල් සඳහා මූලික සම්මුඛ පරීක්ෂණයෙන් ළමුන් ඇතුළත් කර ගැනීමෙන් අනතුරුව, ඉතිරි පුරප්පාඩු (රණවිරු සහ රාජ්‍ය සේවක) සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේදී අනුගමනය කළ ක්‍රියාමාර්ගය කවරේද;

(iii) ඉතිරි පුරප්පාඩු සඳහා ඇතුළත් කර ගැනීමේදී පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා අවස්ථාවන් දෙක බැගින් ලබාදී තිබේද;

(iv) එසේනම්, ඒ සඳහා හේතු කවරේද;

(v) ඉහත (iii) හි සඳහන් ක්‍රමය සාධාරණ නම්, ජාතික පාසල් සඳහාද එම ක්‍රමය අනුගමනය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බස්නාහිර පළාත් සභාව යටතේ ඇති ජනප්‍රිය පාසල් සඳහා පමණක් අතිරේක එක් පන්ති කාමරයක් හා ළමුන් 45ක් ඇතුළත් කර ගැනීමේ බලය තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා තීරණ ගන්නා ආයතනය කවරේද;

(iii) ඒ සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iv) ළමුන් ඇතුළත් කර ගැනීමේදී සෑම බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙකුටම කෝටාවක් (මන්ත්‍රී පංගුවක්) ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முதலாம் தரத்திற்கு பிள்ளைகளை அனுமதிக்கும் போது தேசிய பாடசாலைகள் மற்றும் மாகாண பாடசாலைகளுக்கு ஒரே கொள்கை அமுல்படுத் தப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், 2016ஆம் ஆண்டு மேல் மாகாண சபை பாடசாலைகளுக்கு ஆரம்ப நேர்முகப் பரீட்சையின் மூலம் பிள்ளைகள் அனுமதிக்கப் பட்ட பின்னர் எஞ்சியுள்ள வெற்றிடங்களுக்கு (படைவீரர், அரசாங்க ஊழியர்கள்) பிள்ளை களை அனுமதிக்கின்றபோது பின்பற்றப்பட்ட நடைமுறை யாது என்பதையும்;

(iii) எஞ்சியுள்ள வெற்றிடங்களுக்கு அனுமதிக்கும் போது மாகாண சபை உறுப்பினர்களுக்கு இரண்டு வாய்ப்புக்கள் வீதம் வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேலே (iii) இல் குறிப்பிடப்பட்டுள்ள முறை நியாயமானதாயின், தேசிய பாடசாலைகளுக்கும் குறித்த முறை பின்பற்றப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேல் மாகாண சபையின் கீழ் காணப்படுகின்ற பிரபல்யமான பாடசாலைகளுக்கு மாத்திரம் மேலதிக வகுப்பறை ஒன்றையும் பிள்ளைகள் 45 பேரையும் அனுமதிப்பதற்கான அதிகாரம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பாக தீர்மானங்களை மேற்கொள்ளும் நிறுவனம் யாதென்பதையும்;

(iii) அதற்கு பிள்ளைகளை அனுமதிக்கும் முறைமை யாது என்பதையும்;

(iv) பிள்ளைகளை அனுமதிக்கும்போது மேல் மாகாண சபையின் ஒவ்வொரு உறுப்பின ருக்கும் பங்கீடு (உறுப்பினர் கோட்டா) வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether the same policy is applied when the children are admitted to grade 1 of

[ගරු බුද්ධික පතිරණ මහතා]

National Schools and schools governed by Provincial Councils;

(ii) if so, the course of action that was followed to fill the remaining vacancies (war heroes and public servants) that were left after the children were admitted to the schools coming under the Western Provincial Council through a preliminary interview in 2016;

(iii) whether the Members of the Provincial Council have been given two opportunities when the remaining vacancies are filled;

(iv) if so , the reasons for it; and

(v) if the method mentioned in (iii) above is reasonable, whether the same method is followed with regard to National Schools also?

(b) Will he also inform this House-

(i) whether the popular schools in the Western Province have the authority to have one additional class room and to admit 45 children;

(ii) if so, the institution that takes such decisions;

(iii) the methodology adopted to admit students for that; and

(iv) whether a quota (quota for members) has been granted to each provincial councilor in the Western Province when children are admitted to schools?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2013.05.23 දින නිකුත් කර ඇති 23/2013 චක්‍රලේඛය, ඊට අදාළ සියලුම සංශෝධන හා උපදෙස් 2016 වර්ෂයේදී සියලුම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා බලපවත්වන ලදී.

ඒ අනුව, සියලුම ජාතික පාසල් හා පළාත් පාසල් රජයේ පාසල් ගණයට අයත් වන බැවින්, පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී එකම ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.

(ii) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ බලයලත් නිලධාරීන් විසින් අනුමත කර එවනු ලබන ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි හෝ යෙදී සිටින ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධරයන්ගේ දරුවන්ගේ අනුමත නාම ලේඛනය අනුව ඒ ඒ පාසල් සඳහා පුරප්පාඩු පුරවනු ලැබේ.

රාජ්‍ය සේවක පදනමින් සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයක් නොමැත.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(v) පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා අවස්ථාවන් දෙක බැගින් ලබාදීමේ ක්‍රමවේදයක් නොමැත.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) නැත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -1146/'16- (3), ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11 -1278/'16- (3), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මාතර - බෙලිඅත්ත අධිවේගී මාර්ගය යාබද ඉඩම්: වන්දි තක්සේරු

மாத்தறை - பெலிஅத்த அதிவேக நெடுஞ்சாலையின் அயற் காணிகள்: நிவாரண மதிப்பீடு

LANDS ADJOINING MATARA-BELIATTA HIGHWAY: ASSESSMENT OF COMPENSATION

1289/'16

12. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවට)

(මාණ්ඩලික පුත්තික පතිරණ-මාණ්ඩලිකු டலස் அழகப்பெரும சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Dullas Alahapperuma)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් නැංවීමෙහිලා අතිශයින්ම තීරණාත්මක වූ අධිවේගී මාර්ග තැනීම, ඉකුත් රජයේ ප්‍රමුඛ සංවර්ධන මූලෝපායක් වූ බවත්;

(ii) ඒ අනුව, ඉදිවෙමින් පවතින මාතර - බෙලිඅත්ත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් මේ වනවිට ඇරඹී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්කරගෙන ඇති බවත්;

(iii) මාතර, තිහගොඩ කොට්ඨාශයේ වන්දි තක්සේරු කිරීමේදී ඉඩම් හිමියන්ට යම් අසාධාරණයක් සිදුවී ඇති බවත්;

(iv) එහිදී අධිවේගී මාර්ගයට යාබදව ඉතිරිවන ඉඩම්වල වටිනාකම, පවතින වටිනාකමට සාපේක්ෂව අඩුවීම තක්සේරු කර නොමැති බවත්;

(v) දේපළ කොටසක් පමණක් පවරා ගැනෙන අවස්ථාවන්හිදී ඉතිරිවන කොටස ආර්ථික ඉඩම් බවට පත්වීම සැලකිල්ලට ගෙන නොමැති බවත්;

(vi) කුඹුරු ඉඩම් පවරා ගැනීමේදී ගණනය කරනු ලැබූ, අනාගත වෘත්තීය අහිමිවීම, ගොඩ වගාවන් සඳහා ගණනය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සාමාන්‍ය මහා මාර්ගයක් පුළුල් කිරීමේදී, යාබද ඉඩම්වල වටිනාකම් ඉහළ ගියද, අධිවේගී මාර්ගයන්ට අදාළව එසේ නොවීම පිළිබඳ විශේෂයෙන් සලකා බලන විකල්ප වන්දි තක්සේරු ක්‍රමයක අවශ්‍යතාව පිළිගන්නේද;

(ii) ඒ අනුව, තිහගොඩ, කපුටුව ප්‍රදේශයේ දේපළ සහ වගාවන් අහිමිවූවන්ට සහනයක් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) இலங்கையில் உட்கட்டமைப்பு வசதிகளை விருத்தி செய்வதில், மிகவும் தீர்க்கமானதாக காணப்பட்ட அதிவேக நெடுஞ்சாலைகளை அமைத்தல் கடந்த அரசாங்கத்தின் முதனிலை அபிவிருத்தி மூலோபாயமாக இருந்தது என்பதையும்;

(ii) அதன்படி, நிர்மாணிக்கப்பட்டு வருகின்ற மாத்தறை - பெலிஅத்த அதிவேக நெடுஞ்சாலை யின் நிர்மாணப் பணிகள் இன்றளவில் ஆரம்பிக்கப்பட்டுள்ளதோடு, அதற்கு அவசியமான காணிகள் சுவீகரிக்கப்பட்டுள்ளன என்பதையும்;

(iii) மாத்தறை, திஹகொட பிரிவில் இழப்பீடு மதிப்பீட்டின்போது காணி உரிமையாளர்களுக்கு அநீதி நேர்ந்துள்ளது என்பதையும்;

(iv) இதன்போது அதிவேக நெடுஞ்சாலைக்கு பக்கத்தில் எஞ்சுகின்ற காணிகளின் பெறுமதி, நிலவும் பெறுமதிக்கு ஒப்பீட்டளவில் குறை வடைதல் விலைமதிப்பீடு செய்யப்படவில்லை என்பதையும்;

(v) ஆதனத்தின் ஒரு பகுதி மட்டும் சுவீகரிக்கப்படும் சந்தர்ப்பங்களில் எஞ்சும் பகுதி ஓரக்காணிகளாக மாறுவது கவனத்தில் கொள்ளப்படவில்லை என்பதையும்;

(vi) வயற்காணிகளைச் சுவீகரிக்கும் போது கணிப்பிடப்பட்ட எதிர்கால தொழில் இழப்புகள், மேட்டு நிலப் பயிர்ச்செய்கையின் பொருட்டு கணிப்பிடப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) சாதாரண நெடுஞ்சாலையொன்று விஸ்தரிக்கப் படும்போது, பக்கத்திலுள்ள காணிகளின் பெறுமதி அதிகரிக்கின்ற போதிலும், அதிவேக நெடுஞ்சாலைகள் தொடர்பில் அவ்வாறு நடை பெறாமை குறித்து விசேடமாக ஆராயும் மாற்று இழப்பீடு மதிப்பீட்டு முறையொன்றின் அவசியத்தை ஏற்றுக்கொள்வாரா?

(ii) அதன்படி, திஹகொட, கப்புதுவ பிரதேசத்தில் ஆதனங்கள் மற்றும் பயிர்களை இழந்தவர் களுக்கு நிவாரணம் வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Is he aware that-

(i) the construction of highways which was an extremely significant measure towards enhancement of infrastructure in Sri Lanka was a prominent development strategy adopted by the previous government;

(ii) accordingly, the construction activities of Matara - Beliatta Highway have been commenced by now, and the lands required for the same have been acquired;

(iii) the owners of lands have been subjected to injustice with regard to the assessment of compensation in the Thihagoda Division of Matara District;

(iv) the decrease of the value of lands which are left out adjoining the highway has not been assessed, in comparison with the current value of lands;

(v) attention has not been paid towards the plight of the marginalized lands which

[ගරු බුද්ධික පතිරණ මහතා]

are left over when only one part of a property is taken over; and

(vi) the anticipated livelihood loss, which was calculated pertaining to the acquisition of paddy lands has not been calculated with pertinence to dry land farming?

(b) Will he inform this House-

(i) whether he admits the necessity of an alternative system for the assessment of compensation specially considering the fact that the value of lands adjoining the highway does not increase although the value of lands adjoining roads generally increase with the expansion of a road; and

(ii) accordingly, whether steps will be taken to provide relief to those who lost property, and cultivations in Thihagoda, Kapuduwa area?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Answer tabled:

(අ) (i) මහාමාර්ග සංවර්ධනය හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වර්තමාන රජයද ප්‍රමුඛස්ථානයක් ලබාදී ඇත.

(ii) ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු බොහෝ දුරට අවසන් වෙමින් පවතී.

(iii) වන්දි ගෙවීමේදී ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන හා එයට අනුෂංගිකව අනුමත වී ඇති නියෝග -Regulations- අනුව කටයුතු කරනු ලැබේ.

(iv) තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම් වන්දි තක්සේරු කරන අතර, එහිදී ඉඩමක වටිනාකමට බලපානු ලබන සියලුම කරුණු සලකා ව්‍යවස්ථාපිත වන්දි මුදල තීරණය කරනු ලැබේ.

(v) කිසියම් දේපළක් පවරා ගැනීමේදී එහි කොටසක් ප්‍රයෝජනයට ගත නොහැකි ආන්තික ඉඩමක් බවට පත්වේ නම්, එය පවරා නොගත්තද ඒ සඳහාද වන්දි මුදලක් ගෙවීම සිදු කරයි.

(vi) තක්සේරු වටිනාකමට අමතරව ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත යටතේ ප්‍රකාශයට පත්කර ඇති නියෝග - Regulations-සඳහන් වන දීමනාවන්ද ගෙවනු ලබන අතර, එම දීමනාවන් තුළින් වගාවන් සඳහා සිදුවන හානිය සැලකිල්ලට ගෙන ගෙවීම් කරනු ලැබේ.

(ආ) (i) පවතින වන්දි ක්‍රමවේදය තුළ සෑම පවරාගැනීමක් වෙනුවෙන්ම සාධාරණ වන්දි මුදලක් ලබාදෙනු ලැබේ.

(ii) තිහගොඩ කපුටුව ප්‍රදේශයේ පමණක් නොව, යොමුගත මාර්ග ව්‍යාපෘතියට අදාළව රජයට පවරාගනු ලබන දේපළ අයත්වන සියලුම ප්‍රදේශයන්හි දේපළ හා වගාවන් අභිමිවූවන්ට ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රකාර වන්දි / පොලී මුදල් හා පනත අනුව පවත්නා නියෝග -Regulations -වලට අනුකූලව දීමනා ලබාදීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

කරුණාකරලා ඉල්ලීමක් කරනවා, සටහනේ තිබෙන ප්‍රමාණයෙන් එහාට නොගිහින් අපි කාලය සීමා කර ගනිමු කියලා. Go by the text, please!

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහුවිධ නිපුණතා සේවා සඳහා බඳවා ගත් අභ්‍යාසලාභීන්
இலங்கைத் துறைமுக அதிகாரசபையில் பல்துறைத் திறன் சேவைக்காக ஆட்சேர்க்கப்பட்ட பயிற்சியாளர்கள்
TRAINEES RECRUITED FOR MULTI-SKILLED SERVICES IN SRI LANKA PORTS AUTHORITY

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අද දිනයේ මම ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය යොමු කිරීමට බලාපොරොත්තු වෙන ඇමතිතුමා මේ සභාවේ සිටියා. නමුත් දැන් එතුමා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් ඒක කල් දමනවාද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ. මම ප්‍රශ්නය ඇසීම කල් දැම්මාට, මෙම ප්‍රශ්නයෙන් දුක් විඳින මිනිසුන්ගේ ප්‍රශ්න කල් දමන්න බැහැ. ඒ නිසා මම ප්‍රශ්නය අසන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

දැන් ගරු ඇමතිතුමා සභාවේ සිටියා. ගරු සභානායකතුමනි, හෙටවත් මෙයට උත්තරයක් දෙන්න කියන්න. [*Interruption.*] He was here. He was going to reply. But, now he is not here. [*Interruption.*] No, I do not want to take much time.

ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 23(2) යටතේ අසන්නේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අදාළ ප්‍රශ්නයක්. වරාය හා

නාවික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් මම එයට පිළිතුරු බලාපොරොත්තු වෙනවා. මම එයට කල් දීලා තිබෙනවා.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහුවිධ නිපුණතා සේවා සඳහා කණ්ඩායමක් වශයෙන් බඳවා ගන්නා ලද අභ්‍යාසලාභීන් 210ක ප්‍රමාණයෙන් 29 දෙනෙකු පසු ගිය කාලයේදී ස්ථිර කර ඇත. තවත් 800ක් පමණ අන්‍ය සේවයට බඳවා ගෙන ඇත. මසකට රුපියල් 10,000ක් වන ඉතා අවම දීමනාවක් මෙම බහුවිධ නිපුණතා පුහුණුවන්නන්ට මාසිකව ලබා දෙයි.

එහෙයින්,

01. 210ක් පමණ ආවරණය වන පරිදි 2014 සිට සේවයේ පුහුණු වන සේවකයින් 29 දෙනෙකු පසු ගිය කාලය තුළ සේවයට බඳවා ගෙන ඇති බවත්, තවත් සේවකයින් 88 දෙනෙකු පමණ ස්ථිරත්වය බලාපොරොත්තුවෙන් සිටින බවත් ඔබතුමා පිළිගන්නවාද?

02. මෙම අභ්‍යාසලාභීන් අතර පිය-පුතු පදනම මත ශ්‍රී ලංකා වරාය අධිකාරියට බඳවා ගන්නා ලද පුහුණුව ලත්, ස්ථිරත්වය බලාපොරොත්තුවෙන් සිටින, 2017.7.14 වන දිනට දැනට ලබා දී ඇති පත්වීම් අවසන් වන බැවින්, අනෙක් අය මෙන් ඉතුරුව ඇති මෙම පුහුණු ප්‍රමාණයට වරාය අධිකාරියේ සේවාවට ගැනීමට අදාළ බලධාරීන් සමඟ පියවර ගන්නේද? එනම් කවදාද?

මොකද, මෙම සේවකයින්ගේ නොසන්සුන්තාවක් ඇති වුණාම, එම ප්‍රශ්න විසඳන්නේ නැති වුණාම මේ ආයතන අඩපණ වෙනවා. ඊයේ අගමැතිතුමාට මැදිහත් වෙන්න සිද්ධ වුණා, railway ප්‍රශ්නයට. ඒක කාලයක් ඇදි-ඇදී ආපු ප්‍රශ්නයක්. අදාළ ඇමතිතුමන්ලා පිළිතුරු දීලා මේ ප්‍රශ්නය විසඳනවා නම්, අගමැතිතුමා ළඟට යන්න අවශ්‍ය වන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට හෙට පිළිතුරු දෙනවා කිව්වා.

මීළඟට දෙවැනි ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට, ගරු අනුර දිසානායක මැතිතුමා. මේ අවස්ථාවේදී කාලය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි.

II

උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාව මුහුණ පා ඇති ගැටලු
உமா ஓயா பல்நோக்குத் திட்டத்தினால் மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்
PROBLEMS CAUSED TO PEOPLE BY UMA-OYA MULTIPURPOSE PROJECT

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය හේතුවෙන් මහ ජනතාව මුහුණ පා ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

2008 අප්‍රේල් 29වන දින උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය සඳහා මුල්ගල තබනු ලැබුවේ විවිධ අරමුණු ප්‍රකාශයට පත් කරමිනුයි. කෙසේ නමුත්, මේ වන විට මෙකී ව්‍යාපෘතිය හේතුවෙන් භෞතික සම්පත් විනාශයන්ද, මහජන පීඩාවන්ද, පාරිසරික විනාශයන්ද නොකඩවා සිදු වෙමින් තිබෙනවා. මේ විනාශය මෙසේ දළ වශයෙන් සාරාංශ කළ හැකියි, ගරු කථානායකතුමනි.

මේ වන නිවාස 4,625ක් පුපුරා, ඉරිතලා විනාශ වී ඇති අතර, පූජනීය ස්ථානද, පාසල්ද ගණනාවක් පවතිනවා. මකුල්ඇල්ල විහාරස්ථානය, එගොඩගම විහාරස්ථානය, හීල්ඔය විහාරස්ථානය, කුරුඳුගොල්ල විහාරස්ථානය, දික්අරාව මෙහෙණි ආරාමය, උඩපේරුව භාවනා මධ්‍යස්ථානය, පල්ලෙපේරුව මුස්ලිම් දේවස්ථානයද වනවා. මකුල්ඇල්ල පාසලද පුපුරා, ඉරිතලා හානියට ලක්ව ඇති අතර, බණ්ඩාරවෙල අධිකාරම් පාසලද, බණ්ඩාරවෙල ධර්මාශෝක මධ්‍ය මහා විද්‍යාලයද පුපුරා, ඉරිතලා තිබෙනවා. එසේම මෙම හානියට ලක් වූ ප්‍රදේශයෙහි ළිං, උල්පත්, දියකඳුරු, ඔයවල් 2,333ක් සහමුලින්ම සිඳී, වියළී ගොස් තිබෙනවා. ඒ අතර බණ්ඩාරවෙල ආසන මධ්‍යයෙහි වන හීල්ඔයද අනතුරට මුහුණ පා තිබෙනවා. බහුතරයක් ගොවි ජනතාව ජීවත් වන මේ කලාපයේ ජල මූලාශ්‍ර සිඳී යාම හේතුවෙන් අක්කර දස දහස් ගණනක වගා බිම් අත්හැර දමා අවසන්. තමුන්නාන්සේලා මේ යෝජනා කරන ලද ව්‍යාපෘතියේ අනිසි ප්‍රතිවිපාක අද එහි ජීවත් වන ජනතාවට භුක්ති විඳින්න සිදුවී තිබෙනවා.

මෙම මහා ව්‍යසනය හේතුවෙන් කුඩා තේ වතුද අර්බුදයකට මුහුණ පා ඇති අතර, ස්වයං රැකියාලාභීන් විශාල ප්‍රමාණයක්ද ජලය නොමැතිවීම හේතුවෙන් ව්‍යාපාර අත්හැර දමන තත්ත්වයට පත්ව තිබෙනවා. අප රටේ ඉතා සෞම්‍ය දේශගුණයකින් යුත්, ස්වභාව සෞන්දර්යයෙන් අනූන වූ කලාපයක සිදු වෙමින් පවතින මෙම මහා විනාශයේ ප්‍රධානම හානියට ලක්වන නගරය බවට අද වන විට බණ්ඩාරවෙල නගරය පත්වී තිබෙනවා. කොළඹ-බදුල්ල මාර්ගය පුපුරා ඉරිතලා, ගිලා බැසීමට ලක්වී ඇති අතර, බණ්ඩාරවෙල-හීල්ඔය මාර්ගයෙහිද ස්ථාන ගණනාවක් දැඩි පිපිරුම්වලට ලක්ව තිබෙනවා. එසේම, නගරයේ පවතින ලොකු කුඩා ව්‍යාපාරික ස්ථාන විශාල ප්‍රමාණයක්ද, නිවාසද අඩි දෙක තුන ගිලාබැසීම්වලට හා ඇලවීම්වලට ලක්වීම හේතුවෙන් බරපතළ අවදානමකට ලක්ව තිබෙනවා. අද මුළු බණ්ඩාරවෙල නගරයම මෙම විනාශකාරී ව්‍යසනයට ගොදුරු වෙලා තිබෙනවා.

ප්‍රදේශවාසීන්ගේ අදහසට අනුව මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟ සඳහා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කරඳගොල්ල ගම්මානයේ සිට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදි කරමින් පවතින ඩයබරා ජලාශය දක්වා කිලෝමීටර 15.2ක දිගකින් යුතුව කැණීම් කළ යුතුව තිබෙනවා. මේ වන විට මෙම උමඟේ කැණීම් කරගෙන යාමේදී භූ අභ්‍යන්තරයේ දුර්වල පාෂාණ ස්ථර හානි කරමින්ද, භූ අභ්‍යන්තරයේ වන ජල සංචිත හා ජල මාර්ග විනාශ කරමින්ද, ගමන් කරමින් තිබෙන බව අනාවරණය වූයේ භූ අභ්‍යන්තරයේ විශාල දිය කාන්දු ආරම්භ වීමෙන් පසුයි. මේ වන විට ගරු කථානායකතුමනි, තත්පරයට වතුර ලීටර් 976ක් කාන්දු වන සුවිශාල දිය කාන්දුවක් සිදුවෙමින් තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් ගරු කථානායකතුමනි, භූ අභ්‍යන්තරයේ වන ජලය දිනකට වතුර ලීටර් මිලියන 84කට අධික ප්‍රමාණයක්. මෙහිදී භූ අභ්‍යන්තරයේ වන ජලය දිනකට වතුර ලීටර් 84,326,400ක් බැගින් මෙම ඉරිතැලීම් හේතුකොටගෙන ගලායමින් තිබෙනවා; අපතේ යමින් තිබෙනවා.

ඌව පළාතේ ප්‍රධාන ජනාකීර්ණ ප්‍රදේශවල මතුපිටට වඩා විශාල විපර්යාස ප්‍රමාණයක් භූ අභ්‍යන්තරයේ සිදුවන බවත්, මෙම සිදුවන දිය කාන්දු වසා දැමීම සඳහා ශ්‍රී ලංකා රජයට හෝ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් සමාගම වන ඉරානයේ ෆරාබ් සමාගමට

[ගරු අනුර දිසානායක මහතා]

හෝ තාක්ෂණික හැකියාවක් නොමැති බව ජනතාවගේ අදහසයි. මේ පළමුවෙනි දිය කාන්දුව නොවෙයි. අවස්ථා ගණනාවකම දිය කාන්දු සිදු වෙමින් තිබෙනවා. ඒවා වසා දමන්නවත් තාක්ෂණික හැකියාවක් මෙම සමාගම් වෙත නැහැ. එමෙන්ම මෙම දිය කාන්දු වැළැක්වීම සඳහා කන්ටේනර් පිටින් ගෙන එනු ලබන ටොන් ගණනාවක රසායනික ද්‍රව්‍ය මේ වනවිටත් මධ්‍යම කඳුකරයේ භූ අභ්‍යන්තරයේ ජලයට මුසුකර තිබීම පිළිබඳව ඔවුන් සැක පළ කරනවා. මෙම දිය කාන්දු වැළැක්වීම වෙනුවෙන් විශේෂ විෂ රසායනික ද්‍රව්‍ය යොදවමින් තිබෙනවා.

විශේෂයෙන්ම මේ වන විට මධ්‍යම කඳුකරයේ නැහෙනහිර බෑවුම පුරා ඉරිතලා පුපුරා යාම් දක්නට ලැබෙනවා. මෙම පිපිරීම් මතුපිට ඇති වූ පිපිරීම් නොවන බවත්, මෙම පිපිරීම්වල ආරම්භය අඩි 600-700 යටින් යන උමඟේ සිට සිදු වන බවට නොනිල ලෙස දැන ගන්නට ඇතැයි ජනතාව පවසනවා. තත්ත්වය මෙසේ නම් මෙම කඳුකර භූමියේ ඒකාබද්ධතාව බිඳ වැටී ඉදිරියේ ඇතිවන මහ වැසි සමඟ හෝ සුළු හෝ භූමි කම්පාවකදී ඉතා බරපතළ හානි සිදුවීමේ අවදානමක් මෙම කලාපයේ අද මතු වී තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට ගරු අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

01. උමා ඔය ව්‍යාපෘතිය ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කරනු ලැබුවේද? එසේ නම් අද උද්ගත වී ඇති පාරිසරික ගැටලු හඳුනා ගනු ලැබ තිබුණේද? ඒවාට විසඳුම් යෝජනා කර තිබුණේද?

02. ව්‍යාපෘතිය හේතුවෙන් අවදානමට ලක්ව ඇති කලාපය දැඩි අවදානම් කලාපයක් ලෙස නම් කරනු නොලබන්නේ මන්ද?

දැන්වත් මෙම කලාපය අවදානම් කලාපයක් ලෙස නම් කරන්න. විනාශයන් සිදු වෙමින් තිබෙනවා.

03. සිදු වී ඇති පාරිසරික හා භෞතික විනාශයන් හඳුනා ගැනීමට විද්‍යාත්මක පරීක්ෂණයක් හා ඇස්තමේන්තුවක් සිදු කරනු ලබන්නේද? එය සභාගත කිරීමට කටයුතු කරන්නේද?

ගරු කථානායකතුමනි, සිදු වී තිබෙන විනාශය පිළිබඳව විද්‍යාත්මක ඇගයීමක් අවශ්‍යයි. සිදුවී තිබෙන විනාශයේ බරපතළකම මොකක්ද යන්න පිළිබඳව යම් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි.

04. විනාශයේ ගොදුරු බවට පත් වූ ජනතාවට සාධාරණය ඉටු කිරීමට ගන්නා වූ පියවර කුමක් ද?

05. අනාගතයේ මේ ව්‍යාපෘතිය හේතුවෙන් සිදු විය හැකි පාරිසරික හානිය අවම කර ගැනීමටත්, ජීවිත හා දේපළ හානි අවම කර ගැනීමටත් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද කියා දැනගන්නට කැමැතියි.

බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි.

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)

(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණාව ඒ ප්‍රදේශයත් එක්ක අද වෙනකොට බරපතළ කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා. එය බොහොම පැහැදිලියි.

මෙම කාරණාවේදී 2008 මේ ව්‍යාපෘතිය ආරම්භ වෙනකොට 2011 වර්ෂයේදීයි මෙම ව්‍යාපෘතියට පාරිසරික ඇගයීම් වාර්තාවට අනුමතිය ලැබී තිබෙන්නේ. 2011 වර්ෂයේ පාරිසරික බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව වාර්තාව සකස් කර තිබෙන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේයි. හැබැයි අද වෙනකොට අපි සියලුදෙනාටම මේ ඇගයීම් වාර්තාවෙන් ලබා දුන් කරුණු කාරණාවලට එහා ගිය, එයින් පරිබාහිර වූ, ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්නට සිද්ධ වී තිබෙනවා.

අපට අද බරපතළම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ මේ රටේ අභිංසක මිනිසුන්ගේ මුදල් රුපියල් බිලියන 57ක් ගරු කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය වෙනුවෙන් අපි වියදම් කර තිබීමයි. ව්‍යාපෘතියේ සමස්ත වැඩ ප්‍රමාණය ගත්තාම සියයට 77ක වැඩ ප්‍රමාණයක් අපි අවසන් කර තිබෙනවා. මුළු වටිනාකම ඇමෙරිකන් ඩොලර් මිලියන 514ත් ඇමෙරිකන් ඩොලර් මිලියන 378ක් වියදම් කර සියයට 77ක වැඩ කටයුතු අවසන් කර තිබෙනවා. තව ඇමෙරිකන් ඩොලර් මිලියන 137ක වැඩ ප්‍රමාණයක් තමයි වැඩ අවසන් කිරීම සඳහා වියදම් කරන්නට තිබෙන්නේ.

මේ ව්‍යාපෘතියේදී අපි අර කලින් කියපු ඇගයීම් වාර්තාව පිළිබඳ වූ ප්‍රශ්නය බොහොම පැහැදිලිව පැන නඟිනවා. හැබැයි රජයක් හැටියට ගත යුතු සහ ගත හැකි සියලු ක්‍රියා මාර්ග ගනිමින් ඒ ප්‍රදේශයේ ජනතාවට දිය හැකි උපරිම ආරක්ෂාව හා ඔවුන්ට වන්දි මුදල් සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා දිය හැකි සියලු දේවල් ලබා දෙමින් තමයි මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යන්නේ. මොකද, පාර්ලිමේන්තුවේ වුවත් අපට අහන්නට තිබෙන එකම ප්‍රශ්නය ගරු කථානායකතුමනි, මේ රටේ මේ තරම් මුදල් ප්‍රමාණයක් යට කළාට පස්සේ නැවත වාරයක් අපට ආපස්සට යන්නට පුළුවන්ද කියන කාරණාවයි. රජයක් හැටියට අපි එක පැත්තකින් සතුටු වෙනවා, අතිගරු ජනාධිපතිතුමා මේ මහවැලි අමාත්‍යාංශය භාර ගෙන, මේ ව්‍යාපෘතිය එතුමා අතට අරගෙන එතුමා යටතේ ක්‍රියාත්මක කිරීම ගැන. පසු ගිය 2017 ජනවාරි 09 වනදා එතුමා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව හරහා විශේෂයෙන් ඒ ප්‍රදේශයේ හැටියට අපි මුදල් වෙන් කර, ආධාර ලබා දී කළ යුතු සියලු කරුණු කාරණා අපි ඉටු කර දුන්නා.

මෙහිදී ගරු මන්ත්‍රීතුමා යොමු කළ එක ප්‍රශ්නයක් තමයි, "මේ ප්‍රදේශය අවදානම් කලාපයක් හැටියට නම් කරන්නේ නැත්තේ ඇයි?" කියන කාරණාව. එලෙස නම් කළ යුතුව තිබෙන්නේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟිනුයි. අපි ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ නිලධාරීන් මේ වෙනකොට මේ ව්‍යාපෘතියට අනුයුක්ත කර සිටිනවා. ඒ වාගේම මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයේ නිලධාරීන්ද මේ ව්‍යාපෘතියට අනුයුක්ත කර ඉන්නවා. මේ සියලුදෙනා දැනට වාර්තා කර තිබෙන්නේ, පොළොවේ තිබෙන ජලස්තරය වෙනස් වීම නිසා, එසේත් නැත්නම් ඒ ජලය මේ උමඟට කාන්දු වීම නිසා සිදුවන ගිලා බැසීමක් මිස මෙය එතැනින් එහාට ගිය කාරණාවක් නොවන බවයි.

අපි දන්නවා, එම ප්‍රදේශයේ ගෙවල්වල ඉරි තැලී තිබෙනවා; වහළවල් කඩාගෙන වැටෙන මට්ටමට පත් වෙලා තිබෙනවා කියලා. මේ සියලු දේවල් වෙලා තිබෙන්නේ ක්ෂණිකව වන ගිලා බැසීම් එක්කයි. එය දිගින් දිගටම සිදුවන කාර්යක් නොවෙයි. එම නිසා මේ ප්‍රදේශ අවදානම් කලාප හැටියට නම් කරන්න පුළුවන්කමක් නැහැ. හැබැයි කොහොම වුණත්, 2017 ජනවාරි

09 වෙනි දා අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට අනුව, ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට අවදානම් කලාපයක ඉන්න කණ්ඩායමක් සේ සලකා දිය යුතු සහ දිය හැකි සියලු සහනාධාර දීමට අපි කටයුතු කර ගෙන යනවා.

මෙහිදී තවත් එක් කාරණාවක් ගරු මන්ත්‍රීතුමා මතු කරනවා. ඒ, මේ මේ ව්‍යාපෘතිය ඉදිරියට යාමේදී සිදුවිය හැකි පාරිසරික හානිය අවම කර ගැනීමටත්, ජීවිත දේපළ හානි අවම කර ගැනීමටත් අපට දෙන්නට පුළුවන් සහතිකය මොකක්ද කියන එක පිළිබඳවයි. 2015 මාර්තු වෙනකොට ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ වෙනුවෙන් විද්වත් කමිටුවක් පත් කර මේ ඇගයීම් වාර්තාව සම්බන්ධයෙන් නැවත වාරයක් ඒ විද්වත් කමිටුව හරහා පරීක්ෂණයක් කරනවා. ඒ පරීක්ෂණයෙන් ලැබුණු වාර්තා හා නිර්දේශ එක්ක තමයි ඉදිරි කටයුතු ක්‍රියාත්මක කෙරෙන්නේ. ගරු කථානායකතුමනි, මම ඒ අදාළ වාර්තාව මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ වාර්තාව අනුව අපට අවශ්‍ය තොරතුරු බලා ගන්න පුළුවන්. මේ කාරණා අනුව ක්‍රියාත්මක කිරීම නිසා තමයි ගරු කථානායකතුමනි, අද වෙනකොට වෙන්න තිබුණු හානිය යම් මට්ටමකට හෝ අපට අවම කර ගන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ.

මේ වෙනකොට කරදගොල්ල සිට කිලෝමීටර් 8ක් ඇතුළට අපි කැනීම් කටයුතු කර අවසන් කර තිබෙනවා. ඩයර්බා සිට කිලෝමීටර් 2ක වැඩ කටයුතු අවසන් කර තිබෙනවා. කරන්නට තිබෙන කිලෝමීටර් 15න් තව කිලෝමීටර් 5යි කරන්නට ඉතිරි වෙලා තිබෙන්නේ.

පොල්ගොල්ලේ ඒ ඉදිකිරීම් කරනකොට මේ උමඟ ඉදි කරන අවස්ථාවේදී ජලය උමඟ ඇතුළට ඇවිත් ඒ ප්‍රදේශයේ ළිංවල වතුර නැති වෙලා මේ ප්‍රශ්නයම පැන නැඟුණා.

හැබැයි, ස්ථිර විසඳුමක් හැටියට සියලු දෙනා අද අපට උපදෙස් ලබා දීලා තිබෙන්නේ කොන්ක්‍රීට් යොදලා මේක සම්පූර්ණයෙන් 'සීල්' කරලා, වර්ෂා තුන හතරක් ගියාට පසුව තමයි ඒ පොළොවේ ජල ස්ථාවරය යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් වන්නේ කියලායි. එහෙම කළොත් තමයි ඒ පොළොව -භූමිය ඇතුළු සියලු දේවල් - යථා තත්ත්වයට පත් කරන්න අපට පුළුවන් වන්නේ. මම හිතන විධියට මේ කිලෝමීටර් පහේ ඉදි කිරීම් කටයුතු කරන්නේ මේ මාර්තු මාසයේ ලබා ගත්ත වාර්තාවත් එක්කයි. ඒ හරහා අපට මුහුණ දෙන්න සිදු වෙන ගැටලු ප්‍රමාණය අවම කර ගන්න පුළුවන්කම ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

ලබා දුන් වන්දි, සහනාධාර මොනවාද කියන එක පිළිබඳ ප්‍රශ්නය මතු කළා. ගරු කථානායකතුමනි, අපි මේ වෙනකොට නිවාස හානි සඳහා පමණක් රුපියල් 197,605,342ක වන්දි මුදලක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම වගාවන් පිළිබඳ පැවැත්වූ රැස්වීමකදී අපි තීරණයක් ගත්තා, කුඩා තේ වතු සහ අනෙකුත් සියලුම වගාවන් සඳහා සිදුවන හානිවලට, අදාළ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සහතික කරපු සියලුදෙනාට, වන්දි ලබා දෙන්න. ඒ අනුව මේ වෙනකොට රුපියල් 367,922,417.05ක් වන්දි වශයෙන් ගෙවලා අවසන් කරලා තිබෙනවා.

ජල යෝජනා ක්‍රම පිළිබඳ බරපතළ ප්‍රශ්න තිබුණු ප්‍රදේශ තිබුණා. එහි අපි හඳුනා ගත්ත ප්‍රදේශ තිබෙනවා. මකුල්ඇල්ල, වෙහෙරගලතැන්න, කුරුඳුගොල්ල කියන ප්‍රදේශ තමයි ඒ. මකුල්ඇල්ලේ පවුල් 1,500ක්, වෙහෙරගලතැන්නේ පවුල් 500ක් සහ කුරුඳුගොල්ලේ පවුල් 400ක් ඉන්නවා. මේ පවුල් 2,400 සඳහා වන ජලවිදුලි ව්‍යාපෘතියට රුපියල් මිලියන 352ක් වියදම් කරලා තිබෙනවා. දැන් මේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ක්‍රියාත්මක වෙනවා. ඒකේ වෙහෙරගලතැන්න සහ කුරුඳුගොල්ල කියන ජල යෝජනා දෙකහි වැඩ කටයුතු මේ වන විට සම්පූර්ණයෙන් අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම පවුල් 1,500 සඳහා ක්‍රියාත්මක වන මකුල්ඇල්ල ජල යෝජනා ක්‍රමය 2017.06.30වැනි දින වන කොට අවසන් කරලා එම ජනතාවට ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මේ ජල සම්බන්ධතාව ලබා ගැනීමට එක පුද්ගලයෙකුට රුපියල් 17,000ක් ගෙවන්න වෙනවා. හැබැයි, ඒ වෙනුවෙන් වැය වන සම්පූර්ණ මුදල වූ රුපියල් මිලියන 40ක වියදම සම්පූර්ණයෙන්ම රජය හරහා දැරීමට අපි මේ වන විට කටයුතු කරලා තිබෙනවා.

අපි ගත්ත තීන්දු, තීරණ සහ කරපු කාරණා මීට වඩා බොහොමයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව ඇති වාර්තාවත් මට සභාගත කරන්න පුළුවන්. එම වාර්තාවේ පවුල්, ප්‍රදේශ, වසම් සඳහා අපි වෙන් කරපු මුදල් ප්‍රමාණය කොපමණද කියලා එකින් එක සඳහන්ව තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වෙනුවෙන් වෙනම වේලාව ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, මෙම ව්‍යාපෘතියෙන් අනාගතයේ සිදු විය හැකි හානි පිළිබඳව කථා කරනකොට, අපි මේ ව්‍යාපෘතියේ අද වන විට ගිහින් තිබෙන දුර ප්‍රමාණය, ක්‍රියාත්මක වුණු වැඩ ප්‍රමාණයත් එක්ක ගත්තාම සියයට 100ක් මේක මේ ආකාරයෙන් කිසිදු ගැටලුවක් නැතිව ක්‍රියාත්මක වෙයි කියන සහතිකය අපට දෙන්න පුළුවන්කමක් නැහැ. ඒක තමයි ඇත්ත, ඒක තමයි යථාර්ථය. හැබැයි, රජය හැටියට අපි ඒ ජනතාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් දිය හැකි සියලු දේ ලබා දෙනවා. නිවසක් අහිමි වුණු පුද්ගලයෙක් ඉන්නවා නම්, ඔහුට නිවසක් වෙන යාම සඳහා කුලියක් ලබා දීම පවා අපි මේ වේලාවේදී සිදු කරනවා.

ඒ නිසා රජය හැටියට ඒ ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කළ යුතු සියලු කටයුතු කරනවා. ඒ වෙනුවෙන් අපි වෙනමම කමිටුවක් හදලා අපේ ඌව පළාතේ හිටපු ප්‍රධාන ලේකම් පී.බී. අමරසේකර මැතිතුමා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා හැටියට පත් කරලා තිබෙනවා. ඒ කමිටුවට ත්‍රිවිධ හමුදාව ඇතුළු පොලීසියේ නිලධාරීන් අයත් වනවා. ඒ වාගේම ඒ කමිටුවට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ නිලධාරීන් සියලු දෙනා එකතු කරලා ඒ ප්‍රදේශයේ වෙනම කාර්යාලයක් ස්ථාපිත කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ගැටලු එනකොට ඒ කණ්ඩායම ඒ තැන්වලට ක්ෂණිකව ගිහිල්ලා ක්‍රියාත්මක වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි. විද්‍යානුකූලව පියවර ගන්නා බවට ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා, අපි ඒ ගැන විවාදයකට යන්න අවශ්‍ය නැහැ. ඔබතුමාට මොනවාද කියන්න තිබෙන්නේ?

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේක උමගක් ඉදි කිරීමක් සහ ජලාශයක් එක්ක ගැට ගැසී තිබෙන ප්‍රශ්නයක්. එතකොට ශක්‍යතා අධ්‍යයනය පිළිබඳව ආර්ථික වශයෙන් වාගේම පාරිසරික වශයෙනුත්, භූ ගර්භයේ සිද්ධ වන වලනයන් පැත්තෙනුත් සැලකිල්ලට ලක් කළ යුතුව තිබුණා. නියෝජ්‍ය ඇමතිතුමා කියූ පරිදි ශක්‍යතා අධ්‍යයන වාර්තාව හදලා තිබෙන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන්. නමුත් ගරු කථානායකතුමනි, පාරිසරික පැත්ත සම්බන්ධයෙන් ගත්තොත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට තිබෙන හැකියාව කුමක්ද කියලා මා දන්නේ නැහැ. ඒ වාගේම භූ ගර්භ පැත්තෙනුත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට තිබෙන හැකියාව කුමක්ද? අපි දන්නවා, මොරටුව විශ්වවිද්‍යාලයට ඒ හැකියාව තිබෙන බව. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෙනම භූ ගර්භ අධ්‍යයන අංශයක් තිබෙනවා. ඒකට ඒ හැකියාව තිබෙනවා. නමුත් ගරු කථානායකතුමනි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒ ක්ෂේත්‍රය පිළිබඳ නිපුණතාවක් තිබෙන පාඨමාලාවක් හෝ ක්ෂේත්‍රයක් හෝ තිබෙන විශ්වවිද්‍යාලයක් නොවෙයි. ඒ නිසා ඉතා හොඳින් පෙන්නුම් කරමින් තිබෙනවා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් 2011 වසරේ සකස් කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව අසාර්ථක බව. ඒ බව දැන් නියෝජ්‍ය ඇමතිතුමාම කියනවා.

ගරු කථානායකතුමනි, එතුමා විසින්ම කියනවා, මේ වාර්තාව අනුව නොවෙයි, මේක සිදුවෙමින් තිබෙන්නේ කියලා. ඕනෑම ව්‍යාපෘතියක් ආරම්භයේදී වැදගත්ම දේ ශක්‍යතා අධ්‍යයන වාර්තාවයි. ඒ ශක්‍යතා අධ්‍යයන වාර්තාව නිවැරදි ලෙස සිදුවී නැත්නම් මේ ව්‍යාපෘතිය පිළිබඳ දැන් අපි කවර විශ්වාසයක් තැබිය යුතුද? ඒ විතරක් නොවෙයි, මමත් අදාළ නිලධාරීන් හමුවී කළ සාකච්ඡාවකදී ඔවුන් කිව්වා අවුරුද්දක් දෙකක් යනකොට මේවා සාමාන්‍ය තත්ත්වයට පත්වෙලා සීල්වීමක් සිදුවේවි කියලා. නමුත් දැන් අවුරුදු ගණනාවක් තිස්සේ දිගින් දිගටම බිඳ වැටීම් සිදු වනවා. පළමු බිඳ වැටීමේ සිට දැන් අවුරුදු තුන හතරකට වැඩි කාලයක් තිස්සේ දිගින් දිගටම නැවත බිඳ වැටීම් සිදුවෙමින් තිබෙනවා. ඒ නිසා ඒ නිලධාරීන් කියූ කාරණය පිළිබඳවත් ඇත්තටම දැන් පිළිගත නොහැකි තත්ත්වයක් මතු වී තිබෙනවා. ඒ නිසා තමයි මම ඔබතුමාට යෝජනා කරන්නේ මෙම ව්‍යාපෘතිය හරහා සිදුවිය හැකි විනාශයන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකොට වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා අද සමහර වාර්තා සභාගත කරනවා නේ.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, ඉදිරියට මේ කටයුතු කිරීමේදී ඇති විය හැකි ප්‍රශ්න පිළිබඳව තව එක කාරණයක් එකතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම කරපු වාර්තාව අපට පිළිගන්න බැහැ කියන කාරණාව සම්බන්ධව. ඒක බොහොම සාධාරණ තර්කයක්. ඒක අපිත් පිළිගන්නවා. මොකද, ඒ කියලා තිබෙන කාරණාවලට අනුකූලව ගියා නම් අද මේ වාගේ බරපතළ ප්‍රශ්න එකක්වත් පැන නඟින්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා ස්විට්සර්ලන්තයේ සහ නෝර්වේ තානාපතිවරු කැඳවලා මේ පිළිබඳව විශේෂ සාකච්ඡාවක් කළ බව විශේෂයෙන්ම කියන්න ඕනෑ. එතුමා වෙනමම ඉල්ලුවා විශේෂ කණ්ඩායම් අපට ලබා දීලා මේකට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා. අපි කථා කරන මේ මොහොත වන විටත් ස්විට්සර්ලන්තයේ ඉංජිනේරුවරුන් කණ්ඩායමක් අපේ උමා ඔය ව්‍යාපෘතියට ගිහිල්ලා මේ වෙලාවේදීත් අවශ්‍ය උපදෙස් ලබා දෙමින් සිටිනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, දැන් මෙහි ජලය කාන්දු වන ප්‍රමාණය තත්පරයකට නවසිය ගණනක් නොවෙයි තිබෙන්නේ. ජලය කාන්දු වන ප්‍රමාණය දැන් තත්පරයකට එක්දහස් හැත්තෑට දක්වා වැඩි වෙලා තිබෙනවා. අපි නැවත වාරයක් ලබා ගත්ත මේ වාර්තාවත්, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා තානාපතිවරු හරහා විදේශ රටවල්වල ඉංජිනේරුවරුන්ගෙන් ලබා ගන්නා තාක්ෂණයත් සියලු දේ උපයෝගී කරගෙන මේ කටයුත්තේදී වෙන්න පුළුවන් හානිය අවම කරගෙන ඉදිරියට යන්නයි බලාපොරොත්තු වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි.

මීළඟට, අමාත්‍යාංශ නිවේදන. ගරු අග්‍රාමාත්‍යතුමා.

ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර වූ ආරක්ෂක ගිවිසුම: ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

இலங்கைக்கும் ஐக்கிய அமெரிக்க இராச்சியத்துக்கும் இடையிலான பாதுகாப்பு ஒப்பந்தம்: மாண்புமிகு பிரதம அமைச்சரின் கூற்று

MILITARY AGREEMENT BETWEEN SRI LANKA AND UNITED STATES OF AMERICA: STATEMENT BY HON. PRIME MINISTER

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, පිළිතුරු දෙන්න ප්‍රශ්න දෙකක් තිබෙනවා. එක ප්‍රශ්නයක් ගරු අනුර දිසානායක මැතිතුමා අසා තිබෙනවා. මා මුලින්ම එතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්නම්.

ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය 2007 වසරේ අත්සන් කළ ආරක්ෂක ගිවිසුම දීර්ඝ කිරීමට අප රජය බලාපොරොත්තු වෙනවා. මෙම ගිවිසුමේ මූලික අරමුණ වන්නේ වැඩිදියුණු කළ ප්‍රවර්ධන සහයෝගය තුළින් හමුදාවන්ගේ අන්තර්ග්‍රහණය, සූදානම් බව සහ කාර්ය සාධනය ඉහළ නැංවීම හා ආහාර, ජලය, රැකියා, ප්‍රවාහන, බහිජ තෙල්, ලිහිසි තෙල්, සන්නිවේදන සේවා, සබැඳි මූලික මෙහෙයුම් සහයෝගිතාව සඳහා අවස්ථාවන් ගොඩ නැඟීම සහ පාර්ශ්වයන් අතර ඒකාබද්ධ ක්‍රියාකාරකම්, පුහුණුවීම්, මෙහෙයුම් හෝ වෙනත් සහයෝගිතා උත්සාහයන් තුළින් අනපේක්ෂිත හෝ වෙනත් අවදානම් තත්ත්වයකදී යම් පාර්ශ්වයකට අවශ්‍ය සහයෝගිතාව, සැපයුම් හා සේවා පහසුකම් අන්‍යෝන්‍ය සහයෝගය තුළින් ළඟා කර ගැනීමයි. වර්තමාන ලෝක දේශපාලන තත්ත්වයන් හමුවේ මෙවැනි ද්විපාර්ශ්වික ගිවිසුමක් ඇති කර ගැනීම අප රටට ඉතා වැදගත් වෙනවා.

අදාළ ගිවිසුම සහ එහි අන්තර්ගත කරුණු පිළිබඳව ඇමෙරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකා රජය අතර රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ මූලික සාකච්ඡා වට කීපයක්ම පවත්වා තිබෙනවා. අනතුරුව ත්‍රිවිධ හමුදාපතිවරුන්, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ ජනරාල් සහ ආරක්ෂක අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡා වට කීපයක් සහ තාක්ෂණික මට්ටමේ සාකච්ඡා පවත්වා තිබෙනවා. කෙසේ වෙතත්, ඇමෙරිකානු රජය මෙම ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධයෙන් අප වෙත පිළිතුරක් ලබාදීමට තවත් කාලයක් අවශ්‍ය බව දැනුම් දී තිබෙනවා.

පෙර ගිවිසුම හා නව යෝජිත ගිවිසුම අතර ඇති ප්‍රධාන වෙනස වන්නේ ගිවිසුමේ දක්වා ඇති වලංගු කාලසීමාවයි. පැරණි ගිවිසුම අනුව ගිවිසුම්ගත එක් පාර්ශ්වයක් විසින් දින 180කට පෙර අනෙක් පාර්ශ්වය වෙත කරන ලද පූර්ව දැනුම්දීමකින් පසුව එම ගිවිසුම අවලංගු කරනු නොලැබුවහොත්, වසර 10ක් සඳහා එම ගිවිසුම බලපැවැත්වෙනවා. නමුත්, නව යෝජිත ගිවිසුම සඳහා නිශ්චිත කාලසීමාවක් නොමැති අතර ඕනෑම අවස්ථාවකදී එක් පාර්ශ්වයක් විසින් දින 180කට පෙර අනෙක් පාර්ශ්වයට කරනු ලබන පූර්ව දැනුම්දීමකින් අනතුරුව අදාළ ගිවිසුම අවලංගු කිරීමට හැකියාව තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අගමැතිතුමනි, ඔබතුමා ඔය කියන ගිවිසුම අත්සන් කළාද කියා මා දැන ගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
තවම නැහැ. කටයුතු කරමින් පවතිනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එම නිසා මා ඔබතුමාට යෝජනා කරනවා, ගිවිසුම අත්සන් කිරීමට පෙර ඒ ගැන පාර්ලිමේන්තුවේදී විධිමත් සාකච්ඡාවක් පැවැත්වීමට අවස්ථාව දෙන්න කියලා. මොකද, එවකට සිටි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහත්මයාත්, ඇමෙරිකානු තානාපති රොබට් ඕ. බ්ලේක් මහත්මයාත් 2007 වසරේදී මේ ගිවිසුම අත්සන් කළේ. ඒ කාලයේ මේ ගිවිසුම ගැන කිව්වේ, "ඇමෙරිකන් පුරවැසියෝ දෙදෙනෙක් ඇමෙරිකාව වෙනුවෙන් අත්සන් කරපු ගිවිසුමක්" කියලායි. මෙය විශාල ලෙස සාකච්ඡාවට බඳුන් වුණු ගිවිසුමක්. අවුරුදු 10ක් ඉක්මවා ගියාට පසුව ඒ ගිවිසුම අවලංගු වී තිබෙනවා. එම නිසා බැලූ බැල්මට නව ගිවිසුමක් අත්සන් කිරීම තමයි ඔබතුමන්ලාට දැන් පැවරී තිබෙන්නේ. මේ නව ගිවිසුම අත්සන් කිරීමට පෙර මෙම පාර්ලිමේන්තුව තුළ විධිමත් සාකච්ඡාවක් සිදු කිරීමට ඔබතුමා අවස්ථාවක් දෙනවාද? පාර්ලිමේන්තුවේ ඇති කරන ලද විවාදයකින් පසුව මෙම ගිවිසුම අත්සන් කරන්න කියන එක තමයි අපේ යෝජනාව.

ඔබතුමා දන්නවා අද ලෝකයේ, දේශපාලනය වෙනස් වී තිබෙන බව. වෙන වෙන කඳවුරු නිර්මාණය වී තිබෙනවා. ආර්ථික කඳවුරු නිර්මාණය වෙමින් තිබෙනවා. එම නිසා විදෙස් ප්‍රතිපත්තිය අනුගමනය කිරීමේදී අපිත් ස්වාධීනව එළඹෙන ගිවිසුම් අතිශයින් වැදගත්. එම ගිවිසුම කවුරු හෝ පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇති වන ගිවිසුමක් නොවෙයි; පවුල් දෙකක් අතර ඇති වන ගිවිසුමක් නොවෙයි. ශ්‍රී ලංකා රාජ්‍යය සහ ඇමෙරිකානු රාජ්‍යය අතර ඇති වන ගිවිසුමක්. එම නිසා, එකී ගිවිසුම අත්සන් කිරීමට පෙර මෙම පාර්ලිමේන්තුව තුළ විවාදයක් පැවැත්විය යුතුයි කියන එක තමයි ගරු කථානායකතුමනි, මගේ යෝජනාව. ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන්න කියා ගරු අගමැතිතුමනි, ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි ගිවිසුම් අත්සන් කළායින් පස්සේයි ගරු සභාවට ලබා දෙන්නේ. ඊට පෙර විවාදයක් අවශ්‍ය නම්, මම සාකච්ඡා කරලා දැනුම් දෙන්නම්.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Member?

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Sir, there is no Tamil interpretation being provided.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි මෙතැනදී නොබැඳි පිළිවෙතින් ඉවත් වෙලා නැහැ. මෙය ආරක්ෂක ගිවිසුමක් නොවෙයි. ඒ ගැන පාර්ලිමේන්තුවේ සාකච්ඡාවක් වුවමනා නම්, මම සාකච්ඡා කරලා දැනුම් දෙන්නම්.

ජන ජීවිතයට බලපාන ගැටලු විසඳීම සඳහා කඩිනම් පියවර ගැනීම : ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

மக்களின் வாழ்வைப் பாதிக்கும் விடயங்களைத் தடுப்பதற்கான துரித நடவடிக்கை : மாண்புமிகுபிரதம அமைச்சரினது கூற்று

IMMEDIATE ACTION TO ARREST ISSUES AFFECTING PUBLIC LIFE: STATEMENT BY HON. PRIME MINISTER

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඊයේ දිනයේ -2017.06.20- මතු කළ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ගරු කථානායකතුමනි, දැනට උතුරු, නැඟෙනහිර, උතුරු මැද හා වයඹ පළාතෙන් කොටසකට නියඟය හේතුවෙන් බලපෑම් ඇති වී තිබෙනවා. එම නියඟය නිසා දුෂ්කරතාවට පත්ව සිටින ජනතාවට සහන සැලසීමට රජය විසින් අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග ගනිමින් සිටිනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

උතුරු, නැඟෙනහිර හා රජරට ප්‍රදේශවල ස්ථාපිත ජාතික ජල සම්පාදන ක්‍රම මඟින් අඛණ්ඩව ජල සැපයුම සිදු කෙරෙන නිසා එම ප්‍රදේශවල පානීය ජල සැපයුමට බාධාවක් වී නැහැ. ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් ආවරණය නොවන ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතාව සැපිරීම සඳහා එම මණ්ඩලය මඟින් පිරිසිදු කෙරෙන ජලය බවුසර් මඟින් බෙදාහැරීම සිදු කරනු ලබනවා. විශේෂයෙන්ම උතුරු පළාතේ නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහනයක් වශයෙන් මේ වසරේ ජලය බෙදා හැරීම සඳහා රුපියල් මිලියන 2කට අධික මුදලක් වැය කර තිබෙනවා. ඊට අමතරව මුලතිව්, යාපනය, කිලිනොච්චි, මන්නාරම, වවුනියා දිස්ත්‍රික්කවලට ලීටර් 4500ක ධාරිතාව සහිත ට්‍රැක්ටර් බවුසර් 26ක් සහ ජල ටැංකි 1300ක් ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් උතුරු, උතුරු මැද හා නැඟෙනහිර පළාත් මුල් කර ගනිමින් කෘෂි ළිං ප්‍රතිසංස්කරණය කිරීමට ජල පොම්ප හා ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල ලබා දීම වාගේම අමාත්‍යාංශය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වෙන්වූ ප්‍රතිපාදන යටතේ සුළු වාරිමාර්ග අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරමින් පවතිනවා. කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් උතුර, උතුරු මැද හා නැඟෙනහිර පළාත්වල 2016/17 මහ කන්නයේ නියඟය නිසා වගා හානි වූ හා වගා කිරීමට නොහැකිව අසරණ වූ වී හා අතුරු බෝග වවන ගොවි පවුල් ඒකකයක් සඳහා රුපියල් 10,000 බැගින් වන්දි මුදල් ලබා දීමට මේ වන විට කටයුතු කර තිබෙනවා. 2017 යල කන්නයේ බෝග වර්ග 6ක් සඳහා රුපියල් 40,000 බැගින් වූ රක්ෂණ ආවරණ ක්‍රමයක් ලබා දීමට මේ වන විට සැලසුම් කර තිබෙනවා. මේ වන විට එහි ප්‍රතිරක්ෂණ ක්‍රියාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය දිනවල ප්‍රධාන වශයෙන් කළුතර, රත්නපුර, ගාල්ල, මාතර දිස්ත්‍රික්කවල ඇති වුණු ගංවතුර හා නායයෑම් තත්ත්වය ගැන පැවසීමේදී මා අවධාරණය කර සිටින්න කැමතියි, රජය විසින් ගත යුතුව තිබූ සියලුම ක්‍රියා මාර්ග කඩිනමින් ගනු ලැබූ බව. විශේෂයෙන්ම දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ඇතුළු රාජ්‍ය නිලධාරීන් හරහා කඩිනම් සහන සැලසීමට රජය විසින් කටයුතු කරනු ලැබුවා. ගංවතුර තත්ත්වය ඇති වීම ආරම්භවීමත් සමඟ දිසාපති සම්මේලනය සඳහා කොළඹට පැමිණ සිටි දිසාපතිවරුන් වහාම ඒ ඒ දිස්ත්‍රික්කවලට පිටත් කර හැර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙත උපදෙස් ලබා දුන්නා.

ඒ විතරක් නොවෙයි. ගරු ජනාධිපතිතුමා ඒ ප්‍රදේශවලට ගොස් අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කළා. එසේම කිසිදු ආකාරයකින් ආපදා සහන සඳහා මුදල් හිඟයක් ඇති නොවන ලෙස වග බලාගන්නා ලෙසත්, අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත කිසිදු ප්‍රමාදයකින් තොරව ලබාදෙන ලෙසත් ගරු ජනාධිපතිතුමා හා මා විසින් මුදල් අමාත්‍යාංශයට උපදෙස් දෙනු ලැබුවා.

එදා පාර්ලිමේන්තුව රැස්වෙලා තිබුණා. අපේ පක්ෂ නායකයන්ගේත්, මන්ත්‍රීවරුන්ගේත් සහයෝගය ලැබුණා. ඒ වාගේම ඒ සිකුරාදා අර්නස්ට් ද සිල්වා මාවතේ අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ අපි වෙනම මධ්‍යස්ථානයක් ආරම්භ කරලා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කෝලිත ගුණතිලක මැතිතුමා යටතේ වැඩ කටයුතු මෙහෙයවුවා. මෙම ආපදා තත්ත්වය නිසා පවුල් 1,47,920ක් බලපෑමට ලක්ව තිබෙන බවත්, පුද්ගලයන් 213ක් මිය ගොස් 77දෙනකු අතුරුදන්ව තිබෙන බවත්, නිවාස 3,115ක් පූර්ණ වශයෙන් සහ 19,996ක් අර්ධ වශයෙන් හානියට පත්ව තිබෙන බවත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් වාර්තා කර තිබෙනවා. එසේම මා විදේශගතව සිට දිවයිනට පැමිණි පසු, පසු ගිය 15, 16 දිනවල බුලත්සිංහල, අයගම, නෙළුව, දෙනියාය, කොටපොල ප්‍රදේශවල සංචාරය කළා. ඒ සංචාරයේදී රාජ්‍ය නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවලදී ඒ ප්‍රදේශවල සියලු අවශ්‍යතා සොයා බලා කටයුතු කරන්න මා උපදෙස් ලබා දුන්නා.

මේ වනවිට ගංවතුර හා නායයෑම් ආපදාවලින් විපතට පත් වූවන් සඳහා ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ රුපියල් මිලියන 125ක් වෙන්කර තිබෙනවා. එසේම හානි වූ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රුපියල් මිලියන 250ක් යොදා ගනිමින් කඩිනම් සහන සැලසීමට අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඊට අමතරව නිවාස ඉදිකිරීම සඳහා විදුලි සංදේශ අරමුදලින් රුපියල් බිලියන පහක මුදලක් ලබා දීමටත් ගරු ජනාධිපතිතුමා උපදෙස් ලබා දී තිබෙනවා. මෙයට වුවමනා රුපියල් බිලියන 17න් මා හිතන හැටියට දැන් අපට රුපියල් බිලියන 15ක් පමණ භාණ්ඩාගාර අරමුදලෙන් හා විදේශ ආධාරවලින් ලබාගන්න පුළුවන්වෙලා තිබෙනවා.

එසේම අග්‍රහාර අරමුදලෙන් රුපියල් බිලියන පහළොවක මුදලක් වෙන්කර තිබෙනවා. කඩිනම් ආපදා සහන සේවා සඳහා ලෝක බැංකුවෙන් හා ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් බිලියන දෙකකට ආසන්න මුදලක් ලබා දී තිබෙනවා.

ඒ යටතේ ආපදාවට ලක්වූවන්ට පානීය ජලය ලබාදීම, පිසූ ආහාර ලබාදීම, වියළි සලාක ලබාදීම, අවමංගල්‍ය සහනාධාර ලබාදීම මෙන්ම කඳවුරු සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන ලබාදීම සිදුකරනු ලැබුවා. නිවාස හානි තක්සේරු කර අදාළ වන්දි මුදල් ලබාදෙන තුරු මූලික පහසුකම් සපයාගැනීම සඳහා විපතට පත් පවුල්වලට රුපියල් 10,000ක් බැගින් වූ අත්තිකාරම් මුදලක් ලබාදීමට අප මේ වනවිට කටයුතු කරමින් පවතිනවා. ආපදා තත්ත්වය බලපෑ ප්‍රදේශවල හානි තක්සේරු අයදුම්පත් ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කළ පසු අදාළ වන්දි මුදල් කඩිනමින් ලබා දීමට කටයුතු කරන බව මා ප්‍රකාශ කරන්න කැමැතියි.

පූර්ණ වශයෙන් හා පදිංචියට නුසුදුසු ලෙස නිවාස හානි වී ඇති පවුල් හා නායයෑම් අධිඅවදානම් තත්ත්වය හේතුවෙන් නිවාසවලින් ඉවත් කර ඇති පවුල් සඳහා මසකට රුපියල් 7,500 බැගින් වූ ගෙවල් කුලී දීමනාවක් ජුනි, ජූලි, අගෝස්තු මාස සඳහා ලබාදීමට පියවර ගෙන තිබෙනවා.

එසේම දැනට අධිඅවදානම් කලාපවල ජීවත්වන ජනතාවට විකල්ප ඉඩම් ලබාදීමටත් කටයුතු කරමින් සිටිනවා. මේ සඳහා වැවිලි සමාගම්වල ඉඩම් හා වෙනත් රජයේ ඉඩම් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් හඳුනාගෙන තිබෙනවා. ඒවා ලබා ගැනීමට දැන් සාකච්ඡා කරමින් සිටිනවා.

එසේම ආපදාවට ලක් වූ ප්‍රදේශවල ජනතාව රජයේ හා පෞද්ගලික බැංකුවලින් ලබාගත් සියලු ණය සඳහා මාස 03ක සහන කාලයක් ලබාදීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලැබුවා. ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ වනවිට නිකුත් කර අවසන්. එසේම, හානියට පත් ප්‍රදේශවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නඟා සිටුවීම සඳහා අවශ්‍ය සහන ණය ලබාදීමට රුපියල් බිලියන 02ක මුදලක් වෙන්කරන ලෙසට අවශ්‍ය උපදෙස් ලබාදී තිබෙනවා.

මීට අමතරව හානියට පත් ප්‍රදේශවල අපොස සාමාන්‍ය පෙළ හා අපොස උසස් පෙළ සිසුන් සඳහා පාඩම් සටහන් ඡායා පිටපත්

කිරීමට දීමනාවක් ලබාදීමටත්, අපොස උසස් පෙළ විභාගය සඳහා වැඩිපුර අවස්ථාවක් ලබාදීමටත් කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යතුමා වෙත උපදෙස් ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, එසේම, මෙම ආපදා තත්ත්වය හේතුවෙන් සිදු වූ ආර්ථික බලපෑම පිළිබඳ වාර්තාවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කළා. ගංවතුර හා නායයෑම් තත්ත්වය හේතුවෙන් සිදු වූ හානි පිළිබඳ තක්සේරු වාර්තාවක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් සකස් කළා. මෙම වාර්තා දැනට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා වෙනත් ජාත්‍යන්තර ආයතන වෙත ලබාදී තිබෙන අතර ඉදිරියේදී ඔවුන්ගෙන් ලබාගත හැකි ආධාර උපකාර පිළිබඳ වැඩදුරටත් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය දිනවල පැවති වර්ෂාවත් සමඟ ඩෙංගු රෝගය පැතිර යෑමේ වර්ධනයක් සිදුව තිබෙනවා. මෙම තත්වය යටතේ මේ වසරේ දැනට ඩෙංගු රෝගීන් 60,850 ක් පමණ වාර්තා වී ඇති අතර මරණ සංඛ්‍යාව 200ක් වශයෙන් වාර්තා වී තිබෙනවා. මෙම තත්වය සමනය කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කිහිපයක් මම මේ සභාවට ඉදිරිපත් කරන්න කැමතියි.

- ඩෙංගු මර්දනය සඳහා ජනාධිපති කාර්ය සාධක බළකාය ක්‍රියාත්මක කර ජනාධිපතිගේ ප්‍රධානත්වයෙන් සියලු අදාළ අමාත්‍යාංශවල අමාත්‍යවරු, පළාත් ඇමතිවරුන්, ප්‍රධාන අමාත්‍යවරුන්, එම අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ සෞඛ්‍ය ලේකම්වරුන් සමඟ එක්ව ඩෙංගු මර්දන විශේෂිත වැඩසටහන් පිළිබඳව සති දෙකකට වරක් සාකච්ඡා කොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අදාළ අමාත්‍යාංශවල ලේකම්වරු හා එම කාර්ය මණ්ඩලය එක්ව සතියකට වරක් ඉහත කාර්ය බළකායේ තීරණ, ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම හා අධීක්ෂණය කිරීම.
- ඩෙංගු රෝගීන් හඳුනාගත් විගස එම නිවෙස් ආශ්‍රිතව දින දෙකක් ධූමායනය කිරීම සඳහා කටයුතු කිරීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ රේඛීය රෝහල් සහ පළාත් රෝහල්වල හදිසි ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරීම.
- දැනට රෝහල්වල අධිසත්කාර ඒකක 100කට අධික ප්‍රමාණයක් ස්ථාපිත කර ඇති අතර එම සංඛ්‍යාව 500ක් දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම.
- බාහිර ප්‍රතිකාර අංශවල උණ රෝගීන් සඳහා වෙනම අංශ පිහිටුවීමට උපදෙස් ලබාදීම.
- සමහර කුඩා රෝහල් ඩෙංගු රෝගය සඳහා ප්‍රතිකාර සඳහා පමණක් යොදා ගැනීමට කටයුතු කිරීම.
- පෞද්ගලික රෝහල් හා රසායනාගාරවලින් පූර්ණ රුධිර පරීක්ෂණය - Full Blood Count - හා ඩෙංගු ප්‍රතිදේහ පරීක්ෂණය - Dengue Antigen Test - සඳහා අය කළ යුතු ගාස්තුව පිළිවෙළින් රුපියල් 250ක් හා රුපියල් 1,000 ක් ලෙස අඩු කිරීමට කටයුතු කිරීම.
- සියලු ප්‍රධාන රෝහල්වල ඩෙංගු ප්‍රතිකාර සඳහා විශේෂ වාට්ටු ඇති කිරීම.
- ඩෙංගු මදුරු කීටයන් බෝකිරීමට අනුබල දෙන පුද්ගලයන්ට එරෙහිව දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම. මේ වසරේ මේ දක්වා නඩු 25,000ට අධික ප්‍රමාණයක් පවරා තිබෙනවා.
- ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ සහායෙන් වැඩි අවදානම් ප්‍රදේශවල දීප ව්‍යාප්ත ඩෙංගු මර්දන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

ඊයේ සෞඛ්‍ය ඇමති රාජිත සේනාරත්න මැතිතුමා මේ සභාවට මේ ගැන විස්තර කළා.

ගරු කථානායකතුමනි, මේ ආකාරයට රජය විසින් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහාත්, ඩෙංගු රෝගීන්ට කඩිනමින් ප්‍රතිකාර කිරීම සඳහාත් ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබෙන බව අවධාරණය කරන්න කැමතියි. රජය කිසිසේත් මෙම ඩෙංගු ව්‍යසනය සුළුකොට තකන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අප හමුවේ ඇති අභියෝගය නම් මෙම ආපදා තත්ත්වයට සාර්ථකව මුහුණ දෙමින් ආරෝකයේ වර්ධන වේගය තවදුරටත් එලෙසම රඳවා ගැනීමයි. මේ සඳහා විශේෂයෙන් ග්‍රාමීය මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කර කුඩා පරිමාණ ව්‍යාපාරවල නිරතවූවන් නැවත එම ව්‍යාපාර සඳහා යොමු කළ යුතුයි. අපි මෙම අභියෝගය ජය ගනිමින් මෙම ආපදාවෙන් සමස්ත ආර්ථිකයට වන බලපෑම අවම කර ගැනීමට හැකි සෑම පියවරක්ම ගනිමින් සිටිනවා.

මෙම ආපදා අවස්ථාවේදී පක්ෂ, පාට නොබලා සියලු මහජන නියෝජිතයන් ඉතා කැපවීමෙන් අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. මා ඉදිරියටත් ඒ සහයෝගය අපේක්ෂා කරනවා. මා මේ අවස්ථාවේදී ඉතා කැපවීමෙන් රාජකාරි කටයුතු කරන ලද දිසාපතිවරුන්ටත්, ප්‍රාදේශීය ලේකම්වරුන්ටත්, ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ඇතුලු සියලු රාජ්‍ය නිලධාරීන් වෙතත් රජය වෙනුවෙන් මාගේ ස්තුතිය පළ කර සිටින්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම අහපු තුන්වැනි ප්‍රශ්නයට අගමැතිතුමා උත්තරයක් දෙනවා නම් මම අගය කරනවා. අගමැතිතුමාත්, අපිත් පිළිගන්නවා, රටම අද ගැඹුරු තත්ත්වයකට මුහුණ දෙමින් තිබෙන බව. මේ පිළිබඳ තොරතුරු හැම මන්ත්‍රීවරයෙකුට ලබා ගැනීමට හැකිවෙන පරිදි පාර්ලිමේන්තුවේ Standing Committee එකක් පත් කරන්න. ගං වතුර, ඩෙංගු උවදුර වාගේම අනෙකුත් ආපදා ගැනත් ඒ කොමිටියට බලන්න පුළුවන්.

ගිය අවුරුද්දේ කොස්ගම හමුදා කඳවුර ගිනි ගත්තා; ඊයේ කොස්ගම හන්දිය ගිනි ගත්තා. ඒ වාගේ විපත්වලදී monitor කරන්න පුළුවන් Standing Committee එකක් පත් කරන්න; a Standing Committee that will monitor whatever the decisions and advices the Government has sent down the line be appointed. ගරු අගමැතිතුමනි, රජයේ ඉඩමක් ගන්න ගියාම, ඔබතුමා කියනවා දෙන්න කියලා. දිසාපතිතුමාත් කියනවා, දෙන්න කියලා. නමුත් ඉඩම ගන්න බැහැ. මම ඊයේත් ඇමතිතුමා එක්ක ඒ ගැන කථා කළා. මේක ඉක්මන් කළ හැකි ක්‍රියා මාර්ගයක් monitor වෙන්න ඕනෑ. තාවකාලිකව ගෙයක් හදාගෙන පදිංචි වෙන්න හෝ අවතැන් වූ අයට තැනක් තිබෙන්න ඕනෑ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Do you want the Oversight Committee to do it or a separate Standing Committee be appointed?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You can cope up. The relevant Minister must preside the Committee.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
You can talk it over at the next Party Leaders' Meeting and let me know.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා ගොවි පවුලකට රුපියල් 10,000 ගණනේ දුන්නාය කියලා. අපේ හිටපු මුදල් ඇමතිතුමා පසු ගිය අප්‍රේල් මාසයේ ඒ මුදල්වලින් සමහර අයට රුපියල් 10,000, රුපියල් 8,000 ආදී වශයෙන් බෙදලා තිබෙනවා. ඒක හරි. නමුත්, සමහර ගොවීන්ට ඒක ලැබුණේ නැහැ. අපේ ඉල්ලීම වන්නේ මේකයි. මේ සෑම ගොවි පවුලකම අතුරු පවුල් තිබෙනවා. ගොවිතැන විනාශ වුණාම අතුරු පවුලේ ආර්ථිකයත් කඩා හැළෙනවා. ගරු අගමැතිතුමනි, ඔබතුමාගේ පිටුපස පේළියේ සිටින අපේ ගරු චන්ද්‍රානි බණ්ඩාර ඇමතිතුමියගෙන් අහලා බලන්න. මේ තත්ත්වය තුළ අනෙක් පවුල්වලට මේ සහනාධාර ලැබුණේ නැහැ. ඒක නිසා විශාල ගැටලුවක් ඇති වී තිබෙනවා. ඒ මිනිසුන් සම්බන්ධයෙන් කරන්න පුළුවන් මොකක්ද කියන එක ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අගමැතිතුමනි, ඔබතුමාගේ පිළිතුරත් එක්ක පැන නඟින ප්‍රශ්නයක්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පසු ගිය කාලයේ විශාල නියඟයක් මතු වුණා. ඒ හේතු කොට ගෙන කුඹුරු විශාල ප්‍රමාණයක් වගා කරන්න බැරිවුණා. ජනාධිපතිවරයා පොළොන්නරුවේ රැස්වීමකදීත්, ඒ වාගේම තවත් අවස්ථාවකදීත් ප්‍රකාශ කරලා තිබුණා මා දැක්කා, මේ සෑම පවුලකටම මාසයකට රුපියල් 10,000 ගණනේ මාස හතරක් දක්වා දෙනවාය කියලා. ගරු කථානායකතුමනි, එහෙම දුන්නොත් මාස හතරට රුපියල් 40,000ක් වෙනවා. නමුත් එක මාසයක් විතරයි ඒ මුදල ලබා දුන්නේ. රක්ෂණයකට කියලා රුපියල් 1,350ක විතර මුදලක් කපා ගෙන, රුපියල් 8,650ක් වාගේ මුදලක් තමයි ඒ මාසයේත් ලබා දුන්නේ. ඒක අප්‍රේල් මාසයේ දුන්නා. ඒ මාසයෙන් පසුව කිසිදු මුදලක් ඒ අයට ලැබෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ගොවි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ගොවිතැන කියලා ඔබතුමා දන්නවා. එක කන්නයක් අත් හැරුණාම ඊළඟ කන්නයේ අස්වැන්න එන තෙක් ජීවත් වෙන්න විධියක් නැහැ. ඒ නිසා දැන් ඒ අය විශාල දුෂ්කරතාවකට පත් වී තිබෙනවා. නමුත්, ජනාධිපතිවරයා විසින් අවස්ථා දෙකකදී ප්‍රකාශ කරලා තිබුණා ගොවි පවුලකට මසකට රුපියල් 10,000 බැගින් ලබා දෙනවා කියලා. එක මාසයක රුපියල් අටදහස් ගණනක් ලබා දී තිබෙනවා. ඉතිරි ඒවා ලබා දෙන්නේ කවදාද කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මම ඒ තොරතුරු ලබා ගෙන දැනුම් දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විදේශ කටයුතු ඇමතිතුමා.

කටාර් රාජ්‍යයෙහි වර්තමාන තත්ත්වය: විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
கட்டார் நாட்டின் தற்போதைய நிலைமை : வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று
CURRENT SITUATION IN QATAR: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS

ගරු රවී කරුණානායක මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Foreign Affairs)
ගරු කථානායකතුමනි, මැද පෙරදිග ඇති වී තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් බොහෝ දෙනා නොයෙක් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ නිසා නිවැරැදි තත්ත්වය මේ ගරු සභාවේදී පැහැදිලි කිරීම මා සතු කාර්ය භාරයක් ලෙස මා සලකනවා.

කටාර්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන්, සෞදි අරාබිය හා ඊජිප්තුවේ තානාපති කාර්යාල හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය වත්මන් තත්ත්වයේ වර්ධනයන් ඉතා සමීපව

නිරීක්ෂණය කරනු ලබන අතර, කටාර් හි විදේශ අමාත්‍ය එච්.එච්. මොහොමඩ් බින් අබ්දුල්රාහ්මන් බින් ජසීම් අල් තානි මහතා සමඟ සෘජු දුරකතන සංවාදයකද, කටාර් හි තානාපති අතිගරු රසීඩ් ශාෆි අල් මාර්රි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපති අතිගරු අබ්දුල්හමීඩ් අබ්දුල්ෆටා කාසිම් අල් මුල්ලා, ඊජිප්තු තානාපති අතිගරු හිෂාම් අසාන් සහ සෞදි අරාබියේ තානාපති වෙනුවට වැඩ බලන, මම්දුහ් මොහොමඩ් අලි අලාෆ් යන මහත්වරු කොළඹදී අඛණ්ඩව මුණ ගැසී ගල්ෆ් ගලාපයේ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළෙමි.

ගරු කථානායකතුමනි, ගල්ෆ් කලාපයේ රටවල් අතරින් ශ්‍රී ලාංකිකයන් නෙරපීම පිළිබඳ සලකා බලන ඇස්තමේන්තුගත තොරතුරු මෙසේය:

සෞදි අරාබිය	- 193,000
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	- 125,000
කටාර්	- 150,000
බහරේන්	- 18,000

කටාර් හි වෙසෙන ශ්‍රී ලංකාවාසීන් අයත් වන කාණ්ඩයන් අතරට නිපුණ ශ්‍රමය, අර්ධ නිපුණ ශ්‍රමය, මධ්‍යස්ථ මට්ටම, ලිපිකරුවන්, ගෘහ සේවිකාවන් මෙන්ම වෛද්‍යවරු, ගණකාධිකාරිවරු, ඉංජිනේරුවන්, ප්‍රමාණ සමීක්ෂණ සැලසුම්කරුවන්, බැංකුකරුවන්, නියමුවන්, කාර්යාල කළමනාකාරවරුන් යනාදී වෘත්තීයවේදීන් ඇතුළත් වෙනවා. එහි කිසිම භයක් නැතිව ඒ අය ජීවත් වෙන වාතාවරණයක් ඇති වෙලා තිබෙනවා. මම හිතන විධියට කටාර්වලට වැඩිය ලංකාවේ ජීවත් වෙන අයට මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. අපි හැම දවසකම එම සියලු රටවල් සමඟ කථා කරලා ලංකාවත් එක්ක කිට්ටු සම්බන්ධකමක් ඇති කර ගන්නට කටයුතු කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඇතිවූ තත්ත්වය සම්බන්ධයෙන් කලාපයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් කැළඹීමටත්, වික්ෂිප්තභාවයටත් පත්වූ බවක් පෙනෙන්නට තිබුණු බව මා මේ ගරු සභාවට දන්වනු කැමැත්තෙමි. කෙසේ වෙතත්, එහි තත්ත්වය ස්ථාවර හා සන්සුන් බව කටාර් හි බලධාරීන් සහතික කර තිබේ. කටාර් හි පවතින වත්මන් තත්ත්වය හේතුවෙන් කිසිදු ශ්‍රී ලාංකිකයෙක් හෝ ශ්‍රී ලංකා ව්‍යාපාරයකට බලපෑමක් සිදුවී ඇති බවට වාර්තා වී නොමැත.

ගරු කථානායකතුමනි, මාගේ උපදෙස් පරිදි, 2017 ජූනි 14 වැනි දින කටාර් හි ශ්‍රී ලංකා තානාපතිවරයා ශ්‍රී ලංකා සංවිධාන 22ක ශ්‍රී ලාංකිකයන් 300කට ආසන්න පිරිසක් දෝහා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට කැඳවා, මතුව ඇති තත්ත්වය සහ හදිසි අවස්ථාවකදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කළා. නමුත්, එතුමා ප්‍රකාශයක් කර තිබුණා. මා හිතන විධියට මේ සම්බන්ධයෙන් කර තිබූ වැරදි ප්‍රකාශයට නිවැරදි කිරීමක් කර තිබුණා. අප අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් නිර්දේශ අනුව තානාපතිවරුන්ට දැනුම් දීලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන්න ඉස්සෙල්ලා අමාත්‍යාංශයෙන් අවසර ලබා ගෙන කටයුතු කරන්න කියලා. සෑම අවස්ථාවකම අප මේ රටවල් 05ත් සමඟ සාකච්ඡා කරමින් කිසිදු ප්‍රශ්නයක් ඇති නොවන ආකාරයට කටයුතු කර තිබෙනවායි කියන එක මේ අවස්ථාවේදී මා වගකීමකින් යුතුව ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, තවද, මේ රටවල බලධාරීන් ශ්‍රී ලාංකීය ජාතිකයන් වෙත ඔවුන්ගේ අඛණ්ඩ සහය සහතික කර සිටි අතර, වත්මන් තත්ත්වය සම්බන්ධයෙන් කිසියම් සහයක් හෝ උපදෙස් අවශ්‍ය නම් සෑම ශ්‍රී ලාංකිකයකුටම කටාර්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා සම්බන්ධ වන ලෙස දන්වා තිබෙනවා. ඒ සඳහා පැය 24ම සේවය ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශයේත් පැය 24ම වැඩ කරන්න පුළුවන් පුද්ගලයන් තුන් දෙනකු යොදවා තිබෙනවා. වැඩි කල් යාමට පෙර මා ඒ ගැන ප්‍රසිද්ධ කරන්නම්.

ගරු කථානායකතුමනි, කටාර් රාජ්‍යය ලොව පොහොසත්ම රටවලින් එකක් බව අප සැලකිල්ලට ගත යුතු වනවා සේම, 2016 වසරේ එරට ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් 129,000ක් වනවා. ගල්ෆ් සහයෝගිතා කවුන්සලය, බහරේන්, සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඔවුන්ගේ මිත්‍ර පාර්ශ්වය වන ඊජිප්තුව සමඟ එක්ව කටාර් රාජ්‍යය සමඟ රාජතාන්ත්‍රික සබඳතා නතර කළ අතර, ගල්ෆ් සහයෝගිතා කවුන්සලයේ තවත් රටවල් දෙකක් වන ඕමානය සහ කුවේට් අපක්ෂපාතී පිළිවෙතක් අනුගමනය කරමින් කටාර් රාජ්‍යය සමඟ අඛණ්ඩව රාජතාන්ත්‍රික සබඳතා සහ වාණිජ සබඳතා පවත්වාගෙන යාමට කටයුතු කරයි.

ගරු කථානායකතුමනි, 2017 ජූනි 14 වැනි දින ඇමෙරිකානු එක්සත් ජනපදය ඩොලර් බිලියන 12ක වටිනාකමකින් යුත් F15 ප්‍රහාරක ජෙට් යානා මිලදී ගැනීමේ ගිවිසුමකට අත්සන් තබන බවද මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ තුළින් අපට පෙනෙනවා දැනට තිබෙන වාතාවරණය සුහද තත්ත්වයකට පරිවර්තනය වෙමින් පවතින ආකාරය. මේ සම්බන්ධයෙන් මීට වඩා දැනුවත් කරන්න අවශ්‍ය වුවහොත් අප පාර්ලිමේන්තුව දැනුවත් කරන්නම්. මා සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, මෙවැනි ප්‍රකාශ කරමින් රටක ජාත්‍යන්තර ප්‍රතිපත්තිය එක්ක සෙල්ලම් කිරීමක් නොකර, අපෙන් අහලා කරුණු සාක්ෂාත් කරගෙන කටයුතු කරන ලෙස. එහෙම නැත්නම් රටක් වෙනුවෙන් මෙවැනි ප්‍රකාශ කරන්න එපායි කියන එක මා කාරුණිකව මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහන්න අවසර ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුරු දෙන්න සූදානම්ද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සූදානම්.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම කටාර් රාජ්‍යය කියන්නේ ශ්‍රී ලාංකිකයන් විශාල සංඛ්‍යාවක් සේවය කරන රටක්. විශේෂයෙන් කාන්තාවන් වැඩි පිරිසක් සේවය කරන රටක්. එම රටේ රැකියාවල යෙදෙන අයගේ රැකියාව, ඒ අයගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු අමාත්‍යාංශය විධියට ඔබතුමා ඒ සම්බන්ධයෙන් යම් තහවුරු කිරීමක් කරනවාද? ඒ වාගේම -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ ප්‍රකාශයේදී ඒ ගැන සඳහන් වුණා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු ඇමතිතුමනි, මාසය අවසාන වන කොට ඒ හැම සේවකයකුගේම ගෙවල්වලින් ඒ අයගේ වැටුප එනතුරු බලාගෙන ඉන්නවා. මොකද, දුප්පත් අය තමයි පිට රට සේවයට ගිහිල්ලා තිබෙන්නේ. මේ අයගේ වැටුප් නිසි පරිදි ලබා දීමට අවශ්‍ය පියවර ගන්නවා ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එතුමිය මා කළ ප්‍රකාශයට ඇහුම්කන් දුන්නා නම් මේ ප්‍රශ්නය අහන්න අවශ්‍ය වන්නේ නැහැ. නමුත්, එතුමිය උනන්දුවෙන් මේ ප්‍රශ්නය අහපු නිසා ඒකට උත්තර දීම මගේ යුතුකමක්. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය සඳහන් කරන කාරණය සම්බන්ධයෙන් කිසි සේත්ම භය වෙන්න අවශ්‍යතාවක් නැහැ. මා හිතන විධියට එහෙ අයට වැඩිය ඔබතුමිය භය වෙලා තිබෙනවා. එහෙ සිටින අයට නියමිත වෙලාවට වැටුප් ලබා ගන්න හැකියාව තිබෙනවා. දැන් වනතුරු කිසිම විධියකින් එතැන ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. ආහාර භීතියක් ඇති වෙලාත් නැහැ. මේවා සම්බන්ධයෙන් මවා පෑමකුයි තිබෙන්නේ. මේකට දේශපාලනය ඇදා ගැනීමක් කරන්නයි හදන්නේ. ඒ නිසා තමයි මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළේ. ඔබතුමිය කියන විධියට එහෙම කිසිදු ප්‍රශ්නයක් ඇති වෙන්නෙත් නැහැ, වැඩි කල් යන්නට පෙර මේ ප්‍රශ්නය නිරාකරණය වෙලා ඔබතුමියගේ ඔය ප්‍රශ්නයට සදාකාලික පිළිතුරක් ලැබේවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, බොහොම ස්තුතියි. මීළඟට, ප්‍රධාන කටයුතු.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත
சுகததாச தேசிய விளையாட்டுகள் கட்டிடத்தொகுதி அதிகாரசபை (திருத்தம்) சட்டமூலம்
SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY (AMENDMENT) BILL

"1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2017 ජූලි 04වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

விளையாட்டுத்துறை அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.
2017 யூலை 04, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka, on behalf of the Minister of Sports; to be read a Second time upon Tuesday, 4th July, 2017 and to be printed;
and to be referred to the relevant Sectoral Oversight Committee.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

විජය උදාන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
விஜய உதான மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
WIJEYA UDANA FOUNDATION (INCORPORATION) BILL

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
Hon. Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Wijeya Udana Foundation."

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත රීට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare and Kandyan Heritage for report.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත
காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் (தாபித்தலும், நிருவகித்தலும், பணிகளை நிறைவேற்றுதலும்) (திருத்தம்) சட்டமூலம்
OFFICE ON MISSING PERSONS (ESTABLISHMENT, ADMINISTRATION AND DISCHARGE OF FUNCTIONS) (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 3.08]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කිය විය යුතුය"යි මා යෝජනා කරනවා.

මෙම සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට හේතුව මම පැහැදිලි කරන්නම්. 2016 අංක 14 දරන මූලික පනත් කෙටුම්පත ඉදිරිපත් කළ අවස්ථාවේදී විපක්ෂය සමඟ සාකච්ඡා කරලා අපි සංශෝධන කිහිපයකට එකඟ වුණා. ඒ පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කිරීමේදී එක සංශෝධනයක් ඉදිරිපත් කිරීමට අතපසු වුණා. ඒ තමයි ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනය. එදා විශේෂයෙන්ම කිව්වා, මේ පනත ක්‍රියාත්මක කරන්නට පෙර එම සංශෝධනය ඉදිරිපත් කරන්න කියලා. ඒ එකඟත්වය අනුව තමයි අද මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ.

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ 11. (අ) වගන්තියේ මෙසේ සඳහන් වෙනවා. "යම් සංවිධානයක් හෝ යම් තැනැත්තකු සමග ඕ.එම්.පී. ට අවශ්‍ය යයි පෙනී යන අවස්ථාවක දී තම කාර්යභාරය ඉටු කර ගැනීම සඳහා ගිවිසුම්වලට ඇතුළත්වීම;" කියලා. එදා අපි එකඟ වුණා, මේ කොටස ඉවත් කරන්නට. මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ ඒ අරමුණ ඉටු කර ගැනීම සඳහා බව මම විශේෂයෙන්ම කියන්නට කැමැතියි.

මේ කාර්යාලයට පැවරෙන කාර්යය අතුරුදහන් වූවන් පිළිබඳව සොයා බලලා අදාළ සහතිකය නිකුත් කිරීම පමණයි. වෙන කිසිම බලයක් නැහැ. අපේ රටේ 1970 ගණන්වල ඇති වුණු අභ්‍යන්තර යුද්ධ සහ සිවිල් කෝලාහල නිසා බොහෝ දෙනෙකු අතුරුදහන් වුණා. ඒ අතුරුදහන් වූ පුද්ගලයන් ගැන සොයා බැලීම සඳහායි අපි මේ පනත ගෙන ආවේ. නමුත් අපි සමහර අතුරුදහන් වූ පුද්ගලයන් සොයා ගත්තාම ඒ පුද්ගලයා තමන්ගේ ඥාතීන්ට දැනුම් දෙන්නට එපා කියලා කිව්වොත්, ඒ ඉල්ලීම අනුව ඥාතීන්ට දැනුම් නොදී සිටීමට මේ කාර්යාලයට යුතුකමක් තිබෙනවා. ඒ ආකාරයටයි මේක ක්‍රියාත්මක කරන්නේ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් අපේක්ෂිත කාර්ය, විමර්ශනයක් පැවැත්වෙන අතරතුර පැමිණිල්ල අදාළ වන තැනැත්තා අතුරුදහන් වූ තැනැත්තකු බවට තීරණය කිරීමට අතුරුදහන් වූ තැනැත්තා පිළිබඳ කාර්යාලයට ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවක දී දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම පමණයි. ඒ සහතිකය ලබාදීමට පමණයි මේ කාර්යාලයට බලය තිබෙන්නේ. අතුරුදහන් වූ තැනැත්තෙකු ලෙස සලකන්නේ, යම් තැනැත්තකුට අත් වූ ඉරණම හෝ ඔහු සිටින ස්ථානය සාධාරණ ලෙස නොදන්නා බවට විශ්වාස කරනු ලබන්නා වූ ද, ඒ තැනැත්තා ගණනය නොවූ බවට සහ අතුරුදහන් වූ බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන්නා වූ ද අවස්ථාවකයි. ඒ පුද්ගලයාට අත් වූ ඉරණම දන්නවා නම් මේ කාර්යාලයේ වැඩ කටයුතුවලට, කාර්ය භාරයට අදාළ වෙන්නේ නැහැ. අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතියෙකුට අතුරු වාර්තා නිකුත් කළ යුත්තේ 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත ක්‍රියාත්මක වන කාලය තුළ දී හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් දක්නට නොමැති බවට වූ සහතික නිකුත් කිරීමට අවසර ලබා දෙන වෙනත් යම් නීතියක් ක්‍රියාත්මක වන කාලය තුළ දී එවැනි සහතික නිකුත් කිරීමට පහසුකම් සැලසීමේ කාර්ය සඳහා පමණි.

එහෙම නම්, අතුරුදහන් වුණා කියා සහතිකය නිකුත් කරන්නේ ඒ නීති දෙකට අනුව පමණයි. විශේෂයෙන්ම එයයි මෙහි සඳහන් කර තිබෙන්නේ. වෙනත් එකම නීතියක් යටතේ වත් එම සහතිකය නිකුත් කරන්නේ නැහැ. විශේෂයෙන්ම අපරාධ ගැන සොයා බලන්න හෝ නඩු දමන්න හෝ බලයක් මෙම කාර්යාලයට නැහැ. ඒ බලය එතැනට නොවෙයි අයිති. යම්කිසි අපරාධයක් සිදු වී තිබෙනවා නම්, ඒ ගැන සොයා බලන්න දැනට නීත්‍යනුකූල බලධාරීන් ඉන්නවා. ඒ අයගේ යුතුකම තමයි ඒවා ගැන සොයා බැලීම. එහෙම නම්, මෙහි කාර්යය සීමා කර තිබෙන්නේ තැනැත්තෙකු අතුරුදහන් වුණාද, නැද්ද කියා සෙවීමට පමණයි. මෙය කරන්න වුවමනායි. ඇයි? අපේ රටේ විශාල යුද්ධයක් තිබුණා. උතුරේ යුද්ධයක් තිබුණා; දකුණේ යුද්ධ තිබුණා. ඒවා නිසා අතුරුදහන් වූ පුද්ගලයන් බොහෝ දෙනෙකු ගැන ස්ථිර තීරණයක් ගන්න අපට තවම බැරි වෙලා තිබෙනවා. එහෙම නම් අපි දැනගන්න ඕනෑ ඒ පුද්ගලයන්ට මොකක්ද වුණේ කියා. ඒ පවුල්වල අය කැමැතියි, ඒ අය පිළිබඳව සහතිකයක් ලබා ගන්න.

LLRC වාර්තාවේ විශේෂයෙන්ම කියා තිබෙනවා, ඒ පුද්ගලයන් - තමන්ගේ ඥාතීන් - නැති වුණාද නැද්ද කියා

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දැනගන්න නැඳෑ හිතවතුන්ට අයිතියක් තිබෙන බව. අන්න ඒ අයිතිය රැකීමේ කාර්යය ඉෂ්ට කරන්නයි අප මෙය ඉදිරිපත් කර තිබෙන්නේ. එහෙම නැතිව, මේ පසුපස යන්නවත් නඩු පවරන්නවත් බලාපොරොත්තු වන්නේ නැහැ. ආරක්ෂක අංශයේ කටයුතු කළ අයෙකු වුණත්, එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයකු වුණත් ඒ අය පිළිබඳව නඩු දමන එක මෙහි වගකීමක් නොවෙයි. මෙයට කරන්න තිබෙන්නේ එක කාර්යයක්. එනම්, අතුරුදහන් වෙලා තිබෙන්නේ කවුද කියන එක සොයා බැලීමයි. ඒක කරන්න වුවමනායි. මොකද, යුද්ධය 2009 වර්ෂයේදී අවසන් වෙලා තියෙනවා. දැන් අපට මේ සඳහා විසඳුම් සොයන්න වෙනවා. එක විසඳුමක් තමයි මේ පීඩාව ගැන සොයා බලන එක. අනෙක් එක තමයි, මේ ප්‍රශ්නවල අවසානයක් දකින එක. We must have a closure to this. Closure is multifaceted. The closure requires that we address many aspects, not only a constitutional settlement, not only the return of lands, but also look at the people who are missing in different parts of the country and the remedial action we can take for the families. ඒ පවුල්වලට අයිතියක් තිබෙනවා. විශේෂයෙන්ම උතුරේ තිබෙන එවැනි පවුල් ගණනාවක් මට මුණගැසී තිබෙනවා. ඒ අයගේ පවුල්වල එක පුද්ගලයකු බැගින් හෝ අතුරුදහන් වෙලා තිබෙනවා. මොකක්ද සිදු වුණේ කියා තවම කියන්න බැහැ. අපි ඒ ගැන දන්නේ නැහැ. ඒ වාගේම ආරක්ෂක අංශයේ 5,000ක් විතර ඉන්නවා. ඒ පුද්ගලයන් ගැනත් කිසිම සාක්ෂියක් නැහැ. එහෙම නම්, ඒවා පිළිබඳව අපි අවසාන නිගමනයක් ඇති කරගන්න ඕනෑ. මේ තුවාලය තවත් වැඩි කරන්න වුවමනා නැහැ. අප බලන්න ඕනෑ, "අපි කොහොමද එයට සාත්තු කරන්නේ?" කියන එකයි. "How do we heal this wound? How do we ensure that we become one nation with one people?" අන්න එය ක්‍රියාත්මක කරන්නයි මෙය ගෙනෙන්නේ. සමහරුන් තුළ මේ පිළිබඳ සැකයක් තිබුණා, නඩු දමන්න යනවා කියා. නඩු දමන්නේත් නැහැ. යුද අපරාධ චෝදනා ගෙනෙන්න වත් නොවෙයි හදන්නේ.

ගරු කථානායකතුමනි, අප මීට අමතරව දැනට සාකච්ඡා කරගෙන යන්නේ දකුණු අප්‍රිකාවේ වාගේ සත්‍ය කොමිසමක් - Truth and Reconciliation Commission එකක්- ඇති කිරීම ගැනයි. වර්ගවාදී ක්‍රමය ඉදිරිපත් කිරීම නිසා දකුණු අප්‍රිකාවේ අවුරුදු 50ක් තිස්සේ - 1948 ඉඳලා 1994 වන කල් - විශාල යුද්ධයක් තිබුණා; අභ්‍යන්තර යුද්ධ තිබුණා. බොහෝ අය - සිවිල් සංවිධාන - එයට විරුද්ධ වුණා. දකුණු අප්‍රිකාවේ සුදු රජය බොහෝ දෙනෙකු එතැනින් ඉවත් කළා. සමහර අය අතුරුදහන් වුණා. සමහර අය මැරුණා. යුද්ධ තිබුණා.

විශේෂයෙන්ම විමුක්ති හමුදා ගිහින් සුදු ජාතිකයන්ගේ ස්ථානවලට පහර දුන්නා. ඒ සියල්ල අවුරුදු 50ක් තුළ සිදු වුණා. ඒ සියල්ල ගැන සොයා නඩු දමන්න යනවා නම්, ඒක සාර්ථක වන්නේ නැහැ කියා නෙල්සන් මැන්ඩෙලාත්, හිටපු ජනාධිපති ඩික්ලර්ක් මැතිතුමාත් තීරණය කළා. ඒ අය තීරණය කළා, අපි සත්‍ය දැනගනිමු, ඒ කාරණා සොයා ගන්න සත්‍ය කොමිසමට බාර දෙමු කියා. අපත් සත්‍ය කොමිසමක් ඇති කළ යුතුද කියා සාකච්ඡා කර තීරණයක් ගන්නවා නම්, අප එය මේ සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. සත්‍ය දැනගන්න ඕනෑ. දකුණු අප්‍රිකාව ආදී රටවල උදාහරණ අරගෙන තමයි අප ඉදිරියට යන්න ඕනෑ.

මෙහි පසු බිම ගැනයි මා කිව්වේ. ඇත්ත වශයෙන් මේ සංශෝධනය සීමා වෙලා තිබෙන්නේ එක වගන්තියක් ඉවත් කරන්නයි. මේ සියලු දෙනා ඒ ගැන දන්නවා. එහෙත් මේ විවාදයට සහභාගි වන අයටත්, රටටත් කියන්න අපට වුවමනා වෙලා තිබෙන්නේ, මෙය අවසානයකට ගෙනෙන්න ඕනෑ බවයි. අතුරුදහන් වූවන්ගේ පවුල්වලට අයිතියක් තිබෙනවා, ඒ අයගේ සාමාජිකයන් අතුරුදහන් වුණාද, නැද්ද කියා දැනගන්න. ඒ වාගේම, අපි සියලු දෙනා විසඳුමක් කරා ගමන් කරමු.

විශේෂයෙන්ම අපේ මෙහෙයුම් කමිටුව ජාතික ප්‍රශ්නය ගැන බොහෝ දුරට එකඟත්වයකට ඇවිල්ලා තිබෙනවා. සාකච්ඡා කරන්න තව කාරණා කිහිපයයි තිබෙන්නේ. අද රට දේශපාලන වශයෙන් ඉදිරියට යන්නේ එකඟත්වයක් ඇති කර ගන්නයි. මේ ප්‍රශ්න අතීතයට දමන්නයි. ඒ නිසා ඒ සඳහා 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනතත් වැදගත් පනතක් බව, නීතියක් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

මෙම පනත 2016 සම්මත කළ බව ඇත්ත. 2016 අගෝස්තු මාසයේ ගරු කථානායකතුමා එයට අත්සන් තබා තිබෙනවා. මෙම කාල පරිච්ඡේදය තුළ ජනාධිපතිතුමා ආරක්ෂක ඇමති ලෙස මේ පනත ක්‍රියාත්මක කිරීමට අදාළ පත්වීම් කර තිබෙනවාද, අත්සන් කර තිබෙනවාද කියන එක පැහැදිලි කරනවා නම් අපි කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)

අපි කිව්වේ මේ සංශෝධනය සම්මත කළාට පස්සේ තමයි ක්‍රියාත්මක කරන්නේ කියන එකයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

එතෙක් ක්‍රියාත්මක වන්නේ නැහැ, ජනාධිපතිතුමා අත්සන් කළේ නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)

නැහැ, මේක ක්‍රියාත්මක කරන්න කියලා කිව්වා. මොකද, අපි එදා පාර්ලිමේන්තුවේදී එකඟ වුණේ මේ සියල්ලම සංශෝධනය කළාට පසුව ඒ ගැන බලන්නයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

The next speaker is Hon. M.A. Sumanthiran. You have 15 minutes.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු සෙල්වම් අඩෙක්කලනාතන්] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. M.A. Sumanthiran, you may speak now.

[3.17p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Mr. Deputy Chairman of Committees, for this opportunity to speak a few words on this amendment that has been presented to the House by the Hon. Prime Minister.

As the Hon. Prime Minister said, this is an important piece of legislation that the Government brought in. In respect of the aftermath of the war, there are a number of things that needed to be done. Truth had to be ascertained, justice had to be done, reparation needs to be made and guarantees of non-recurrence had to be ensured. In that respect, this was one small "baby step", as I said when we debated the principal enactment last August.

It is a matter of regret that although the Act was passed in August last year, to this day, it has not been in operationalized. I am happy that the Hon. Dinesh Gunawardena clarified that as well. One sees the amendment that has been now placed before the House just to remove one Clause, and one sees that that has been made the apparent excuse for not operationalizing this very important, yet small step, in the direction of reconciliation in this country. It is an important step, as the Hon. Prime Minister himself said, that relatives of persons who are missing must know the fate of those who have gone missing. It is a horrendous crime to disappear people and the Government has taken the second step of gazetting and bringing in the International Convention for the Protection of All Persons from Enforced Disappearance Bill to make that an offence. One hopes that also will not be delayed and that will be brought very soon to this House.

The delay in operationalizing cannot be said to be this small amendment that the Janatha Vimukthi Peramuna wanted. Once the Speaker signs a Bill that has been passed, it becomes an Act and this does not have to be brought into operation by a Minister. It is in operation. When the President allocates subjects and functions to various Ministers, there is a practice of identifying the different pieces of legislation under different Ministries and that has not been done. That not being done cannot be the reason for several steps that could have been taken by the Act that has actually come into operation with the signature of the Hon. Speaker.

I was hoping that the Hon. Speaker himself would be in the Chair when I said this. Being the Chairman of the Constitutional Council, he could have taken certain steps. The Constitutional Council has to appoint the Commission Members for this Office. Now that is a responsibility of the Constitutional Council. The Minister has no role to play in that. Therefore, for almost one year, the Constitutional Council also has delayed being remiss in making those appointments. The Minister has certain functions to perform; where it says, "the Minister shall" - that Minister perhaps needs to be identified and until that identification is done, it may not be possible for the Minister to perform those functions. But where it is the responsibility of the Constitutional Council, there need not have been any delay and I think the Constitutional Council has failed to appoint those Members of the Commission and I trust that that will be done without delay.

There was a question asked about the Minister of Defence, His Excellency the President. I saw somewhere recently - I think in a speech he made in Sampur recently - the President has said, once this Amendment is passed, he will identify the Minister and gazette it under that particular Minister. I hope that guarantee will be fulfilled. Although this Office does not confer civil or criminal liability on any person, the functions of this Office is a very serious function; is an important function. It sets in motion a process through which the next of kin can actually be satisfied about the fate of the missing person. It is not enough merely making statements and saying, "Well, if they are not in detention or they cannot be found, either they must have left the country or they must be all dead". That will be a very insensitive way that a government deals with this serious issue of persons who have gone missing. There must be a process and I am glad that this Office is to be set up because this is the permanent mechanism, a mechanism that the world recognizes to be the right process through which all relevant inquiries can be made, so that the relatives can actually be satisfied that every effort has been taken to find persons who are missing.

The fear of the security sector in this regard is unfounded. Persons have been made to disappear not only by the security forces. It is true that several surrendered to security forces and thereafter have gone missing and the Government and the security forces must bear responsibility towards that and when inquiries are made, I believe, that will come out. But, over a long period of time through this protracted conflict there were others also who were responsible for disappearing people. At different times, in different places, people knew if somebody went missing where to go and look for them. For instance, when the Paranagama Commission held its sittings in Jaffna, people who gave evidence very clearly said, ‘‘When my son went missing, I went to the EPDP office and asked, 'Why are you keeping my son there?' and they gave us assurances, ‘We will release them soon’’. All of these came in the newspapers. So, there was a time when disappearances were carried out by the EPDP. There were times when disappearances were carried out by several other armed groups in Vavuniya, in Mullaitivu, in Mannar and in Jaffna. Given periods of time and places, our people know who carried out these disappearances. The truth with regard to all of these must be ascertained; must be brought out.

The LTTE too conscripted people, at least during the last stages of the war. It may be, some people will not say it for fear that they will be called, ‘‘traitors’’. But, these are facts that are known to our people and one cannot

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

hide this. It is important that the truth is brought out. Only when the truth is brought out, can there be true reconciliation. So, I urge the Government not to be fearful to operationalize this Office. It must be done. Everyone must know as to who did what, so that other steps that we take towards reconciliation can be meaningful; can be something that is evenhanded; it cannot be one-sided that all will take due responsibility of what they have done during this period.

I want to say a few words with regard to the Amendment that was brought to the Births and Deaths Registration Act since the Hon. Prime Minister made mention of that. We find that although Certificates of Absence have now been made possible, in actual fact, people are facing severe difficulties in obtaining these Certificates of Absence. There is no clarity with regard to this. People are fearful that if they obtain the Certificates of Absence, no further inquiries will be made; nothing can be further from the truth. Certificate of Absence is the first acknowledgement by the Government that that person is missing. Thereafter, the fate must be ascertained and if it is ascertained that the person is dead, then a Death Certificate can be issued. But the reason why a Certificate of Absence is issued is so that there can be certain other remedial measures that can be taken. The Office of Reparations must come into being and there must be other consequences with regard to dealing with property that was owned by the person who was missing, even marital rights and so on. The persons will benefit if they have a Certificate of Absence of their next of kin who has gone missing.

The officials in the District Secretariats and Divisional Secretariats also seem unaware or not very clear as to the provisions with regard to the Amendment that was made. I am told people are being misled with regard to this and I would like the Government to make clear, even through advertisements, pronouncements and perhaps through circulars issued to Divisional Secretaries and District Secretaries, the true position with regard to the Certificate of Absence so that our people will not be sent from pillar to post and will not have to be in a state of not being clear as to what they should do. Some are told, "Well, if you obtain this, then no inquiries will be made." Some are told, "Only if you get a Certificate of Death, then certain legal consequences can follow." So, there is a large amount of suspicion as to what a Certificate of Absence can accomplish. I urge the Government to make that clear.

(The Hon. Rohitha Abeygunawardana)
ඔබතුමා මගේ මිත්‍ර මන්ත්‍රීතුමා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔක්කොම වෙලාවට මිත්‍රයි.

[අ.භා. 5.19]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)
මම හැම දාම ඔබතුමා සමඟ මිත්‍රයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත 2016 අගෝස්තු මාසයේ 11වැනි දා කෙටුම්පතක් ලෙස මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ පාර්ලිමේන්තුවේ මහා කලබගෑනියක් ඇති වුණු දිනයක් එදා. ඉන් අනතුරුව නැවත එයට සංශෝධන ගණනාවක් ඉදිරිපත් කළා. එයින් සංශෝධන දෙකක් අද පිළිගෙන තිබෙනවා. එය පිළිගෙන අද ඉදිරිපත් කර තිබෙනවා. නමුත්, මේ කාර්යාලය පිහිටුවන්න වන්නේ අද මෙම සංශෝධන දෙක පිළිගත්තාට පසුව, නැවත එම සාමාජිකයන් නම් කිරීමෙන් අනතුරුව ජනාධිපතිතුමා විසින් ඒ සඳහා අත්සන් කිරීමෙන් පසුවයි.

අපි බොහොම පැහැදිලිව කියනවා, අතුරුදහන් වූ කෙනෙකු සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක සොයා බලන එක රජයක; රටක වගකීමක්ය කියලා. ඒකේ කිසිම සැකයක් නැහැ. ඒකට ජාතියක්, ආගමක්, කුලයක්, පක්ෂයක් යනාදී කිසි දෙයක් අදාළ වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ශ්‍රී ලාංකීය පුරවැසියෙක් හැටියට ඒ අසාධාරණයට ලක් වුණ කෙනෙකු වෙනුවෙන් යම් හොඳ කර්තව්‍යයක් වෙනවා නම් ඒක ඉටු කරන්න ඕනෑ. නමුත්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවන්න වැඩ පිළිවෙළ ආවේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අවුරුදු 30ක් තිස්සේ පැවැති යුද්ධයක් අවසන් වුණා. ඒ අවුරුදු 30ක් තුළ පැවැති යුද්ධය 2009 මැයි මාසයේ 19 වෙනිදා අවසන් නොවුණා නම්, වීරෝදාර රණවිරුවෝ සහ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙම යුද්ධය අවසන් කරන්න නායකත්වය නොදී එය අවසන් නොවුණා නම්, පසු ගිය අවුරුදු 8 ඇතුළතත් අතුරුදහන්වීම් සිදු වෙනවා. ඒකේ කිසිම සැකයක් නැහැ. අනිවාර්යයෙන්ම අතුරුදහන් වෙනවා. ඒක උතුරෙන් වෙයි, නැඟෙනහිරත් වෙයි, රටේ අනෙකුත් තැන්වලත් වෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මූලාසනය සඳහා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුඛසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු රඞ්ජන් රාමනායක්ක - සමූක වලුවූට්ටල්, නලන්පුරි මර්‍රුම් කණ්ඩි මරපුරිමෛකළ් පර්‍රිය පිරති අමෛච්චර්)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු බිමල් රත්නායක මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.

අතන් පිරකු, මාණ්පුමිකු එට්වට් කුණසේකර අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු පිමල් රත්නායක්ක අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON.EDWARD GUNASEKARA left the Chair, and THE HON. BIMAL RATHNAYAKE took the Chair.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවසන් නොවුණා නම් ඒ අතුරුදහන්වීම එසේම තිබෙනවා. මේ කියන සංඛ්‍යා ලේඛනවලට පසු ගිය අවුරුදු 8ක කාලයත් එකතු වන විට අතුරුදහන් වූ තැනැත්තන්ගේ ප්‍රමාණය තවත් වැඩි වෙනවා. හමුදා සාමාජිකයන් 5,500 ක් කියලා කිව්වා නම්, ඒක සමහර වෙලාවට 15,000ක් බවට පරිවර්තනය වෙයි. සාමාන්‍ය වැසියෝ වෙන්න පුළුවන්, එල්ටීටීඊකාරයෝ වෙන්න පුළුවන්. ඒ ප්‍රමාණය වැඩි වෙන්න පුළුවන්. නමුත් පැහැදිලිවම යුද්ධය අවසන් කළා. අතුරුදහන් වූ තැනැත්තන් ගැන කථා කරනකොට මේ රටේ හිටපු ජනාධිපතිවරු කිහිප දෙනෙකුට කරන්න බැරි වෙච්ච දේ, රජයන්ට කරන්න බැරි වෙච්ච දේ ඉටු කරලා යුද්ධය අවසන් කරපු එක ගැන අපට කථා කරන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් ගැන කථා කරනවිට අපි බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ, මෙම අතුරුදහන්වීම් සිදු වෙන්නේ එල්ටීටීඊ් ත්‍රස්තවාදය කාලයේ විතරද කියලා? නැහැ. 1988-1989 කාලයේ සිදු වූ සිදුවීම් ගැන මූලාසනයේ ඉන්න අපේ ගරු මන්ත්‍රීතුමා හොඳට දන්නවා. එතුමා අද ඒ සම්බන්ධයෙන් කථා කළා. 1988-1989 කාලයේත් අතුරුදහන් වෙලා තිබෙනවා. 1988-1989 කාලයේ අතුරුදහන් වුණු රෝහණ විජේවීර මැතිතුමා මේ රටේ දේශපාලන ධාරාවක ප්‍රධාන නායකයෙක්. රෝහණ විජේවීර කියන ඒ දේශපාලන නායකයා 1988-1989 කාලයේදී අතුරුදහන් වුණා. කවුද, ආණ්ඩු කළේ?

මට ඉස්සරවෙලා තරුණ මන්ත්‍රීවරයෙකු වන තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කථා කළා. මට ඇහුණා එතුමා කියනවා "හාරන්න" කියලා. හාරනකොට බයයි. හාරන්න. අලුත් වළවලුයි,

පරණ වළවලුයි ඔක්කෝම හාරන්න. හාරනකොට තමයි උඩ එන්නේ. හැම එකක්ම හාරන්න. හැබැයි, තමන්ට ඕනෑ එක විතරක් හාරන්න පනත් කෙටුම්පත් ගෙනෙන්න එපා. තමන්ට ඕනෑ එක හාරන්න, තමන්ට කබරගොයාව තලගොයා කර ගන්න ඕනෑ වුණාම මේ විධියට පනත් කෙටුම්පත් ගෙනෙන්න එපා කියන එක අපි කියනවා. හොයන්න, ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර මැතිතුමාගේ අතුරුදහන්වීම ගැන. එවකට පැවැති රජය කුමක්ද කියලා හොයන්න. එවකට රටේ හිටපු අගමැතිවරයා කවුද කියලා හොයන්න. එවකට හිටපු තරුණ කටයුතු ඇමතිවරයා කවුද කියලා හොයන්න. මේවාත් හොයන්න. මේවාත් හොයනකොට මේ අතුරුදහන්වීම් ගැනත් හොයා ගන්න පුළුවන් වෙයි. ඒවාත් හොයලා අනෙක් ඒවාට පිළිතුරු දුන්නොත් ජාත්‍යන්තරයට ආදර්ශයක් වෙයි කියලා මම හිතනවා. මොකද, ජාත්‍යන්තරය වෙනුවෙන් නේ මේ දේවල් කරන්නේ. ජාත්‍යන්තරය පිනවීම කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා කිව්ව දේවල් අපට ඇහුණා.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් කිව්වා නේ, අතුරුදහන් වුණාය කියලා කියන සමහර අය පිට රටවල ඉන්නවා කියලා. ඒක ප්‍රායෝගිකව අපිත් දැකලා තිබෙනවා. හැබැයි, අතුරුදහන්වූවන්ගේ කාර්යාල පිහිටුවනකොට ඒක කොළඹ විතරක් නොවෙයි, යාපනයේත් පිහිටුවන්න ඕනෑ, වන්නියේත් පිහිටුවන්න ඕනෑ, නැහෙනහිර පළාතේත් පිහිටුවන්න ඕනෑය කියලා සම්පන්දන් මැතිතුමා කිව්වා.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම කාර්යාල දකුණේත් පිහිටුවන්න ඕනෑ. ඉතිහාසයේ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ ප්‍රශ්න දකුණේත් තිබෙනවා. එහෙමනම්, දකුණේත් මේ කාර්යාල පිහිටුවන්න ඕනෑ. ඒ පළාතේත් මේ හා සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා.

තමන්ගේ කෙනෙක් අතුරුදහන් වූවාය කියා මේ එන බිරින්දෑවරුන්, මේ එන දරුවන්, මේ එන පවුල්වලට සම්බන්ධකම් තිබෙන අය හා සමානවම 88, 89 අවුරුදුවල අතුරුදහන් වූ අයගේත් බිරින්දෑවරුන්, දරුවන් ඉන්නවා. මොකද, එදා ජනතා විමුක්ති පෙරමුණට සාමාජිකයන් වශයෙන් බැඳුණේ කසාද බැඳපු නැති අයද? කසාද බැඳපු අයත් හිටියා, ඒ අයටත් ළමයින් හම්බ වුණා, තාත්තලා වුණු අය හිටියා. අපි එතැනින් පටන් ගනිමු. එතැනින් පටන් ගත්තාම සමහර වෙලාවට මේ අය ගැන සොයන්න පුළුවන් වෙයි. හැබැයි විශ්වාසයක් තිබේද කියන ප්‍රශ්නය තිබෙනවා.

අපි දන්නවා, මේ පනතට සංශෝධන ගෙනෙන කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනුත් සංශෝධන ගෙනාවා කියලා. ජනතා විමුක්ති පෙරමුණ සංශෝධන ගෙනෙනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙනුත් සංශොධන හයක් ගෙනාවා. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත්, ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාත් ඒකාබද්ධව අත්සන් කර සංශෝධන හයක් ගෙනාවා. ඒ සංශෝධන හයට මොකද වුණේ? ඒ සංශෝධන හය හැලුණාද? කොහේද, ඒ සංශෝධන හය ගියේ? ඒකත් ප්‍රශ්නයක්. ඒ සංශෝධන හයට මොකක්ද සිද්ධ වුණේ කියන එක අපි දැන ගන්නට කැමතියි. ඒ සංශෝධන හයට සිද්ධ වුණු දෙයක් නැහැ. එම නිසා මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම ගැන දෙබිඩි පිළිවෙතක් ඉදිරියට ක්‍රියාත්මක වෙනවා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා කථා කරනකොට කිව්වා, "අද සංශෝධන සහිතව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පස්සේ මේ සම්බන්ධයෙන් සාමාජිකයන් පත් කර, ජනාධිපතිතුමා අත්සන් කළාට පස්සේ කාර්යාලය පිහිටුවන්න පුළුවන්" කියා. ඊට පස්සේ මේ විෂයය පථය යම් අමාත්‍යාංශයකට එකතු කරන්නට වෙනවා. අතිගරු ජනාධිපතිතුමාට හෝ ගරු අගමැතිතුමාට, නැත්නම් විෂයභාර ඇමතිවරුන් කාට හෝ මේ විෂය එකතු කරන්න ඕනෑ. මේ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය ගැන වගකීමට ඇමතිවරයෙකු ඉන්න ඕනෑ. අපටත් ප්‍රශ්නයක් තිබෙනවා, මේක කාටද දෙන්නේ කියන එක ගැන. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා යටතේ, ආරක්ෂක ආරක්ෂක අමාත්‍යාංශය තිබෙන නිසා මේ විෂයය එතැනට යන්නත් පුළුවන්ලු; එසේ නැත්නම් අපේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා හැටියට මේවාට මැදිහත් වෙන නිසා එතැනට යන්නත් පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දවස්වල මේ රටේ අමාත්‍යාංශවලට විෂයයන් බෙදූ විධියට රටේ මිනිසුන්ටත්, අපටත් සැකයක් තිබෙනවා, මේ අවස්ථා දෙකම තියෙද්දී, මේ විෂයය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට යාවිද කියලායි. මොකද හේතුව, මුදල් අමාත්‍යාංශය යටතේ තිබුණු ලොතරැයි බෝඩ් එක ඒ විධියට දෙනවා නම් මා මිත්‍ර ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමනි, අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් ඇති කරන කාර්යාලය විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට හෝ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අයත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට හෝ සංස්කෘතික අමාත්‍යාංශයට ගියාට කමක් නැහැ නේද? රටක එහෙම වෙන්නට පුළුවන්. එහෙම වෙලාත් තිබෙනවා නේ. [බාධා කිරීමක්] ක්‍රීඩා අමාත්‍යාංශයට නම් කොහොමවත් දෙන එකක් නැහැ. නමුත් මේ විධියට තමයි මේ රටේ කරුණු සිදු වන්නේ. දැන් මේක දේශපාලන විභේදයක් වෙලා.

සමහර වෙලාවට කැබිනට් එකේ ඉන්න ඇමතිවරුන්ටත්, ගරු ගයන්ත කරුණාතිලක අමැතිතුමාට, ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමාට හෝ පසු පෙළ මන්ත්‍රීවරුන්ටවත් මේවාට උත්තර දෙන්නට බැහැ. ගමේදී ඒ අයත් කියන්නේ, මේවා දේශපාලන විභේදී කියායි. එම නිසා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවන ගමන්ම ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමනි, ආණ්ඩුව ඇතුළේ පෙරළියක් ඇති කරන්න, ජාතිවාදී මානසිකත්වයට, ජාතිවාදී හැඟීම් ඉස්මතු කරන වැඩ පිළිවෙළවලට තිත තියන්න කියලායි අපි ඉල්ලන්නේ. නැත්නම් ඒ අදහස් නැවත ඉදිරියට ආවොත් වෙන්නේ නැවත යුද්ධයකට අත වැනීමයි; යුද්ධයක් ඇති වීමයි. එලෙස යුද්ධයක් ඇති වුණාට පස්සේ නැවත අතුරුදහන් වීම් ඇති වෙයි. එතකොට මේ ආණ්ඩුවෙන් ඇති කළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙනුවට තව ආණ්ඩුවකට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව කාර්යාල තුන හතරක් ඇති කරන්න වෙයි; ගමකට එක ගණනේ ඇති කරන්න වෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

එම නිසා අපි බොහොම පැහැදිලිව කියනවා, මේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යනවාට අපි විරුද්ධ නැහැ කියලා. කාට හෝ අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, යම් කිසි කෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා නම් ඔවුන් වෙනුවෙන් මේ කටයුත්ත කරනවාට අපි කැමැතියි. හැබැයි මෙය පාවිච්චි කර ගෙන ඉදිරියට යම් පුද්ගලයෙක් යැපෙන්න හදනවා නම්, යම් පක්ෂයක්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

යැපෙන්න හදනවා නම්, යම් ජාතියක් යැපෙන්න හදනවා නම් එයට අපි විරුද්ධයි කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 5.30]

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ මේ විවාදයට අද දවසේ එක් වෙන්නට ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා.

අපි සියලුදෙනා මේ සම්බන්ධව කථා කර තිබෙනවා. අපේ රටේ අතුරුදහන්වීම් සිදු වෙන්නේ කොයි කාල වකවානුවේ ඉඳලාද කියලා බැලුවොත්, අපට පැහැදිලිව පෙනෙන්න තිබෙන කාල වකවානුව, අපට මතක තිබෙන කාල වකවානුව තමයි 1971 කැරැල්ල පැවැති කාලය. ඒ කාලය තුළ විශාල සංඛ්‍යාවක් අතුරුදහන් වුණා කියලා අපි දන්නවා. ඊට පසුව එන 1988 - 1989 කාලයත් ඒ වාගේමයි. ඉන් පසුව පසු ගිය අවුරුදු 30ක යුද්ධ කාලයේ දිගටම අතුරුදහන්වීම් විශාල සංඛ්‍යාවක් සිදු වුණා. ඒ කාල වකවානුව තුළ සිවිල් පුරවැසියන් මෙන්ම, හමුදාවේ 5,000ක්දෙනා ද අතුරුදහන් වුණාය කියන එක රටේ පුරවැසියන් විධියට අපි සියලුදෙනාම බොහොම පැහැදිලිව දන්නවා. පසු ගිය කාල වකවානුව බැලුවාම පෙනෙනවා, ඒ සම්බන්ධව විශේෂයෙන්ම කොමිෂන් සභා විශාල ප්‍රමාණයක් පත් කර ඇති බව. මෙලෙස කොමිෂන් සභා පත් කරන්න පටන් ගත්තේ 1991 වර්ෂයේ. 1991 වර්ෂයේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ, "අකැමැත්තෙන් ඉවත් කිරීම" පිළිබඳව මේ වාගේ කොමිෂන් සභාවක් පත් කළා. නමුත්, ඒ කොමිෂන් සභාව ගත්ත කිසිදු තීරණයක් ගැන අපට දැන ගන්න ලැබුණේ නැහැ. 1992 වසරේත් මේ වාගේම අතුරුදහන් වූවන් පිළිබඳ කොමිෂන් සභාවක් පත් කළා. හැබැයි, එයින් ගත්ත පියවර මොනවාද, ඒ අයට දුන්න සහනය, වන්දිය මොකක්ද, අවසානයේදී මොකක්ද වුණේ කියන කිසිම දෙයක් අපි දැනගෙන හිටියේ නැහැ. ඒ වාගේම 1993 වසරේ මේ නමින්ම තවත් කොමිෂන් සභාවක් ස්ථාපිත කළා. ඒ කියන්නේ 1991, 1992, 1993 වර්ෂවල. 1993 වර්ෂයේ, ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා, අතුරුදහන් වූවන් පිළිබඳව කොමිෂන් සභාවක් නැවත පත් කළා. එයින් ඇති වුණ තත්ත්වය පිළිබඳවත් අපි කවුරුවත් දැනගෙන හිටියේ නැහැ. ඒ වාගේම 1994 වර්ෂයේ, අවුරුදු 17කට පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් පත් වුණාම චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය කොමිෂන් සභාවක් පිහිටෙව්වා. එහි වාර්තාව 1997 වර්ෂයේ ගෙනැත් දීලා තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධව කිසිදු පියවරක් මේ වෙනතුරු අරගෙන නැහැ. ඒ විතරක් නොවෙයි, 1998 වර්ෂයේත් මේ වාගේම කොමිෂන් සභාවක් පිහිටෙව්වා. 2001 වර්ෂයේ එහි වාර්තාව පිට වුණා. එයට අත්වුණු ඉරණම අපි කවුරුවත් දන්නේත් නැහැ. යුද්ධයෙන් පසුව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ පරණගම කොමිෂන් සභාව පිහිටෙව්වා. එයින් සොයා ගැනීම් විශාල සංඛ්‍යාවක් සිදු කළා. විශේෂයෙන් 5,000කට අධික හමුදාවේ සහ පොලීසියේ රණ විරුවන් අතුරුදහන් වෙලා තිබුණා. ඒ වාගේම 16,000කට අධික පැමිණිලි සංඛ්‍යාවක් ඔවුන්ට ලැබිලා තිබුණා. පරණගම වාර්තාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, මේ ක්‍රියාදාමය තුළ 60,000කට අධික සංඛ්‍යාවක් අතුරුදහන් වුණාය කියලා. නමුත්, කවුරුවත් ඒවායේ තිබෙන තොරතුරු මොනවාද කියලා දන්නේ නැහැ; එකතු කරලා තිබෙන තොරතුරු මොනවාද කියලා දන්නේ නැහැ. එතැනින් පසුව මොකක්ද සිදු වුණේ කියන එක අපි සියලු දෙනාටම ප්‍රශ්නයක්. එම නිසා තමයි අද අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රශ්නය, මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න සිදු වෙලා තිබෙන්නේ.

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මට කලින් කථා කළා. එතුමා මේ අදාළ පනත හරියට කියවලා නැති ආකාරයක් තමයි මට එතුමාගේ කථාවෙන් තේරුණේ. එම නිසා මේ පනත හරියට කියවලා, මේ ගැන කථා කළොත් හොඳයි කියලා අපි විශ්වාස කරනවා. එතුමා අතුරුදහන් වූවන්ට අදාළ කාලය පිළිබඳව විශේෂයෙන් කථා කළා. මේ පනතේ 10 (2) වගන්තියේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන්ව තිබෙනවා:

"යම් තැනැත්තකු අතුරුදහන් වූ කාලවකවානුව නොතකා 'අතුරුදහන් වූ තැනැත්තන්' පිළිබඳ කාර්යාලයේ කාර්යභාරය අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය."

අපි ඒ පනත තවත් කියවාගෙන යනකොට එහි 12 (ආ) වගන්තිය යටතේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"(i) ඉතා මෑතක දී සිදු වූ පුද්ගලයන් අතුරුදහන් වීම පිළිබඳ සිද්ධීන්;

(ii) දැනටමත් වැදගත් සාක්ෂි තිබෙන සිද්ධීන්;

(iii) ඕ.එම්.පී. හි මතය අනුව මහජනතාවට වැදගත් වන සිද්ධීන්"

මේ ඕනෑම කාරණයක් පිළිබඳව මේ ක්‍රියාදාමය ස්ථාපිත කර ගන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. එතුමාට මම කියන්න කැමැතියි කරුණාකරලා බලන්න කියලා -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු ඇමැතිතුමා. මේ අවස්ථාවේදී කවුරුන් හෝ මන්ත්‍රීවරයෙකු ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ඩිලාන් පෙරේරා මහතා (මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - நெடுஞ்சாலைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilan Perera - State Minister of Highways)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே,மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමැතිතුමා කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ 27 වැනි වගන්තියත් මම කියවන්න කැමැතියි. එහි මෙසේ සඳහන් වනවා:

"(i) උතුරු නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර හෝ එහි ප්‍රතිඵලයක් ලෙස නැතහොත් එම සන්නද්ධ ගැටුම්වලට පසුව අතුරුදහන් වූ තැනැත්තකු හෝ 'යුද්ධයේ දී අතුරුදහන් වූ' තැනැත්තකු ලෙස හඳුන්වනු ලබන තැනැත්තකු ක්‍රියාත්මකයේ දී අතුරුදහන් වූ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු හෝ පොලීසියේ සාමාජිකයකු; හෝ

(ii) දේශපාලන නොසන්සුන්තාවයක් හෝ සිවිල් කැරළි කෝලාහල හෝ සම්බන්ධයෙන් අතුරුදහන් වූ ; හෝ "

ඒ පුද්ගලයන් පිළිබඳ සොයා බලන්න කාර්යාලයක් පිහිටුවන්න තමයි මෙම පනත ගෙනැත් තිබෙන්නේ.

ඒක නිසා බොහොම පැහැදිලියි, මේක උතුරු-නැගෙනහිරට විතරක් සම්බන්ධ කරලා, නැත්නම් මෑතකදී සිදුවූ සිද්ධීන් ගැන විතරක් සංසන්දනය කරලා හදන ක්‍රියාවලියක් නොවෙයි කියලා. වැදගත් කාරණාවක් ගැන අපි පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරන කොට ඒවා අපේ රටේ ජනතාව අතරට යනවා. මිනිස්සු අතර විවිධ මානසික ප්‍රශ්න තිබෙන අය ඉන්න පුළුවන්. මේ සියලු කාරණා මත ඔවුන් මේවා වැරදි විධියට තේරුම් ගන්න පුළුවන්. ඒ නිසා මේ පනත් කෙටුම්පත හරිහමන් විධියට කියවලා ආවා නම් එතුමාට මේ වාගේ කථාවක් කරන්න වෙන්නේ නැහැ කියලා මම කියන්න කැමැතියි.

තමා වෙත රහසේ දෙන ලද කරුණු සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත අදාළ වීම ගැන එතුමා කථා කළා. දැන් බලන්න මෙම පනතේ 15.(1) වගන්තිය යටතේ මෙහෙම සඳහන් වනවා:

"... තමා වෙත රහසේ දැනුම් දෙන ලද කරුණු සම්බන්ධයෙන් එම තැනැත්තා විසින් රහස්‍යභාවය ආරක්ෂා කරමින් එසේ ආරක්ෂා කිරීමට ආධාර කළ යුතු ය. එම තොරතුරු සම්බන්ධයෙන් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ විධිවිධාන අදාල නොවිය යුතු ය."

ඒ වගන්තියෙන් මොකක්ද කියන්නේ? ඒ වගන්තියෙන් බොහොම පැහැදිලිව කියන්නේ, ඒ පුද්ගලයා ලබාදෙන ලද තොරතුරු ආරක්ෂා කිරීම වැදගත් බවත් ඒක තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ විධිවිධානවලට අදාළ වෙන්නේ නැති බවත්. මේක ඇත්ත කථාවක්.

දැන් කවුරු හරි 1980 ගණන්වල අතුරුදන් වූ පුද්ගලයෙකුගේ තොරතුරු ඇවිල්ලා කියනවා කියලා හිතමු. "කවුද ඒ සාක්ෂි දුන්නු පුද්ගලයා; දින 14ක් ඇතුළත මට ඒ තොරතුරු එවන්න; මේ පැමිණිල්ල කරපු පුද්ගලයාගේ නම මට දෙන්න; ඔහු කියන එක්කෙනාගේ නම මොකක්ද; කවුද අතුරුදන් කළේ?" කියලා තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ කවුරු හරි ඒ සම්බන්ධයෙන් ඇහුවොත් මොකද කරන්නේ? ඒක තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ගියාම ඊළඟට මොකක්ද වෙන්නේ? ඇයි මේවා ගැන කල්පනා කරන්නේ නැත්තේ?

කරුණාකරලා කථා කරන කොට මේ ගැන යම් අදහසක් තියාගෙන කථා කරන්න. මොකද, අපි ඔක්කෝම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු. මම එතුමාට චෝදනා කරනවා නොවෙයි. නමුත්, මේ කාරණා කියන කොට කැල්ලක් දෙකක් අරගෙන කියන එකෙන් විශාල නොසන්සුන්තාවක් රට ඇතුළේ ඇති වෙන්න පුළුවන්. ඒ වාගේම බොහෝම පැහැදිලිව මෙහි ඇතුළත් කරලා තිබෙනවා, මේ ක්‍රියාදාමය කරන කොට මේ නිලධාරීන් පැහැදිලිවම සාමාන්‍ය රාජ්‍ය නිලධාරීන් විධියට සලකලා තිබෙනවා කියලා.

මෙම පනතේ 25. (1) (අ) වගන්තියේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන්ව තිබෙනවා:

"... ක්‍රියාවත් හෝ අත්හැරීමක් යම් නීති කෘත්‍යක දී හෝ යම් අධිකරණයක් ඉදිරිපිට අභියෝගයට ලක් කළ නොහැකි ය."

ඒක හරි. හැබැයි ඒ වාගේම ඊට යටින් තිබෙන එකත් කියවන්න. 25. (2) (අ) වගන්තියේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන්ව තිබෙනවා:

"... අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධිකාරි බලයට එරෙහිව අපහාස කිරීම සම්බන්ධයෙන් හැර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද නැතහොත් කිරීම අත්හරින ලද යම් ක්‍රියාවක් සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය."

මෙහි බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා, සද්භාවයෙන් මේ ක්‍රියාදාමය කරනවා නම් ඒ නිලධාරියෙකුට විරුද්ධව නඩු පවරන්න බැහැ කියලා. හැබැයි, අසද්භාවයෙන් - ඒකෙන් මොකක්ද අදහස් කරන්නේ?- කරන්නාවූ ක්‍රියාවක් පිළිබඳව ඔහුට විරුද්ධව නඩු පවරන්න පුළුවන්. මේවා ගැන මීට වඩා අපි කල්පනා කළොත් හොඳයි කියලායි මම විශ්වාස කරන්නේ. මොකද, මේ පනත තුළ තිබෙන කාරණා ටික අපට වැදගත් වෙන කාරණා. ලංකා ඉතිහාසයේ අතුරුදන් වූ කිසිම පුද්ගලයෙක් ගැන කවුරුවත් දන්නේ නැහැ, තොරතුරු මොනවාද කියලා.

අපේ ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරු හැමදාම අප්‍රේල් විරු සමරුව පවත්වනවා. අතුරුදන් වූ අයගේ අම්මලා තාත්තලා එයට සහභාගි වනවා. ඒ අය තවම තමන්ගේ පුතා ජීවත් වෙනවා කියලා හිතේ තියාගෙන කල්පනා කරනවා වෙන්න පුළුවන්. ඒ අය පහනක් පත්තු කරන කොට මේ රටේ තමන්ගේ දරුවාට අත් වුණු ඉරණම හොයලා දෙන්න කියලා හිත හිතා තමයි ඒ පහන පත්තු කරන්නේ. රෝහණ විජේවීර මැතිතුමාගේ ආදරණීය බිරිඳත්, පුත්‍ර රත්නයත් ඒ විධියට කල්පනා කරනවා වාගේම, අනෙක් සියලු දෙනාමත් ඒ විධියට තමයි කල්පනා කරන්නේ. මුස්ලිම් ජනතාවත් එහෙමයි; දෙමළ ජනතාවත් එහෙමයි. අපි කාටවත් ජාතියක් හෝ ආගමක් විධියට කල්පනා කරලා මේ ක්‍රියාවලිය ගැන කථා කරන්න බැහැ. ඒක තමයි ඇත්ත කථාව. අපි දකුණේ අප්‍රේල් විරු සමරුව පවත්වනවා වාගේම උතුරේ අයත් තමන්ගේ පුතාගේ ෆොටෝ එක උස්සාගෙන ඇවිත් සමරනවා. ඒවා අරගෙන ඇවිත්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ජනාධිපතිතුමා යන කොට, අගමැතිතුමා යන කොට, ඇමතිවරු යන කොට කෑ ගහනවා, "අපේ ළමයි හොයලා දෙන්න." කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක අදවත් මෙතැනින් ඉවර කරන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. මෙතැනින් පස්සේ අඩුම තරමේ මේ රටේ ජනතාවට තමන්ගේ ළමයාට මොකක්ද වුණේ, තමන්ගේ දරුවා ඉන්නවාද, මැරුණාද, නැත්නම් අතුරුදන් වුණාද කියලා දැනගන්න පුළුවන් වෙන්න ඕනෑ. අතුරුදන් වුණා නම් අඩුම තරමින් ඒ සිද්ධිය සම්බන්ධයෙන් ඊළඟට මොනවාද කරන්න පුළුවන්, මොනවාද ඒ ගොල්ලන්ට විරුද්ධව ගන්න පුළුවන් ක්‍රියා මාර්ග කියලා දැනගන්න පුළුවන් වෙන්න ඕනෑ. අන්න ඒ විධියේ ක්‍රියා මාර්ග ගන්න අවශ්‍ය මූලික වැඩ කටයුතු ටික මේකෙන් සකස් කරලා තිබෙනවා. කිසිම වෙලාවක මේක ආපහු අපරාධ නඩු නිමිත්තක් බවට පත් වෙන්නේ නැහැ. මේකෙන් ඔවුන්ට කියලා දෙනවා, "මෙන්න මේකයි ඇති වෙලා තිබෙන තත්ත්වය." කියලා. අඩුම තරමින් මේ රටේ මේකවත් කරන්න බැරි නම්, අපි මොකටද මේ රටේ පුරවැසියන් විධියට ජීවත් වෙන්නේ? මේ පාර්ලිමේන්තුවක් තියාගෙන දවසකට ලක්ෂ ගණන් වියදම් කරමින් වැඩ කරන්නේ මොකටද? මේ ක්‍රියාදාමය අද රටට අවශ්‍ය වෙලා තිබෙන කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය අපි දකින්නේ සිංහල හෝ දෙමළ හෝ මුස්ලිම් හෝ ජාතීන් අතර ඇති වෙලා තිබෙන මහා දැවැන්ත ප්‍රශ්න ටික බේරා ගන්න තිබෙන එක කාරණයක් විධියටයි. එම නිසා මේ ගන්නා වූ ක්‍රියා මාර්ගය ඉතා වැදගත්. අපේ ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා ඇහුවා, "මෙම විෂයය අයිති වෙන්නේ කාටද?" කියලා. අතිගරු ජනාධිපතිතුමාගේ අභිමතය පරිදි ඒක තීරණය වනවා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත වෙන්නේ කොළඹ. මෙම පනතේ 3. (3) වගන්තිය යටතේ බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "The head office of the OMP shall be situated in Colombo." කියලා. අවශ්‍ය නම්, කාර්යාල අනිකුත් පළාත්වලත් ස්ථාපිත කරන්න පුළුවන්. 1988දී වැඩියෙන්ම අතුරුදහන් වෙලා තිබෙන්නේ මාතර නම්, මාතරත් කාර්යාලයක් ස්ථාපිත කළ හැකියි. මඩකලපුවේ වැඩි පිරිසක් අතුරුදහන් වෙලා තිබෙනවා නම්, ඕනෑ නම් මඩකලපුවේ කාර්යාලයක් ස්ථාපිත කළ හැකියි. එවිට ඒ අයට කොළඹට එන්න ඕනෑ නැහැ. ඒගොල්ලන්ට මඩකලපුවේ කාර්යාලයට ගිහිල්ලා තමන්ගේ දරුවා හොයා ගන්න වැඩ පිළිවෙළ සකස් කරන්න පුළුවන්. මෙම කාර්යාලය ස්ථාපිත කරන්නේ කොළඹද, වෙනත් පැතිවලට ගෙනි යන්න බැරිද කියන කාරණය ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා අපි අන්න ජාතිවාදී විධියට කල්පනා කරන්නේ නැතුව, බුද්ධිමත් විධියට කල්පනා කරමු කියලා මම කියන්න කැමැතියි. අද සිංහල, දෙමළ හා මුස්ලිම් කියන අපි සියලු දෙනාට ශ්‍රී ලාංකික ජනතාවක් විධියට එකට එකතු වෙලා වැඩ කරන්න වුවමනා වාතාවරණයකුයි ඇවිත් තිබෙන්නේ. ඒ සඳහා කරුණාකරලා සංයමයෙන් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මෙම පනත් කෙටුම්පතට අපේ සහයෝගය ලබා දෙනවාය කියා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක් තිබෙනවා.

[අ.භා. 5.41]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව කථා කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මෙම විෂයය සම්බන්ධයෙන් කථා කරද්දී අපි විශේෂයෙන්ම මතක තබා ගන්න ඕනෑ, අතුරුදහන් වීම් අපේ රටේ අවස්ථා කීපයකදීම සිද්ධ වුණ බව. අපි දන්නවා 70 දශකයේත්, ඒ වාගේම 80 දශකයේ 1988 - 89 කාලයේත්, ඊළඟට පසු ගිය යුද සමයේදීත් මේ රටේ මිනිසුන් අතුරුදහන් වුණ බව. එසේ අතුරුදහන් වුණේ, උතුරේ වෙන්න පුළුවන්; නැඟෙනහිර වෙන්න පුළුවන්; දකුණේ වෙන්න පුළුවන්. අතුරුදහන් වුණේ කවුරු වුණත්, ඒ මේ රටේ ඉපදුණු අයයි. එල්ටීටීඊ සංවිධානයේ ක්‍රියාකාරීන් අතුරුදහන් වෙලා ඉන්න පුළුවන්. සාමාන්‍ය මිනිසුන් අතුරුදහන් වෙලා ඉන්න පුළුවන්. හමුදා සෙබළුන් විශාල ප්‍රමාණයක් අතුරුදහන් වුණා. පොලිස් නිලධාරීන් අතුරුදහන් වුණා. ඒ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් මේ රට හමුවේ තිබෙනවා. ඒ අතුරුදහන් වුණු අය අතර යුද්ධයත් එක්ක ගැටුණු, යුද්ධයට අඩුවෙන් සම්බන්ධ වූවන් මෙන්ම, කොළඹ වාගේ නගර තුළ සිටි තරුණයනුත් අතුරුදහන් වුණ බව අපි දන්නවා. මම දන්න විධියට යුද්ධය අවසාන වුණාට පස්සේත් කොළඹ නගරයේ තරුණයන් 15කට - 25කට වැඩි ප්‍රමාණයක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ අවුරුදු 25 - 30 වයස්වල තරුණයන්. අදටත් ඔවුන්ගේ දෙමව්පියන් තමන්ගේ පුතා ඉන්නවාද කියලා හොයන්න, උතුරේ තිබෙන කඳවුරුවලටත් යනවා; දකුණේ තිබෙන කඳවුරුවලටත් යනවා. යුද්ධයත් එක්ක කිසිදු සම්බන්ධතාවක් නැතිව කොළඹ නගරයේ අතුරුදහන් වුණු එහෙම පිරිසකුත් ඉන්නවා. එසේ අතුරුදහන් වූවන්ගේ දෙමව්පියෝ සහ සහෝදරයෝ, තමන්ගේ දරුවෝ, තමන්ගේ සහෝදරයෝ අද එයි, හෙට එයි කියලා බලාගෙන ඉන්න කාලයක තමයි අප මේ ජීවත් වෙන්නේ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව සොයා බැලීම සඳහා කාර්යාලයක් පිහිටුවන්න නිර්දේශ කළේ, පසු ගිය ආණ්ඩුව බවත් අපි ඒ වාගේම මතක තබා ගන්න ඕනෑ. එදා මහින්ද රාජපක්ෂ මහත්තයා පත් කරපු, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ පරීක්ෂණ කොමිසම -LLRC- යටතේ තමයි එය නිර්දේශ කර තිබුණේ. එම කොමිෂන් සභා වාර්තාවේ එක නිර්දේශයක් තමයි, අතුරුදහන් වූවන් පිළිබඳව සොයා බැලීමට කාර්යාලයක් පිහිටුවීම. යුද්ධයෙන් පස්සේ -පශ්චාත් යුගයේ- අන්‍යෝන්‍ය අවබෝධය ඇති කරගෙන ජාතික සංහිඳියාවට මේ යන ගමන සඳහා තමයි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව සෙවීමේ කාර්යාලය අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ. මොකද, අපට වුවමනා වෙලා තිබෙනවා සියලුදෙනාටම යුක්තිය ඉෂ්ට කරන්න.

අපට මතකයි එදා 88-89 කාලයේදී මහින්ද රාජපක්ෂ මහත්මයාත්, අපේ මංගල සමරවීර ඇමතිතුමාත් හැදුවා "මව් පෙරමුණ" කියන මහජන ව්‍යාපාරය. ඊළඟට, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා මූලික වෙලා "අතුරුදහන් වූවන් පිළිබඳ

සොයා බැලීමේ සංවිධානයක්" හැදුවා. එම සංවිධාන හදලා, 88-89 කාලයේ දකුණේ අතුරුදහන් වුණු අයගේ ලැයිස්තු අරගෙන ගිහින් එදා ජිනීවාවලට ඉදිරිපත් කළා. 1994දී මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ආවා. නමුත්, එතුමා බලයට ආවාට පස්සේවත් ඒ භාර දීපු ලැයිස්තු ගැන කිසිදු සොයා බැලීමක් වුණේ නැහැ. රාජපක්ෂලා භාර දීපු ලැයිස්තු ගැනවත් රාජපක්ෂලාගේ පාලන කාලයේදී හොයා බැලුවේ නැහැ.

එදා මහින්ද රාජපක්ෂ මහත්මයා ජිනීවාවලට ගිහින් භාර දීපු ලැයිස්තු ටික අප පිහිටුවන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට භාර දුන්නා නම්, ඒ ගැන අපට දැන් සොයා බලන්න පුළුවන් කියලා මා කියන්න කැමැතියි. අපි මේ කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයක්. මෙය, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් කරන කර්තව්‍යයක්. එහෙම නැතුව මෙය කවුරුන්වත් බිල්ලට දෙන්නවත්, කවුරුන්වත් බිල්ලට යවන්නවත්, කාටවත් විරුද්ධව කරන දෙයක්වත් නොවෙයි.

අතුරුදහන් කිරීම කියලා කියන්නේ සාපරාධී අපරාධයක්. කවුරුවත් අතුරුදහන් කරනවාට අපි කවුරුවත් කැමැති නැහැ. එය කොයි කාලයේදී සිද්ධ වුණත්, එය වැරැදියි කියලා අපි සියලුදෙනාම පිළිගන්නවා. අතුරුදහන් කරවීම අපරාධයක් හැටියට තමයි ශිෂ්ටසම්පන්න ලෝකය අද පිළිගන්නේ. මා හිතන හැටියට ඒ අපරාධය අපේ රටින් තුරන් කරන්න අද අපට අවස්ථාවක් ලැබී තිබෙනවා. අපි අගය කරන්නේත්, මේ කර්තව්‍යයට අපි මැදිහත්වෙලා ඉන්නේත්, අපට ඕනෑ කරන්නේත් පුද්ගලයන් අතුරුදහන් නොවන ශ්‍රී ලංකාවක් හදා ගැනීමයි. අපි සියලු දෙනාගේම බලාපොරොත්තුව එයයි. පුද්ගලයන් අතුරුදහන් කරවීමේ රටක් නොවෙයි අපට ඕනෑ වෙලා තිබෙන්නේ. එය නතර කරන රටක් තමයි අපට ඕනෑ වෙලා තිබෙන්නේ. අනාගතයේදී මේ වාගේ දේවල් නොවෙන්න තීන්දුවක් ගන්න තමයි රජයක් හැටියට අපි මේ කර්තව්‍යය කරගෙන යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කාරණාවල යම් යම් පරස්පර විරෝධතා තිබෙනවා. දයාසිරි ජයසේකර අමාත්‍යතුමාත් එය පෙන්වා දුන්නා. විශේෂයෙන්ම නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, නඩු පවරන්න බැහැයි කියලා. එය වැරැදියි. මේ පනතේ 25 (2) උප වගන්තිය යටතේ තිබෙනවා, සද්භාවයෙන් තොරව කරන ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ නිලධාරීන්ට විරුද්ධව නඩු මාර්ගයකට යන්න පුළුවන් කියලා.

ඒ විතරක් නොවෙයි. අපේ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාගේ කථාවේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම ගැන කථා කළා. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා කිව්වා, කොළඹ නගරයේ මූලික කාර්යාලය හැදෙන බවත්, පළාත් කාර්යාල පටන් ගන්න පුළුවන් බවත්. ඒවා උතුරේ විතරක් නොවෙයි, අවශ්‍ය නම් දකුණේ අතුරුදහන් වුණු අය සොයන්නත් දකුණේත් ඒ කාර්යාල පිහිටුවන්න පුළුවන්.

විශේෂයෙන්ම අද ආණ්ඩුවට වුවමනා වෙලා තිබෙන්නේ, අපේ අවබෝධය, අපේ සංහිඳියාව දියුණු කරමින් අලුත් රටක් හදන්න යන වැඩ පිළිවෙළක් කරා ගමන් කරන්නයි. පටු දේශපාලන වාසි ලබාගැනීමේ චේතනාවක්වත්, වෙන යම් පෞද්ගලික වුවමනාවක්වත්, එහෙම නැත්නම් පළිගැනීමේ චේතනාවක්වත් මේ ක්‍රියාවලිය තුළ නැහැ. අපේ රට අවුරුදු 30ක යුද්ධයකට හසුවුණු රටක්. මේ රටේ සංහිඳියාව අපි නැවත බලාපොරොත්තු වනවා. මේ රටේ ජාතීන් අතර එකමුතුව අපි නැවත බලාපොරොත්තු වනවා. ජාතීන් අතර එක්සත්කම අපි නැවත බලාපොරොත්තු වනවා. ඒ සියලු බලාපොරොත්තු කැටිකරගෙන යන ගමනේදී තමයි අතුරුදහන් වුණු අය ගැන සොයන්න ඕනෑ. ඔවුන්ට මොකක්ද වුණේ, ඔවුන් ජීවත්වෙලා ඉන්නවාද, නැද්ද, ඔවුන් අතුරුදහන් වුණේ ඇයි කියන ගැටලුවලට ලෝකය ඉදිරියේ අද අපි මුහුණ දෙනවා. අපේ රට, අසාධාරණයට ලක්වුණු, අයුක්තියට ලක්වුණු ජනතාවට සාධාරණය ඉෂ්ට කරන රටක් බව අපට අද ලෝකයාට කියන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදී මේ කර්තව්‍ය තුළින් ලෝකයාට ඒ පණිවුඩය දෙන්න අපට පුළුවන්.

අද ලෝකය ඉදිරියේ අපි මේ රටේ මානව හිමිකම් ආරක්ෂා කරමින්, මේ රටේ මනුෂ්‍යයන් ජීවත්වනවාය කියන හැඟීම නැවත පණ ගන්වමින් යන මේ යුගයේදී, අපේ රටේ අසාධාරණයට ලක්වුණු ජනතාවට යුක්තිය ඉෂ්ට කරන්න පුළුවන් කර්තව්‍ය මේ ආණ්ඩුව ඉෂ්ට කරනවාය කියන පණිවුඩය අපට ලෝකයට දෙන්න පුළුවන් බව කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.49]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்பட்ட காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் (தாபித்தலும், நிர்வகித்தலும் பணிகளை நிறைவேற்றுதலும்) (திருத்தம்) சட்டமூலம் உண்மையிலே முக்கியமான ஒரு விடயம். ஆனால், இதுபற்றி உரையாற்ற எனக்கு 4 நிமிடங்கள் மட்டுமே ஒதுக்கப்பட்டுள்ளன. இதனை ஒரு பாரபட்சமான விடயமாகத்தான் நான் பார்க்கின்றேன்.

வடக்கு, கிழக்கிலே காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவுகள் இற்றைக்கு 4 மாதங்களுக்கு மேலாகத் தொடர்ச்சியாகத் தங்களுடைய பிள்ளைகளுக்கு என்ன நடந்தது என்பதை அறிவதற்காக வீதியோரங்களிலே கவனயீர்ப்புப் போராட்டத்தில் ஈடுபட்டிருக்கிறார்கள். ஆனால், பொறுப்புவாய்ந்த இந்தத் தேசிய அரசாங்கம் இதுவரைக்கும் அவ்வாறிருக்கின்ற அந்த மக்களுக்கு உருப்படியான எந்தவொரு பதிலையும் வழங்கவில்லை. யாழ்ப்பாணம் சென்ற மேதகு ஜனாதிபதி அவர்கள் சில வாக்குறுதிகளை அவர்களுக்கு வழங்கியிருக்கின்றார். அதாவது, காணாமல் ஆக்கப்பட்டிருப்பவர்களுடைய பெயர் விபரங்களை வெளியிடுவதாகவும் இரகசியத் தடுப்பு முகாம்கள் தொடர்பான தகவல்களை வெளியிடுவதாகவும் தெரிவித்திருக்கின்றார். ஆகவே, மேதகு ஜனாதிபதி அவர்கள் அளித்த வாக்குறுதியின்படி அதனை நிறைவேற்ற வேண்டுமென்று நாம் எதிர்பார்க்கின்றோம்.

காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகமானது வெறுமனே காலத்தைக் கடத்துவதற்காகவும் கண்துடைப்புக்காகவும் அமைக்கப்படாமல், உண்மையையும் நீதியையும் நிலைநாட்ட வேண்டும். ஏனென்றால், காணாமல் ஆக்கப்பட்டவர்களுக்கான நீதியைக் கண்டறிய வேண்டிய ஒரு தேவைப்பாடு இருக்கிறது. குறிப்பாக இலங்கை அரசாங்கம் ஐ.நா மனித உரிமைகள் பேரவைத் தீர்மானத்தின் (30)-i இன் கீழான வாசகத்தை ஏற்றுக்கொண்டதன் அடிப்படையில் ஒரு கலப்பு நீதிமன்றத்தினூடாக இந்த விசாரணைகள் இடம்பெற வேண்டுமென்பதுதான் எங்களுடைய

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

கோரிக்கையாகும். ஏனென்றால், இறுதிக்கட்டப் போரிலே இராணுவத் தினருடைய - அரசாங்கத்தினுடைய வேண்டுகோளை ஏற்றுச் சரணடைந்தவர்கள் மற்றும் கடத்தப்பட்டவர்கள், கைது செய்யப்பட்டவர்கள் எனப் பல்லாயிரக்கணக்கானோர் காணாமல் ஆக்கப்பட்டிருக்கிறார்கள்; இவர்களோடு நேரடியாக இராணுவத்தினர் சம்பந்தப்பட்டிருக்கின்றனர். அடுத்து, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் வேண்டுகோளையேற்று இந்த அரசாங்கத்தை ஆட்சிக்குக் கொண்டுவருவதற்காக அதற்கு ஆதரவளித்த எமது மக்கள் இற்றைக்குப் பல நாட்களாகத் தங்களுடைய உறவுகளுக்கு - குடும்பத்தவர்களுக்கு என்ன நடந்திருக்கிறது என்று தெரியாத நிலையில் இருக்கிறார்கள்.

மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் 2015ஆம் ஆண்டு ஐ.நா. மனித உரிமைப் பேரவையின் கூட்டத் தொடரின் பின்னர், "முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களை மின்சாரக் கதிரையிலிருந்து நான்தான் காப்பாற்றியிருக்கின்றேன்" என்று கூறியிருந்தார். அதேபோல் "இராணுவத்திலே இருக்கக்கூடிய 40 க்கும் மேற்பட்ட முக்கியமான தளபதிகளையும் அதிலிருந்து காப்பாற்றியிருக் கின்றேன்; எந்தவொரு சந்தர்ப்பத்திலும் இராணுவத்தினரை விசாரணைக்கு உட்படுத்தமாட்டேன்" என்றவாறு விடயங்களைக் கூறிக்கொண்டிருக்கின்ற இந்த நாட்டின் முப்படைகளுக்கும் தலைமைதாங்குகின்ற ஜனாதிபதி அவர்கள் எப்படி ஒரு நீதியான விசாரணையை மேற்கொள்ள முடியும்? என்பதுதான் எங்களுக்குள் இருக்கின்ற சந்தேகம்! கேள்வி!

காணாமல் ஆக்கப்பட்டோர் பற்றிய அலுவலகமானது மாவட்டங்கள் தோறும் திறக்கப்பட வேண்டும். ஆனால், இது காலம் கடத்துவதற்காகவோ அல்லது உண்மையை மூடிமறைப்பதற்காகவோ அல்லாமல் செயற்பட வேண்டும். ஒரு நீடித்த - நிலைத்த சமாதானமும் நல்லிணக்கமும் ஏற்பட வேண்டுமாக இருந்தால், பாதிக்கப்பட்டவர்களுக்கு நீதியைப் பெற்றுக்கொடுக்க வேண்டிய தேவை இருக்கின்றது. இந்த அலுவலகம் நிறுவப்படுவதை, காலம் கடத்துகின்ற ஒரு செயற்பாடாகத்தான் நாங்கள் பார்க்கின்றோம். ஏனெனில், ஏற்கெனவே இடம்பெற்ற பலவிதமான செயற்பாடுகள் காலம் கடத்துகின்றவையாவே இருந்தன. புதிய அரசியலமைப்பைக் கொண்டுவருவதா? அல்லது இருக்கின்ற அரசியல் யாப்பில் திருத்தத்தைக் கொண்டுவருவதா? என்பது குறித்துச் சம்பந்தப்பட்ட அரசியலமைப்புக் குழு 62 தடவைகளுக்கு மேல் கூடியபோதிலும் அதனூடாக எந்தவொரு முடிவையும் எட்ட முடியாத நிலைமைகள்தான் இருக்கின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up your speech now.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
ஆகவே, இந்த ஆட்சி மாற்றத்திற்குப் பின்னால் இருக்கக்கூடிய தமிழ் பேசும் மக்களின் வாக்குகளைப் பெற்ற அரசாங்கம், காணாமல் ஆக்கப்பட்டவர்களின் விடயமாக இருக்கலாம், காணிகளை விடுவிக்கின்ற விடயமாக இருக்கலாம், எந்தவொரு விடயமாக இருந்தாலும் எதுவித முன்னேற்றத்தையும் காண முடியாமல் காலம் கடத்துகின்ற செயற்பாட்டையே மேற்கொண்டு வருகின்றது. அவ்வாறு இந்த அலுவலகமும்கூட வெறுமனே காலத்தைக் கடத்துகின்ற ஓர் அலுவலகமாக இல்லாமல், உண்மையையும் நீதியையும் கண்டறிகின்ற அலுவலகமாகச் செயற்படுவதற்கு அரசாங்கம் உரிய நடவடிக்கை எடுக்க வேண்டும் எனக் கோரிக்கை விடுத்து, விடைபெறுகின்றேன்.

[5.54 p.m.]

ගරු රවි කරුණානායක මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Foreign Affairs)
Hon. Presiding Member, the 11th of August, 2016 was an important day in the modern history of our country. It was also an important day for this House. On that day, this House unanimously approved the Bill that was before us on establishing an Office on Missing Persons.

By taking this important step to establish an Office on Missing Persons by an Act of Parliament, we sent an important message to all the people of our country; a message which echoed throughout the world. After two insurrections in the South of our country and after a prolonged conflict in the North and the East, we showed the world that day that we have now turned a new leaf in our nation's journey. We showed the world that this House is united by compassion for all the people in all parts of our country who have suffered the fate of having their loved ones join the ranks of a category called "missing persons." We also told the people of our country, loud and clear, that this House stands firm in protecting the fundamental rights of all Sri Lankans provided for in the Constitution of our country and, helping to heal the wounds of our people. We united that day to show the world by our actions that we in this nation are, in fact, guided by the teachings of Gauthama Buddha that we are governed in our actions by extending compassion for the grieving mothers, fathers, sisters and brothers in our country.

As you are aware, Sir, the mothers and the fathers agonizing over their missing children and the wives and children, grieving over their missing husbands and parents is not a phenomenon that is confined to any particular part our country. There are over 5,000 missing security forces personnel in this country. Their mothers, fathers, wives, children, sisters and brothers are still waiting to know what happened to them. There are mothers and fathers in the South of our country who have been grieving for their missing children from the 1980s and 1990s and are still living with the hope of finding out their fate. The mothers of the North and the East of our country, continue to fast and go on processions, grieving and crying and urging us to find their missing children.

Hon. Presiding Member, today, we have before this House, an amendment to the Act that was adopted on 11th of August and certified on 23rd of August last year. This amendment which was proposed in this House on the 11th of August, could not be incorporated before the approval of the Bill on that day due to the atmosphere that prevailed in this House. Therefore, steps have been taken

to introduce this amendment through this Bill that is before us today. I urge all the Hon. Members of this House to support this amendment.

His Excellency President Maithripala Sirisena, just last week, demonstrated his statesmanship, empathy, humaneness and respect for the grieving families of the missing during his visit to Jaffna. Those families, like the families of the missing from all regions of our country, who were consulted during the island-wide consultations conducted by the Consultation Task Force last year, long for clarity about the fate of their loved ones. Our Prime Minister has been echoing this message for the last couple of decades that natural justice should take place and he has been leading this from the forefront from all ends.

This Office is not our country's first attempt to resolve cases of the missing. Previous attempts included steps taken during the 1990s and the appointment of Paranagama Commission. However, they were not comprehensive in nature and were limited in scope. This Office is of a permanent nature and has a broad mandate given by this House to search for and trace missing persons and to clarify the circumstances of their disappearance. It will be tasked with centralizing all available data on missing persons and will make recommendations to relevant authorities to protect the rights and interests of missing persons and their relatives. It will also make recommendations aimed at making sure that incidents of this nature will not happen in the future in our country. It will serve as a reminder to future generations of our country of the importance of ensuring that problems are resolved through peaceful means; it will be a reminder to us, all of the youth, from all parts of our country that this nation lost, and help us and generations to come, to resolve to never allow a repetition of such horrors.

The Office on Missing Persons will not prioritize the missing and disappeared of one community over another. It will investigate the circumstances of the missing irrespective of the date of disappearance. Members of the Armed Forces and the police "missing in action", those missing in the context of the conflict in the Northern and Eastern Provinces, and those missing from political unrest and civil disturbances from earlier decades, will also fall within the mandate of the Office on Missing Persons.

Sir, some of the Hon. Members of Parliament have attempted to mislead this House and the public of this country by stating that this Office has a prosecutorial or judicial mandate. If they only spend some time to read the Act carefully, they will realize that the mandate of this Office is purely humanitarian. It does not have any prosecutorial or judicial powers. Its aim is to ensure that we find answers for the grieving families and that we ensure that we take the required steps to make the people of our country enjoy sustainable peace and prosperity at least in the future, with no chances of the horror of violence and pain that the people of this country had to face in the past ever being repeated again.

Sir, this is not an issue to be politicized. The question of the missing is a critical humanitarian concern. Every human being with an ounce of compassion can relate to the anguish of the families who do not know what happened to their loved ones. If one of our own children, if one of our brothers or sisters, were to vanish without a trace, imagine how distraught each one of us would be. If years passed since the incident, without a sign for us to mourn or to hope, our pain would not diminish. We would always wonder what happened to them. We would continue to wonder whether they are alive or whether they are dead. We would carry the agony of not knowing what happened to them, all the way to our graves, while our children and grandchild will also continue to carry this pain.

As a responsible Government, as a responsible State, as a responsible community, and as a responsible people who care for our fellow citizens, we must untie to take steps to establish this Office without delay and show that we are a compassionate nation.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඩිලාන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

ගරු ඩිලාන් පෙරේරා මහතා (මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - நெடுஞ்சாலைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilan Perera - State Minister of Highways)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොච්චර වෙලාවක් තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.02]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගන්නේ ඉතාම වැදගත් ඒ වාගේම අපි කාටවත් විරුද්ධ වෙන්න බැරි පනත් කෙටුම්පතක් පිළිබඳව කියලායි මම කල්පනා කරන්නේ. අතුරුදහන්වූවන්ගේ කොමිසමක් පත් කරලා, අතුරුදහන් වුණු ඒ පුද්ගලයන් ඉන්නවාද, නැද්ද කියලා ඒ අයගේ අම්මලා - තාත්තලට දැන ගැනීමේ අයිතිය වෙනුවෙන් මේ සභාවේ ඉන්න පක්ෂ - විපක්ෂ අපි ඔක්කෝම එක එක වකවානුවල කථා කරලා තිබෙනවා. හැබැයි කථා කරලා තිබෙන්නේ දේශපාලන වාසි ගන්න විතරයි. ඒ දවස්වල එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පැවැති කාලයේ අපි විරුද්ධ පක්ෂයේ සිටින කොට මව්වරුන්ගේ පෙරමුණු හදලා, මව්වරුන්ගේ පෙරමුණුත් එක්ක කොළඹ ඉඳන් කතරගමට පෙළපාළි ගිහිල්ලා අපි ඒ අම්මලාත් එක්ක ලෝකයටම ඇහෙන්න විශාල උද්ඝෝෂණයක් කළා, "මගේ පුතා ඉන්නවාද, නැද්ද? කියලා කියන්න" කියලා. එදා අපි පෙළපාළි ගියේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ගාමිණී ලොකුගේ මැතිතුමා

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

ඇතුළුව එදා තිබුණු ආණ්ඩුවට එරෙහිවයි. එදා අපි පෙළපාළි ගිහිල්ලා හඬ ගාලා ඉල්ලුවේත්, "අපේ පුතා ඉන්නවාද, නැද්ද කියලා කියන්න" කියලායි. වර්තමානයේ උතුරු පළාතේ, නැහෙනහිර පළාතේ අම්මලා මගේ පුතා ඉන්නවාද, නැද්ද? කියලා අහනවා. ඒකට උත්තරය දෙන්න යන කොට, තව කට්ටියක් ඒකට ජාතිවාදය ගාවා ගෙන කියනවා, "නැහැ, නැහැ. ඒක හොයනවා නම් අරකත් හොයලා ඉන්න" කියලා. මේක හොයන්න නම් ඒක හොයන්න ඕනෑම නැහැ. මේක හොයලා ඒකත් හොයමු. හැබැයි, මේක හොයනවා නම් අරකත් හොයන්නම ඕනෑ කියලා කියන්නේ ආපසු ඒකට ජාතිවාදය අමුණා ගැනීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නා විධියට නම් මේ ලෝකයට ඉපදුණු ඕනෑම දරුවෙකුට ලේ කිරි කරලා අම්මා පොවන කොට ඒකේ ජාතිය ලියවිලා නැහැ. මම දන්නා විධියට ලේවල තිබෙන්නේ, "A, B, AB and O" කියලා වර්ග හතරයි. ඒකේ දෙමළ ලේ, සිංහල ලේ, මුස්ලිම් ලේ කියලා කොහේවත් ලියවිලා නැහැ. හැබැයි අපි දැන් ලේවලත් ලියනවා, "දෙමළ ලේ, මුස්ලිම් ලේ" කියලා. ඊළඟට, ඉඩන අම්මලාගේ දරුවෝ ඉන්නවාද, නැද්ද කියන එකට උත්තරය දෙන කොටත් අපි කියනවා, "දෙමළ ලේද, සිංහල ලේද කියලා බලලා උත්තර දීපං" කියලා. මේ සභාවේ විවාදවලට අහුම්කන් දීගෙන ඉන්න කොට මට නම් හැහුණේ ඒක තමයි.

අපි ඔක්කෝම අම්මාගේ කිරි බීලා හැදිච්ච දරුවෝ. මම නැති වුණා නම්, මගේ අම්මා කොච්චර අඬනවාද? මමත් එක්ක විශ්වවිද්‍යාලයේ සමකාලීන සහෝදරයෙක් හිටියා, උපාලි ජයවීර කියලා. කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු ශිෂ්‍ය සභාවේ සභාපති සහෝදරයා. මා දේශපාලනයට ගෙනෙන්න මුල් වුණු සහෝදරයා. ඒ සහෝදරයා අතුරුදහන් වුණා. ඒ සහෝදරයාගේ බිරිඳට දරුවෙක් ලැබෙන්නයි හිටියේ. අද ඔහුගේ දරුවාත්, භාර්යාවත් හොඳින් ජීවත් වෙනවා. හැබැයි, මට ඒ දවස්වල කොච්චර හිතේ වේදනාවක් ඇති වුණාද, උපාලි සහෝදරයා අතුරුදහන් වුණාය කියලා. මගේ මිතුයෙක් අතුරුදහන් වෙලා එහෙම වේදනාවක් දැනුණා නම්, තමන්ගේ දරුවෙක් එහෙම අතුරුදහන් වුණා නම්? ඒක නිසා මේ ප්‍රශ්නය දිහා ජාතිවාදී කෝණයෙන් බලන්න එපා. මේ ප්‍රශ්නය දිහා ආගම්වාදී, දේශපාලන කෝණවලින් බලන්න එපා. දෙමළ අම්මා වේවා, සිංහල අම්මා වේවා, මුස්ලිම් අම්මා වේවා තමන්ගේ දරුවා උන්නාද, මළාද කියලා දැන ගැනීමේ අයිතිය ඔවුන්ට තිබෙන්නට ඕනෑ.

මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ හැම අවුරුද්දකම පෙබරවාරි මාසයේ දී මමත් ලෝකය පුරාම ගියා. අපි ගිහිල්ලා එම රටවලට මොකක්ද කිව්වේ? අපි කිව්වා, "අතුරුදහන්වූවන් ගැන හොයන්න අපි මේ වාගේ mechanism එකක් හදනවා" කියලා. අපි එහෙම පොරොන්දු වුණා. "ඒ නිසා අපට තව කල් දෙන්න. අපව බිත්තියට හේත්තු කරන්න එපා; අපට විරුද්ධව යෝජනා ගෙනෙන්න එපා. අපි මේ වාගේ එකක් හදනවා. අපි පරණගම කොමිසම හැදුවා. LLRC එකේ තීන්දු තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න අපට ඉඩ දෙන්න; කල් දෙන්න" කියලා මම ගිහිල්ලා පැවැති ආණ්ඩුව වෙනුවෙන් ඒ රටවලින් ඉල්ලුවා. හැබැයි, අද ඇවිල්ලා වෙන කතන්දර කියනවා. ඒක නිසා කරුණාකරලා මේ ප්‍රශ්නය දිහා දේශපාලන කෝණවලින් බලන්න එපා; ජාතිවාදී කෝණවලින් බලන්න එපා. සමහර වෙලාවට කියන කථාව ඇත්ත. ලෝකයේ මෙවැනි සමහර කොමිෂන් දිහා බැලුවාම ඒ කොමිෂන් සභාවලින් සමහර වෙලාවට වැඩක් වෙන්නේ නැහැ කියලා තීන්දු කරන්න පුළුවන්. හැබැයි, එක වැඩක් අනිවාර්යයෙන් වෙනවා. මොකක්ද ඒ? තමන්ගේ තිබෙන බර හැල්ලු කර ගන්න පුළුවන් වෙනවා. තමන්ගේ පුතා නැහැ කියලා දැන ගත්තාම ඒ බර හැල්ලු කරලා දීමම පමණක් දැනට ප්‍රමාණවත් නැද්ද? උතුරේ අම්මලා තමන්ගේ දරුවන්ගේ පින්තූර අල්ලා ගෙන ඉන්න කොට මට මතක් වෙන්නේ අපි ඒ කාලයේ පින්තූර අරන් දකුණේ ගිය විධිය. ඒක නිසා මගේ හිතට එන්නේ නැහැ, "අනේ දකුණේ එක හෙව්වේ නැහැ, ඒ නිසා මේක හොයන්න එපා"ය කියලා. මම කියන්නේ දැන් මේ ගැන හොයන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයට කාර්යාලයක් දැම්මායින් පස්සේ අඩු ගණනේ අනාගතයේදී මෙවැනි අතුරුදහන්වීම් නවතී; මෙවැනි අතුරුදහන් කිරීමවලට වග කියන්න ඕනෑ සමහර පුද්ගලයින්, මෙවැනි අතුරුදහන් කිරීම් කරන්න භය වෙයි. එල්ටීටීඊ එක වේවා; හමුදාව වේවා; වෙනත් අය වේවා; මුස්ලිම් කල්ලි වේවා, අනාගතයේදී එවැනි දේ කරන්න භය වෙයි. අනාගතයේදී යම් කෙනෙක් අතුරුදහන් කරන්න හිතනවා නම්, මෙවැනි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් තිබෙන කොට ඒ සිතිවිල්ල ඒ පුද්ගලයා එතැනින්ම අයින් කර ගනී. අඩු ගණනේ එවැනි දෙයක්වත් මෙයින් වෙන්නේ නැද්ද? මේ කාර්යාලය ඇති කරනවාට කවුරු හෝ විරුද්ධ වෙන්න පුළුවන්. අම්මා කෙනෙකුගෙන් කිරි බීලා හැදුණේ නැති දරුවෙකු විතරයි මේකට විරුද්ධ වෙන්නේ.

මේ කාර්යාලය ඇති කරන්න මුලින්ම යෝජනා ගෙනෙන කොට, මේ හරහා තිබුණු අපේ ස්වෛරීත්වයට බලපාන සමහර කරුණු පිළිබඳව අපි සියලු දෙනාම එකට එකතු වෙලා සංශෝධන ගෙනාවා. අද රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා ඇහුවා, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංශෝධනවලට මොකද වුණේ?" කියලා. අපි ගෙනාපු සංශෝධනවල තිබෙන කාරණා බොහොමයක් ජේවීපී සංශෝධනවල තිබෙනවා. අපිට ඕනෑ නැහැ, "ඒක ජේවීපී එකේ සංශෝධන නොවෙයි, ශ්‍රී ලංකා එකේ" කියලා ගෙනෙන්න. අපට ඕනෑ වුණේ, සංශෝධනවල තිබෙන අන්තර්ගතය ගෙන එන්න පමණයි. එහෙම නැතිව ලකුණු දමා ගැනීමේ වුවමනාවක් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා මේ යෝජනාව ගෙනාපු වෙලාවේ ප්‍රශ්න මතු කරලා, කාල ගෝට්ටි ඇති කළා. එහෙම වුණු නිසා අපේ රටේ මැරිච්ච දරුවාගේ අම්මාට, ඒ දරුවා ඉන්නවාද නැද්ද කියලා හොයන්න තීන්දු කරලා තිබෙනවාය කියන පණිවිඩය ලෝකයට දෙන්න තිබුණු ඒ අගනා අවස්ථාව එදා ගිලිහී ගියා. කථාවලින් මොන මොන ආකාරයේ දේවල් කිව්වත්, අද ඊට වඩා හොඳ පරිසරයක් නිර්මාණය වෙලා තිබෙනවා. සමහර අය ගෙදරින් කවුරු හරි ලියලා දීපු කථාව කියපු නිසා, බබාලා වාගේ-

[බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අද මේ සම්මත කරන පනත් කෙටුම්පත හරහා අපි ලෝකයට පණිවිඩයක් දෙනවා, "අපි මනුස්සකමට සලකන මිනිස්සු" කියලා. ඉතිහාසයේ අතුරුදහන් වුණු ඒ දරුවන්ගේ අම්මලාට පණිවිඩයක් දෙනවා, "ඔව් අම්මේ, ඔයාගේ දරුවත් ඉන්නවාද නැද්ද කියලා මේ කාර්යාලය හරහාම හොයා ගන්න පුළුවන්" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ අම්මාගේ දරුවාත්, දකුණේ අම්මාගේ දරුවාත්, ඌවේ අම්මාගේ දරුවාත්, සිංහල

අම්මාගේ දරුවාත්, දෙමළ අම්මාගේ දරුවාත්, මුස්ලිම් අම්මාගේ දරුවාත් දරුවෙක්. ඒ නිසා ඒ දරුවා ඉන්නවාද නැද්ද කියන අයිතිය දැන ගන්න ගෙනෙන මේ පනත් කෙටුම්පතට මේ ගරු සභාවේ අපි සියලු දෙනාම එක අතක් නොවෙයි, අත් දෙකම ඔසවන්න ඕනෑ කියලා මම කල්පනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, - [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද ඔබතුමන්ගේ point of Order එක?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශ්‍රී ලාංකික තරුණියක් වන ජයත්මා වික්‍රමනායක මැතිනිය ඊයේ හැන්දෑවේ next "Envoy on Youth" වශයෙන් පත් වෙලා තිබෙනවාය කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමා අපව දැනුවත් කරලා තිබෙනවා. මම ඒ ලිපිය ඔබතුමාගේ අවසරය පරිදි කියවන්නම්. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කෙටියෙන් කියන්න. වෙලාව පිළිබඳව පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay, Sir.

On behalf of the Sri Lankans, I would like to read out very proudly the Official Media Release on this appointment that was sent to the Ministry of Foreign Affairs yesterday. It states, I quote:

"SECRETARY-GENERAL APPOINTS JAYATHMA WICKRAMANAYAKE OF SRI LANKA AS ENVOY ON YOUTH.

United Nations Secretary-General António Guterres has appointed Jayathma Wickramanayake of Sri Lanka as his next Envoy on Youth. She will succeed Ahmad Alhendawi of Jordan to whom the Secretary-General is grateful for his dedicated service in addressing the needs and rights of young people, bringing the work of the United Nations closer to them. The success of the 2030 Agenda for Sustainable Development depends on empowering young people as rights-holders, agents of change and torchbearers.

Having represented and motivated global youth development on an international level since the age of 21 notably during high-level United Nations initiatives including the declaration of World Youth Skills Day, Ms. Wickramanayake has also played a key role in transforming the youth development sector at the national level, notably through the creation of a large movement for civic and political engagement of youth people named "Hashtag Generation."

Presently working as an officer of the Sri Lanka Administrative Service, Ms. Wickramanayake has previously served as Secretary to the Secretary-General of the Parliament of Sri Lanka (2016 - 2017), Project Officer - Youth, One - Text Initiative in Sri Lanka (2015 - 2016), Member and Youth Lead Negotiator, International Youth Task Force of the World Conference on Youth 2014 (2013 - 2014) ...."

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තාරක බාලසූරිය මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමන්ගේ point of Order එක? [බාධා කිරීමක්]

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Sir, what is being raised by the Hon. Minister is not a point of Order. He is referring to the -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමා විදේශ කටයුතු ඇමතිතුමා හැටියට, - [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Surely this is a singular and a spectacular achievement for Sri Lanka. I know that you do not want to give the credit. මම දන්නවා ඔබතුමන්ලා ලාංකික - okay, if you think it is not a point of Order, take it in anyway. But it is a - [*Interruption*.] I cannot make it as a Statement at this particular moment, Hon. Member. Sir, I am only reading out a good notice coming from the Secretary-General - all we previously had were negative notices with sanctions coming on. This is at least to say youth in Sri Lanka is going to represent the world.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කෙටියෙන් කරුණු ඉදිරිපත් කරලා, ඉතිරි ටික සභාගත කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තත්පර දහයයි මම කාලය ගන්නේ.
It further states, I quote:

".... and Official Youth Delegate to the United Nations, Ministry of Youth Affairs and Skills Development (2012 - 2013). She was furthermore a Senator in the Sri Lankan Youth Parliament (2013 - 2015).

Born in 1990, Ms. Wickramanayake is reading for Master of Development Studies, at the University of Colombo and holds a Bachelor degree in Science, from the same university."

[ගරු රවි කරුණානායක මහතා]

So, on behalf of the President, the Prime Minister and the fellow Sri Lankans, I congratulate her and I wish that more of such talent from Sri Lanka be recognized.
Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you very much. ගරු තාරක බාලසූරිය මහතා. ඔබතුමාගේ නියමිත කාලය - seven minutes - තිබෙනවා.

[6.13 p.m.]

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Hon. Presiding Member, first of all, I must bring to your attention that what has been raised by the Hon. Minister is not a point of Order. If you give the Ministers their way, you cannot conduct the Proceedings of this House properly.

Anyway, I want to thank you for allocating seven minutes of the time allocated for this Debate to express my views on the Amendments to the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) (Amendment) Bill which was presented last year in its originality.

Might I digress a little bit from here, because I think there was an attempt by the Members of the Government to show what happened on that day; to show that it was a fault of the Joint Opposition. It should be noted that the Bill, according to the Order Paper, was supposed to be taken up for debate on the third week of May. But, on the request of the Government, the Bill was forwarded to the first week's Business, nonetheless the Opposition was in agreement as long as two full days of debate were allocated.

It all started, Hon. Presiding Member, with the Prime Minister's condescending attitude. He felt that the LAWASIA Conference, for which he was the Chief Guest, deserves more merit to attend than a debate of national importance. He wanted a vote by 11.00 a.m. the following day. To the Prime Minister, I would say that this Bill, - the first of four such Bills, which will fundamentally influence on how the country is governed - is a love child between the Hon. Mangala Samaraweera and the Human Rights Council in Geneva. This Bill is so treacherous and it will start a witch-hunt against our valiant armed forces. It does not even merit a two full days' debate.

Even if the Prime Minister was ignorant of, or chose to ignore the structural changes in that - whether the citizens of this country are to adhere to laws of this country or to higher international laws, or how such international forces can use OMP to manipulate the course of this country which can be in the geopolitical interest of superpowers but detrimental to our own fate - the Prime Minister cannot surely give more importance to a law conference. Sir, even if the Prime Minister was ignorant, which he was not, he should have given the due courtesy to the citizens of this country, as this is a very divisive Bill, probably along ethnic lines. The citizens of this country deserve more respect and deserve to hear a debate on the merits of this Bill without being pushed aside by the Prime Minister. To be candid, Mr. Presiding Member, even for the Speaker, it was not one of his brightest hours either. For a man who has had such an illustrious career and now at the pinnacle of the temple of democracy, he should have done better. And the excuse that the order was decided at a Party Leaders' Meeting by the majority also does not hold. If this was always the case, then we would not need a Speaker. A system where Party Leaders by majority can decide on anything will surely suppress the true voice of the Opposition, as was the case that day. So, it is imperative for the Hon. Speaker to ensure that the voice of the Opposition is heard. The decision should not only be made on technicalities but more on spirit of democracy.

Now, there is also this small matter that when this Bill was passed, the Members of the JVP agreed with the Bill on conditions upon three amendments which the Government agreed. However when the Bill was published, those amendments were not included. I am not sure whether Section 11 (a) which provides the Office on Missing Persons the power to enter into agreements with any person or organization was one of those amendments, but even if it was so, then what has happened with the omission of the other two amendments? Does this make the Leader of the House who is present over here a liar as he agreed on the due amendments? Even if we are to agree that the publishing of the Bill on the first instance was done erroneously, the amendments could have been included now. The fact that it has not, goes to show that the Leader of the House indeed told untruth and led the JVP down the garden path.

Now, it is my opinion that this Bill should not be passed at all. This is just the first step of the Geneva Resolution 30/1 that was brought upon by this Government on itself. Co-sponsoring the Geneva Resolution 30/1 and the signing of the peace accord giving recognition to LTTE rule in the North and the East will no doubt go down in the post-independent Sri Lankan history as the most treacherous acts which a Government has brought upon its own people. It is small wonder that both Governments were led by the same man.

Let me emphasize this but it is not to say that a country that has been ravaged by a 30-year war does not need any closure and reconciliation. Of course, it does. And of course, we believe a mechanism must be developed and be given due process. We believe that process should be local with observers from friendly nations, and most of us believe that the process should be about reconciliation and not retribution. The process cannot be one-sided either as in this case. We already know of the members of the armed forces killed and missing in action. So any Commission or any Office which seems to find information on one side without

highlighting the atrocities of the other seems to be one-sided.

There is also the question that it is not morally correct to punish valiant soldiers who brought peace upon this Island. Without them, we would still be ravaged by war. It was only recently that the British Prime Minister Theresa May said that the UK forces will be exempted from any European Human Rights Laws in conflict zones. It seems odd here that in Britain's case it is protecting its soldiers whereas we are only too happy to build the foundation for the prosecution of our forces. Also, Sir, more importantly, action taken against the armed forces - even a small issue like not issuing visas- would be viewed by the majority Sinhalese as an attempt to punish the soldiers who has brought them victory.

So, for all these reasons, I do not believe that the Office on Missing Persons will bring reconciliation. In fact, it will do exactly the opposite. It will create a deep rift between the Sinhalese and the Tamils and can lead to more hatred in the country, which is already deeply divided. So, for all these logical reasons, this is not a good piece of legislation and this must be repelled at its earliest, but not without finding a meaningful solution for closure for the victims of the war.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Now, wind up, please.

ගරු තාරක බාලසූරිය මහතා
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
Since the time does not permit me, I do not wish to speak further, but I think we really need to study the nitty-gritty of this Bill and also look into how this Bill could be used by foreign powers to manipulate the governance of the country.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට තිබෙන්නේ බොහොම කෙටි කාලයක්. විනාඩි තුනහමාරයි.

[අ.භා. 6.20]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතා කනගාටු වෙනවා මට මුලින් විනාඩි දහයක කාලයක් වෙන් කරලා පසුව එය විනාඩි තුනකට සීමා වීම ගැන.

කොහොම වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉතා වැදගත් කාරණා කිහිපයක් මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ විවාදයට ලක් වුණා.

විශේෂයෙන් මා කරුණු කිහිපයක් කියන්න බලාපොරොත්තු වෙනවා. අපේ ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ සිටීම ගැන මා සතුටු වෙනවා. විශේෂයෙන් පැහැර ගැනීම් පිළිබඳව එතුමා කථා කළා. රටක් පාලනය කරන හැම කෙනෙකුම රටේ භෞමික අඛණ්ඩතාව, ස්වෛරීත්වය ආරක්ෂා කළ යුතු වනවා සේම, රටේ මිනිස්සු හැටියට ඕනෑම කෙනකුට පැහැරගෙන යෑම්වලදී, සන්නද්ධ ගැටුම්වලදී, දේශපාලන නොසන්සුන්තාවන්වලදී, සිවිල් කැරලි කෝලාහලවලදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඉරණම පිළිබඳව දැන ගැනීමේ අයිතියක් තිබෙනවා. මෙතැනදී කථා වුණු ආකාරයට අපි දන්නවා ලසන්ත වික්‍රමතුංග මැරුණු හැටි, ඔහු අතුරුදහන් වුණු ආකාරය පිළිබඳව. ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ ගම් ප්‍රදේශයේ ඉන්නේ. ඇය උදේට නැඟිටිනකොටත්, හැන්දෑවට නිදා ගන්නකොටත් හැඬු කඳුළිනුයි ඉන්නේ, තමන්ගේ ස්වාමි පුරුෂයා අතුරුදහන් වීම නිසා. ඒකයි ඇත්ත තත්ත්වය.

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, "1988, 1989 කාලයේ ඒවාත් හොයන්න." කියලා. මා කියනවා 1971 කාලයටත් යන්න ඕනෑයි කියලා. මා දන්නවා 1971 කාලයේත් දසදහස් ගණනක් මිය ගිය බව. ඒවා ගැනත් හොයන්න තිබුණා. ඒ විතරක් නොවෙයි. 1988 - 1989 කාලයේ ඒවා හොයන්න තිබුණේ තමුන්නාන්සේලාටයි; අවුරුදු 09ක්, 10ක් මේ රටේ පැවැති මහින්ද රාජපක්ෂ පාලනයටයි. ඒ අය කවදාවත් ඒක නොකර, ඒ පිළිබඳව හොයන්නේ නැතිව අද කථා කරනවා. මේ රටේ පැවැති යුද්ධයෙන් බැට කාලා හිටපු අහිංසක ද්‍රවිඩ, මුස්ලිම් ඇතුළු සියලු ජන කොටස්වලට ඉතා හොඳින් ජීවත් වෙන්නට ඕනෑ පරිසරයක් මැවිවේ 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේය කියන එක අපි පැහැදිලිව කියන්නට ඕනෑ. විදේශ රටකට යන්න බැරිව හිටපු, විශේෂයෙන් යුරෝපා රටවලට යන්න බැරිව හිටපු මේ රටේ රාජ්‍ය නායකයන්ට භය නැතිව පෙළොවේ පය ගහලා ඒ රටවල ඇවිදින්න වාතාවරණයක් හැදුවේ 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේය කියන එකත් අප පැහැදිලිව කියන්නට ඕනෑ. ඒ කාලයේ මහින්ද රාජපක්ෂ මහත්මයා විදුලි පුටුවට ගෙන යන්න හදනවාය කිව්වා. ඩයස්පෝරාව ගැන කථා කළා. අද විදුලි පුටුව කෝ? ඩයස්පෝරාව කෝ? [බාධා කිරීමක්] ඒ නිසා දේශපාලන වේදිකාවල පට්ටපල් අසත්‍ය කියලා අනුකම්පාව අරගෙන ඡන්ද ගන්නයි එදා ලැහැස්ති වුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එපමණ කාලයක් දෙන්න බැහැ. නියමිත වෙලාව අවසන්.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට විනාඩි 10, 15 දෙනකොට මේවාට උත්තර දෙන්න අපට ලැබෙන්නේ විනාඩි තුනයි. මේ

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

අයට විනාඩි 10, 15 කථා කරන්න දෙනවා. ඒ අය පට්ටපල් අසත්‍ය කියලා මේ සභාව නොමඟ යවනවා. ඒ ගැන මා කනගාටු වෙනවා. පසු පෙළ මන්ත්‍රීවරුන් හැටියට හැමදාමත් අපට කථා කරන්න මේ ටිකමයි. හැබැයි, විනාඩියද, දෙකද, තුනද කියලා නොවෙයි- [බාධා කිරීම] මා කනගාටු වෙනවා, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කථා නොකිරීම ගැන. එතුමා දන්නවා, මේකේ- [බාධා කිරීම] ඒ නිසා අපි නැවත වරක් පැහැදිලිව කියනවා, මේ වැඩ කටයුතුවලට තමුන්නාන්සේලාගේ සහයෝගය දෙන්න කියලා. ජනතා විමුක්ති පෙරමුණ කථා කරලා කිව්වා, "අපි මේකට සහය දෙනවා." කියලා. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිරි බබෙක් වාගෙයි අද කථා කළේ. ඒ නිසා කරුණාකර, මේවා හරියට කියවා බලා කථා කරන්නය කියමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාල වේලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාටත් විනාඩි තුනහමාරක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ.භා. 6.24]

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූවන් පිළිබඳව පපුවට ගහ ගනිමින් කථා කරමින්, අතුරුදහන් වූවන්ගේ මව්වරුන්ගේ, පියවරුන්ගේ කඳුළු ගසා කමින්, බෞද්ධවාදී කොටි ත්‍රස්තවාදය කම්මුතු කරපු රණ විරුවන් දංගෙඩියට දක්කන්න ගෙනා මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීම ගැන එක් පැත්තකින් ජනාධිපතිතුමාට අප ස්තුතිවන්ත වෙනවා. එහෙම ප්‍රමාද වුණේ ඇයි? ඒ වෙන හේතුවක් නිසා නොවෙයි. මේ පනත් කෙටුම්පතින් වෙන්න යන නස්පැත්තිය පිළිබඳව තේරුම් ගත්තු මේ රටේ ජනයා එතුමාට මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කළා. විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවෙන් පිටු 15ක ලිපියක් එතුමාට එව්වා, මේක සිදු වුණොත්, මේ පනත් කෙටුම්පත සම්මත වෙලා ක්‍රියාත්මක වුණොත්, මේ කාර්යාලය ඇරියොත් මොකද වෙන්නේ කියන එක පිළිබඳව.

ඒ නිසා තමයි මෙයට සාමාජිකයන් පත් කිරීම කල්දමා මේ සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙනෙන්න කියලා කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත. මෙය බලාත්මක වුණොත්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ 11වන වගන්තියේ (අ) ඡේදය සංශෝධනය වුණාට වැඩක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනකොට, මේ ජාත්‍යන්තර සම්මුතියේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත් මේ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුව තිබුණා; පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දිය යුතුව තිබුණා; පාර්ලිමේන්තුවේ තිබිය යුතුව තිබුණා.

අපි ගරු කථානායකතුමාට කිව්වා, "මේ ප්‍රඥප්තිය බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න යනවා, නමුත් ඒ ජාත්‍යන්තර ප්‍රඥප්තිය පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමක් කරලා නැහැ, මන්ත්‍රීවරුන්ට දැනුවත් වෙන්නට ඒ ප්‍රඥප්තිය දීලා නැහැ" කියලා. මම ගරු කථානායකතුමාගෙන් 2017.04.05වන දින මේ පිළිබඳව ලිඛිත ඉල්ලීමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස සහ එම සම්මුතියේ සිංහල භාෂා පිටපතක් ලබා දෙන ලෙසට මා විසින් 2017.04.05වන දින ගරු කථානායකතුමාගෙන් කරන ලද ලිඛිත ඉල්ලීම **සභාගත*** කරනවා.

මම අවසාන වශයෙන් කියනවා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ජාත්‍යන්තර බලපෑම්වලින් මුදවාගෙන, මේ කාර්යාලය ජාතික යන්ත්‍රණයක් බවට පමණක් පත් කරන්නට ජනාධිපතිතුමාට ඕනෑ වුණා නම්, ඒක හොඳ වුවමනාවක් බව. අපි එතුමාට කියනවා, ඒක ඉෂ්ට කරන්නට නම් අද-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර ප්‍රඥප්තිය -දේශද්‍රෝහී ප්‍රඥප්තිය- බලාත්මක කිරීම සඳහා වන පනත් කෙටුම්පත වහාම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන්න කියලා අපි ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
අදන්පඩි, සට්ටමූලම් මූරණ්ටාම් මදිප්පිඩප්පට්ටදු.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."-[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

තීර්මානික්කප්පට්ටදු.
"සට්ටමූලම් මුළුප් පාරාළුමන්රක් කුළුවුක්කුච් සාට්ටප්පඩුමාග" [මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Lakshman Kiriella.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]
කුළුවිල් ආරායප්පට්ටදු.
[මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.]
Considered in Committee.
[THE HON. PRESIDING MEMBER in the Chair.]

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ආම් වාසකත්තිලිරුන්තු 3ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

සට්ටමාකු වාසකමුම් තලෛප්පුම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

සට්ටමූලම් තිරුත්තමින්ත්‍රි අරික්කෛ සෙය්යප්පට්ටතු.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported without Amendments.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.

අතන්පඩි, සට්ටමූලම් මූන්‍රාම්මුරෙයාක මතිප්පිටප්පට්ටු නිරෙවේත්‍රප්පට්ටතු.

Question put, and agreed to.

Bill, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

විනා එටුත්තියම්පප්පෙට්‍රත්තු.

Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා.

කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය අවිධිමත් වීම හේතුවෙන් ජන ජීවිතයට සිදුවන අහිතකර බලපෑම්
கழிவகற்றல் செயற்பாட்டின் ஒழுங்கீனம் காரணமாக மக்களின் வாழ்வுக்கு ஏற்படும் பாதிப்பு
ADVERSE IMPACTS ON PUBLIC LIFE OWING TO IRREGULAR GARBAGE DISPOSAL

[අ.භා. 6.29]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"බස්නාහිර පළාත තුළ කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය විධිමත් ලෙස සිදු නොවීම හේතුවෙන් ජන ජීවිතයට සිදුවන බලපෑම් සහ එම හේතුවෙන් ඩෙංගු රෝගය ජාතික ව්‍යසනයක් බවට පත් වීමට තුඩු දෙන කාරණා උග්‍ර වන බැවින් මෙම ගැටලුව විසඳන ලෙසට රජයට කරන යෝජනාව සහ කසළ බැහැර කිරීමේ අර්බුදය උග්‍ර වීමට පළාත් පාලන ආයතන මහජන නියෝජිතයන් රහිතව අක්‍රිය කිරීම බලපාන බවට මම මෙම සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන කොට විෂය භාර අමාත්‍යවරයා ගරු සභාවේ සිටියොත් හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ඔබතුමා කථාව කරගෙන යන්න, එතුමා සමහර විට ඒවි. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඔරුවර්)
(An Hon. Member)

සමහර විට ආවේ නැත්නම්? [බාධා කිරීමක්]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව සඳහා වේලාව වෙන් කර තිබෙන්නේ කොයි ආකාරයටද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

යෝජනාව ඉදිරිපත් කරන පක්ෂයට පැය භාගයයි, රජයට පැය භාගයයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

රජයේ කවුරුත් නැත්නම් ඒ වේලාවත් ගන්න පුළුවන්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

දැනට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු සිටිනවා. ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවට ආවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)

මගේ කථාවට විනාඩි 15ක් ගන්නවා, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කර කථා කිරීමට විනාඩි 15ක් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයාට මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ කුණු ප්‍රශ්නය සම්බන්ධයි. එතුමා මේ දවස්වල කුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් මැදිහත් වෙලා යම් යම් මාධ්‍යවල ඒ වෙනුවෙන් පෙනී සිටිනවා අපි දැක්කා; ඒ වෙනුවෙන් කථා කරනවා දැක්කා.

හැබැයි ඒ වෙනුවෙන් පෙනී සිටියත්, ඒ වෙනුවෙන් කතා කළත් අද බස්නාහිර පළාත විතරක් නොවෙයි, මුළු රටම කුණු වෙලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ කුණු නොවෙච්ච

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

තැනක් නැහැ. හැබැයි රට බාර ගත්තේ, මල් වත්තක් බවට පරිවර්තනය කරන්නයි. මල් පිපෙන, ඒ මල්වල සමනලුන් වහන, මී මැස්සන් පැණි උරා බොන මහා මල් වත්තක් බවට පරිවර්තනය කරන්න 2015 ජනවාරි 09වන දා එළි වන කොට බාර ගත් අපේ මාතෘ භූමියේ අද මී මැස්සන් වෙනුවට නිල මැස්සෝ වහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මල්වල මී මැස්සන් වහනවා වෙනුවට කුණු ගොඩවල නිල මැස්සන් වහන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුණු එකතු කිරීම සම්බන්ධව අපි දන්නවා. මේ ආණ්ඩුව දැන් කුණුවලිනුත් ජීවත් වනවා. ආණ්ඩුව මේ දවස්වල කුණුවලිනුයි ජීවත් වන්නේ. ආණ්ඩුව කුණුවලින් ජීවත් වන්නේ කොහොමද? දැන් නගර සභාව, ප්‍රාදේශීය සභාව තමන්ගේ ප්‍රදේශවල ගෙවල්වලට ගිහින් කුණු ටික ගන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, නගර සභාව, ප්‍රාදේශීය සභාව කුණු ටික ගන්නේ නැති වුණාම මිනිස්සු අසරණ වෙනවා. මිනිසුන්ගේ ගෙවල්වල කුණු බෑග් තිබෙනවා. ඒ මිනිස්සු කළු පාට බෑග්වල කුණු ටික දාගන්නවා. කුණු ටික දාගෙන රෑ වන කොට කරන්නේ මොකක්ද? තමන්ගේ ගෙදර වාහනයක් තිබෙනවා නම්, ඒ වාහනයේ දාගෙන රෑ වෙන කොට ඒ කුණු ටික අරගෙන යනවා, කවුරුවත් නැති කොහේ හෝ තැනකට එය හලා දමන්න පුළුවන්ද කියලා බලන්න. එහෙම හලන කොටම පොලීසිය ඒ අය අල්ලා ගන්නවා. අල්ලාගෙන දමනවා, නඩු. අපට දැන් හුඟක් වෙලාවට ප්‍රවෘත්ති ඇහෙනවා, අහවල් ප්‍රදේශයේ කුණු දමන අය 200 දෙනෙකු පමණ අල්ලයි; අල්ලා නඩු දමයි කියා. නඩු දැම්මාම මොකක්ද වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? දැන් ඒ මුදලත් රජයටයි එන්නේ. මේ පැත්තෙන්, කුණු ප්‍රශ්නය. දැන් යොදා තිබෙන විකල්පය මොකක්ද? ගරු අමාත්‍යතුමනි, කොළඹ නගර සභාව අවුරුද්දකට රුපියල් කෝටි 120ක් ගෙවනවා, කුණුවලට. අවුරුද්දකට රුපියල් කෝටි 120ක්! 2013 වර්ෂයේ ඉඳලා ගෙවපු ඒ මුදල දැන් දෙගුණයකින්, තුන්ගුණයකින් වැඩි වෙනවා. වැඩි වන එම ප්‍රමාණය දරාගන්න බැරි ප්‍රමාණයක්. සාමාන්‍යයෙන් පාන් ගෙඩියකට රටේ මිලක් තිබෙනවා. පාන් ගෙඩියට බටර් ටිකක් දැම්මොත් එහි මිල පොඩ්ඩක් වැඩි කරන්න පුළුවන්; මුද්දරප්පලම් ටිකක් දැම්මොත් මිල තවත් ටිකක් වැඩි කරන්න පුළුවන්. හැබැයි රුපියල් හැත්තෑවේ පාන් ගෙඩිය රුපියල් 700යි කියා එක පාරටම කිව්වොත්, ප්‍රශ්නයක්. මේ වාගේ තමයි කුණුවල ගණනත් වැඩි කර තිබෙන්නේ.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සොයා බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. කුණු මෙට්‍රික් ටොන් 800ක් දවසකට කොළඹ මහ නගර සභාව එකතු කරනවා කිව්වා. ඒ කුණු මෙට්‍රික් ටොන් 800 කොළඹ මහ නගර සභාව වෙනුවෙන් පෞද්ගලික සමාගමකුයි එකතු කරන්නේ. ඒවායෙන් කොටසක් දැන් දමන්නේ කරදියානටයි. එකතු කරන්නේ කුණු මෙට්‍රික් ටොන් 800ක් බව දැනගන්නා නිර්ණායකය කර ගන්නේ මොකක්ද? කොහේද ඒ සඳහා තරාදියක් තිබෙන්නේ? කුණු මෙට්‍රික් ටොන් 800 මනින තරාදිය කොහේද තිබෙන්නේ? තරාදියක් නැහැ. මෙට්‍රික් ටොන් 1ක් ගෙනිච්චත්, අදාළ සමාගමට පුළුවන්, 1ට එහා පැත්තෙන් 8 දාලා 18 කරන්න. එහෙම නැත්නම්, එයට තවත් 0ක් දැම්මාම, 180යි. කුණු ප්‍රමාණය ගණනයට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. මම දන්නේ නැහැ මේ කුණුවලට යට ඉන්නේ කවුද, කුණුවල උඩ ඉන්නේ කවුද කියා.

ගරු අමාත්‍යතුමනි, මම දැක්කා, තමුන්නාන්සේ කරපු ප්‍රකාශයක්. ඒ, "කොළඹ නගර සභාවේ කුණුවලට කරන ගෙවීම් දැක්කාම පුදුම හිතෙනවා - ඇමති ෆයිසර් කියයි" යන්නයි. සාධාරණයි එය. ඇමතිවරයා පුදුම වන කොට කොහොම වේවිද, කුණු කන අපි? යහ පාලන ආණ්ඩුව කුණුවලිනුත් ගහනවා, ගරු අමාත්‍යතුමනි. කුණුවලිනුත් ගහන්නේ කවුද කියා මම දන්නේ නැහැ. ගහන පාර්ශ්වයන් වෙතින්, එක් එක් පැතිවලින් ගඳ එනවා. පළාත් සභාවෙන් ගඳ එනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ නම් ඉදිරිපත් කරන්න, බය නැතිව. ඔබතුමා කෙළින් කතා කරනවා නේ. ඔබතුමා මගේ මිත්‍රයා නේ. ඔබතුමා මාත් එක්ක දීර්ඝ කාලයක් මිත්‍රව සිටින ඇමතිවරයා නිසායි අද මේ යෝජනාව මම ම ඉදිරිපත් කළේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔබතුමන්ලාගේ කාලයේත් -මේ ආණ්ඩුවට කලිනුත්- කුණු එකතු කළේ මේ අයමයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ආ! පොඩ්ඩක් ඉන්න, කියන කල්. ඔහොම ඉන්න, කියන කල්. යහ පාලන ආණ්ඩුවට ඉස්සර වෙලා තිබුණු ඒ ආණ්ඩුව සියඹලාණ්ඩුව නොවෙයි. එය, ඔබතුමාත් මමත් කියන දෙදෙනාම හිටපු ආණ්ඩුවයි. එය, සියඹලාණ්ඩුව නොවෙයි. එය අර සියඹලාණ්ඩුවයි කියා සිතන්න එපා. අපි ඩබලම සිටියේ එහි. එකටයි සිටියේ. ඒක රැක ගන්න දෙදෙනා නැහෙනහිර ගිහින් හොඳ හොඳ වැඩ කළා. ඔබතුමාට මතකයි නේද? මා ඒ කාරණය එතැනින් නවත්වනවා.

දැන් කියන්නේ කුණු ගැනයි. [බාධා කිරීමක්] ඔව්, ඔව්. මම කියන්නේ රටම කුණු කළා කියලායි. රටම කුණු කරලා ඉවරයි. මේ කුණු ප්‍රශ්නයේදී මෙට්‍රික් ටොන් 800ක් ගණනය වෙන්නේ කොහොමද කියලා ඇමතිතුමා දැන් අපට උත්තරයක් දෙන්න.

දෙහිවල මහ නගර සභාවේ කුණු මෙට්‍රික් ටොන් 250ක් ගණනය වෙනවා. Weighbridge එකක් තිබෙනවා. එතකොට ගණනය වෙනවා. කෝට්ටේ මහ නගර සභාවේ ගණනය වෙන්නේ කොහොමද? විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමා ඒක සොයන්න. කෝට්ටේ මහ නගර සීමාව තුළ ජීවත් වන මිනිසුන්ගෙන් බදු අය කර ගන්නවා. මේ රටේ මිනිස්සුන්ගෙන් බදු අය කරනවා. අද ඒ මිනිස්සු අසරණ වෙලා තිබෙනවා. කුණුවලින් මිනිස්සුන්ට ලැබෙන ප්‍රතිලාභය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රතිලාභය තමයි ඩෙංගු.

ඊයේ මේ සභාවේ ඩෙංගු ගැන කථා කළා. දැන් මේ ගරු සභාවේ ඉන්න තිබුණා, සෞඛ්‍ය ඇමතිවරයා. විෂය භාර අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා මේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. සාමාන්‍යයෙන් අපි ඉතිහාසයේ අහලා තිබෙන විධියට චේතිය රජ්ජුරුවෝ තමයි වැඩියෙන්ම බොරු කියලා තිබෙන්නේ. නමුත් චේතියට ඉස්සරවෙලා තමයි රාජිත සේනාරත්න ඇමතිතුමා ඉපදිලා තිබෙන්නේ. චේතිය රජ්ජුරුවෝ ඉපදිලා තිබෙන්නේ පස්සේ. එතුමා මුලින් ඉපදුණේ. එතුමා කියන අමු බොරු පෙන්වන්න, මම අද මේ ලේඛනය ගෙනාවා. ඇමතිතුමා මේ ලේඛනය ඊළඟ කැබිනට් රැස්වීමට අරගෙන ගිහිල්ලා චේතියගේ මල්ලිට දෙන්න. Original චේතියට මේ ලේඛනය දෙන්න. මේ ලේඛනය අනුව 2011දී -[බාධා කිරීමක්] දිස්ත්‍රික්කයේ ප්‍රශ්න නැහැ, දෙයියන්ගේ පිහිටයි. දිස්ත්‍රික්කයේ ප්‍රශ්න නැහැ, ආණ්ඩු බලය නැති වුණත් ලක්ෂ ගණනින් ඡන්ද අරගෙන අපි එනවා. 2011 ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 28,473යි. 2012 ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 44,456යි. 2016 විෂය භාර ඇමතිවරයා රාජිත සේනාරත්න මැතිතුමා. 2016 ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 55,150යි. 2017 ජූනි මාසයේ අද වන විට ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 68,053යි.

ගරු ඇමතිතුමනි, සංචාරක අමාත්‍යාංශය තමුන්නාන්සේ භිටපු අමාත්‍යාංශයක්. සංචාරක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පදිංචිවෙලා හිටියේ පානදුරේ. පෙරේදා මම එතුමාගේ මළ ගෙදර ගියා. වයස අවුරුදු 34යි. එතුමාට උණ රෝගය හැදුණා; පානදුර ඉස්පිරිතාලයේ නැවැත්වුවා. දවස් දෙකයි. එතුමා මිය ගියා. වයස අවුරුදු 34යි. ඩෙංගු රකුසාගෙන් බේරෙන්න බැරි වුණා. ඇයි මේක වුණේ? මතක තියාගන්න, ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේත් මේකට වග කියන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි,තමුන්නාන්සේ වග කිව යුතු තැනට මම එන්නම්. තමුන්නාන්සේ මේකට වග කියන්න ඕනෑ, මේ රටේ පළාත් පාලන ආයතන අක්‍රිය කිරීම නිසායි. ඒ වරද නිසා තමයි මේ ඩෙංගු රෝගය ව්‍යාප්ත වුණේ. මේ රටේ ක්‍රියාත්මක වුණු මහජන නියෝජිතයන්ගෙන් සැදුම්ලත් පළාත් පාලන ආයතන ටික අකර්මණ්‍ය කරලා දැනට අවුරුදු දෙකයි, මාස ගණනක් වෙනවා. ඒවා අකර්මණ්‍ය කරපු එකේ පාපය තමයි අද මේ ගෙවන්නේ. ඒකට හේතුව මොකක්ද? ඇත්ත කථාව මම කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේයි මමයි එක පළාත් සභාවේ හිටියා. මේ පළාත් පාලන ආයතන විසුරුවලා තිබෙන එක, දැන් මහ ඇමතිවරුන්ට එක්තරා කේක් ගෙඩියක් වෙලා තිබෙනවා. ඇයි, කේක් ගෙඩියක් වන්නේ? කුණු අදින්න ඕනෑ නැහැ, කුණුවලට ඕනෑ දෙයක් වුණාවේ. හැබැයි, ඒ පළාතේ තමන් යටතේ තිබෙන ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ තිබෙන මුදල් ටික තනි අයිතියට පාලනය කරනවා. තමන්ගේ දේශපාලන ස්වරූපය හදා ගන්න ඒවායේ රැකියා ටික පාවිච්චි කරනවා. ඒකයි හේතුව. ෆයිසර් මුස්තාපා ඇමතිතුමාත් විෂය භාර ඇමතිවරයා නිසා සමහර වෙලාවට අතහරින්නේ නැහැ. පොඩි පොඩි ගේම් යනවා. මෙතුමාත්, මෙතුමාගේ අයිතිය ඉල්ලනවා. නමුත් එතුමාගේ අයිතියත් එක්ක හැපි හැපී යනවා. මොකක්ද, හේතුව? ගිහිල්ලා සංඛ්‍යාලේඛන අරගෙන බලන්න.

මේ ආයතන අකර්මණ්‍ය වෙලා තිබෙන කාලය ඇතුළත බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවලට දමා තිබෙන සේවකයන් ප්‍රමාණය කොච්චරද කියලා බලන්න ඔබතුමා සංඛ්‍යාලේඛන ඉල්ලන්න. ඒ ආයතනවල තිබෙන මුදල් ටික පළාතේ මහ ඇමතිවරයාට හෝ තමන්ගේ දේශපාලන හෙංචයියකුගේ වුවමනාවට යොදවනවා. අදාළ තැන්වලට බල්බ් එක වැටෙන්නේ නැහැ. කුණු ටික ඇදෙන්නේ නැහැ. එදා එහෙම ප්‍රශ්නයක් ඇති වෙන කොට, කුණු ටික ඇදෙන්නේ නැති වන කොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙක් ඉන්නවා නම්, මන්ත්‍රීවරු ඉන්නවා නම් - ඒ අය එක්සත් ජාතික පක්ෂයේ වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්, වෙනත් පක්ෂවල අය වෙන්න පුළුවන්- ඒ අය කුණු ටික දමන්න තැනක් සොයා ගන්නවා. සභාපතිවරු ගිහිල්ලා මිනිස්සුන්ට වදිනවා, "මේකට විසඳුමක් සොයා ගන්න තෙක් අනේ අපට කුණු දමන්න තැනක් දෙන්න" කියලා. ඒ අයගේ නිර්මාණශීලී වැඩ තිබෙනවා. ඒ ජනතාවගෙන් එන මන්ත්‍රීවරු. ඒගොල්ලෝ නැවතත් ඒ මිනිස්සු ළඟට යන්න ඕනෑ. හැබැයි, නිලධාරීන්ට මිනිස්සු ළඟට යන්න ඕනෑ නැහැ, ෆයිසර් මුස්තාපා ඇමතිතුමනි. ඒ නිසා ඒගොල්ලන්ට කමක් නැහැ, "කුණුවෙන්න බැරි නම් ඕනෑ එකක් වුණාවේ. කොළඹ නොවෙයි, ඕනෑ තැනක් කුණු වුණාවේ, අපට කමක් නැහැ, අපට තිබෙන්නේ අපේ යුතුකම සහ වගකීම ඉටු කරන එකයි" කියන එකයි ඒගොල්ලන්ගේ හැඟීම.

අද ඇත්ත තත්ත්වය වෙලා තිබෙන්නේ ඒකයි. එම නිසා මේ තත්ත්වය තුළ ඉදිරියට යන්න ගියොත් මේ රටේ ජනතාව ඉතාමත්ම අසරණ තත්ත්වයකට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පාර්ලිමේන්තුවේ නිලධාරී මහත්තයෙකුට දැන් තත්පරයකට, දෙකකට පෙර කථා කළා; මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාටත් මම කිව්වා. මෙතැනින් දැන් මදුරුවෙකු ගියා. මේ පිළිබඳව වහාම හොයන්න. මට නම මතක නැහැ, මම නිලධාරියෙකුට අඬගැහුවා. මම ඒ නිලධාරියාට කිව්වා, "මෙතැනින් මදුරුවෙකු ගියා" කියලා. පාර්ලිමේන්තුව ඇතුළේත් මදුරුවෝ ඉන්න තත්ත්වයකට පරිවර්තනය වෙන්නේ කොහොමද? පාර්ලිමේන්තුවට සර්පයෝත් ආවා. ඒක වෙනම කථාවක්. නමුත්, රටේ නීති හදන, රටේ තීන්දු තීරණ ගන්නා පාර්ලිමේන්තුව ඇතුළත අද අනාරක්ෂිත වෙලා. දැන් මෙතැනින් ගියේ ඩෙංගු මදුරුවා වෙන්න පුළුවන්; වෙන මදුරුවකු වෙන්න පුළුවන්. පාර්ලිමේන්තුවේත් මදුරුවෝ ඉන්නවා නම්, රටේ මිනිස්සුන්ගේ තත්ත්වය මොකක්ද, දෙවි හාමුදුරුව නේ? ඊට වඩා වැඩි මට්ටමකට මිනිස්සුන්ගේ තත්ත්වය පත් වෙලා තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සේ දන්නවා, කොළඹ කුණු ප්‍රශ්නයත් එක්ක තමයි මේ ප්‍රශ්න මතුවන්නේ කියලා. එක පැත්තකින් වම්පික රණවක ඇමතිතුමා ඉන්නවා. මීතොටමුල්ලේ බෞද්ධායතනය මරණ දඬුවම් දිය යුතු වරදක් කියලා එතුමා කියනවා. මරණ දඬුවම දෙන්නේ කාටද කියන එක සම්බන්ධයෙන් තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ වරද නිසා කාවද එල්ලන්නේ, කාටද මරණ දඬුවම දෙන්නේ කියන එක ජනතාව ඉදිරියට යොමු කරන්න ඕනෑ; Facebook එකට දමන්න ඕනෑ. ඒක ජනතාව භාර ගනීවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙංගු වසංගත තත්ත්වයෙන් බස්නාහිර පළාත පමණක් නොවෙයි, මුළු රටම බේරා ගන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේදී මා කරනවා. විෂයය භාර ඇමතිවරයා දැන් මේ සම්බන්ධයෙන් නොයෙකුත් කථා කියනවා. ඉදිරියටත් එතුමා නොයෙකුත් කථා කියයි. හැබැයි, එතුමා මොනවා කිව්වත්, කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමාගේත් භාතීන් සිටින බේරුවල ප්‍රදේශය අද වැඩිම ඩෙංගු රෝගීන් ප්‍රමාණයක් වාර්තා වීම නිසා ඩෙංගු ව්‍යාප්තිය සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික්කයෙන් අංක එකට ඇවිල්ලා තිබෙනවා. ඒ විෂයය භාර ඇමතිවරයාගේ ආසනය. එම නිසා මේ තත්ත්වයෙන් රට නිදහස් කරන්න; මිනිස්සුන්ගේ ජීවිත රැක ගන්න වග කීමෙන් වැඩ කරන්න කියලා අපි රජයට යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

යෝජනාව ස්ථිර කිරීම, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතු ය" යි මා යෝජනා කරනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා විනාඩි 10යි ගත්තේ. තව විනාඩි 5ක් අපේ ගරු ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාට අපි දැම්මා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එතුමා විනාඩි 12ක් ගත්තා. ඉතිරි කාලය තමයි ඔබතුමන්ලාට අයිති වන්නේ.

[අ.භා. 6.43]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

එහෙම නම්, මම විනාඩි 10ක් කථා කරලා, ඉතිරි විනාඩි 05 ගරු ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාට දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැළි කසළ ප්‍රශ්නය පිළිබඳව දීර්ඝ කතාවක් රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කළ නිසා කැළි කසළ බැහැර නොකිරීම නිසා මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව මම සංඛ්‍යා ලේඛන අරගෙන විස්තර කරන්න යන්නේ නැහැ. මම මේ සභාවේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වන්නේ කැළි කසළ බැහැර නොකිරීම නිසා මේ වනකොට රටේ ඇති වෙලා තිබෙන ඩෙංගු ව්‍යසනය පිළිබඳවයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාල වකවානුව ලංකා ඉතිහාසයේ වැඩිම ඩෙංගු රෝගීන් පිරිසක් වාර්තා වුණු අවාසනාවන්ත කාල වකවානුවක්ය කියලා ඔබතුමාත් දන්නවා ඇති. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, මේ මාස හයට ඩෙංගු රෝගීන් හැටඅටදහස් ගණනක් වාර්තා වෙලා තිබෙනවා කියලා. අද වනකොට -මේ වසරේ ගත වූ මාස හයට- 70,000කට ආසන්න ඩෙංගු රෝගීන් ප්‍රමාණයක් හඳුනා ගෙන තිබෙනවා. බොහෝ වෙලාවට මේ සංඛ්‍යාව ලක්ෂය ඉක්මවන්න පුළුවන්. එහෙම වෙන්න කියලා අපි කියන්නේ නැහැ. එහෙම වෙයි කියලා අපි බලාපොරොත්තු වන්නේත් නැහැ. නමුත්, සමහර විට වසරක් වැනි කාලයක් තුළ මේ ප්‍රමාණය ලක්ෂය දක්වා යන්න පුළුවන්.

මෙතෙක් ලංකාවේ වැඩිම ඩෙංගු රෝගීන් ප්‍රමාණයක් වාර්තා වුණේ 2010 වසරේ. ඒ, 35,000යි. ඒ, අවුරුද්දකටම. හැබැයි, දැන් මාස 6ට ඩෙංගු රෝගීන් 70,000ක් හඳුනා ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙංගු රෝගීන් පිළිබඳ කාරණය අපි දේශපාලනීකරණය කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපි ඩෙංගු ප්‍රශ්නය ආණ්ඩුවට දමා දේශපාලන වාසි ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මේ ප්‍රශ්නය දැන් ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා ආණ්ඩුවට අපි කියන්නේ මේ කාරණය පිළිබඳව මීට වඩා දැඩි අවධානයක් යොමු කරන්න කියලායි. මේ ආණ්ඩුවට මේ විධියට මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ආණ්ඩුව ඉතිහාසයේ අත් දැකීම් ටික ගන්න ඕනෑ. ආණ්ඩුව සාලාව පිපිරීමට ගත් තීන්දුව මොකක්ද? අරණායක නාය යෑමට ගත් තීන්දුව මොකක්ද? ගංවතුරෙන් අවතැන් වූ දහස් ගණනක් සම්බන්ධයෙන් ගත් තීන්දුව මොකක්ද? ආණ්ඩුව සියල්ල අසමත්. ඒ නිසා ආණ්ඩුව මෙවැනි ජාතික ප්‍රශ්නයක් ඇති වූ අවස්ථාවකදී ඒ පිළිබඳව නිසි අවධානය යොමු කරලා, ජාතික වැඩ පිළිවෙළක් හදලා, සියලුදෙනාට එන්න කියලා ඒක ප්‍රකාශයට පත් කරලා, ඒ වෙනුවෙන් දැවැන්ත වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම් ඉතාම බරපතළ තත්ත්වයකට අපට මුහුණ දෙන්න සිද්ධ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සම්බන්ධයෙන් මූලිකව වගකියන්න ඕනෑ සෞඛ්‍ය අමාත්‍යාංශයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෑම අවුරුද්දකම මැයි මාසය වනකොට මෝසම් වැසි එන බව අපි කවුරුත් දන්නවා. සාමාන්‍යයෙන් මේ කාලයට ඩෙංගු රෝගය බෝ වනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය ගමේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හරහා ප්‍රචාරණ වැඩ පිළිවෙළක් ඇති කරලා, දුම් ගහලා හෝ ඩෙංගු රෝගීන්ගේ ප්‍රමාණය අවම කිරීම සඳහා ජනතාව දැනුවත් කරන්න කටයුතු කරන්න ඕනෑ. නමුත් ඒ වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ කිසිම වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ.

ඩෙංගු රෝගීන්ට අවශ්‍ය කරන "Dextran" කියන බෙහෙත නියමිත වෙලාවට ගෙනැල්ලා තිබුණේ නැති බව ඔබතුමා දන්නවා. දැන් නම් ඒ බෙහෙත ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, මේ බෙහෙත අවශ්‍ය කරපු කාලයේදී ගෙනැල්ලා තිබුණේ නැහැ; සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ බෙහෙත තිබුණේ නැහැ; දුම් ගහන මැෂින් නැහැ; වාහන නැහැ. ඒ වාගේ අඩුපාඩුකම් රැසක් තිබෙනවා. ඒ නිසා පළමුවැනියටම මේ සම්බන්ධයෙන් වගකිව යුත්තා වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අමාත්‍යවරයා සහ ලේකම්වරයා ඇතුළු නිලධාරී මණ්ඩලය මේ කාරණය කෙරෙහි දැඩි අවධානය යොමු නොකළ නිසාත්, මේ වෙනුවෙන් සූදානම් නොවුණු නිසාත් තමයි මේ ව්‍යසනය මේ තරම් පැතිරිලා තිබෙන්නේ. ඒ නිසා, මින් ඉදිරියට මෙවැනි තත්ත්වයක් ඇති නොවෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සෞඛ්‍ය ඇමතිතුමා මේ කාරණය දිහා බලන හැටි බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊයේ සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා, "ඩෙංගු මදුරුවන්ගේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ශාක භක්ෂකයෙක් හොයා ගත්තා" කියලා. ශාක භක්ෂකයෙක් යොදාගෙන ඩෙංගු කීටයා මර්දනය කරන්නේ කොහොමද කියලා මට නම් තේරෙන්නේ නැහැ. මේක හරි විහිළුවක්. ශාක භක්ෂකයන්ට පුළුවන්ද, ඩෙංගු කීටයා කන්න. ඩෙංගු කීටයාව මර්දනය කරන්න හොයාගෙන තිබෙන්නේ මාංශ භක්ෂකයෙක් නොවෙයි. සෞඛ්‍ය ඇමතිතුමා කියන විධියට සිංහයා තණ කොළ කාලා, හාවා මස් කන්න ඕනෑ. ශාක භක්ෂකයෙක් හොයාගෙන මදුරු කීටයන් මර්දනය කරන්නේ කොහොමද කියලා මට නම් තේරෙන්නේ නැහැ. මේ විධියට රටට විහිළු සපයන්න එපා.

ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා සෞඛ්‍ය අමාත්‍යාංශයට ලේකම්වරයෙක් පත් කළා. එතුමා තමයි, උදය සෙනෙවිරත්න මහත්තයා. ඇමතිතුමා එතුමාට වැඩට එන්න දෙන්නේ නැහැ. ඔබතුමා ඒ ගැන දන්නවානේ, ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා. Secretaryට වැඩට එන්න ඇමතිතුමා ඉඩ දෙන්නේ නැහැ; සෞඛ්‍ය

අමාත්‍යාංශයේ ලේකම්තුමාට ඇමතිතුමා වැඩට එන්න දෙන්නේ නැහැ. ඇමතිතුමා ශාක භක්ෂකයෙක් ගෙනැල්ලා මදුරු කීට ප්‍රශ්නය විසඳන්න හදනවා. එහෙම කරන්න බැහැ. මේ ඩෙංගු රෝගයේ තිබෙන අවදානම තේරුම් ගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟ කාරණය මෙයයි. ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා, ඔබතුමා තමයි පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා. පළාත් පාලන මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙන් ඔබතුමාටත් යම් ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමා. අද මේ කාරණය දේශපාලනීකරණය කරන්නේ නැහැ කියලා මා ඔබතුමාට කිව්වා. මේ කාරණය කිව්වාය කියලා ඔබතුමන්ලා ඡන්දය පවත්වන්නේත් නැහැ. ඒ නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා ගරු ඇමතිතුමනි. මේ යාන්ත්‍රණය කැඩිලා, ඇමතිතුමනි. නිලධාරීන් වැඩ කරන්නේ නැහැ. ඔබතුමා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන් වාගේම සියලු ප්‍රාදේශීය සභා, පළාත් සභාවල ලේකම්තුමන්ලා වහාම කැඳවන්න. මම වගකීමෙන් කියනවා, මගේ ආසනයේ ප්‍රාදේශීය සභා ලේකම්තුමන්ලාට මා කථා කළ බව. ඔවුන් තීන්දු ගන්නේ නැහැ; වැඩ කරන්නේ නැහැ.

2010 අපේ ආණ්ඩුව පැවති කාලයේ - මම ඇමතිවරයකු හැටියට සිටි කාලයේ - ඩෙංගු ව්‍යසනය ආවා මට මතකයි. ප්‍රාදේශීය සැලැසුම් කමිටුව රැස්වෙලා, ඉස්කෝලවල ගුරුවරුන් සහ දරුවන් ගෙනැල්ලා, දුම් ගහලා, සුද්ද කරලා අපි මේ කටයුත්තට මැදිහත් වුණා. ප්‍රාදේශීය සභා සභාපතිවරු වාගේම මන්ත්‍රීවරු මැදිහත් වෙලා ඩෙංගු රෝගය මර්දනය කිරීම වෙනුවෙන් වැඩ කළා. ඒ නිසා තමයි ඩෙංගු රෝගය සම්පූර්ණයෙන්ම අපට අවසන් කර ගන්න පුළුවන් වුණේ. අද මොකද වෙලා තිබෙන්නේ? අද මේ වෙනුවෙන් නායකත්වය දෙන්න දේශපාලන අධිකාරියක් නැහැ. ඇමතිතුමනි, අද මොකක්ද වෙලා තිබෙන්නේ?

ජා-ඇල ආසනය තමයි කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා නියෝජනය කරන්නේ. ජා-ඇල ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරු කවුද? ජෝශප් මයිකල් පෙරේරායි, පීලික්ස් පෙරේරායි. අපේ තරුණ මන්ත්‍රීවරයකු වන කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමාට මොකුත් නැහැ. පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීතුමාට, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිකම නැහැ. එතුමා එළියේ. පැරදිච්ච දෙදෙනා ඒ කමිටුව ඇතුළේ ඉන්නවා. පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීතුමාට ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ කිසිම තනතුරක් ලැබිලා නැහැ. ඒ දෙදෙනාට පුළුවන්ද, නිලධාරීන් එකතු කරගෙන ඩෙංගු වසංගතය මර්දනය කරන්න? ගරු ඇමතිතුමා, මේ කරන මෝඩ වූන් වැඩේ මොකක්ද? මෙහෙම කටයුතු කරන්න බැහැ ඇමතිතුමා. අඩු ගණනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මේ ප්‍රාදේශීය සැලැසුම් කමිටුවේ හිටියා නම් මේ කටයුත්ත කරනවා. ඒ නිසා ඔබතුමා කඩිනමින් - හෙටම - සියලු ප්‍රාදේශීය සභා ලේකම්තුමන්ලා කැඳවන්න කියා මා ඔබතුමාට කියනවා, ගරු ඇමතිතුමනි. තමන්ගේ බල ප්‍රදේශය තුළ මොනවාද කරන්නේ කියලා ඔබතුමා ඒ අයගෙන් අහන්න. පළාත් පාලන කොමසාරිස්වරුන් කැඳවන්න. මම ඔබතුමාට වග කීමකින් කියනවා, ප්‍රාදේශීය සභාවල ලේකම්තුමන්ලා මේ කටයුතු වෙනුවෙන් යන්නේ නැති බව. PHIලා යන්නේ නැහැ. ඒ ගැන හොයන්න කෙනෙක් නැහැ; බලන්න කෙනෙක් නැහැ, ඇමතිතුමා. ඒ නිසා කඩිනමින් මේ පළාත් පාලන යාන්ත්‍රණය විධිමත් කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම මා ගරු ඇමතිතුමාගෙන් කරනවා.

මේ කාලය තුළදී ඩෙංගු රෝගීන් 70,000ක් හඳුනාගෙන තිබෙන බව කිව්වා. 200කට ආසන්න ප්‍රමාණයක් මිය ගිහිල්ලා තිබෙනවා. මේ රෝගීන්ගෙන් සියයට 43.5ක් බස්නාහිර පළාතෙන් තමයි හොයාගෙන තිබෙන්නේ. ඉන් සියයට 25ක් පාසල් යන දරුවන්. සෞඛ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණය සෞඛ්‍ය ඇමතිතුමාට කියන්න. අපට මේ ගැන කථා කරන්න වෙනත් අවස්ථාවක් ලැබෙන්නේ නැති නිසායි මේ ගරු සභාවේදී මේ කාරණා කියන්නේ. වහාම විදුහල්පතිවරු කැඳවලා, පාසල් ගුරුවරුන් සහ සිසුන් දැනුවත් කරන්න කියලා අධ්‍යාපන ඇමතිතුමාට කියන්න.

යුද්ධය පැවති කාලයේ දෙමව්පියන් ඇවිල්ලා පාසල් ආරක්ෂා කළ බව අපට මතකයි. දෙමව්පියන් ඉස්කෝලවලට ඇවිල්ලා ඒ දරුවන්ගේ බෑග් check කළා. යුද්ධය පැවති කාලයේ දෙමව්පියන් පාසල්වලට ඇවිල්ලා දරුවන් එක්ක හිටියා අපට මතකයි. ඒ නිසා දෙමව්පියන්ට ඉස්කෝලවලට එන්න කියන්න. ඇවිල්ලා සියලු පාසල් පිරිසිදු කරන්න කියලා දෙමව්පියන්ට කියන්න. ඒ වාගේ ජාතික වැඩ පිළිවෙළක් හදන්න, ගරු ඇමතිතුමනි. නමුත් එහෙම දෙයක් වෙන්නේ නැහැ. ඒ යාන්ත්‍රණය දුවන්නේ නැහැ; ඇන්ජිම හිටලා. ඒකයි ප්‍රශ්නය, ගරු ඇමතිතුමනි. ඒ නිසා අපි ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. අපි මේ දේශපාලනය ගැන කථා කරනවා නොවෙයි. ප්‍රායෝගික තත්ත්වය ගැනයි අපි මේ කියන්නේ. ගරු ඇමතිතුමනි, අපට හොඳ යාන්ත්‍රණයක් තිබෙනවා. ඔබතුමා බලන්න, පඩි ගන්න රාජ්‍ය නිලධාරීන් කී දෙනෙක් ගමක ඉන්නවාද කියලා. සමෘද්ධි සංවර්ධන නිලධාරියා ඉන්නවා; කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියා ඉන්නවා; පවුල් සෞඛ්‍ය සේවිකාව ඉන්නවා; උපාධිධාරියා ඉන්නවා; ලියුම් බෙදන පුද්ගලයා ඉන්නවා; විදුලි බිල ගෙන යන පුද්ගලයා ඉන්නවා. ඒ විධියේ කී දෙනෙක් ඉන්නවාද? ගමට මේ කරුණු සන්නිවේදනය කරන්න පුළුවන් නිලධාරීන් අට දෙනෙක් ඉන්නවා. ආණ්ඩුවෙන් පඩි ගන්න නිලධාරීන් අට දෙනෙක් ඉන්නවා. කරන්න තිබෙන්නේ ඩෙංගු මර්දනය සඳහා ජාතික වැඩ පිළිවෙළක් හදලා එය ගමට ගෙන යන එක විතරයි.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සම්පත්දායකයන්ගෙන් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. මම ඔබතුමාට කාරණයක් කියන්නම්. මම ඩෙංගු සම්බන්ධයෙන් ලංකාවේ ඉන්න හොඳම ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයා වන මීගමුව රෝහලේ වෛද්‍ය ලක්කුමාර මහත්මයා හමු වුණා. ඔබතුමා දන්නවාද? එතුමාගේ දක්ෂතාව හඳුනාගෙන පාකිස්තානයේ එක ප්‍රාන්තයක මහ ඇමතිවරයෙක් එතුමා පාකිස්තානයට ගෙන්වා ගත්තා. එතුමා පාකිස්තානයේ ඒ ප්‍රාන්තයට යනකොට ඩෙංගු රෝගීන් දෙලක්ෂ හතළිස්දහසක් හිටියා. එතුමා ගිහිල්ලා මාසයක් ඉඳලා වැඩ පිළිවෙළක් දියත් කළා. ඩෙංගු රෝගීන් සංඛ්‍යාව හතළිස්දහසට අඩු වුණා. බලන්න, එතුමා පාකිස්තානයට ගෙන්වාගෙන එතුමාගෙන් වැඩ ගත්තා. අඩු ගණනේ මේ රටේ එතුමාට කථා කරන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, අපට හොඳ සම්පත්දායකයන් ඉන්නවා. අපේ උණ රෝහලේ, ඒ වාගේම රිජ්වේ ආර්යා ළමා රෝහලේ හොඳ විශේෂඥ වෛද්‍යවරු ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ගරු ඇමතිතුමනි, ඊළඟ කාරණය තමයි රජය තුළින් දැවැන්ත මාධ්‍ය ප්‍රචාරණයක් දියත් කරන්න ඕනෑ. "ඩෙංගු මාරාන්තිකයි" කියන එක හැම වෙලාවේම කියන්න. Radio එකේ ඒක විනාඩි පහෙන් පහට ඒක විකාශය කරන්න. TV එකේ ඒක විනාඩි පහෙන් පහට ඒක විකාශය කරන්න. ඒ ගැන පත්තරේ advertisements දමන්න. එහෙම තමයි අපි කළේ. 2010 වසරේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේදී අපි මේ ප්‍රශ්වලට මුහුණ දුන්නා. ඔබතුමාට මතක ඇති, යුද්ධය පැවැති කාලයේදී බස් රථවල බෝම්බ තියනකොට අපි ඒවා ඔක්කෝම නැවැත්වූවේ යම් වැඩ පිළිවෙළක් දියත් කරලායි. ඒ නිසා ඩෙංගු මර්දනය සඳහා දැවැන්ත මාධ්‍ය ප්‍රචාරණයක් ගෙන යන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. මේ සඳහා රූපවාහිනී නාළිකා ගෙන්වන්න; ගුවන් විදුලි ආයතන ගෙන්වන්න; පත්තර ගෙන්වන්න; මේ වැඩේට බහින්න කියන්න. බැහැලා, වහාම ජනතාව දැනුවත් කරන්න කියලා කියන්න. "ඩෙංගු මාරාන්තිකයි" කියලා කියන්න.

ගරු ඇමතිතුමනි, මම කොළඹ තිබෙන ප්‍රධාන පෙළේ පෞද්ගලික රෝහලකට ගියා ඩෙංගු රෝගය හැදුණු පුංචි ළමයෙක් බලන්න. මම ඒකේ නම කියන්න කැමැති නැහැ. මම යනකොට ඒ රෝහලෙන් ඒ දරුවාට බරපතළ antibiotic එකක් දීලා තිබුණා. වතුර ඕනෑ තරම් බොන්න කියලා කියා තිබුණා. ඒ දරුවාට හොඳටම අමාරු වුණා. ඒ දරුවාගේ වෙලාවට රජයේ රෝහලකට අරගෙන ගිහිල්ලා ඒ දරුවාගේ ජීවිතය බේරා ගත්තා. ගරු ඇමතිතුමනි, සමහර වෛද්‍යවරු මේ රෝගය ගැන දන්නේ නැහැ; හෙදියන් දන්නේ නැහැ. ඔබතුමා දන්නවා, මේ ලෙඩේට බෙහෙතක් නැහැ. අද වෙනකල් බෙහෙතක් හොයා ගෙන නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් හොඳ දැනුවත් කිරීමක් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. ඇමතිවරු හැටියට -ඔබතුමා පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයා හැටියට- මේ සම්බන්ධයෙන් ලොකු කාර්ය භාරයක් කරන්න ඔබතුමන්ලාට පුළුවන්. පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ නැහැ. ඒකට ප්‍රශ්නයක් නැහැ. අපි ඒක පැත්තකට දමමු. හැබැයි ඒ යාන්ත්‍රණය කඩාගෙන වැටිලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා ඒ යාන්ත්‍රණය ශක්තිමත් කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්න. අද ඩෙංගු රෝගීන් ලක්ෂ ගණනක් ඉන්නවා. බලන්න, ඒකෙන් ඇති වන ප්‍රතිඵලය මොකක්ද කියලා. අද සංචාරක ව්‍යාපාරය කඩා ගෙන වැටිලා. අද විදේශිකයින් මේ රටට එන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. බලන්න, අද planes ඔක්කෝම හිස් වෙලා. මෙහෙම මිනිස්සු මැරෙනකොට, මෙහෙම ඩෙංගු හැදෙනකොට විදේශිකයන් එයිද? ගරු ඇමතිතුමනි, මේ රට අවදානම් රටක් බවට පත් වෙන්න පුළුවන්. හෙට මේ රෝගය ඔබේ දරුවාට හැදෙන්න පුළුවන්; මාගේ දරුවාට හැදෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙට ඔබතුමාගේ දරුවාට මේ රෝගය හැදෙන්න පුළුවන්. ඩෙංගු මදුරුවෙක් කෑවොත් අපි දෙදෙනාටත් හෙට ඩෙංගු හැදෙන්න පුළුවන්. මේක ඉතාම බරපතළ, බේදජනක තත්ත්වයක්. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේක විහිළුවකට ගන්න එපා.

ගරු ඇමතිතුමනි, ගංවතුරේ අත්දැකීම් ගන්න. හෙම්මාතගම නාය යෑමේ අත්දැකීම් ගන්න. ගරු ඇමතිතුමනි, සාලාව අවි ගබඩාවේ සිදු වූ පිපිරීමේ අත්දැකීම් ගන්න. ඒ තිබුණු අඩු පාඩුකම් හදලා මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න. මේ ආණ්ඩුව මීට වඩා වැඩ කරන්න ඕනෑ. නමුත් මොනවාද මේ කථා කරන්නේ? ගොං චූන් වැඩ ගැන කථා කර කර ඉන්නවා. අනවශ්‍ය වැඩ ගැන කථා කරන්න එපා. මේ වාගේ වෙලාවක පාර්ලිමේන්තුව වහන්න; කල් දමන්න. මන්ත්‍රීවරුන්ට කියන්න ආසනවලට යන්න කියලා. පළාත් සභා මන්ත්‍රීවරු ඔක්කෝටම ආසනවලට යන්න කියන්න. ගිහිල්ලා මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න කියන්න. මේ රෝගය ව්‍යාප්තවීම වළක්වන්න සියලු දෙනාම එකතු වෙලා වැඩ පිළිවෙළක් හදන්න. ගරු ඇමතිතුමනි, නැත්නම් ඉතාම අවදානම්, බරපතළ තත්ත්වයකට අපට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒක අපට නවත්වන්න බැහැ, ගරු ඇමතිතුමනි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.54]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම ඉතාම වැදගත් යෝජනාවක් ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා ඉදිරිපත් කළා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ඒ යෝජනාව ස්ථිර කළා. මෙය අපි ඉතාම දැඩි ලෙස අකාරුණික තත්ත්වයකට පත් වුණු මොහොතක්. හැබැයි, මතක තබා ගන්න, මේ යෝජනාව ගෙනාවේ ඒ තුළින් රජයට මඩ ගහන්නයි; පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයාට මඩ ගහන්නයි; රාජිත සේනාරත්න ඇමතිවරයාට මඩ ගහන්නයි. මතක තබා ගන්න, අර කුණු කඳු ඉතුරු කරලා ගියේ තමුන්නාන්සේලා. වසර ගණනක් මේ රට පාලනය කරපු මිනිස්සු, මේ රටේ පාලකයෝ හැටියට වැඩ කරපු අය, ඇමතිවරු හැටියට වැඩ කරපු අය, කැබිනට් ඇමතිවරු හැටියට වැඩ කරපු අය නිදා ගත්තාද කියලා මම අහනවා, මීතොටමුල්ලේ කුණු කන්ද අවුරුදු ගණනක් තිස්සේ උඩට නගිනකල්. මේ ආණ්ඩුව බලයට පත් වෙලා තවම අවුරුදු දෙකයි- දෙකහමාරයි. නමුත් තමුන්නාන්සේලාගේ ප්‍රකාශවලින් කියන විධියට මේ ආණ්ඩුව තමයි මීතොටමුල්ලේ කුණු කන්ද හදලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, අද ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉතාමත් අවඥාවට ලක් කළා. මේ රටේ නිලධාරින් හරියට වැඩ කරන්නේ නැහැයි කියලා ඔබතුමන්ලා කිව්වා. මතක තියාගන්න, මේ රටේ මේ විධියේ බෝවන රෝග, වසංගත රෝග ඉතිහාසයේත් තිබුණු බව. මැලේරියා රෝගය ඉතිහාසයේ තිබුණා. දහස් ගණන් මිය ගියා. ඒවාට පිළියම් හැදුවා. අද කොච්චර නවීන තාක්ෂණය තිබුණත් අවුරුදු ගණනක් යනකල් මේ ඩෙංගු වසංගතය නැති කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. තමුන්නාන්සේලාට මේ කාරණය කියන්න ඕනෑ. ඩෙංගු මදුරුවා මර්දනය කරන්න පුළුවන් සීමාවන් ටික ගත්තාම, ඒ සඳහා තිබෙන ඖෂධ වර්ග ගත්තාම, තත්ත්වය ඉතාමත්ම කනගාටුදායකයි; බොහොම සංවේගජනකයි.

එවැනි වාතාවරණයක් තුළ ආණ්ඩුවක් හැටියට මේ රටේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ ඉඳලා, ඒ වාගේම නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හැමදාමත් මේ ඩෙංගු රෝගය මර්දනය කරන්න අවශ්‍ය කටයුතු කරනවා. අද පළාත් පාලන ආයතනවල නියෝජිතයින් නැහැයි කියලා ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්වා. නමුත්, ඒවායේ කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ එක්කම සෞඛ්‍ය අමාත්‍යාංශය තිබෙනවා. තමුන්නාන්සේලා ඔහොම කථා කළාට, ඉස්සෙල්ලා හිටපු තමුන්නාන්සේලාගේ මහ ඇමතිවරු තමයි මේ පළාත් පාලන ආයතන සියල්ල භාරව ඉන්නේ. නමුත්, දැන් ඉන්න හැම මහ ඇමතිවරයෙක්ම අකාර්යක්ෂමයි, ඒ පිළිබඳව දැනුවත් නැහැ,

වැඩ බැරි ටාසන්ලා කියලා තමයි තමුන්නාන්සේලා කියන්නේ. ඒ අය තමුන්නාන්සේලා යටතේ ඉන්න කොට හොරකමක් කළත්, මොන දෙයක් කළත්, ඒ අයව තමයි මුදුන්නෝ හැටියට තියාගෙන සිටියේ.

අද යම් කිසි විධියකින් පළාත් පාලන ආයතන ටික මහඟරවන්න පුළුවන්කමක් නැත්නම්, ඒවායේ පාලනය හරියට කරන්න බැරි නම්, එහි වග කීම භාරගන්නත් ඕනෑ තමුන්නාන්සේලා නියෝජනය කරන පක්ෂයයි. මමත් ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක්. අපි දන්නවා, මහජන නියෝජනය අවශ්‍ය බව. ඒක අපි පිළිගන්නවා. හැබැයි, ඒක නැහැයි කියලා ඩෙංගු රෝගය, මේ වාගේ දේවල් මර්දනය කරන්න බැරිකමක් නැහැ. එතුමන්ලා කියනවා, ජාතික වැඩ පිළිවෙළක් නැහැයි කියලා. ජාතික වැඩ පිළිවෙළක් ඇයි නැත්තේ? අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් සෑම මාසයකම නොවෙයි, සති දෙකකට වරක් ජාතික වැඩ පිළිවෙළක් පිළිබඳව සමාලෝචනයක් කරනවා. හැම තැනම ශුද්ධ පවිත්‍ර කරනවා. අවශ්‍ය මැෂින් දීලා තිබෙනවා. පළාත් පාලන ආයතනවලට අවශ්‍ය ධූමායන මැෂින් ලබා දීලා තිබෙනවා. යාන වාහන ලබා දීලා තිබෙනවා. අද අඩු පාඩුවක් නැහැ.

රෝහිත අබේගුණවර්ධන මහත්මයා දන්නවා ඇති, එතුමා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් සිටි කාලයේ අපට ට්‍රැක්ටරයයි, දෙකයි තිබුණේ කියලා. අද සියලු සම්පත් දීලා තිබෙනවා. අද excavators, JCBs සහ trucks වාගේ අවශ්‍ය හැම දෙයක්ම දීලා තිබෙනවා. ඇයි, එහෙම නම් මේ කුණු කළමනාකරණය කරන්න බැරි කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මේ තත්ත්වයට හැම කෙනෙක්ම වග කියන්න ඕනෑ. මගේ මිත්‍ර මහින්දානන්ද අලුත්ගමගේ, රෝහිත අබේගුණවර්ධන හිටපු ඇමතිතුමන්ලාගේ ඉඳලා හැම කෙනෙක්ම මේකට වග කියන්න ඕනෑ. මේ රටේ සෑම පුරවැසියෙක්ම වග කියන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් තිබෙන නොසැලකිලිමත්කම නිසා, අඩු අවධානය නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. තමුන්ගේ ගෙදර වත්ත පිරිසිදුව තියා ගන්න බලනවා, අල්ලපු ගෙදර වත්ත අපිරිසිදු කරලා. තමන් රැවුල කපන රේසරයේ ප්ලාස්ටික් කෑල්ල පවා පරිසරයට එක් කරනවා. කවුද මේ අපද්‍රව්‍ය කළමනාකරණය කරන්නේ? අපේ රටේ ඒවා නිසි පරිදි බැහැර කිරීමක් සිදුවනවාද? නැහැ. මේ කාල සීමාව තුළ ඕනෑ තරම් වැඩ පිළිවෙළවල් සකස් කරන්න පුළුවන්කම තිබුණා. එතුමන්ලා කියනවා, එතුමන්ලාගේ කාලයේත් ඩෙංගු උවදුර තිබුණා කියලා. එහෙම නම් ඒක ආරම්භ වෙච්ච කාලයේම තමයි එය මුලිනුපුටා දමන්න තිබුණේ. හැබැයි, ඒ වැඩේ හරියට කළේ නැහැ. ඒ කාලයේ මේ පිරිසිදු කිරීම් කරන්න පළාත් පාලන ආයතන හරියට වැඩේ පටන් ගෙන තිබුණා නම්, අද වෙන කොට මේ තරම් භයංකර -බියකරු- තත්ත්වයකට පත් වෙන්නේ නැහැ. තමන්ගේ කාලයේ සියල්ල සිදු වෙන්න ඉඩ දීලා අද මේ විධියට කථා කරනවා. මතක තියා ගන්න, මේ අවුරුදු දෙකහමාර ඇතුළත මේ රටේ ව්‍යසන අටක් සිදු වෙලා තිබෙන බව. නොයෙක් විධියේ නාය යෑම් සිදු වුණා, ගංවතුර උවදුරු ආවා.

පසු ගිය දවස්වල දැඩි ගංවතුර උවදුරක් ආවා. 2003 වාගේ නොවෙයි, 2017 අපි දරුණුතම උවදුරට මුහුණ දුන්නා. ගිං ගහ අසබඩ ජීවත් වෙච්ච කෙනෙකු හැටියට මම ඒ ගැන හොඳින් දන්නවා. එවැනි දෙයක් තිබෙද්දීත් මේ ආණ්ඩුව නොසලකා හැරියේ නැහැ. මේ වෙනුවෙන් කටයුතු කරන්න බිලියන අටක මුදලක් අද ලැහැස්ති කරලා තිබෙනවා. වෙන කවරදාටත් වඩා කසළ කළමනාකරණය පිළිබඳ විධිමත් වැඩ පිළිවෙළකට අපි අද ලැහැස්ති වෙලා තිබෙනවා. බස්නාහිර පළාතේ විතරක් නොවෙයි, ගාල්ල දිස්ත්‍රික්කයේත් අද කසළ කළමනාකරණයට ලැහැස්තියි. නමුත් අපට කසළ නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා, අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ගෙනැල්ලා කටයුතු කරන්න. අද ඉතාලියේ සමාගම් ඇවිල්ලා තිබෙනවා, ඒ පිළිබඳව අධ්‍යයනය කරලා තිබෙනවා. ඒ පිළිබඳව ශක්‍යතා වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා ආර්ථික කමිටුවට ඉදිරිපත් වෙලා තිබෙනවා. හෙට-අනිද්දා වෙන කොට ඒ කටයුතු අපි පටන් ගන්නයි හදන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
හැබැයි, තමුන්නාන්සේලා නොවෙයි අවුරුදු 20කට ආසන්න කාලයක් මේ රට පාලනය කරපු පාලකයෝ අබමල් රේණුවකවත් ප්‍රමාණයට මේ පිළිබඳව හිතපු නැති නිසා තමයි මේ තරම් භයංකර තත්ත්වයකට අද රට පත් වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේ කියනවා, පාර්ලිමේන්තුවේ මදුරුවෙක් හිටියා කියලා. හැබැයි, ඒ දවස්වල සර්පයෝ හිටියේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා විපක්ෂ නායක හැටියට හිටපු කාලයේ එතුමාගේ කාමරයේත් සර්පයෝ හිටියා.

මම දන්නේ නැහැ, මොකක් වෙලාද කියලා. ඒවා පෙනෙන්නේ නැහැ. තමන්ගේ ගෙදර ඉස්සරහා පැත්ත පෙනෙන්නේ නැති අය අද අනුන්ගේ ගෙවල්වල පිටුපස පැත්තේ තිබෙන දේවල් පිළිබඳව සමහර වෙලාවට කථා කරනවා.

මම පැහැදිලිව කියනවා, අපි ඩෙංගු උවදුරේ අභියෝගයට මුහුණ දෙන්න ලැහැස්තියි. මුළු රටම එක වැඩ පිළිවෙළක් විධියට ගෙන යන්න අපි ලැහැස්තියි. ඒකට ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ලැහැස්තියි. ඒකට රාජිත ඇමතිතුමාත් විශාල කැප කිරීමක් කරලා තිබෙනවා. මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඉතාම පැහැදිලි වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. මේක බැරෑරුම් දෙයක් හැටියට අරගෙන, එම කටයුත්ත අපේ ඇඟට අරගෙනයි අපි මේ කටයුතු කරන්නේ. ඒ නිසා බය වෙන්න එපා. ඩෙංගු තුළින් ඉදිරියට වෙන ව්‍යසනය වළක්වන්නට රටක්, ජාතියක් හැටියට දිවි හිමියෙන් අපි කටයුතු කරනවා; ත්‍රිවිධ හමුදාව කටයුතු කරනවා; පොලීසිය කටයුතු කරනවා; සිවිල් ආරක්ෂක අංශ කටයුතු කරනවා; බන්ධනාගාර කටයුතු කරනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ ඉඳලා, සෞඛ්‍ය අංශයේ කම්කරුවාගේ ඉඳලා හැම කෙනෙකුම යොදවා ගෙන මේ කටයුතු කරන්න අපි ලැහැස්ති කරලා තිබෙන්නේ. ඒ නිසා රෝහිත අබේගුණවර්ධන මැතිතුමා හිතන්න එපා - ගංවතුරෙන්, ව්‍යසන **අටෙන්** ආණ්ඩුව වටිටන්න හැදුවා. නොයෙක් දේවල් කියලා, "සාලාව" ගැන කියලා ආණ්ඩුව වටිටන්න හැදුවා. හැබැයි, එහෙම හිතන්න එපා. පසු ගිය දවස්වල ආණ්ඩුව වතුරෙන් අනා ගනියි කියලා බලාගෙන හිටියා. හැබැයි, එහෙම අනා ගන්නේ නැහැ. ව්‍යසන කීයක් ආවත් ඒ වෙනුවෙන් පෙනී සිටින්න අපි ලැහැස්තියි. ඩෙංගු තුළින් මේ ආණ්ඩුව වටිටන්න සමහරු හදනවා, අපේ අකාර්යක්ෂමතාව කියලා. ඒකටත් මුහුණ දෙන්න අපි ලැහැස්තියි. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා. අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා මෙවැනි බොහොම වැදගත් යෝජනාවක් ගෙන ඒම ගැන එතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.02]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රෝහිත අබේගුණවර්ධන හිටපු ඇමතිතුමා කැළි කසළ උවදුර සම්බන්ධයෙන් අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගෙනා යෝජනාවට මමත් අදහසක් එකතු කරන්න කැමැතියි. මම හිතන විධියට අපි කවදාවත් මේ කාරණය පිළිබඳව කථා කරද්දී එක එක පාර්ශ්වයන්ට චෝදනා කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා අද එතුමාගේ කථාවේ දී කිව්වා, අපි ද්වේෂයෙන් කථා කළාය; අපි ආණ්ඩුව විවේචනය කළාය; අපි අමාත්‍යාංශ විවේචනය කළාය කියලා. හැබැයි, එතුමාට වැරදිලා. අපි අමාත්‍යාංශ විවේචනය කළේ නැහැ. අපේ හිටපු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කථා කරන අවස්ථාවේ කිව්වේ මොකක්ද? "නියම වැඩසටහනක් ගෙනෙන්න; ගමට යන්න; මන්ත්‍රීවරුන්ට වැඩ කරන්න අවස්ථාව දෙන්න; මේ ආයතන පිහිටුවන්න" කියලායි. එතුමා ඉල්ලීමක් කළේ. ඒ කාරණය ගැන විරෝධයෙන් බලනවා නම්, ඔබතුමන්ලාට එහෙම දැනෙනවා ඇති.

විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කියනවා, අපි අවුරුදු දෙකහමාරක-තුනක කුණු කන්දක් ඉතුරු කරලා ගියා ලු, ඒක අයින් කර ගන්න එතුමන්ලාට විධියක් නැහැ ලු. ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා මතක් කරලා බලන්න. ඔබතුමා නියෝජනය කරන පක්ෂය තමයි අවුරුදු තිහක යුද්ධයක් මේ රටේ ඉතුරු කරලා ගියේ. ඒ අවුරුදු තිහක යුද්ධය අපට ඉවර කරන්න පුළුවන්කම තිබුණා. ඔබතුමන්ලාට අපි ඉතුරු කරලා ගිය shopping bags දෙකක්-තුනක් ඉවත් කර ගන්න බැරුව දැන් මහා උජාරුවට, මහා භයියෙන් කෑ ගහනවා. කුණු ටිකක් අයින් කර ගන්න බැරුව, "පසු ගිය ආණ්ඩුවයි මේක කෙරුවේ" කියලා කෑ ගහනවා. ලජ්ජයි. අවුරුදු තිහක යුද්ධයක් ඉවර කරපු ආණ්ඩුවකට මේ shopping bags එකක්-දෙකක්, grocery bags එකක්-දෙකක් කියන්නේ මහා ලොකු කන්දක් නොවෙයි. අපේ වැඩ පිළිවෙළවල් තිබුණා. අපි කොළඹ ලස්සන කරලා තිබුණා. අද මේ ආයතන ටික අකර්මණ්‍ය කරලා තිබෙනවා. ඔබතුමන්ලාට පිට කොන්දක් තිබෙනවා නම්, ඔබතුමන්ලා ෆයිසර් ඇමතිතුමා හරහා පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්න, පරණ ක්‍රමයටම මැතිවරණය ගෙනෙන්න කියලා. පළාත් පාලන මැතිවරණය මොන ක්‍රමයෙන් හරි ගෙනැල්ලා මේ ආයතන ටික පිහිටෙව්වා නම්, කැළි කසළ ප්‍රශ්නයක් මේ රටේ උද්ගත වෙන්නේ නැහැ. පෙනෙන තෙක් මානයක මැතිවරණයක් නැති බව අපි දන්නවා. පෙනෙන තෙක් මානයකට මැතිවරණයක් ගෙනෙන්න පක්ෂ දෙකටම හැකියාවක් නැහැ. පසු ගිය දවස්වල එක්සත් ජාතික පක්ෂය කිව්වා, "අපි මැතිවරණවලට ලැහැස්තියි" කියලා. හැබැයි, රට අකර්මණ්‍ය වෙලා තිබෙන නිසා අද මැතිවරණ පවත්වන්න බැහැ.

එදා, බලයට එන වෙලාවේ ඔබතුමන්ලා කිව්වේ මොකක්ද? එදා බලයට එන වෙලාවේ ඔබතුමන්ලා කිව්වා, මේ කැළි කසළ අයින් කරන්න, කානු ශුද්ධ කරන්න, මං මාවත් ශුද්ධ කරන්න හමුදාව යොදා ගන්නේ නැහැ කියලා. අන්න, ෆීල්ඩ් මාර්ෂල්තුමා හමුදා නිලධාරීන් වතුරට බස්සාගෙන ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රදේශය ශුද්ධ කරවනවා. ඒකෙන් හමුදා නිලධාරීන්ගේ ගරුත්වය නැතිව යනවා. ලංකාවට රන් පදක්කම් ගෙනාපු හමුදාවේ සේවය කරන ක්‍රීඩකයින් 51 දෙනෙකුගේ අද වනවිට වැඩ තහනම් කරලා තිබෙනවා. ෆීල්ඩ් මාර්ෂල්තුමා, ලංකාවට රන් පදක්කම් ගෙනා කාය වර්ධන ක්‍රීඩකයින් 51 දෙනෙකුගේ වැඩ තහනම් කරලා තිබෙනවා, කානු ශුද්ධ කරන්න ආවේ නැහැ කියලා. මෙන්න, යහ පාලනය ක්‍රියාත්මක වෙන ආකාරය. කානු ශුද්ධ කරන්න හමුදාව යොදා ගන්නේ නැහැ කියපු ආණ්ඩුව අද වනවිට හමුදා නිලධාරීන් වූ එම ක්‍රීඩකයන්ගේ වැඩ තහනම් කරලා තිබෙනවා. මෙන්න මෙහෙමයි කටයුතු සිදු වන්නේ.

මම හිතන විධියට විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මේ හැම ආණ්ඩුවක්ම නියෝජනය කර තිබෙනවා.

පැවති ආණ්ඩුවල ලේකම්වරු වෙලා හිටියා. පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් වෙලා හිටියාය කිව්වා. හැබැයි, ඔබතුමන්ලා වාගේ හැකියාවක් නැති මන්ත්‍රීතුමන්ලා එදා එම ආයතනවල නිදාගෙන ඉන්න ඇති. මොකද, අසීමිත බලයක් නේ, තිබෙන්නේ. පළාත් පාලන ආයතන නැතත් මේ කටයුතු කරගෙන යන්න පුළුවන් කියා ඔබතුමා අද කථා කරලා කියනවා නම්, ඒක විහිළුවක්. ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, පනතේ හැටියට මන්ත්‍රී කෙනෙකුට, ඇමති කෙනෙකුට නැති බලතල පළාත් පාලන ආයතන මන්ත්‍රීවරයෙකුට තිබෙනවා; පළාත් පාලන ආයතන සභාපතිවරයාට තිබෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මේ කාරණයේදී point of Order ගන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
පළාත් පාලන ආයතනයක සිටි නියෝජිතයෙක් හැටියට මම කිසි ලෙසකින්වත් එහෙම ප්‍රකාශ කර නැහැ. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමා හැන්සාඩ් වාර්තාව බලන්න. මම කියූ දෙය recording එකෙන් නැවත අසා බලන්න. මම එහෙම කියන කෙනෙක් නොවෙයි. මම එහෙම කියා නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මෙතුමා මගේ seat එකට එහා පැත්තේ ඉන්නේ. මම දන්නවා නේ, එතුමා දවසේම මෙතැන නිදාගෙනයි ඉන්නේ. එහෙම ඉඳලා, නින්දෙන් ඇහැරිලා එක පාරටම මොනවා හෝ කියනවා. එතුමා පළාත් පාලන ආයතන ප්‍රධානියෙක් වෙලා හිටියා ලු; ඒ සභාපතිවරු නැතත් ආයතනවලට

කටයුතු කරගෙන යන්න පුළුවන් ලු. ඒක පුදුම කථාවක්. මම සභාපතිවරයෙක් වෙලා ඉඳලායි මෙතැනට ආවේ. මම දන්නවා ඇමතිවරයෙකුට නැති බලතල ප්‍රාදේශීය සභා සභාපතිවරයාට තිබෙන බව. [බාධා කිරීමක්]මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වදේ නවත්වා දෙන්න කෝ. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, කරුණාකර වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
එතුමා මෙහෙම බාධා කරද්දි මට කථා කරන්න බැහැ. එතුමා වාඩි කරවලා දෙන්න. [බාධා කිරීම්] ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය ආවා නම් එතුමා වාඩි වෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මම අවුරුදු අටක් සභාපති ලෙස හිටියා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මෙතුමාගේ බාධා කිරීම නවත්වලා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට කථා කරන්න විධියක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, කරුණාකර වාඩි වෙන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මේ යහ පාලනය ක්‍රියාත්මක වන විධියද? අග්‍රාමාත්‍යතුමාට අගෞරව කරන්න එපා. [බාධා කිරීමක්]මේක හරි කරදරයක් නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, කරුණාකර වාඩි වෙන්න. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මෙතුමා මට කථා කරන්න දුන්නේ නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව විනාඩියක් තිබෙනවා. ඔබතුමා කථා කරලා අවසන් කරන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හොඳයි. ගරු මන්ත්‍රීතුමාට මම අගෞරව කරනවා නොවෙයි.

පළාත් පාලන පනත අනුව, කුණු අයින් කරන්න ඕනෑ නම් සභාපතිවරයාට ට්‍රැක්ටර් එක අරගෙන යන්න පුළුවන්. පළාත් පාලන පනත අනුව, ලේකම්වරයාට එහෙම කරන්න හැකියාවක් නැහැ. ගරු ඇමතිතුමනි, එම නිසා ලේකම්වරු යටතේ තිබෙන ආයතන අකර්මණ්‍ය වෙනවා. එම නිසා හෙට දවසත් ඔබතුමාට තීරණාත්මකයි; barriers ටිකක් දමා ගන්න වෙයි. බොහොම භයානක තත්ත්වයකටයි රට ඇවිත් තිබෙන්නේ. ඒ ජනතා විරෝධය, ඒ මන්ත්‍රීවරුන්ගේ විරෝධය, ගම්වල විරෝධය දිනෙන් දින මහ පාරට එන තත්ත්වයට පත් වෙනවා. වත්තලට, ජා-ඇලට කොයි තරම් කුණු ගෙනාවත් කමක් නැහැ කියා ජෝන් අමරතුංග ඇමතිතුමන්ලා කියනවා. ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයට පත් කළ මන්ත්‍රීතුමා විධියට ඔබතුමාට ඔය සම්බන්ධීකරණ කමිටුවලට ගියාම, ගම්පහට කැලි කසළ ගේනවාද නැද්ද කියා තීන්දුවක් ගන්න වෙයි. එතුමාට නුවර පැත්තෙන් ආසනයක් හම්බ වෙන තත්ත්වයක් තිබෙනවා. ඒක කිරිඇල්ල ඇමතිතුමා පසු ගිය දිනවල ප්‍රකාශ කර තිබුණා. එම නිසා එතුමා ගම්පහ ගැන කථා නොකරයිද දන්නේ නැහැ. මට කථා කරන්න අවස්ථාව ලබාදුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා නිදාගෙන ඉඳලා නැඟිටලා මගේ විනාඩි දෙක තුනක් නැති කළා.

මේ ඩෙංගු උවදුර නැති කරන්නත්, කැළි කසළ ප්‍රශ්නය විසඳන්නත් මොන යම් ක්‍රමයකින් හෝ පළාත් පාලන මැතිවරණය කඩිනමින් පවත්වන්න කියන එකයි අපේ ඉල්ලීම. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.09]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට කලින් කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරු තුන්දෙනාම මේ මානෘකාව කථා කරන කොට කිව්වේ මේක දේශපාලනීකරණය කරන්නේ නැහැ කියායි. නමුත්, එතුමන්ලා එය දේශපාලනීකරණය කළා. මේ ප්‍රශ්නය දේශපාලනමය ඇසින් බලන්න මම කැමැති නැහැ. මෙය දේශපාලනමය ඇසකින් බැලිය යුතු ප්‍රශ්නයක් නොවෙයි. ඒකට හේතුව මේකයි.

මම එක කාරණයක් කියන්නම්. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා සඳහන් කළ අසත්‍ය කාරණයක් ගැන මම ඇත්ත කථා කරන්නම්. එතුමා මීගමුවේ, දොස්තර ලක්කුමාර් මහත්මයා ගැන කිව්වා. ඩෙංගු රෝගය පාලනය සඳහා වූ කඩිනම් අන්තර් පාර්ශ්වීය වැඩසටහනට මම අද උදේ සහභාගි වුණා. එය සෞඛ්‍ය අමාත්‍යාංශයේ තමයි තිබුණේ. දොස්තර ලක්කුමාර් මහත්මයාත් ඒ වැඩසටහනේ එක ප්‍රධානියෙක්. එම වැඩසටහන අද උදේ 9.00 සිට 11.30 වන තුරු සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවැත්වුණා. මමත් එයට සහභාගි වුණා. [බාධා කිරීමක්] නැහැ. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඒ අසත්‍යය කියන්න එපා. දොස්තර ලක්කුමාර් මහත්මයාට ඒ තැන අප දීලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පොඩ්ඩක් ඉන්න, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පාර්ලිමේන්තුවේ අසත්‍යය ප්‍රකාශ කළාය කියා ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා කිව්වා. මම කිව්වේ - [බාධා කිරීමක්] මම ඔබතුමාට බාධා කළේ නැහැ. මීට සතියකට කළින් එතුමා සම්බන්ධ කර ගත්තා. හැබැයි, දැන් 70,000ක් වෙලා. ඊට කලින් සම්පත් දායකයෝ ගන්න තිබුණා කියායි මම ඔබතුමාට කිව්වේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
සම්පත් දායකයෝ හරියට අරගෙන අප මේ ප්‍රශ්නය විසඳනවා. ඒ සඳහා තමයි අප මේ වැඩසටහන ඉදිරිපත් කර තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකයේ ගෝලීය උෂ්ණත්වය වැඩිවීම තුළ රටවල් රාශියක ඩෙංගු උවදුර වැඩි වෙලා තිබෙනවා.

අපි ඊයේ-පෙරේදා ලාඕස් රටට ගියා. ලාඕසයේත් ඩෙංගු උවදුරු වැඩි වෙලා තිබෙනවා, ඒකට ප්‍රතිකර්ම යොදන්නේ කොහොමද කියලා අපි සොයා බැලුවා. මේ සෑම රටකම මෙම ප්‍රශ්නය තිබෙනවා. මම දැන්වත් ඉල්ලනවා, මේ ප්‍රශ්නයට පක්ෂ-විපක්ෂ මන්ත්‍රීවරු 225ම එකතු වෙලා මේ වැඩේ කරමු. නැත්නම් මේක වළක්වන්න බැහැ. ඒක තමයි එකම ක්‍රමය. මම වචනයක්වත් කියන්න කැමැති නැහැ. තමුන්නාන්සේලා මේක අවුරුදු ගණනාවක් තිස්සේ කළේ නැති නිසා කරන්නේ නැහැ. අද මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙනවා. මනුෂ්‍යත්වයේ නාමයෙන් දේශපාලනය පැත්තකට තියලා අපි සියලු දෙනාම එකතු වුණේ නැත්නම්, මේ ඩෙංගු උවදුර නවත්වා ගන්න බැහැ. මොකද, අපේ රටේ තිබෙන ප්‍රධානම කාරණය වන්නේ, අපි morally educate වෙලා නැහැ. මොකද, මම බලන්නේ මගේ ගෙදර කුණු ටික අල්ලපු ගෙදරින් ගිහින් තියලා වැඩේ "ෂේප්" කියලා හිතා ගන්නයි. ඒක නොවෙයි කළ යුත්තේ. අපි පක්ෂ-විපක්ෂ මන්ත්‍රීවරු සියලු දෙනාම එකතු වෙලා එකට ඉඳගෙන මෙන්න මේ moral education එක බිම් මට්ටමේ සිට හදන්න ඕනෑ. එහෙම හැදුවේ නැත්නම්, අපට හැමදාම වෙන්නේ මොකක්ද?මේ රටේ මෙම ඩෙංගු මදුරු උවදුර විතරක් නොවෙයි, ගෝලීය උෂ්ණත්වය වැඩිවීම තුළ තිබෙන අනෙක් සියලුම ප්‍රශ්න උග්‍ර ප්‍රශ්න වනවා. මේකට අපි විසඳුම් සොයන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්දේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉතාමත් හොඳ වැඩපිළිවෙළක් වන කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන -කසළ බඳුන් වෙන් කරලා හඳුනාගෙන කරන වැඩසටහන- පටන් ගත්තා. අපි මේ වැඩසටහනේදී ග්‍රාමීය මට්ටමෙන් දැනුවත් කිරීම සඳහා හැම තැනකටම යනවා. මේ බිම් මට්ටමේ සිට කරනු ලබන දැනුවත් කිරීම් අපි දේශපාලන භේදයකින් තොරව එකතු වෙලා කළ යුතුයි. නැත්නම්, මේ ගැන නිවැරදි දැනුවත්වීමක් වන්නේ නැහැ. නොදිරන කසළ එක්ක දිරන කසළ දානවා. මේ දේවල් තමයි අපි කථා කළ යුත්තේ. මේ ගැන විද්‍යාත්මකව කථා කළ යුතු වැඩසටහනක් වෙලා තිබෙනවා. එහෙම නැතිව "ගිය අවුරුද්දේ කළේ නැහැ, මේ අවුරුද්දේ කළේ නැහැ" කියන එක නොවෙයි ගරු මන්ත්‍රීතුමනි. කළ යුතු වන්නේ මෙයයි. මේ වැඩසටහන සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීන් 225ටම එකතු වෙන්න පුළුවන් වැඩසටහනක්. දේශපාලන භේද ඔක්කෝම අමතක කරලා දමමු. අපි ඔක්කෝම 225 දෙනාම එකතු වෙලා මේ වැඩසටහන ඉදිරියට ගෙනියමු. එහෙම නැතිවුණොත් අපි එකිනෙකාට ඇඟිල්ල දික් කරගත්තත්, ඔය මදුරුවා මාවත් කනවා, ඔබතුමාවත් කනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාවත් කනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට කඩිනම් විසඳුමක් හැටියට අපි සියලු දෙනාම එකට එකතු විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දොස්තර මහත්වරු මේ ගැන කොච්චර මහන්සි වෙනවාද කියලා මම අද දැක්කා. තමන්ට අදාළ කාර්යන්ගෙන් බැහැරව ඒ මහත්වරු මහන්සි වෙලා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. මේ සෞඛසුරාදා කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතනවල මහත්වරු සහ දේශපාලන නායකයෝ ඔක්කෝම එකතු වෙලා මේ වැඩසටහනට සහභාගි වෙනවා. ඒ ආදී වශයෙන් පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව අපි ඔක්කෝම මේකට එකතු වෙමු. මේ කාර්යයේදී අපි පළාත් පාලන ඇමතිතුමාත් එක්ක, සෞඛ්‍ය ඇමතිතුමාත් එක්ක, අතිගරු ජනාධිපතිතුමාත් එක්ක, ගරු අගමැතිතුමාත් එක්ක එකතු වෙලා මේ සියලුම දොඟේ වැඩසටහන් එක්ක එකතු වෙමු. ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු "ඩෙංගු රෝගය පාලනය කිරීම සහ වැළැක්වීමේ සැලැස්ම" තිබෙනවා. මේ වැඩසටහන එක්ක අපි සියලු දෙනා පක්ෂ භේදයකින් එකතු වෙමු. එහෙම එකතු වුණොත් විතරයි මේ රටේ තිබෙන මෙම ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ. එහෙම නැතිවුණොත් අපි එකිනෙකාට චෝදනා කර ගත්තොත්, මෙම ඩෙංගු ප්‍රශ්නයෙන් ගොඩ එන්න බැහැ. මේක පැහැදිලිව තේරුම්ගත යුතුයි ගරු ඇමතිතුමනි. මෙම ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් තුළින්; කසළ නිවැරදි ආකාරයෙන් යොදන වැඩසටහන් තුළින් මේ ඩෙංගු ප්‍රශ්නයට විසඳුමක් ලබා ගත හැකි වෙනවා. මේ සියලුම දෙනා එක්ක එකාබද්ධ වෙලා, රටේ සියලුම මහජනතාව එකතු වෙලා මෙය කළ යුතුයි. එහෙම නැතිව පවතින පාලන පක්ෂයට විතරක් මේක කරන්න බැහැ. ඒ වාගේම තමයි අධ්‍යාපන ක්‍රමවේදය තුළ අපි වැඩසටහන් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙලා තිබෙනවා. ජූලි, අගෝස්තු මාසයන් තුළ මෙම වැඩසටහන් තිබෙනවා. එම දැනුවත් කිරීම් ප්‍රාථමික අවධියේ සිට; ළදරු පාසලේ සිට කළ යුතු වෙනවා. ඒ ආකාරයෙන් කසළ ප්‍රතිචක්‍රීකරණය හරියට කරගත්තොත් පමණයි මෙහි මූලික දේ වළක්වා ගත හැකි වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙංගු මදුරුවා හැදෙන්නේ පිරිසිදු වතුරේ කියලා අපි දන්නවා. ඩෙංගු මදුරුවා පිරිසිදු වතුරේ හැදෙනවා නම්, පිරිසිදු වතුර එකතු වෙන ස්ථාන ගැන දැඩි අවධානයක් යොමු කරමින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම කළ යුතු වෙනවා. එහෙම නැතිවුණොත්, මෙම ඩෙංගු උවදුර වසංගතයක් දක්වා වැඩිදියුණු වෙනකොට ඒ පරිසර පද්ධතියත් එක්ක හැඩගැහෙන මදුරුවන් සමඟ අප හැමදෙනාටම සටන් කළ යුතු වෙනවා. මේ ආදී අභියෝග සියල්ලම ඩෙංගු වසංගතයත් සමඟ තිබෙනවා. ඒ සඳහා ලෝකයේ විවිධ රටවල විවිධ ප්‍රතිකර්ම පාවිච්චි කරමින් මේ මර්දන වැඩසටහනට මුළු රටේම ජනගහනය එකතු වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඒ නිසා තමයි මේ අවශ්‍යතාව ඇති වන්නේ. මා නැවතත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225 දොඟෙන්ම ඉල්ලා

සිටින්නේ, අපි සියලු දෙනාම එකතු වෙමු කියලායි. ගමට යමු. අපි සියලු දෙනාම කථා කරමු. අපි ඇමතිවරු එක්ක එකතු වෙමු. අන්න! එදාට මන්ත්‍රීවරයෙක් විධියට; ජනතා නියෝජිතයෝ හැටියට හෘද සාක්ෂියට කථා කරලා අහන්න පුළුවන් අපේ යුතුකම අපි ඉටු කළා නේද කියලා. අන්න, ඒ යුතුකම ඉටු කරන්න රටේ නායකත්වයත් එක්ක අපි සියලු දෙනාම එකට එකතු වෙලා, මේ වසංගතයෙන් මේ රට බේරා ගනිමු කියන ආයාචනය කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.15]

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මිත්‍ර ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන ඇමති වශයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම භාග්‍යයක් හා යුතුකමක්කොට සලකනවා. අවාසනාවකට වාගේ අද රටේ සමහර අය කුණු ප්‍රශ්නවලින්, ඩෙංගු ප්‍රශ්නයෙන් මූල්‍ය වශයෙන් පෝෂණය වෙනවා වාගේම සමහර මේ ප්‍රශ්න තුළින් දේශපාලන වශයෙන් පෝෂණය වන්නට උත්සාහ දරනවා. රටේ නොයෙක් බේදවාචකයන් වූ අවස්ථාවලදී එය දේශපාලන වේදිකාවක් කර ගෙන ," අපි තමයි මේ වැඩය හරියට කළේ. ආණ්ඩුවට මේ වැඩය කරන්නට බැහැ." කියන චෝදනාවා නහනවා.

අපේ රට නිදහස ලබා අවුරුදු 65ක් වෙනවා. හැබැයි, අපට කුණු සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් ඇති කරන්නට බැරි වුණා. රජයන් කිහිපයක් කුණු ප්‍රතිචක්‍රීයකරණ වැඩ පිළිවෙළ ගැන කථා කළා. නමුත් මේ රජය විතරයි කුණු ප්‍රතිචක්‍රීයකරණය සම්බන්ධයෙන් ව්‍යාපෘති තුනක් දියත් කර තිබෙන්නේ. මීට කලින් සිටි හැම ආණ්ඩුවක්ම කථා කළා විතරයි. ඒ ගැන කිසිම කර්තව්‍යයක් කළේ නැහැ. අපේ ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා සහ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ඩෙංගු ප්‍රශ්නය ගැන පසු ගිය රජය ක්‍රියා කළ දක්ෂතාවය ගැන කථා කළා. මා හිතන විධියට පසු ගිය රජයේ එම දක්ෂතාව හිමිවිය යුත්තේ ඒ කාලවකවානුවේ සෞඛ්‍ය අමාත්‍යවරයාව සිටි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටයි. එම නිසා අපේ ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා සහ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ දක්ෂතාවය ගැන තමයි කථා කළේ. එතුමා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ විශාල කර්තව්‍යයක් මේ රටට කළා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ අවස්ථාවේදී වැඩිපුරම කථා කළේ වර්තමාන සෞඛ්‍ය ඇමතිවරයා වන ගරු රාජිත සේනාරත්න මැතිතුමා ගැනයි. මෙතුමාට අමතක වුණා, පසු ගිය ආණ්ඩුව කාලයේ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සෞඛ්‍ය ඇමති හැටියට ඩෙංගු ප්‍රශ්නය සම්බන්ධයෙන් විශාල කර්තව්‍යයක් කළ බව.

මේ ප්‍රශ්නය විසඳන්න අතිගරු ජනාධිපතිතුමා ප්‍රාදේශීය මට්ටමෙන්, දිස්ත්‍රික් මට්ටමෙන් සහ ජාතික මට්ටමෙන් ඩෙංගු කාර්ය සාධක බලකායක් පිහිටුවා තිබෙනවා. ඒ වාගේම මේ ප්‍රශ්නය විසඳන්න නොයෙක් ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. රාජ්‍ය නායකයා සෘජුවම මැදිහත් වෙලා ඩෙංගු උවදුරට විසඳුමක් සොයන්න උත්සාහ දැරූ පළමුවන අවස්ථාව හැටියට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගත් කර්තව්‍යය අපි පිළිගත යුතුයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා මීතොටමුල්ල ගැන කථා කළා. මීතොටමුල්ල ඉතිහාසය ගැන අපි දැන ගත යුතුයි. කවුද බලෙන් ගිහිල්ලා මීතොටමුල්ලට කුණු දැම්මේ? එම නිසා කුණු කන්දේ ප්‍රශ්නයට වගකිව යුත්තේ කවුද කියන එක මා නැවත වරක් ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාට මතක් කරන්නට කැමැතියි. ඒ ගැන පොඩ්ඩක් රෝහිත අබේගුණවර්ධන අපේ මිත්‍රයාට මතක් කරන්නට කැමැතියි. නමුත් කොළඹ නගර සභාවේ දූෂණය පිළිබඳව එතුමා කිව්ව ප්‍රකාශය ගැන මා එකඟ වියයුතුයි.

We have got the issue of weighbridge sorted out. I will take a personal initiative on corruption with regard to payments and attend to it because I see payments being made in an *ad hoc* manner. As we all know, the local bodies have been corrupt, but with regard to the Colombo Municipal Council, there needs to be a focus and a direction.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු අමාත්‍යතුමනි, -[බාධා කිරීමක්]

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

Please do not disturb my speech. -[*Interruption.*] I will have an investigation on that. As regards to Meethotamulla-[බාධා කිරීමක්] දේශපාලන වශයෙන් සමහර අය කුණු ප්‍රශ්නයෙන් පෝෂණය වෙනවා වාගේම කුණුවලිනුත් පෝෂණය වුණු උදවිය මේ රටේ ඉන්නවා. ඒ උදවිය සම්බන්ධව නීතියේ ක්‍රියා මාර්ග ගන්න ඕනෑ. ඒ ක්‍රියා මාර්ග මම ගන්නවා. [බාධා කිරීමක්] - I do not want to be disturbed by both my Hon. Friends, the Hon. Rohitha Abeygunawardana and the Hon. Mahindananda Aluthgamage. You all can make allegations. But we have to work together. Dengue has increased not only in developing countries but in developed countries also. It is not only infrastructure that matters. ඉස්සර, ඩෙංගු මදුරුවෝ පිරිසිදු වතුරේ තමයි හිටියේ. But, now in unclean water also you get Dengue mosquito breeding. Therefore, we all have to act with responsibility. It is easy to point the finger at the Government; it is easy to point the finger at anybody. But, we also have to know that this is a national issue and we should not try to politically benefit from this issue. It is very unfortunate that some Hon. Members of this House want to point fingers at the Minister of Health and the Minister of Provincial Councils and Local Government. This Adjournment Motion also has referred to the fact that unavailability of elected Members in the Local Authorities is the reason for this.

මම මේ අවස්ථාවේදී පළාත් සභා හා පළාත් පාලන ඇමති හැටියට පළාත් පාලන මැතිවරණය ගැන වචන ස්වල්පයක් කථා

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

කිරීම මගේ යුතුකමක් ලෙස සලකනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා චෝදනා කළා. නිලධාරීන් කිසිසේත්ම දේශපාලන අධිකාරිය වෙනුවෙන් ආදේශ කරන්නට බැරිය කියන එක මම පිළිගන්නවා. හැබැයි කොමසාරිස්වරුන්ට හා ලේකම්වරුන්ට පූර්ණ බලයක් තිබෙනවා, නගරාධිපතිවරුන් හැටියට සභ සභාපතිවරුන් හැටියට ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්න. ඒ වාගේම පළාත් සභාවලට වගකීමක් තිබෙනවා, ඒ කටයුත්ත පරිපාලනය කරන්න. එම නිසා ඇඟිල්ල දික් කරන්න ලෙහෙසියි. නමුත් පළාත් පාලන මැතිවරණය නොතිබීමට හේතුව පෙර පවිවලට මට දුක් විඳින්නට සිදු වීමයි. සීමා නිර්ණය අභියාචනා විමර්ශන කටයුත්තක් මට කරන්නට සිදු වෙනවා.

I would like to inform this House that the Bill is ready with all the amendments. Yesterday, it appeared in the Order Paper. So, as regards to holding of the election we have taken all the necessary steps. This Government for a moment is not fearful of holding an election. It has happened so because the Hon. Basil Rajapaksa did the delimitation to his fancy. He did it in the way he wants. That day, I told the Hon. Dullas Alahapperuma also, if he was responsible for delimitation this could not have happened. But unfortunately, it was done according to the whims and fancies of one particular individual.

අභියාචනා ක්‍රියාදාමයකට යන්න සිද්ධ වුණා. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමා කලින් බේරුවල ආසනයේ සංවිධායක වෙලා ඉඳලා පසුව වෙන ආසනයකට දැම්මා නේද? ඔබතුමාටත් එහෙම වුණා නේ. ඔබතුමාට කළුතරට මාරුවක් ලැබුණා නේද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ඔව්.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මෙතුමාටත් විශාල අසාධාරණයක් වුණා. එතුමා මගේ මිත්‍රයා. එතුමා ඒ ගැනත් මට කතා කරලා තිබෙනවා. දේශපාලනයේදී මේක වෙනවා. හැබැයි, මේ ආණ්ඩුව කිසිසේත්ම මේ පළාත් පාලන මැතිවරණය කල් දැමීමට වගකීමක් ගන්නේ නැහැ. We are not responsible for that. The reason for postponing is that we had to take certain steps. We will hold the election and then, let the members be elected.

හැබැයි, ඩෙංගු උවදුරටයි, කුණු කසළ ප්‍රශ්නයයි මේ රජයේ වගකීමක් හැටියට පෙන්වන්න එපා, රෝහිත අබේගුණවර්ධන මැතිතුමා. මැතිවරණය කල් යාමට හේතුව මේ ආණ්ඩුව නොවෙයි; කලින් සීමා නිර්ණ කටයුතු හරියාකාරව නොකිරීමයි. ඒක ඔබතුමාට පිළිගන්න වෙනවා. ඔබතුමාගේ බල ප්‍රදේශයේත් සීමාවන් වෙනස් වුණා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
පරණ විධියට තියන්න කෝ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඔබතුමා කියනවා නේ අපේ ආණ්ඩුව කියලා. ඔබතුමායි, මමයි අත උස්සලා ජනතාව වෙනුවෙන් ඡන්ද ක්‍රමය වෙනස් කළත්, ඔබතුමා අද කියනවා පරණ ක්‍රමයට යන්න කියලා. ඒක ජාතික අපරාධයක්. [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා දැන් පරණ ක්‍රමයට යන්න ඕනෑ නැහැ නේ. දැන් අවශ්‍ය කරන සියලුම සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තමයි තිබෙන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
බාලගිරි දෝෂය.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
බාලගිරි දෝෂය නොවෙයි, බැසිල් රාජපක්ෂ දෝෂය. [බාධා කිරීමක්] ඔබතුමාට මම වගකීමකින් කියන්නම්, මේ සංශෝධනය පාර්ලිමේන්තුවේ - [බාධා කිරීමක්] ඔබතුමා නීතිය දන්නේ නැහැ නේ. රෝහිත අබේගුණවර්ධන මැතිතුමනි, දින වකවානු තීරණය කරන්නේ කවුද කියලා ඔබතුමා දන්නේ නැහැ. දින වකවානු තීරණය කරන්නේ කවුද? මැතිවරණ කොමසාරිස්. [බාධා කිරීමක්] ඔබතුමා දේශපාලනය දන්නවා වාගේ නීතියත් පොඩ්ඩක් මගෙන් අහන්න. මම ඔබතුමාට කියලා දෙන්නම්. [බාධා කිරීමක්] මැතිවරණ කොමිසම කියලා තිබෙනවා මේ සංශෝධන සම්මත වුණාට පසුව මැතිවරණය පවත්වන්න අඩු ගණනේ දින 55ක් ඕනෑ කියලා. මේ සංශෝධනයෙන් පසුව දින 55න් මේ මැතිවරණය පවත්වයි. ඔබතුමන්ලා ඩෙංගු පෙන්වලා, කුණු පෙන්වලා මැතිවරණය පරක්කු කරනවා කියලා කියන්න එපා. තමුන්නාන්සේලාට වේදිකාවක් අවශ්‍ය නම්, වෙන වේදිකාවක් සොයන්න. ඩෙංගු උවදුර කියන්නේ ජාතික ප්‍රශ්නයක්; මාරාන්තික ප්‍රශ්නයක්. අපි දේශපාලන වශයෙන් ඩෙංගුවලින් පෝෂණය වෙන්න හොඳ නැහැ. ඩෙංගු උවදුර සම්බන්ධයෙන් දත්ත පෙන්වනවා, මේ ආණ්ඩුව කාලයේ ඩෙංගු රෝගය වැඩි වෙලා කියලා. යටිතල පහසුකම් සියල්ල තිබුණත් ලෝකයේ දියුණුම රටවලත් ඩෙංගු රෝගය වැඩි වෙලා තිබෙනවා. My Hon. Friend, you have the right to show figures. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා දත්ත පෙන්නුවා. දත්තවලින් චිතරක් කියන්න බැහැ, ඩෙංගු උවදුරට රජය වගකියන්න ඕනෑ කියලා. This Government under the leadership of His Excellency President Maithripala Sirisena has taken every step to improve infrastructure in the hospitals. Also, the number of patients which have to be dealt with has increased by three or four-fold. It is a national crisis. We will have to work together to solve this problem. I would like tell my dear Friend, the Hon. Rohitha Abeygunawardana and the Hon. Mahindananda Aluthgamage and all Members from both sides, that we should get together and work without criticizing. There is no point in trying to criticize. - [*Interruption.]* No, Hon. Member, you are trying to make use of this issue for politics. ඔබතුමා අහිංසක ජීවිතත් එක්ක සෙල්ලම් කරන්න එපා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඩෙංගු උවදුර කියන්නේ ජාතික ප්‍රශ්නයක්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ඔබතුමාට එහෙම චෝදනා කළේ නැහැ. මම ඔබතුමාට කිව්වේ, "පළාත් පාලන යන්ත්‍රණය කඩා වැටිලා. ඔබතුමා කැඳවලා ඒක කඩිනම් කරන්න." කියලායි.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
රෝහිත අබේගුණවර්ධන මැතිතුමා කිව්වා කිව්වා පරණ ක්‍රමයට මැතිවරණය පවත්වන්න කියලා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මෙතැන මෙතුමා දේශපාලන මුහුණුවරක් තමයි ගත්තේ. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා මම දිගින් දිගට - [බාධා කිරීමක්]

I have continuously summoned the Commissioners and Secretaries and have had dialogue with all of them. - [*Interruption.]* I do not have to be educated. I have called Commissioners, Secretaries and had dialogues continuously.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please. මොකක්ද point of Order එක?

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙතැන කථා කරලා කිව්වේ 200ක් මැරෙන තුරු -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ඔබතුමා වාඩි වෙන්න. අමාත්‍යතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
කිව්වා. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි 2යි තිබෙන්නේ. ඒ නිසා කරුණාකර කථා කරලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
I would like to educate the Hon. Members that His Excellency the President called for meetings of all Secretaries and Commissioners and we have been having dialogues continuously to deal with the dengue problem. Our Ministry has also continuously summoned the Secretaries and Commissioners. Therefore, we need not be educated. You all are trying to educate us on how to function, but I think, because of the manner the previous regime functioned only it was thrown out of office. So, give this Government an opportunity to function without being critical and finally the people will judge. You all are trying to say that during your time it was very rosy - I was also in that Government - and criticizing the fact that there is dirt on the streets. We know why. අද කොළඹ කුණු තිබෙන්නේ මීතොටමුල්ල ප්‍රශ්නය නිසා. මීතොටමුල්ල ප්‍රශ්නයට වගකිව යුත්තේ කවුද කියලා තමුන්නාන්සේ දන්නවා. තමුන්නාන්සේලා මඩ ගහන්න කලින් හෘදය සාක්ෂියට එකඟව අහන්න මීතොටමුල්ල කුණු ප්‍රශ්නයෙන් ජීවිත නැතිවීම සම්බන්ධව වගකිව යුත්තේ කවුද කියලා. කවුද, බලෙන් ගිහිල්ලා මීතොටමුල්ලට කුණු දැම්මේ කියන එක අහන්න. කිසිම කළමනාකරණයක් නැතිව මීතොටමුල්ල කුණු කන්දට දිගින් දිගටම කුණු දැම්මා. මීතොටමුල්ල කුණු කන්ද කඩාගෙන යෑමට වගකිව යුත්තේ කවුද කියන එක තමුන්නාන්සේලා දැන ගෙන කථා කරන්න කියන එක මම තමුන්නාන්සේලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Presiding Member, I would like to end my speech by saying that they should act with more responsibility; they should not play politics with dengue; they should not play politics with dirt because these are national problems. Also Members should not use an Adjournment Motion dealing with dengue to request the Government to hold the election under the earlier system. The reason why you wanted this Adjournment Motion is to do bankrupt politics and not for the benefit of our masses.

Thank you.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 7.28ට, 2016 මාර්තු මස 08 වන දින සභා සම්මතිය අනුව, 2017 ජූනි මස 22 වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 7.28 மணிக்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2017 யூன் 22, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.28 p.m. until 10.30 a.m. on Thursday, 22nd June, 2017, pursuant to the Resolution of Parliament of 08th March, 2016.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.